269 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 269 - இல. 4
Volume 269 - No. 4

2019 මාර්තු 08වන සිකුරාදා
2019 மார்ச் 08, வெள்ளிக்கிழமை
Friday, 08th March, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

ව්‍යවස්ථාදායක කාරක සභාව: අතිරේක සාමාජිකයන්

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයන් නම් කිරීම

**මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්න:**

"ගම් පෙරළිය" වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී මතුවන ගැටලු

**විසර්ජන පනත් කෙටුම්පත, 2019 – [තුන්වන වෙන් කළ දිනය]:**

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**කල් තැබීමේ යෝජනාව:**

විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා දීමනා සහ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වැඩි කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்

**தேர்தல் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா :**

"கம்பெறலிய" வேலைத்திட்டத்தை முன்னெடுப்பதிலுள்ள பிரச்சினைகள்

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2019 - [ஒதுக்கப்பட்ட மூன்றாம் நாள்] :**

இரண்டாம் மதிப்பு – விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

மாற்றுத்திறனாளிகளுக்கான கொடுப்பனவு மற்றும் சமுர்த்தி பயனாளிகளின் எண்ணிக்கையை அதிகரித்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Legislative Standing Committee: Additional Members

Ministerial Consultative Committees: Nomination of Members

PERFORMANCE REPORT OF THE ELECTION COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Difficulties in Implementation of "Gamperaliya" Programme

APPROPRIATION BILL, 2019 - [Third Allotted Day]:

Second Reading – Debate Adjourned

ADJOURNMENT MOTION:

Allowance for Persons with Special Needs and Increase Number of Samurdhi Recipients

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2019 මාර්තු 08වන සිකුරාදා***
*2019 மார்ச் 08, வெள்ளிக்கிழமை*
*Friday, 08th March, 2019*

---

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப.9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
### சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
### LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

"ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ 113(2) දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු සඳහන් මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් ගරු කථානායකතුමා විසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

1. ගරු අශෝක් අබේසිංහ මහතා
2. ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
3. ගරු නිහාල් ගලප්පත්ති මහතා
4. ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
5. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
6. ගරු ඉම්රාන් මහරූෆ් මහතා
7. ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
8. ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බුද්ධික පතිරණ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නියෝජනය කරන කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීන අවතැන්වූවන් සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව අපට කැඳවාගන්න විධියක් නැහැ, උපදේශක කාරක සභාව පත් කරන කල්. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. අපි කැමැතියි, උපදේශක කාරක සභාව කැඳවන්න. සමහර පක්ෂවලින් ඒ සඳහා නම් ලබා දී නැහැ. ඒ නිසා කරුණාකරලා, නම් ලබා දෙන්නේ නැත්නම් ඒ ටික අත්හැර දමා ඉතිරි ටික කැඳවා හෝ මෙය ඉදිරියට කරගෙන යන්න අවස්ථාව සලසනවා නම් හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නම්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

නිවේදන අංක 2.

## II

### අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයන් නම් කිරීම
### அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்
### MINISTERIAL CONSULTATIVE COMMITTEES: NOMINATION OF MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 විධිවිධාන ප්‍රකාරව සහ 2019 ජනවාරි මස 24වන දින සහ පෙබරවාරි මස 5වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනා ප්‍රකාරව, ඒ ඒ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවල සේවය කිරීම සඳහා පහත සඳහන් මන්ත්‍රීවරයන්ද, තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

1. රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව - ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
2. ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

[ගරු නියෝජ්‍ය කථානායකතුමා ]

3. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව - ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

4. කාන්තා හා ළමා කටයුතු සහ වියළි කළාප සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව - ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

5. තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව - ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා

6. ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව - ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

7. කම්කරු සහ වෘත්තිය සමිති සබඳතා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව -ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

8. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව- ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

9. ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව - ගරු එස්. ශ්‍රීතරන් මහතා

10. ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව- ගරු එස්. ශ්‍රීතරන් මහතා

## III

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2019 මාර්තු 8වන සිකුරාදා එනම් අද දින අ.භා. 2.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
### தேர்தல் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
### PERFORMANCE REPORT OF THE ELECTION COMMISSION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

2018 වර්ෂයේ තෙවැනි කාර්තුව ( 2018.07.01-2018.09.30) සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
### PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2014/2015 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ව්‍යාපාර සහ වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
### துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
### SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, “1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග” සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) බෙලිඅත්ත, කුඩාහීල්ල දකුණ, දික්වැල්ල පාර, "තුෂාරා" යන ලිපිනයෙහි පදිංචි බී.ඒ.කේ.පී. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රන්න, වාඩියගොඩ, අංක 13/1 දරන ස්ථානයෙහි පදිංචි එච්.කේ. අජන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කාණ්ඩ අංක 01, තම්බලුවිල්, ඒ.පී.සී. පාර යන ලිපිනයෙහි පදිංචි එස්. සෙන්තිල් කුමාර් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) රන්න, කට්ටකඩුව, යාය 19, අංක 523 දරන ස්ථානයෙහි පදිංචි විදානගේ නන්දසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූරිය වැව, හ/සූරියවැව ජාතික පාසලේ සේවය කරන ඊ. රුවන් නාලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කන්තලේ, අග්බෝපුර, යුනිට් 19, අංක 56/සී දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී.තරිඳු පියුමාල්

රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### පැල්මඩුල්ල, දොඹගස්වත්ත ගම්මානය : පානීය ජල පහසුකම්
### பெல்மடுல்ல, தொம்பகஸ்வத்த கிராமம்: குடிநீர் வசதி
### PALMADULLA, DOMBAGASWATTA VILLAGE: DRINKING WATER FACILITY

13/'18

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පැල්මඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ, දොඹගස්වත්ත නමැති දුෂ්කර ගම්මානයේ දැඩි පානීය ජල ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) එම ජනතාවට පානීය ජලය ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர்வழங்கல் மற்றும் உயர்கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பெல்மடுல்ல தேர்தல் தொகுதியில், தொம்பகஸ் வத்த என்ற பின்தங்கிய கிராமத்தில் பெரும் குடிநீர் பிரச்சினை காணப்படுகின்றதென்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி மக்களுக்கு குடிநீரைப் பெற்றுக் கொடுப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning, Water Supply and Higher Education:

(a) Will he inform this House-

(i) whether he is aware that there is an acute shortage of drinking water in the village named Dombagaswatta, a village full of difficulties, in the Palmadulla electorate; and

(ii) the steps taken by the Ministry to provide drinking water to the people in that area?

(b) If not, why?

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹக்கீம் - நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning, Water Supply and Higher Education)

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයේ සඳහන් ගම්මානයේ නමේ පොඩි වැරැද්දක් වෙලා තිබෙනවා, නේද? ඒ ගම්මානයේ නම දොඹගස්හින්න විය යුතුයි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ඔව්, ගරු ඇමතිතුමනි, දොඹගස්හින්න විය යුතුයි.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. පැල්මඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ දොඹගස්හින්න ගම්මානයේ පානීය ජල ගැටලුවක් පවතී.

[ගරු රවුෆ් හකීම් මහතා]

(ii) එම ගම්මානයේ පවුල් 540ක් ජීවත් වේ. එයින් පැල්මඩුල්ල ජල සම්පාදන ක්‍රමයේ තාක්ෂණ හැකියාව අනුව පවුල් 40කට ජල සම්බන්ධතා එම ජල සම්පාදන ක්‍රමයෙන් ලබා දී ඇත.

තවත් පවුල් 345ක් සඳහා ප්‍රජා ජල හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් ජල ව්‍යාපෘතියක් ඉදි කරමින් පවතින අතර, මාර්තු මාසයේ අවසාන භාගයේදී පමණ ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කරමින් පවතී. ඉතිරි පවුල් සඳහා ඔවුන්ගේ පෞද්ගලික ජල ප්‍රභව මඟින් පානීය ජල අවශ්‍යතාව සපුරා ගනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා පිළිතුරක් ලබා දීම සම්බන්ධව. රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ආසනයේ තිබෙන මේ ගැටලුව වෙනුවෙන් යම් සාධනීය පිළිතුරක් එතුමාගේ අමාත්‍යාංශය හරහා ලැබී තිබීම ගැන අපි සතුටු වෙනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි ගරු ඇමතිතුමනි.

රත්නපුර දිස්ත්‍රික්කයේ සූරියකන්ද ජල මූලාශ්‍රය තුළින් විශාල ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන නමුත්, ඒ ජල යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලැබෙන්නේ දිස්ත්‍රික්කයේ වෙනත් පැත්තකටයි. ඒ නිසා මේ කටයුතු යම් විනිවිදභාවයකින් යුතුව කටයුතු කෙරී නැහැ කියා අපි දකිනවා, ගරු ඇමතිතුමනි. අවට ඉන්න පිරිස්වලට, ඊට මැදිව තිබෙන ගම්මාන කිසිවකට ඒ මූලාශ්‍රයෙන් ජල පහසුකම ලැබෙන්නේ නැහැ. ඒ අවට ගම්මානවල ඉන්න මිනිසුන් බලාගෙන ඉඳිද්දී, ඒ ජල මාර්ගය වෙනත් ප්‍රදේශවලට අරගෙන යනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයට අරගෙන යන්නත් උත්සාහයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ජලය කියන්නේ මිනිසුන්ගේ ප්‍රධාන අවශ්‍යතාවක්. මේ අවශ්‍යතාව සපුරන්න රජයක් බැඳිලා ඉන්නවා., ඔබතුමා මේ වෙනුවෙන් සාධනීය මැදිහත් වීමක් කරන අමාත්‍යවරයෙක්.

ගරු ඇමතිතුමනි, සූරියකන්ද ජල යෝජනා ක්‍රමයේ වාගේම, මා නියෝජනය කරන රක්වාන මැතිවරණ කොට්ඨාසයේ මස්ඉඹුල යෝජනා ක්‍රමයේ ජලයත් රක්වාන ආසනයේ මිනිස්සු බලාගෙන සිටියදී වෙනත් ප්‍රදේශවලට අරගෙන යනවා. ඒ ජල යෝජනා ක්‍රමය විවෘත කරන්න ඔබතුමාත් ගියා. අපිත් සම්බන්ධ වුණා ඒ උත්සවයට.

ඒ ජලය නිවිතිගල ආසනයට යනවා. නිවිතිගල ආසනයටත් ජලය දෙන්න ඕනෑ. නමුත් මේ ජලය රැගෙන යන මාර්ගය අවට සිටින ජනතාවට මෙම පහසුකම අහිමිවීම පිළිබඳව ඒ ජනතාව තුළ විශාල ගැටලුවක් තිබෙනවා. එය නිරාකරණය කිරීම සඳහා යම් වැඩසටහනක් තිබෙනවාද ගරු ඇමතිතුමනි?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූරියකන්ද, රක්වාන වැනි ප්‍රදේශවල වාගේම, රට පුරාම අපේ ජල ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක වෙනවා. ඒ අවට ගම්මානවලට ජලය නොමැතිව ඊට වඩා දුරින් පිහිටි ගම්මානවලට ජලය ගෙනයනවා කියන දෝෂාරෝපණය එල්ල වෙනවා. මෙයට පිළියමක් ලෙස ඒ ධාරිතාව ගැන සලකා බලා අපට වෙනම ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු වෙනවා. අවශ්‍ය ධාරිතාව තිබේ නම් ජල සම්බන්ධතා ලබා දීම සඳහා නළ එළීම් කටයුතුවලට වෙනම මුදල් වෙන් කර ගැනීමට සිදුවේවි. අපි ඒ පිළිබඳව මුදල් අමාත්‍යාංශය දැනුවත් කර තිබෙනවා. ධාරිතාව වැඩි කර ගැනීමට ඒ ජල මූලාශ්‍රවල තිබෙන ජලය ප්‍රමාණවත් නම් ඒ සඳහා කටයුතු කිරීමට අපි ඉල්ලීමක් කර තිබෙනවා. මෙවර අය වැයෙන් ඒ සඳහා මුදලක් වෙන් කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මෙවැනි ගැටලු පවතින අනෙකුත් ප්‍රදේශවලට වෙනම මුදලක් ලබා ගැනීම සඳහා මම අද සවස මුදල් ඇමතිතුමා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ සාකච්ඡාවක් පවත්වනවා.

එහෙම නැත්නම්, භාණ්ඩාගාරයේ guarantee එකක් සමඟ අභ්‍යන්තර බැංකුවකින් ණය අරගෙන ඒක සපුරාලීම සඳහා කටයුතු කරන්නයි අපි බලාපොරොත්තු වන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවා ද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම යොමු කරන්නේ මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන්නේ. මේ ආයතනය අපේ රටේ විශාල පිරිසකට සහයෝගයක්, ශක්තියක් වෙමින් පානීය ජල අවශ්‍යතාව වෙනුවෙන් මැදිහත් වන බව අපි දන්නවා. ඒ ආයතනයට අනුබද්ධව ලෝක බැංකුව හරහා ක්‍රියාත්මක වන සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ වැඩසටහනක් තිබෙනවා. ඒක අතිශයින්ම වැදගත් වැඩසටහනක්. ගරු ඇමතිතුමනි, මේ වැඩසටහන ක්‍රියාත්මක වීමේදී සමහර තැන්වල විනිවිදභාවයක් අපට දකින්න නැහැ. විනිවිදභාවයක් නැහැ කියලා කියන්නේ, ලැබිය යුතු තැන්වලට ලැබෙන්නේ නැහැ. මම හිතන විධියට ඔබතුමන්ලා බලාපොරොත්තු වන්නේ water source එකක් අවටින් මේ පහසුකම් ලබා දීලා, ඒවා වැඩිදියුණු කර සනීපාරක්ෂක කටයුතු ක්‍රමානුකූල කරන්නයි. නමුත් දේශපාලන අධිකාරියේ හයිය මත සමහර තැන්වලට එම පහසුකම් වැඩියෙන් ලැබෙනවා අපි දැකලා තිබෙනවා. සමහර අවශ්‍යම තැන්වලට මේ පහසුකම් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මා ඔබතුමාගෙන් ගෞරවනීය ඉල්ලීමක් කරනවා, දුප්පත් මනුෂ්‍යයාට මේ වෙනුවෙන් මුදල් දෙනවා වෙනුවට මේක හදලාම දෙන්න කියලා. මොකද, මේ වෙනුවෙන් අපේ රටේ මිනිස්සුන්ට අය වැයෙනුත් මුදල් වෙන් කරලා තිබෙනවා. මුදල් දුන්නාට මේ වැඩේ වෙන්නේ නැහැ. ඒ නිසා පුළුවන් නම් අමාත්‍යාංශය මැදිහත් වෙලා මේක වෙනම හදලා දෙන්න. ඒ කියන්නේ, නිම කරලාම දෙන තැනට යන්න පුළුවන් නම් හොඳයි. නැත්නම්, ආධාර මුදලක් දීම තුළින් මේක අවසන් වෙන්නේ නැහැ. ඒ විධියට කළොත්, ඔබතුමාගේ පරමාර්ථය සියයට සියයක්ම සාර්ථක කරගන්න පුළුවන් වෙයි.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැන් තැන්වලින් මෙවැනි පැමිණිලි තිබෙනවා. විශේෂයෙන්ම ලෝක බැංකු ව්‍යාපෘතියේ එම ප්‍රතිලාභීන් තෝරා ගන්නේ ප්‍රාදේශීය ලේකම්වරු එක්කත්, ග්‍රාම

නිලධාරින් එක්කත් සාකච්ඡා කරලා, ඒ තුළින් තමයි මේ තෝරා ගැනීම් සිදු වන්නේ. සමහර විට දේශපාලන අධිකාරියේ මැදිහත් වීමක් සිදු වුණා නම්, ඒක අපේ අමාත්‍යාංශයෙන් සලකා බලා අවශ්‍ය නම් ඒ වෙනස්කම් කරන්න පුළුවන්. නමුත් ඒවාට අවශ්‍ය සුදුසුකම් සපුරන්න ඕනෑ. ඒ පිළිබඳව සලකා බලා අපට අවශ්‍ය විටෙක කටයුතු කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 2, ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ අවසරය ඇතිව වතුර ප්‍රශ්නයක් ගැන අහන්න මට අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
( மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. ඔබතුමාම පිළිගන්නවා, විශාල ප්‍රසිද්ධ ජල ව්‍යාපෘති තිබුණත් අල්ලපු ගමට වතුර නැහැ කියලා. "තුරුවිල" ජල යෝජනා ක්‍රමය ආරම්භ කරලා සෑහෙන කාලයක් වෙනවා. නමුත් "තුරුවිල" ජල යෝජනා ක්‍රමයට කිලෝමීටර් භාගයක් මෙහායින් වතුර නැති ගම්මානයක් තිබෙනවා. ඒ ගම්මානවල මිනිස්සු තමන් එකතු වෙලා ජල යෝජනා ක්‍රමයක් හදලා තිබෙනවා. ඒකට සහයෝගයක් වශයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් යම් ආධාරයක් දෙන්න පුළුවන්ද?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ඒ පිළිබඳව අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ ගැන චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමියත් එදා අපට කථා කළා. අපි ඒ සම්බන්ධයෙන් කඩිනමින් වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 2 - 74/'18-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊයේ අහපු ප්‍රශ්නයකටත් උත්තර දුන්නේ නැහැ. අද ප්‍රශ්නයටත් උත්තර නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා මේ ප්‍රශ්නය අහන්නේ පළමුවැනි වතාවට නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙහෙම ඇවිල්ලා තේරුමක් නැහැ. අහන ප්‍රශ්නවලට දවස ගානේ උත්තර නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ ප්‍රශ්නයට උත්තර දෙන්න එතුමා කාලය ඉල්ලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි එන එකේ තේරුමක් නැහැ. අපි මෙච්චර වියදම් කරගෙන එනවා. වැඩක් නැහැ නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පක්ෂයේ ලේකම් නිසාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රශ්න අහන්නේ නැතිව ජනාධිපතිවරණයට ලෑස්ති වෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් ජනාධිපතිවරණයට ලෑස්ති වෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි ජනාධිපතිවරණයට ලෑස්තියි. කිසි ගැටලුවක් නැහැ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 -125/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -196/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -254/'18- (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -329/'18- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -459/'19- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -486/'19- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -512/'19- (1), ගරු විමලවීර දිසානායක මහතා.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Speaker, on behalf of the Minister of Lands and Parliamentary Reforms, I ask for two weeks' time to answer that Question.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 70ක් පරණ දේවස්ථානයක් පිළිබඳ ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නමුත් පළමුවන වතාවටයි මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -524/'19- (1), ගරු මයන්ත දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 -528/'19- (1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 12 -546/'19- (1), ගරු එස්. ශ්‍රීතරන් මහතා.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Sir, I ask Question No. 12.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Education, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 13 -560/'19- (1), ගරු අ. අරවින්ද් කුමාර් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 14 -562/'19- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 15 -581/'19- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන : බදුල්ල දිස්ත්‍රික්කය

"சமுர்த்தி சிப்தொர" புலமைப்பரிசில் திட்டம்: பதுளை மாவட்டம்
"SAMURDHI SIPDORA" SCHOLARSHIP PROGRAMME: BADULLA DISTRICT

125/'18

**3. ගරු හේෂා විතානගේ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. Chaminda Wijesiri)
ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමෘද්ධි වැඩසටහන යටතේ "සමෘද්ධි සිප්දොර"ශිෂ්‍යත්ව නමින් වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම වැඩසටහනේ අරමුණු කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව ලැබූ බදුල්ල දිස්ත්‍රික්කයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නම්, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිරියේදී දැනට වඩා වැඩිපුර සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රමාණයක් බදුල්ල දිස්ත්‍රික්කයට ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

ஆரம்ப கைத்தொழில்கள் மற்றும் சமூகவலுவூட்டல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமுர்த்தி நிகழ்ச்சித்திட்டத்தின் கீழ் "சமுர்த்தி சிப்தொர" புலமைப்பரிசில் எனும் பெயரில் ஒரு நிகழ்ச்சித்திட்டம் செயற்படுத்தப்படுகின்றதா;

(ii) ஆமெனில், அந்நிகழ்ச்சித்திட்டத்தின் நோக்கங்கள் யாவை;

(iii) 2010 ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை "சமுர்த்தி சிப்தொர" புலமைப்பரிசில் பெற்ற பதுளை மாவட்ட மாணவ, மாணவிகளின் பெயர்கள் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின் படி வெவ்வேறாக யாவை;

(iv) எதிர்வரும் காலத்தில் தற்போதுள்ளதைவிட அதிக அளவிலான புலமைப் பரிசில்களை பதுளை மாவட்டத்துக்கு வழங்க அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Primary Industries and Social Empowerment:

(a) Will he inform this House-

(i) whether a scholarship programme named "Samurdhi Sipdora" is implemented under the Samurdhi Programme;

(ii) if so, the objectives of the aforesaid programme;

(iii) the number of students in each Divisional Secretary's Division in the Badulla District, that have received Samurdhi Sipdora scholarships up to now from the year 2010, separately; and

(iv) the steps taken by the Ministry to provide more scholarships to the Badulla District in the future?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් උසස් ප්‍රතිඵල ලැබූ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන්ට උසස් පෙළ අධ්‍යාපනය වෙනුවෙන් මූලාධාර සැපයීම මින් සිදු කෙරේ. අ.පො.ස.(උ.පෙළ) විභාගය දරුවෙකුගේ උසස් අධ්‍යාපනයේ ආරම්භක දොරටුව වන හෙයින් ආර්ථික දුෂ්කරතා මත එම අවස්ථාව ගිලිහී යාමට ඉඩ නොදී දරුවාගේ අනාගත අධ්‍යාපනය සුරක්ෂිත කිරීම සහ උසස් පෙළ හදාරන සිසුන්ගේ අධ්‍යාපනය සඳහා උපකාර කිරීමෙන් සමෘද්ධිලාභී පවුල්වල දරුවන් වැඩි සංඛ්‍යාවකට උසස් අධ්‍යාපන වරම් ලබා ගැනීමට සහයෝගය ලබා දීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

(iii)

| වර්ෂය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ශිෂ්‍ය සංඛ්‍යාව | ඇමුණුම් අංක |
|---|---|---|---|
| 2010 | මහියන්ගනය | 20 | A2 |
| | රිදීමාලියද්ද | 21 | A3 |
| | මීගහකිවුල | 21 | A4 |
| | කන්ද කැටිය | 22 | A5 |
| | සොරණාතොට | 17 | A6 |
| | බදුල්ල | 19 | A7 |
| | පස්සර | 21 | A8 |
| | හාලිඇල | 20 | A9 |
| | වැලිමඩ | 20 | A10 |
| | ඌව පරණගම | 21 | A11 |
| | බණ්ඩාරවෙල | 20 | A12 |
| | ඇල්ල | 21 | A13 |
| | හපුතලේ | 19 | A14 |
| | හල්දුම්මුල්ල | 18 | A15 |
| | ලුණුගල | 20 | A16 |
| | එකතුව | 300 | |
| | | | |
| 2011 | මහියන්ගනය | 20 | B 2 |
| | රිදීමාලියද්ද | 21 | B 3 |
| | මීගහකිවුල | 20 | B 4 |
| | කන්ද කැටිය | 21 | B 5 |
| | සොරණාතොට | 20 | B 6 |
| | බදුල්ල | 18 | B 7 |
| | පස්සර | 20 | B 8 |
| | හාලිඇල | 20 | B 9 |
| | වැලිමඩ | 20 | B 10 |
| | ඌව පරණගම | 20 | B 11 |
| | බණ්ඩාරවෙල | 20 | B 12 |
| | ඇල්ල | 20 | B 13 |
| | හපුතලේ | 20 | B 14 |
| | හල්දුම්මුල්ල | 20 | B 15 |
| | ලුණුගල | 20 | B 16 |
| | එකතුව | 300 | |
| | | | |
| 2012 | මහියන්ගනය | 27 | C2 |
| | රිදීමාලියද්ද | 27 | C3 |
| | මීගහකිවුල | 26 | C4 |
| | කන්ද කැටිය | 28 | C5 |
| | සොරණාතොට | 26 | C6 |
| | බදුල්ල | 26 | C7 |
| | පස්සර | 21 | C8 |
| | හාලිඇල | 26 | C9 |
| | වැලිමඩ | 26 | C10 |
| | ඌව පරණගම | 26 | C11 |
| | බණ්ඩාරවෙල | 26 | C12 |
| | ඇල්ල | 26 | C13 |
| | හපුතලේ | 19 | C14 |
| | හල්දුම්මුල්ල | 26 | C15 |
| | ලුණුගල | 19 | C16 |
| | එකතුව | 375 | |
| | | | |
| 2013 | මහියන්ගනය | 28 | D2 |
| | රිදීමාලියද්ද | 29 | D3 |
| | මීගහකිවුල | 28 | D4 |
| | කන්ද කැටිය | 28 | D5 |
| | සොරණාතොට | 27 | D6 |
| | බදුල්ල | 26 | D7 |
| | පස්සර | 26 | D8 |
| | හාලිඇල | 26 | D09 |
| | වැලිමඩ | 26 | D10 |
| | ඌව පරණගම | 26 | D11 |
| | බණ්ඩාරවෙල | 26 | D12 |
| | ඇල්ල | 26 | D13 |
| | හපුතලේ | 26 | D14 |

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

| | | | |
|---|---|---|---|
| | හල්දුම්මුල්ල | 26 | D15 |
| | ලුණුගල | 26 | D16 |
| | එකතුව | 400 | |
| | | | |
| 2014 | මහියන්ගනය | 29 | E2 |
| | රිදීමාලියද්ද | 30 | E3 |
| | මීගහකිවුල | 27 | E4 |
| | කන්ද කැටිය | 30 | E5 |
| | සොරණාතොට | 29 | E6 |
| | පස්සර | 25 | E7 |
| | ලුණුගල | 15 | E8 |
| | බදුල්ල | 16 | E9 |
| | හාලිඇල | 32 | E10 |
| | ඌව පරණගම | 32 | E11 |
| | වැලිමඩ | 27 | E12 |
| | බණ්ඩාරවෙල | 29 | E13 |
| | ඇල්ල | 32 | E14 |
| | හපුතලේ | 23 | E15 |
| | හල්දුම්මුල්ල | 24 | E16 |
| | එකතුව | 400 | |
| | | | |
| 2015 | මහියන්ගනය | 36 | F2 |
| | රිදීමාලියද්ද | 38 | F3 |
| | මීගහකිවුල | 26 | F4 |
| | කන්ද කැටිය | 28 | F5 |
| | සොරණාතොට | 23 | F6 |
| | පස්සර | 30 | F7 |
| | ලුණුගල | 23 | F8 |
| | බදුල්ල | 24 | F9 |
| | හාලිඇල | 40 | F10 |
| | ඌව පරණගම | 41 | F11 |
| | වැලිමඩ | 40 | F12 |
| | බණ්ඩාරවෙල | 27 | F13 |
| | ඇල්ල | 30 | F14 |
| | හපුතලේ | 21 | F15 |
| | හල්දුම්මුල්ල | 28 | F16 |
| | එකතුව | 455 | |
| | | | |
| 2016 | මහියන්ගනය | 36 | G1 |
| | රිදීමාලියද්ද | 40 | G2 |
| | මීගහකිවුල | 25 | G3 |
| | කන්ද කැටිය | 26 | G4 |
| | සොරණාතොට | 25 | G5 |
| | පස්සර | 30 | G6 |
| | ලුණුගල | 23 | G7 |
| | බදුල්ල | 24 | G8 |
| | හාලිඇල | 40 | G9 |
| | ඌව පරණගම | 41 | G10 |
| | වැලිමඩ | 40 | G11 |
| | බණ්ඩාරවෙල | 27 | G12 |
| | ඇල්ල | 30 | G13 |
| | හපුතලේ | 22 | G14 |
| | හල්දුම්මුල්ල | 26 | G15 |
| | එකතුව | 455 | |
| | | | |
| 2017 | මහියන්ගනය | 36 | H2 |
| | රිදීමාලියද්ද | 38 | H3 |
| | මීගහකිවුල | 24 | H4 |
| | කන්ද කැටිය | 26 | H5 |
| | සොරණාතොට | 23 | H6 |
| | පස්සර | 31 | H7 |
| | ලුණුගල | 27 | H8 |
| | බදුල්ල | 24 | H9 |
| | හාලිඇල | 40 | H10 |
| | ඌව පරණගම | 41 | H11 |
| | වැලිමඩ | 40 | H12 |
| | බණ්ඩාරවෙල | 27 | H13 |
| | ඇල්ල | 29 | H14 |
| | හපුතලේ | 22 | H15 |
| | හල්දුම්මුල්ල | 28 | H16 |
| | එකතුව | 456 | |
| 2018 | මහියන්ගනය | 54 | I 1- I 26 |
| | රිදීමාලියද්ද | 60 | |
| | මීගහකිවුල | 179 | |
| | කන්දකැටිය | 144 | |
| | ඌවපරණගම | 29 | |
| | වැලිමඩ | 60 | |
| | බණ්ඩාරවෙල | 41 | |
| | ඇල්ල | 44 | |
| | හපුතලේ | 35 | |
| | හල්දුම්මුල්ල | 41 | |
| | එකතුව | 687 | |

(iv) මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා වර්ෂයකට අයදුම්පත් 26,000ක් පමණ ඉදිරිපත් වන බැවින්, බදුල්ල දිස්ත්‍රික්කයද ඇතුළුව මුළු දිවයිනම ආවරණය වන පරිදි සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවන් වැඩි පිරිසකට සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කරන ලෙස සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයට උපදෙස් දීමට කටයුතු කරගෙන යනු ලැබේ.

මීට අමතරව 2018/2020 වර්ෂ සඳහා මුළු දිවයිනට ලබා දෙන සිප්දොර ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් **ඇමුණුම* මඟින් ඉදිරිපත් කර** ඇත.

(ආ) අදාළ නොවේ.

** පිළිතුර සහ ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 4 -196/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2015- 2017වර්ෂවල ප්‍රතිසංස්කරණය කළ වාරිමාර්ග: පොළොන්නරුව දිස්ත්‍රික්කය

## 2015 - 2017 வரை புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள்: பொலன்னறுவை மாவட்டம்

IRRIGATION SCHEMES RENOVATED FROM 2015-2017: POLONNAARUWA DISTRICT

254/'18

**5. ගරු චමල් රාජපක්ෂ මහතා (ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Chamal Rajapaksa on behalf of the Hon. Padma Udayashantha Gunasekera)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் பொலன்னறுவை மாவட்டத்தில் புனரமைக்கப் பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப்பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iv) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடை யதான புனரமைப்புப் பணிகளின் பௌதீக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென்பதையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக்கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின் போது அகற்றப்பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப் பத்திரங்கள் கோரப் பட்டனவா என்பதையும்;

(viii) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களை பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the minor, medium and major irrigation schemes renovated in the Polonnaruwa District in the years 2015, 2016 and 2017;

(ii) the estimated amount for each renovation work, separately;

(iii) whether tenders were called for the said renovation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) the physical and financial progress of the renovation work of that contract with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports relevant to that renovation work will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in renovation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development, I **table*** the Answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i)

| Year | Minor Irrigation Schemes |
|---|---|
| 2015 | Rehabilitation ofMinor Irrigation |
| 2016 | Rehabilitation of Tanks |
| | Construction of Structures |
| | Rehabilitation of Irrigation Canal |
| 2017 | Renovation of abandoned anicuts |
| | Minor rehabilitations to anicuts |
| | Augmentation of canal systems |
| | Rehabilitation of Tanks |

| Year | Medium irrigation schemes |
|---|---|
| 2015 | Maha Halmilla Wewa |
| | Bebiya Wewa |
| | Eriga Oya |
| | Nehinna |
| | Attaragalewa |
| | Bhuu Wewa |
| | Heerati Oya |
| 2016 | Maha Halmilla Wewa |
| | Bebiya Wewa |
| | Eriga Oya |
| | Nehinna |
| | Attaragalewa |
| | Bhuu Wewa |
| | Heerati Oya |
| 2017 | Maha Halmilla Wewa |
| | Bebiya Wewa |
| | Eriga Oya |
| | Nehinna |
| | Attaragalewa |
| | Bhuu Wewa |
| | Heerati Oya |

| Year | Major Irrigation Schemes |
|---|---|
| 2015 | Parakrama Samudra |
| | Minneri Wewa |
| | Girithale |
| | Kaudulla |
| | Elahera |
| 2016 | Parakrama Samudra |
| | Minneri Wewa |
| | Girithale |
| | Kaudulla |
| | Elahera |
| 2017 | Parakrama Samudra |
| | Minneri Wewa |
| | Girithale |
| | Kaudulla |
| | Elahera |

(ii)

| Year | Minor Irrigation Schemes | Estimated (.Rs) Amount | Total Estimated (.Rs) Amount |
|---|---|---|---|
| 2015 | Rehabilitation ofMinor Irrigation | 18,842,000.00 | 18,842,000.00 |
| 2016 | Rehabilitation of Tanks | 46,590,000.00 | 82,100,000.00 |
| | Construction of Structures | 16,120,000.00 | |
| | Rehabilitation of Irrigation Canal | 19,390,000.00 | |
| 2017 | Renovation of abandoned anicuts | 1,815,242.58 | 29,429,875.05 |
| | Minor rehabilitations to anicuts | 3,183,393.50 | |
| | Augmentation of canal systems | 12,423,261.04 | |
| | Rehabilitation of Tanks | 12,007,977.93 | |

| Year and Irrigation scheme | Medium irrigation schemes | Estimated (.Rs) Amount | Total Estimated (.Rs) Amount |
|---|---|---|---|
| 2015 | Irrigation System operations and maintenance | 1,567,119.41 | 8,308,190.12 |
| Halmilla Wewa Bebiya Wewa Eriga Oya Nehinna Attaragalewa Bhuu Wewa Heerati Oya | Construction of structures at irrigation schemes and rehabilitation of head works | 499,419.70 | |
| | Improvement affairs of canal Schemes | 2,856,610.41 | |
| | Protection of departmental lands and other assets | 231,830.00 | |
| | Renovation of flood damages | 3,153,210.60 | |
| 2016 Halmilla Wewa Bebiya Wewa Eriga Oya Nehinna Attaragalewa Bhuu Wewa Heerati Oya | Irrigation System operations and maintenance | 1,747,209.27 | 50,104,570.40 |
| | Improvement affairs of canal Schemes | 16,814,190.84 | |
| | Protection of departmental lands and other assets | 117,650.00 | |
| | Construction of Galserugolla Wewa | 31,425,520.29 | |
| 2017 Halmilla Wewa Bebiya Wewa Eriga Oya Nehinna Attaragalewa Bhuu Wewa Heerati Oya | Irrigation System operations and maintenance | 1,412.975.00 | 31,680,383.57 |
| | Construction of structures at irrigation schemes and rehabilitation of head works | 14,694,958.64 | |
| | Improvement affairs of canal Schemes | 12,442.146.24 | |
| | Protection of departmental lands and other assets | 562,700.00 | |
| | Construction of Galserugolla Wewa | 2,567,603.69 | |

| Year and Irrigation scheme | Major Irrigation Schemes | Estimated (.Rs) Amount | Total Estimated (.Rs) Amount |
|---|---|---|---|
| 2015 Parakrama Samudra Minneri Wewa Girithale Kaudulla Elahera | Irrigation System operations and maintenance | 30,776,393.83 | 195,446,816.75 |
| | Construction of structures at irrigation schemes and rehabilitation of head works | 9,338,641.50 | |
| | Renovation of flood damages | 27,009,645.70 | |
| | Maintenance work of agro-roads of the schemes | 18,658,137.49 | |
| | Improvement affairs of canal Schemes | 50,605,145.54 | |
| | Protection of departmental lands and other assets | 8,967,944.69 | |
| | Construction of Kaudulla upper level north canal (028km) under Moragahakanda Project | 7,478,630.00 | |
| | Total Cost of Climate Resilience Improvement Project (CRIP) from 2015 to 2017 | 39,210,000.00 | |
| | Extension of Kaudulla sub-canal with Damsopura Project | 3,402,278.00 | |
| | Irrigation System operations and maintenance | 52,906,575.17 | |
| | Construction of structures at irrigation schemes and rehabilitation of head works | 22,921,591.92 | |
| | Renovation of flood damages | 8,830,683.88 | |
| | Maintenance work of agro-roads of the schemes | 26,674,269.43 | |

| | | | |
|---|---|---|---|
| 2016 Parakrama Samudra Minneri Wewa Girithale Kaudulla Elahera | roads of the schemes | | 367,084,096.31 |
| | Improvement affairs of canal Schemes | 67,921,027.93 | |
| | Protection of departmental lands and other assets | 25,408,364.98 | |
| | Construction of Kaudulla upper level north canal (028km) under Moragahakanda Project | 64,238,306.00 | |
| | Total Cost of Climate Resilience Improvement Project (CRIP) from 2015 to 2017 | 81,880,000.00 | |
| | Extension of Kaudulla sub-canal with Damsopura Project | 16,303,277.00 | |
| 2017 Parakrama Samudra Minneri Wewa Girithale Kaudulla Elahera | Irrigation System operations and maintenance | 43,582,109.00 | 791,408,455.34 |
| | Construction of structures at irrigation schemes and rehabilitation of head works | 4,306,605.14 | |
| | Renovation of flood damages | 13,957,571.27 | |
| | Maintenance work of agro-roads of the schemes | 8,024,221.09 | |
| | Improvement affairs of canal Schemes | 23,054,523.45 | |
| | Protection of departmental lands and other assets | 9,785,277.39 | |
| | Development Project of Polonnaru District | 300,338,612.00 | |
| | Construction of Kaudulla upper level north canal (028km) under Moragahakanda Project | 36,705,487.00 | |
| | Total Cost of Climate Resilience Improvement Project (CRIP) from 2015 to 2017 | 309,450,000.00 | |
| | Extension of Kaudulla sub-canal with Damsopura Project | 42,204,049.00 | |

(iii) Minor irrigation -
Projects lower than Rs. 5 Mn., implemented under minor irrigations have been awarded after assigning as direct contracts to Farmer Organizations and required provisions will be released to relevant districts

and thereby, relevant contracts will be awarded by Assistant/Deputy Commissioners in charge of such districts.

Medium and Major irrigation

- It is mentioned that there are some projects that have been rehabilitated after calling tenders.

(iv) Yes.

(v) Minor irrigation schemes.

| Year | Financial progress % | Physical progress | |
|---|---|---|---|
| | | Completed | Continuation |
| 2015 | 43.16 | 15 | - |
| 2016 | 88.27 | 36 | - |
| 2017 | 33.58 | 03 | 06 |

Medium and Major irrigation - All the works have been finalized under the allocated provisions and 100% of physical and financial progress have been achieved.

(vi) Minor irrigation - Not relevant

Medium and Major irrigation - As all the relevant works had been done as rehabilitation of existing canal systems, relevant reports were not required. Measures have been taken after preparing Engineering estimates.

(vii) No.

(viii) Not relevant.

(b) Not relevant.

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ වන අලි තර්ජනය : විසඳුම්
## அனுராதபுர மாவட்டத்தில் காட்டு யானைகளின் அச்சுறுத்தல்: தீர்வு
## WILD ELEPHANT ATTACKS IN ANURADHAPURA DISTRICT: SOLUTIONS

329/'18

**6. ගරු හේෂා විතානගේ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. Ishak Rahuman)

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වන අලි තර්ජනය හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ ගොවිතැන්වලට, නිවාසවලට හා ජීවිතවලට හානි පැමිණෙන බවත්;

(ii) ඒ සඳහා විසඳුම් ලබාදෙන මෙන් වනජීවී නිලධාරීන් දැනුවත් කළද, මෙතෙක් ස්ථිර විසඳුමක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් මේ වනවිට යම් පියවරක් ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, අදාළ නිලධාරීන් දැනුවත්කර, මෙම දිස්ත්‍රික්කයේ ජනතාවට වන අලින්ගෙන් සිදුවන හානි සම්බන්ධයෙන් විසඳුම් ලබා දෙන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றுலாத்துறை அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காட்டு யானைகளின் அச்சுறுத்தல் காரணமாக அனுராதபுரம் மாவட்டத்தின் விவசாயிகளின் பயிர்ச்செய்கைகளுக்கு, வீடுகளுக்கு மற்றும் உயிர்களுக்கு இழப்புகள் ஏற்படுவதென் பதையும்;

(ii) அதற்கான தீர்வுகளை பெற்றுத்தரும்படி வனசீவ ராசிகள் அலுவலர்களுக்கு விழிப் புணர்வூட்டப் பட்டுள்ள போதிலும், இற்றைவரை நிரந்தர தீர்வொன்று வழங்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இது தொடர்பாக தற்போது ஏதேனும் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்ப தையும்;

(ii) இன்றேல், குறிப்பிட்ட அலுவலர்களை விழிப் புணர்வூட்டி இம்மாவட்ட மக்களுக்கு காட்டு யானைகளால் ஏற்படுகின்ற இழப்புகளுக்கு தீர்வுகளை பெற்றுக்கொடுக்கும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු හේෂා විතානගේ මහතා]

asked the Minister of Tourism Development, Wildlife and Christian Religious Affairs:

(a) Is he aware that-

(i) cultivations and houses of farmers of the Anuradhapura District have been damaged and their lives threatened due to wild elephant attacks; and

(ii) though this has been brought to the notice of wildlife officials, no permanent solution has hitherto been provided?

(b) Will he inform this House-

(i) whether any steps have been taken in this regard as of now; and

(ii) if not, having created awareness among officials, the date on which a solution is offered to the damages caused to the people of this district by elephants?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Tourism Development, Wildlife and Christian Religious Affairs, I **table*** the Answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) I kindly inform you that due to wild elephant threat, damages are occurred on crops, houses and lives of the farmers in the Anuradhapura District and,

(ii) During the year 2018, following solutions were given for the damages occurred in the Anuradhapura District.

- Electric fences were established as a barrier to prevent entering elephants into settlement areas. At present, total extent of electric fences in Anuradhapura is 500.3 km.
- 147 Civil Defence Force (CDF) servicemen have been deployed for the maintenance of such electric fences constructed.
- 52 CDF persons have been deployed to manage wild elephant issue in the Anuradhapura Wildlife Division.
- Under the National Electric Fence System, it is planned to construct 123 km extent of new electric fences in the Anuradhapura District.
- Having necessary measures to well maintain the electric fence system by employing a Maintenance Assistant for each singe 1 km while required employees are being recruited.
- Frequently measures are taken by Wildlife Officers to drive away wild elephants entering into human settlements and farmlands and capturing and releasing of 07 such suppressive elephants into Horowpathana elephant retention centre.
- Measures are having to release elephant corridors and remove existing barriers in the relevant corridors.
- Providing elephant crackers:-

During the year 2018 following types of crackers have been issued

Thunder (large) - 31,100

Thunder (small) - 65,000

Sparks - 44,250

Granting of Compensations:-

| Type of damage | Incidents taken place within the year | Compensations paid with the year (Rs.) |
|---|---|---|
| Compensated deaths | 22 | 11,460,000 |
| Physical injuries (wounds) | 05 | 1,201,184 |
| Property damages | 149 | 3,510,460 |
| Total | | 16,171,644 |

(b) (i) Yes

(ii) I would like to inform that above (a) (ii) measures have been taken to minimize such damages.

(c) Answered above.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 7 -459/'19- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Hon. Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government, I ask for two weeks' time to answer that Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 8 -486/'19 - (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir,on behalf of the Hon. Minister of Telecommunication, Foreign Employment and Sports, I ask for two weeks' time to answer that Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රජයේ කාර්යාලවල "මහජන දිනය": මහජනතාව මුහුණ දෙන අපහසුතා

## அரசாங்க அலுவலகப் பொதுமக்கள் தினம்: மக்கள் எதிர்நோக்கும் சிரமங்கள்

PUBLIC DAY IN GOVERNMENT INSTITUTIONS: DIFFICILTIES FACED BY PUBLIC

524/'19

**10.ගරු හේෂා විතානගේ මහතා (ගරු මයන්ත දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேஷா விதானகே - மாண்புமிகு மயந்த திசாநாயக்க சார்பாக )
(The Hon. Hesha Withanage on behalf of the Hon. Mayantha Dissanayake)

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය විසින් මහ ජනතාවගේ අවශ්‍යතා සඳහා රජයේ කාර්යාල තුළදී නිලධාරීන් හමුවීම සඳහා සතිපතා නිශ්චිත කාර්යාල දිනයක් හඳුන්වා දී තිබේද;

(ii) මෙම කාර්යාල දිනය සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර තිබේ නම්, එය කවරේද;

(iii) කාර්යාල දිනයක් ප්‍රකාශ කර තිබේ නම්, එම දිනයේදී කාර්ය මණ්ඩල රැස්වීම් හා වෙනත් රැස්වීම් පැවැත්වීමෙන් මහ ජනතාවට මුහුණදීමට සිදුවන අපහසුතා සම්බන්ධයෙන් පිළියම් යොදා තිබේද;

(iv) නිශ්චිත කාර්යාල දිනයන්හි දී ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාලවල උසස් නිලධාරීන් කොළඹ ප්‍රධාන කාර්යාලවලට කැඳවනු ලබන්නේද;

(v) එසේ නම්, එවැනි දිනවල දී මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සැලසුම් කවරේද;

(vi) මහජනතාව වෙනුවෙන් වඩාත් ඵලදායී රාජ්‍ය සේවාවක් ඉටු කිරීම සඳහා නව සැලසුම් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) அரசாங்கத்தினால் பொதுமக்களின் அவசியப் பாடுகளுக்காக அரசாங்க அலுவலகங்களில் உத்தியோகத்தர்களை சந்திப்பதற்காக வாரந் தோறும் திட்டவட்டமான அலுவலகத் தின மொன்று அறிமுகஞ் செய்யப்பட்டுள்ளதா;

(ii) இந்த அலுவலக தினம் சம்பந்தமான சுற்ற றிக்கையொன்று வெளியிடப்பட்டிருப்பின் அது யாது;

(iii ) அலுவலகத் தினமொன்று பிரகடனஞ் செய்யப் பட்டிருப்பின் அத்தினத்தில் பதவியணிக் கூட்டங்களையும் வேறு கூட்டங்களையும் நடாத்துவதால் பொதுமக்களுக்கு எதிர்நோக்க நேரிடுகின்ற சிரமங்கள் சம்பந்தமாக பரிகாரங்கள் நடைமுறையில் உள்ளனவா;

(iv ) திட்டவட்டமான அலுவலகத் தினங்களில் பிரதேச மற்றும் மாவட்ட உயர் உத்தியோகத் தர்கள் கொழும்பிலுள்ள தலைமையகங்களுக்கு அழைக்கப்படுகின்றனரா;

(v ) ஆமெனில் அத்தகைய தினங்களில் பொது மக்களின் அவசியப்பாடுகளை ஈடேற்று வதற்காக அமுலாக்கப்படுகின்ற திட்டங்கள் யாவை;

(vi ) பொதுமக்களுக்காக மிகவும் பயனுறுதிமிக்க அரச சேவையொன்றினை ஈடேற்றுவதற்கான புதிய திட்டங்கள் அமுலில் உள்ளனவா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Public Administration and Disaster Management:

(a) Will he state -

(i) whether a specific date has been declared by the Government for the public to meet officials in Government offices to fulfill their requirements;

(ii) whether a circular has been issued with regard to the public day, details of it;

(iii) whether a public day has been declared, and measures have been taken to address the difficulties faced by the public, by conducting staff meetings and other meetings on the day;

(iv) whether higher officials of the divisional and district offices are summoned to head offices in Colombo on specific public days;

(v) if so, measures taken to meet the requirements of the public on such days; and

(vi) whether new initiatives that will be implemented to assure a productive public service for the people?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 1990.10.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 43/90 නිකුත් කර ඇති අතර, 1995.06.19 දිනැති රාජ්‍ය පරිපාලන

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

චක්‍රලේඛ අංක 21/95 මඟින් සහ 2015.05.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2015 මඟින් එම කාර්යාල දිනය සම්බන්ධයෙන් තවදුරටත් අවධාරණය කර ඇත.

(iii) ඔව්.

(iv) 1995.10.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/95(i) මඟින් ගංවතුර හෝ වෙනත් විපත් සඳහා හැර බදාදා දිනවල කාර්යාලවලින් බැහැර රාජකාරි කටයුතු සඳහා නිලධාරින් නොකැඳවිය යුතු බව දන්වා ඇත.

(v) 1995.06.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/95, 2008.02.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008, 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008(i) හා 2015.05.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2015 යන චක්‍රලේඛ මඟින් ඒ පිළිබඳව සියලු ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත.

(vi) ඔව්. නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට සහ කාලීන අවශ්‍යතාව පරිදි යාවත්කාලීන ලෙස ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නැත.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 11 -528/'19- (1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මාස හයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරින් : විදේශ සංචාර

நகரத் திட்டமிடல், நீர் வழங்கல் அமைச்சு மற்றும் தேசிய நீர் வழங்கல்,வடிகாலமைப்புச் சபை உத்தியோகத்தர்கள்: வெளிநாட்டுப் பயணங்கள்

OFFICERS OF MINISTRY OF CITY PLANNING AND WATER SUPPLY AND NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD: OVERSEAS VISITS

560/'19

13.**ගරු හේෂා විතානගේ මහතා (ගරු අ. අරවින්ද් කුමාර් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு அ. அரவிந்த் குமார் சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. A. Aravindh Kumar)
නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරින් වර්ෂ 2010 සිට මේ දක්වා කාලය තුළ රාජකාරි අවශ්‍යතා සඳහා සහ ලෝක බැංකු ආධාර ඇතුළු දේශීය හා විදේශීය ආයෝජන යටතේ වූ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් විදේශගත වූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, තනතුර, සංචාරය කරන ලද රට, සංචාරයේ අරමුණ, සංචාරයේ කාල සීමාව, සංචාරය සඳහා මුළු වියදම, (ගුවන් ටිකට් පත් ගාස්තු, යැපුම් දීමනා හා වෙනත් දීමනා) සහ ඒ සඳහා අරමුදල් සැපයූ දේශීය හෝ විදේශීය ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர்வழங்கல் மற்றும் உயர்கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சிலும் தேசிய நீர் வழங்கல் மற்றும் நீர் வடிகாலமைப்பு சபையிலும் பணியாற்றும் பதவியணி உத்தியோகத்தர்கள் 2010ஆம் ஆண்டு முதல் இற்றைவரை கடமைத் தேவைகளின் பொருட்டும் உலக வங்கி உதவி உள்ளிட்ட உள்நாட்டு மற்றும் வெளிநாட்டு முதலீடுகளின் கீழுள்ள கருத்திட்டங்கள் தொடர்பாகவும் வெளிநாட்டுக்குச் சென்ற சந்தர்ப்பங்கள் எத்தனை என்பதையும்;

(ii) அவ்வாறான ஒவ்வொரு உத்தியோகத்தர்களினதும் பெயர், பதவி, விஜயம் செய்த நாடு, விஜயத்தின் நோக்கம், விஜயத்தின் கால அளவு, விஜயத்திற்கான மொத்த செலவினம் (விமானப் பயணச்சீட்டுக் கட்டணம், வாழ்க்கைச் செலவுப் படி மற்றும் ஏனைய கொடுப்பனவுகள்) மற்றும் அதற்கான நிதியத்தினை வழங்கிய உள்நாட்டு அல்லது வெளிநாட்டு நிறுவனங்கள் தனித் தனியாக யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning, Water Supply and Higher Education:

(a) Will he inform this House-

(i) the number of occasions on which the staff officers of the Ministry of City Planning and Water Supply and the National Water Supply and Drainage Board went overseas for official-purposes and in regard to projects carried out under local and foreign investments including world bank aid during the period from the year 2010 up to now; and

(ii) the name of each officer, position, the country to which the tour was made, objective of the tour, duration of the tour, the total expenditure of the tour (air fares, subsistence and other

allowances) and the local or foreign institutions which provided funds for it, separately?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Deputy Speaker, on behalf of the Hon. Minister of City Planning, Water Supply and Higher Education, I **table*** the answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a)

(i) The following summary detail reports are attached for this.

* Ministry of City Planning, Water Supply and Higher Education (Annex - 1)*

* National Water Supply and Drainage Board (Annex - 2)*

* Water Supply and Sanitation Improvement Project (Annex - 3)*

* China Sri Lanka Collaborative Research Project (Annex - 4)*

(ii)

* Name of the foreign training visits, official visits, designation, the country of visit, purpose of the visit and the expenses are mentioned separately which were carrid out by the officials of the Ministry of City Planning, Water Supply and Higher Education. (Annex - 5)*

* The foreign training visits carried out by the officers of the National Water Supply and Drainage Board from 2010 to January 2019, official visits and visits of testing the pre-shipment items, name of the officer, duration and the country of funding are separately mentioned and the summaries are also attached. (Annex - 6)*

These foreign trainings are provided by institutions such as JICA Institution, ITEC, AFD and foreign states, and they plan required trainings and necessary expenses will be borne. Further, expenses for the testing of pre-shipment of items for the importing goods will be added to the price of the goods by those institutions and produce as the price of the goods and it is only a part of the entire process which is carried out by the relevant contract company for the confirmation of the standard of those goods. i.e. testing of pre-shipments, testing of construction activities using goods and other standards testing after constructions including entire price is included. Hence, it is difficult to produce the expenses for these separately with the available information we possess.

* The summary of the occasions of foreign visits of Water Supply and Sanitation Improvement Project is annexed. (Annex - 7)*

* The summary of the occasions of foreign visits of Sri Lanka Collaborative Research Project is annexed. (Annex - 8)*

(b) Not relevant.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## මිරිදිය ධීවර කර්මාන්තය : වයඹ පළාත
### நன்னீர் மீன்பிடித் துறை: வடமேல் மாகாணம்
### FRESH WATER FISH INDUSTRY: NORTH WESTERN PROVINCE

562/'19

**14.ගරු හේෂා විතානගේ මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. Thushara Indunil Amarasena)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) වයඹ පළාතේ ඇති ජලාශ හා වැව් අතරින් යහ පාලන රජය බලයට පත්වීමෙන් පසුව අද දක්වා මිරිදිය මසුන් මුදා හරින ලද ජලාශ හා වැව් කවරේද;

(ii) එම පළාතට පසුගියදා දැඩි ලෙස බලපෑ නියං තත්ත්වය හා ගංවතුර තත්ත්වය හේතුවෙන් මිරිදිය ධීවර කර්මාන්තය දැඩි පසුබෑමකට ලක් වී ඇති බව දන්නේද;

(iii) වයඹ පළාතේ මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாணத்தில் காணப்படும் நீர்த் தேக்கங்கள் மற்றும் குளங்களில் நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் இன்று வரை நன்னீர் மீன்கள் விடுவிக்கப்பட்ட நீர்த் தேக்கங்களின் மற்றும் குளங்களின் எண்ணிக்கை யாவை என்பதையும்;

(ii) அந்த பிரதேசத்தில் சமீபத்தில் ஏற்பட்ட கடுமையான வறட்சி மற்றும் வெள்ளப்பெருக்கு காரணமாக நன்னீர் மீன்பிடித் துறை கடுமையான பின்னடைவைச் சந்தித்திருப்பதை அறிவாரா என்பதையும்;

(iii) வடமேல் மாகாண நன்னீர் மீன்பிடித் துறையை அபிவிருத்தி செய்வதற்காக அமைச்சு எடுக்கும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House,

(i) the reservoirs and tanks, out of the reservoirs and tanks in the North Western

[ගරු හේෂා විතානගේ මහතා]

Province to which fresh water fish was released after the government of good governance came to power;

(ii) whether he is aware that the fresh water fish industry suffered a severe setback owing to the drought and floods that hit that province recently; and

(iii) the steps the ministry will take to develop the fresh water fish industry in the North Western Province?

(b) If not why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

(අ) (i)

| වැව් වර්ගය | දිස්ත්‍රික්කය | වැව් සංඛ්‍යාව |
|---|---|---|
| 1. මහ වැව් | කුරුණෑගල | 2 |
| 2. මධ්‍යම ප්‍රමාණයේ වැව් | කුරුණෑගල | 9 |
| | පුත්තලම | 5 |
| 3. කුඩා ප්‍රමාණයේ වැව් | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| 4. කාලීන ජලාශ | කුරුණෑගල | 1 |
| | පුත්තලම | 1 |
| 5. වතු ජලාශ | පුත්තලම | 1 |

උක්ත සඳහන් වැව්වල නාම ලේඛන **ඇමුණුම*** මගින් දක්වා ඇත.

(ii) ඔව්.

(iii) නියඟයෙන් පීඩා විඳි කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පහත පරිදි ක්‍රියාමාර්ග ගන්නා ලදී.

1. කාලීන ජලාශවල මසුන් වගාව ව්‍යාප්ත කිරීම.

කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ජලාශ 187ක මසුන් ඇඟිල්ලන් 3,326,500ක් තැන්පත් කර ඇත.

පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජලාශ 104ක මසුන් ඇඟිල්ලන් 1,750,755ක් තැන්පත් කර ඇත.

2. මසුන් ඇල්ලීම සඳහා මිරිදිය යාත්‍රා ලබා දීම.

කුරුණෑගල දිස්ත්‍රික්කයට යාත්‍රා 138ක් ලබා දී ඇත. වටිනාකම ලක්ෂ 103.5කි.

පුත්තලම දිස්ත්‍රික්කයට යාත්‍රා 56ක් ලබා දී ඇත. වටිනාකම ලක්ෂ 42කි.

3. මසුන් ඇල්ලීම සඳහා ධීවර කාර්මිකයන්ට කරමල් දැල් ලබා දීම.

කුරුණෑගල දිස්ත්‍රික්කයට දැල් 300ක් ලබා දී ඇත. වටිනාකම ලක්ෂ 15කි.

පුත්තලම දිස්ත්‍රික්කයට දැල් 675ක් ලබා දී ඇත. වටිනාකම ලක්ෂ 33.75කි.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 15 -581/19'- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, පැහැදිලි කර ගැනීමක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂ කාරණයක් මතක් කරන්න ඕනෑ. මාධ්‍යවේදීන්ට පාවිච්චි කරන්න තිබුණු පාර්ලිමේන්තුවේ කාමර දෙකක් වසා දමා තිබෙනවාය කියා පුවත් පත්වල දිගින් දිගටම සඳහන් වුණා. ඇත්තටම පාර්ලිමේන්තුව තුළ අපේ මාධ්‍යවේදීන් විශාල වැඩ කොටසක් කරනවා. ඔවුන් විශාල කැපවීමක් කරන අයයි. පාර්ලිමේන්තුවේ එම කාමර දෙක ඉබි යතුරු දමලා වසා දමා තිබෙනවාය කියා තමයි දැනුම් දී තිබෙන්නේ. එම නිසා, මේ සම්බන්ධයෙන් සොයා බලා කරුණාකර ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සභානායකතුමා ඒකට පිළිතුරක් දෙයි, ගරු මන්ත්‍රීතුමනි.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකවරයා හැටියට මට කියන්න තිබෙන්නේ, කරන දෙයක් ඒ අයත් එක්ක සාකච්ඡා කරලා කරන්න කියන එකයි - have a discussion with the media personnel. ඔවුන් එක්ක සාකච්ඡා නොකර, එම කාමරවල දොර අගුළු දමා තිබෙනවා නම් ඒක වැරැදියි. ඒ අයත් එක්ක ඒ ගැන සාකච්ඡා කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ පිළිබඳව මම ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මමත් අවුරුදු 30ක් තිස්සේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ කාලයේ ඉඳලාම ඔවුන්ට කාමර ලබා දී තිබුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කථානායකතුමා දැනුවත් කර, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒවා මාධ්‍යවේදීන් අවුරුදු 30ක විතර කාලයක් පාවිච්චි කළ ස්ථානයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.ගරු සභානායකතුමා කියනවා වාගේ, මමත් ඒ කාරණයට එකඟ වනවා. මේක ඒ අය සමඟ සාකච්ඡා කරලා ගන්න තිබුණු තීරණයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක තමයි මම කිව්වේ. ගරු කථානායකතුමා දැනුවත් කර, සාකච්ඡා කරලා මේ පිළිබඳව තීරණයක් දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් ඒ සම්බන්ධයෙන් යමක් කියන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, කියන්න ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා අසුන් ගෙන සිටින මූලාසනයට ඉහළින්; කථානායකතුමාගේ ගැලරියට ඉදිරිපසින් තිබෙන දොරටුව අපි හඳුන්වන්නෙත්, 'පුවත්පත් ගැලරියට එන මාධ්‍යවේදීන්ට ඇතුළු වීමට තිබෙන දොරටුව' ලෙසයි. නමුත්, කලබල කාලයේ ඔවුන්ට ඒ දොරටුව නියම විධියට පාවිච්චි කරන්න දුන්නේ නැහැ. දැනුත් සමහර වෙලාවට ඒ අය එම දොර භාවිත කරද්දී බාධා සිදු වෙනවා. ඒ නිසා කරුණාකර නැවත ඒ ගැන කල්පනා කර බලන්න. තවම එතැන ඒ බෝඩ් එකත් තිබෙනවා. එහි සඳහන් කර තිබෙන්නේ, "මාධ්‍යවේදීන්" කියලා නොවෙයි, "පුවත්පත් ගැලරිය" කියායි. ඒකටත් අවස්ථාව හදා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කලින් කිව්ව විධියට ඒ කාරණය පිළිබඳව සාකච්ඡා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව වැදගත් ප්‍රශ්නයක් අහන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සභානායකතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසාත්, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වාරය ඉක්මනින් අවසන් කළ නිසාත් තමයි මම මේ කාරණය අහන්නේ.

ඔබතුමන්ලාගේ රජය වෙනුවෙන් එදා මංගල සමරවීර ඇමතිතුමා සහයෝගය දෙන විධියට එකඟ වූ ගිවිසුමට අමතරව, අද ජිනීවා මානව හිමිකම් සමුළුවට තවත් ගිවිසුමක්, ආණ්ඩුව යම් සහයෝගයක් සහිතව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවාද? එහෙම නම්, ඒක ඉදිරිපත් කරන්න කලින් එහි අඩංගු කාරණා පිළිබඳව කැබිනට් මණ්ඩලය හෝ ඔබතුමන්ලා සාකච්ඡා කර මේ පාර්ලිමේන්තුව දැනුවත් කර තිබෙනවාද? මම ඒ කාරණය අහන්න හේතුව මේකයි. පසුගිය කාල වකවානුවෙත් ආණ්ඩුව මේ විධියට සහයෝගය දීලා ඇති කළ ක්‍රියාවලි තුළින් අවසානයේ සිද්ධ වුණේ ලංකාව, ජාත්‍යන්තර විනිශ්චයකාරවරු ගෙනැත් පරීක්ෂණ කරන තැනකට පත් වීමයි. එම නිසා, අපේ රටේ නීතිය -අධිකරණ ක්‍රමය- හරියට තිබෙනවාය කියා අපි විශ්වාස කරන වකවානුවක් තුළ, මේ රට වෙනුවෙන් අපි යම් තීන්දුවක් ගන්නවා නම්, ජාත්‍යන්තර විනිශ්චයකාරවරු ගෙන ඒම වැනි තත්ත්වයක් ඇති කරන්න ඔබතුමන්ලා තවදුරටත් බලාපොරොත්තු වනවාද කියා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අහන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා, මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අපේ අධිකරණ පද්ධතිය ගැන ඔබතුමාට විශ්වාසයක් තිබෙනවාද කියා. [බාධා කිරීමක්] ඔබතුමා ඉස්සර වෙලා කියන්න කෝ. [බාධා කිරීමක්] මා අහන්න කැමැතියි, ඔය කතා කරන අයට අධිකරණ පද්ධතිය ගැන විශ්වාසයක් තිබෙනවාද කියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සියයට සියයක විශ්වාසයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔක්තෝබර් මාසයේ 26වන දා ආණ්ඩුව මංකොල්ල කෑවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඊට පසුව අපි අධිකරණයට ගියා. මෙතුමන්ලා අධිකරණයට හොඳටම බැන්නා, අපහාස කළා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට බණිනවා. මෙතුමන්ලාට දැන් අධිකරණය හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද කිව්වේ, අධිකරණය නරකයි කියා? [බාධා කිරීමක්] මේ ආණ්ඩුව කොල්ල කෑවේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මංකොල්ල කෑවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආණ්ඩුව ගිය වැරැදි පාරෙන් හරි පාරට ගන්න වැඩ පිළිවෙළක් අතිගරු ජනාධිපතිතුමා සකස් කළා. මා කියන්න කැමැතියි, ශ්‍රේෂ්ඨාධිකරණය සහ විනිශ්චයකාරවරුන් ගැන අප තුළ විශාල විශ්වාසයක් තිබෙනවා කියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
විශ්වාසයක් තිබෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධිකරණ ක්‍රමය ගැන අපට විශ්වාසයක් තිබෙනවා. මා පෞද්ගලිකව ඔබතුමාට එය කියනවා. හැබැයි, එහෙම විශ්වාසයක් තිබියදී තමයි මේ ආණ්ඩුව -මංගල සමරවීර මැතිතුමා විදේශ කටයුතු අමාත්‍යවරයා විධියට සිටින විට- මේ රටේ අධිකරණයෙන් නඩු අහලා අවසන් කරන්නේ නැතිව විදේශ විනිශ්චයකාරවරුන් ගෙන්වා ලංකාවේ අපේ රණ විරුවන් ජාත්‍යන්තර අධිකරණවලට ගෙන යන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කළේ. මා අහන්න කැමැතියි, එතකොට ඔබතුමන්ලාට අධිකරණය ගැන විශ්වාසයක් තිබුණාද කියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඒ කාලයේ අපත් සමඟයි සිටියේ. එක්සත් ජනතා නිදහස් සන්ධානය ආණ්ඩුව කරපු කාලයේ අධිකරණය ගැන විශ්වාසයක් තැබුවේ නැත්තේ, මෙතුමන්ලා අග්‍ර විනිශ්චයකාරතුමිය පාර්ලිමේන්තුවට ගෙන්වා පැය 24න් ඉවත් කරපු නිසායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඒකට අදත් විරුද්ධයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ වාගේ දේවල් කරපු ඒ අය ජාත්‍යන්තරයට බණිනවා ජාත්‍යන්තරය ඒ අයගේ නඩුකාරයන් එවන්න හදුවා කියා. නමුත්, ඒ තත්ත්වය 2015 වර්ෂයෙන් පසුව වෙනස් වූ බව මා කියන්න ඕනෑ. මේ අයට ඒවා අමතකවෙලා. මම ඊයෙත් මේ ගැන කිව්වා, පෙරේදාත් කිව්වා. ශ්‍රී ලංකාවට විරුද්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ අවුරුදු තුනක් -2012, 2013, 2014- යෝජනා සම්මත වුණා. 2015 මේ අය දින්නා නම් ආර්ථික සම්බාධක - economic sanctions- තමයි අපට එන්නේ. අපේ ආණ්ඩුව ඇවිල්ලා ඒවා ඔක්කොම සමනය කළා. [බාධා කිරීමක්] Let me reply.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමාට උත්තරය කියන්න ඉඩ දෙන්න. ඊට පස්සේ ඔබතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ ආණ්ඩුව ඇවිල්ලා ඒ සියල්ලම සමනය කළා. අද අපි ජාත්‍යන්තරය සමඟ ඉතාම කිට්ටුවෙන් වැඩ කරනවා. අපේ රණවිරුවන් හෝ අනිකුත් අය සම්බන්ධයෙන් තීරණ ගන්න ජාත්‍යන්තර විනිශ්චයකාරවරුන්ට අපි ඉඩ දෙන්නේ නැහැ කියා අපි පැහැදිලිවම කියා තිබෙනවා. මේ අය රණවිරුවන් ගැන කථා කරනවා. සරත් ෆොන්සේකා මැතිතුමා කකුල් දෙකෙන් ඇදගෙන ගිහිල්ලා හිරේ දැම්මේ ඔබතුමන්ලායි. රණවිරුවන් ගැන මොනවාද මේ කථා කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමා, අවසාන කාරණය ඔබතුමා කියන්න. ඊළඟට, ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමාට අවස්ථාව ලබා දෙනවා. එතැනින් මේ කාරණය අවසානයි. ගරු දයාසිරි ජයසේකර මැතිතුමා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ඒ කාරණය පැහැදිලි කර ගැනීමට අවස්ථාවක් ලබා දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පැහැදිලි කරන්න දෙයක් නැහැ. අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කළා. ප්‍රධාන රණවිරුවා හිරේ දැම්මා. තව මොනවාද කථා කරන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමා කියපු කාරණාත් සමඟ මම බොහොම පැහැදිලිව එකඟ වනවා. ගරු සභානායකතුමනි, ඔබතුමාත් මා මේ කියන්න යන කාරණය ගැන දන්නවා. එදා අපේ අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කිරීමට විරුද්ධව පෙළපාළි ගිහිල්ලා, කඳුළු ගෑස් කාපු මිනිහෙක් දයාසිරි ජයසේකර කියන්නේ. ඔබතුමා ඒ ගැන දන්නවා. ඒ වාගේම සරත් ෆොන්සේකා මැතිතුමා හිරේ දමනවාට විරුද්ධව අපි පෙළපාළි ගිහිල්ලා තමයි මගේ වාහන කුඩු කර ගත්තේ. අපි අදත් ඒවාට විරුද්ධයි. ඒකේ කිසි ගැටලුවක් නැහැ. හැබැයි, මම ඇහුවේ එහෙම කාරණයක් නොවෙයි. මම ඇහුවේ මේකයි. එහෙම අධිකරණයක් තිබුණාය කියා අපි හිතමුකෝ. හැබැයි, අපි 2015 ආණ්ඩුවක් හදලා, ඇමෙරිකාවත් සමඟ එකට එකඟවෙලා, ගරු මංගල සමරවීර මැතිතුමා ජිනීවා මානව හිමිකම් කමිටුවට ගිහිල්ලා යෝජනාවක් ඉදිරිපත් කළා. අපේ රණවිරුවන් සම්බන්ධව තිබෙන ප්‍රශ්න ටික මේ රටේ අධිකරණවලින් විසඳා ගන්න තිබෙන වාතාවරණය සකස් කරන වැඩ පිළිවෙළ පැත්තකින් තියලා, ජාත්‍යන්තර විනිශ්චයකාරවරු ලංකාවට ගෙනැල්ලා, ඔවුන්ගෙන් සාක්ෂි විමසලා, ජාත්‍යන්තර අධිකරණවලින් තීන්දු දෙන්න තමයි මේ තීන්දුව ගත්තේ. මම ඇහුවේ වෙන එකක් නොවෙයි. මම ඇහුවේ අපි ආපසු ඒ වැඩ පිළිවෙළට සහයෝගය දීලාද, අද ඉදිරිපත් කරන්න හදන යෝජනාව ඉදිරිපත් කරන්නේ, නැත්නම් ඊට වෙනස් යෝජනාවක්ද, ඒකට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණාද කියන එකයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු සභානායකතුමනි, මට විනාඩියක් දෙන්න. ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේත් අවසාන ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙනවා. එතැනින් පසුව මේ කාරණය ගැන කථා කිරීම අවසන් කරනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු සභානායකතුමනි, ඔබතුමාගේ පිළිතුර තුළ ආණ්ඩුව අද ගන්නා ක්‍රියාවලිය සම්බන්ධයෙන් කිසිම පැහැදිලි කිරීමක් කළේ නැහැ. ඉතාම සාධාරණව අපි අහන ප්‍රශ්නය වන්නේ, අද රජයේ යෝජනාව මොකක්ද කියන එකයි. මොකද, ඇමෙරිකාව මෙම යෝජනාවට සමඅනුග්‍රාහකත්වය දක්වා, අද වනවිට මානව හිමිකම් කවුන්සිලයෙන් ඉවත් වෙලා තිබෙනවා. හැබැයි, යෝජනාව ගෙනා අය මානව හිමිකම් කවුන්සිලයෙන් ඉවත් වෙද්දි, ලංකාව රජයක් හැටියට අපේ රටට විරුද්ධව ගෙනෙන යෝජනාවලිය සම්බන්ධයෙන් පක්ෂපාතීව කටයුතු කරනවා. ඒ නිසා අපි අහන්නේ ඔබතුමන්ලා රජයක් හැටියට අද ආරම්භ වෙන මානව හිමිකම් කවුන්සිලයේදී ගන්නා ක්‍රියාවලිය මොකක්ද, එහි අදහස මොකක්ද කියන එකයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will explain. දයාසිරි ජයසේකර මැතිතුමා අහපු ප්‍රශ්නයට මම පිළිතුරක් දෙන්නම්. මංගල සමරවීර ඇමතිතුමාවත්, අපේ ආණ්ඩුවවත් ජාත්‍යන්තර විනිශ්චයකරුවන් ලංකාවට ගෙනෙන්න එකඟ වෙලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැත්තේ මොකද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එකඟ වෙලා නැහැ. නඩු අහන ක්‍රම ගැන, සාක්ෂිකරුවන් කැඳවන ක්‍රම ගැන - technical assistance - විතරයි එම ගිවිසුමේ තිබෙන්නේ. That is number one. අපි ජාත්‍යන්තරයත් සමඟ සාකච්ඡා කරගෙන යනවා. කලින් ආපු යෝජනා ලංකාවට හිතකර ආකාරයට සංශෝධනය කිරීමට අපි කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. එපමණයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ඊළඟට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### "ගම්පෙරළිය" වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී මතුවන ගැටලු
### "கம்பெறலிய" வேலைத்திட்டத்தை முன்னெடுப்பதிலுள்ள பிரச்சினைகள்
### DIFFICULTIES IN IMPLEMENTATION OF "GAMPERALIYA PROGRAMME"

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி. எனது கேள்வியை நிதி அமைச்சர் கௌரவ மங்கள சமரவீர அவர்களிடம் கேட்கின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

கிராமிய உட்கட்டமைப்பு வசதிகள் உட்பட துரித அபிவிருத்தியின் நிமித்தம் ஆரம்பிக்கப்பட்டுள்ள 'கம்பெறலிய' வேலைத்திட்டமானது நாடு முழுவதிலும் வெற்றிகரமாக நடைமுறைப்படுத்தப்பட்டு வருவதாகக் கூறப்படுகின்றது. அந்தவகையில், இதுவரை காலமும் முன்னெடுக்கப்பட்டு வருகின்ற மற்றும் இனங்காணப்பட்டுள்ள கருத்திட்டங்கள் தொடர்பிலும் ஒதுக்கப்பட்டுள்ள நிதி ஒதுக்கீடுகள் தொடர்பிலும் கூறப்பட்டு வருகின்றன. இந்நிலையில் மாவட்டச் செயலாளர்கள் ஊடாகப் பிரதேசச் செயலாளர் களுக்கு மேற்படி கருத்திட்டங்களுக்கான நிதியை நேரடியாக ஒதுக்கப்போவதாகவும் தற்போது கூறப்படுகின்றது. மேற்படி தொகுதிவாரியாக மேற்கொள்ளப்பட்டு வருகின்ற இவ்வேலைத்திட்டத்தினை நாங்கள் வரவேற்கின்றோம்.

அதேநேரம், கிளிநொச்சி மாவட்டத்தில் 'கம்பெறலிய' திட்டத்தின்கீழ் ஒதுக்கப்பட்ட நிதியினூடாக முன்னெடுக் கப்பட்டு வருகின்ற வீதிப் புனரமைப்புப் பணிகள் ஒப்பந்தத்தில் குறிப்பிடப்பட்டுள்ள நியமங்களுக்கு ஏற்றதாக அமையாது, ஒப்பந்தக்காரர்களால் தரமற்ற வகையில் முன்னெடுக்கப்பட்டு வருவதாகவும், இதனை மேற்பார்வை செய்யவேண்டியவர்கள் அது தொடர்பில் அக்கறை காட்டுவதில்லை எனவும், இதன் பின்னணியில் சில அரசியல்வாதிகளின் அழுத்தங்கள் இருப்பதாகவும், இதன் காரணமாக எவ்விதமான தொழில்நுட்ப மேற்பார்வைகளும் இன்றிய நிலையிலேயே இப்பணிகள் மேற்கொள்ளப்பட்டு வருவதாகவும் பொதுமக்கள் முறையிட்டு வருகின்றனர். இதே நிலை ஏனைய பகுதிகளிலும் நிகழக்கூடும்.

இத்தகைய அரச பொது வேலைத்திட்டங்கள் வகுக்கப் படுகின்றபோது அதன் பெயர்கள் தமிழ் மொழியிலும் குறிப்பிடப்படுகின்றபட்சத்தில் அத்திட்டங்கள் தொடர்பில் எமது மக்களுக்கு உணர்வுரீதியான ஓர் ஈர்ப்பு ஏற்படும். அதேநேரம், தேசிய நல்லிணக்கம் பற்றிக் கதைக்கின்ற நிலையில், மொழி உரிமைகள் பற்றிப் பிரஸ்தாபிக்கப்படுகின்ற நிலையில், இது அத்தியாவசியமானதொரு விடயமாகுமென்றே நான் கருதுகின்றேன்.

அந்தவகையில், மேற்படி திட்டம் தொடர்பில் நிலவுகின்ற சில சந்தேகங்களை நிவர்த்திசெய்துகொள்ளும் வகையில் பின்வரும் கேள்விகளை முன்வைப்பதற்கு விரும்புகின்றேன்.

1. 'கம்பெறலிய' என்னும் சிங்கள சொற்பதத்துடன் அதற்குரிய அர்த்தத்தைத் தரக்கூடிய "கிராமப் பிறழ்வு" அல்லது வேறு உரிய தமிழ் சொற்பதத்தினையும் இணைத்து அந்தத் திட்டத்தைக் குறிப்பிட முடியாதா?

2. இதுவரை காலமும் அனைத்து நாடாளுமன்ற உறுப்பினர்களுக்கும் மேற்படி திட்டத்தின்கீழ் நிதியொதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா? குறிப்பாக, வடக்கு, கிழக்கு மாகாணங்களில் நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ள நாடாளுமன்ற உறுப்பினர்களது பெயர்களையும், அவரவர்க்கு ஒதுக்கப்பட்டுள்ள தொகைகள் குறித்தும் விபரங்களை அறியத்தர முடியுமா?

3. மேற்படி திட்டங்களின் தொழில்நுட்ப மற்றும் ஏனைய கண்காணிப்புப் பணிகளை மேலும் வினைத் திறனுடன் முன்னெடுப்பதற்கு உரியதொரு பொறி முறையை வகுக்க முடியுமா?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தற்பொழுது சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் இங்கு இல்லாத படியினால், மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப்பட வேண்டிய நடவடிக்கைகள் தொடர்பிலான விபரங்களையும் கௌரவ சபை முதல்வர் அவர்கள் வழங்குவார் என நான் எதிர்பார்க்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We will answer the Question tomorrow.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த காலத்தில் நான் முல்லைத்தீவு மாவட்டக் கடற்றொழிலாளர்கள் சம்பந்தப்பட்ட பிரச்சினை தொடர்பில் - வெளிச்ச வீடு சம்பந்தமாக ஒரு கேள்வியை எழுப்பியிருந்தேன். ஆனால், குறித்த விடயம் தனக்குப் பொறுப்பானதல்ல என்று கடற்றொழிலுக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் சொல்லியிருந்தார். இருந்தபோதிலும் நிச்சயமாக அதற்குரிய பதிலை விரைவில் பெற்றுத் தருவதாகத் தாங்கள் எனக்கு உறுதியளித்திருந்தீர்கள். ஆனால், இதுவரை அதற்குரிய பதில் எனக்குக் கிடைக்கவில்லை.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I said I will present it to the relevant Ministry but give me time till tomorrow morning. I will do it.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේ,- [බාධා කිරීමක්]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ වූ ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට මට විනාඩියක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

මහනුවර නගරයේ පසුගිය දා ඇති කර තිබෙන රථ වාහන ධාවනයේ වෙනසක් නිසා මහනුවර නගරය කණපිට හැරී තිබෙනවා. මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමාගේ ඒකමතික තීරණයක් මත තමයි මෙය ක්‍රියාත්මක වෙන්නේ. මේ ඒකමතික තීරණය මත රථවාහන ධාවනය සම්පූර්ණයෙන්ම වෙනස් කර තිබෙනවා. ඒ වාගේම, දළදා වහන්සේ වැඩ සිටින දළදා මාළිගාව ඉදිරිපිට පසුගිය කාලයේ night races දිව්වා වාගේ night bazaar එකක් විවෘත කර නගරයේ තිබෙන ඓතිහාසික තත්ත්වයට බලපෑමක් ඇති කර තිබෙනවා. මේ ගරු සභාවට මම මේ කරුණ ඉදිරිපත් කරනවා. මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර, දිස්ත්‍රික්,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඉක්මනින් අවසන් වූ නිසා මේ සම්බන්ධයෙන් කථා කරන්න මම ඔබතුමාට ඉඩ දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
I will answer briefly, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහනුවර නගරයේ රථ වාහන කළමනාකරණය අයිති නගර සභාවට. ඒක මධ්‍යම ආණ්ඩුවටවත්, පළාත් සභාවටවත් අයිති නැහැ. ඒ කෙසේ වෙතත්, මහනුවර මහ නගර සභාව, පළාත් සභාවත් සමඟ සාකච්ඡා කරලා, දින තුනක අත්හදා බැලීමක් කර තිබෙනවා, one-way අලුත් ක්‍රමයක් ආරම්භ කර. නමුත්, ඒ ක්‍රමය දැන් අසාර්ථක වී තිබෙන බව නගරාධිපතිතුමා මට අද කිව්වා. "නගර සභාවටයි බලය තිබෙන්නේ. වෙන කාටවත් බලය නැහැ. මේ ක්‍රමය වහාම නවත්වලා, පරණ තිබුණු තත්ත්වයට යන්න" කියලා මම නගරාධිපතිතුමා වන කේසර සේනානායක මැතිතුමාට උපදෙස් දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, night bazaar එක ගැන කියනවා නම්, ඇත්තවශයෙන්ම ආණ්ඩුව දැනුවත් නොකර, නගර සභාව දැනුවත් නොකර දළදා වීදියේ සතියකට සැරයක් night bazaar එකක් ආරම්භ කරලා, බයිට් එකට මස් පුච්චනවා. මහනුවර සංස්කෘතිය ගැන නොදන්නා පිරිස් ඊයේ-පෙරේදා මහනුවරට ඇවිල්ලා, වෙන පළාත්වල කළ දේවල් මහනුවර නගරයේ කරන්න හදනවා; අර මරියකඩේ කළ දේවල් කරන්න හදනවා.

මම නගරාධිපතිතුමාට කියා තිබෙනවා, එම bazaar එක පවත්වාගෙන යනවාද නැද්ද කියන එක තීරණය කිරීමේ අයිතිය තිබෙන්නේ නගර සභාවට බවත්, එය වහාම අත්හිටුවන ලෙසත්. මල්වතු අස්ගිරි මහා නා හිමිවරුනුත් එයට පෞද්ගලිකව විරුද්ධත්වය දක්වා තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana and Wayamba Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බුද්ධ ශාසන ඇමති විධියට මේ ගරු සභාවට කියන්නට ඕනෑ, මෙය බෞද්ධයන්ට බොහොම අප කීර්තියක් බව. මේ කාරණය දෙස දේශපාලන ඇසින් බලන්නට බැහැ. මොකද, දළදා පුද බිම පූජනීය වන්දනීය උතුම් ස්ථානයක්. ඉස්සර මෙතැන රේස් ගියා. දළදා මාළිගාව ඉස්සරහ තැනක රේස් ගියා. මේ උතුම් ස්ථානය මේ වාගේ තත්ත්වයකට පත්වන්නට ඉඩ දෙන්නට බැහැ. මටත් මේ සම්බන්ධයෙන් විශාල ලෙස පැමිණිලි ඇවිත් තිබෙනවා. මේ ගැන කටයුතු කිරීම නගර සභාවට පමණක් අයිති කාර්යයක් කියා හිතන්නට බැහැ. අපි රජයක් විධියට මේ ගැන පියවරක් ගන්න ඕනෑ. මේ ස්ථානය පූජනීය ස්ථානයක්, උතුම් ස්ථානයක් විධියට මේ කටයුතුවලට ඉඩ දෙන්නට බැහැ. බෞද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙනවා කියා පාලකයන් හෝ කවුරු හෝ හිතුවක්කාර විධියට මෙවැනි කටයුතු කරනවා නම් ඒවාට ඉඩ දෙන්නට බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. බොහොම ස්තුතියි ඇමතිතුමා.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 - විසර්ජන පනත් කෙටුම්පත, 2019 දෙවැනි වර කියවීම, තෙවැනි වෙන් කළ දිනය - ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2019
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2019
## APPROPRIATION BILL, 2019

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී***
***ඊට අදාළ ප්‍රශ්නය [මාර්තු 05]***
***'පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය'' [ගරු මංගල සමරවීර මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [மார்ச் 05]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு மங்கள சமரவீர]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [05th March]*
*"That the Bill be now read a Second time".- [The Hon. Mangala Samaraweera]*
*Question again proposed.*

[පූ.භා.10.10]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මංගල සමරවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය පිළිබඳව අදහස්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ස්වල්පයක් දැක්වීමට මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මේ අය වැය ලේඛනය ගැන කථා කරනකොට බොහෝ කථිකයින් සඳහන් කළේ, අපි සියලු දෙනාම ණය උගුලකට අහු වෙලා ඉන්නවා; මේ ණය ගෙවා ගන්නට බැරි වීම නිසා ආර්ථික ප්‍රශ්න රාශියක් ජනතාව වෙත පැටවී තිබෙනවා කියන එකයි.

ඇත්තවශයෙන් ණය ගැනීම සෑම ආණ්ඩුවකින්ම කළා; අපේ ආණ්ඩුවෙනුත් කළා; යහපාලන රජයෙනුත් කළා; මේ රජයෙනුත් කරනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ලබා ගන්නා ණය සංවර්ධන වැඩවලට යොදා ගත්තා නම්, මුදල් උත්පාදනය වෙන වැඩවලට යොදා ගත්තා නම් අපට ණය ගෙවීම පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. නමුත් අප විසින් ලබා ගන්නා ණයවලින් බොහෙමයක්ම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යොදා ගැනීමේදී එයින් අප බලාපොරොත්තු වන return එකක් කිසිම ආණ්ඩුවකට ලැබී නැහැ.

ඒ නිසා අඩු වශයෙන් අනාගතයේදීවත් අපි ණය ලබා ගන්නා විට, ඒ ණය ගෙවීම සඳහා ඒ ලබා ගන්නා ණය තුළින් කරන ආයෝජනයන්ගෙන් අපට ආදායමක් එනවාද කියන කාරණය පිළිබඳව සොයා බැලිය යුතුයි. නමුත් මේ අය වැය ලේඛනය දිහා බලනකොට එවැනි දර්ශනයක්, එවැනි පිළිවෙතක්, එවැනි මහපෙන්වීමක් පෙන්වන බවක් මට පෙනෙන්නේ නැහැ. අපි දන්නවා, මේ අය වැය ලේඛනය මැතිවරණයක් ඉලක්ක කර ගනිමින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනයක් බව. ඒකට මම විරුද්ධ වෙන්නේ නැහැ. කොයි රජය හිටියත් මැතිවරණයක් එනකොට තමන්ගේ ඡන්දදායකයන් සැනසීම සඳහා විවිධ උපක්‍රම පාවිච්චි කරනවා. නමුත් ඒ උපක්‍රම තුළින්ම මැතිවරණයක් ජයග්‍රහණය කරන්නත් බැහැ. එහෙම නම්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය තරම් සංවර්ධන වැඩකටයුතු කරපු, බයිසිකල් බෙදූ, රාජ්‍ය සේවකයන්ට වරප්‍රසාද දුන්නු වෙන රජයක් නැහැ. නමුත් එතුමාගේ රජයත් පරාජයට පත් වුණා. ඔය ගම්පෙරළිය වැඩසටහනට මිලියන 300ක් වෙන් කළා වාගේ නොවෙයි, සමහර වෙලාවට එක ග්‍රාම සේවා කොට්ඨාසයකට මිලියන 300 ගාණේ ඒ කාලයේ බැසිල් රාජපක්ෂ මැතිතුමා දුන්නා. ඒ වැඩකටයුතු කළා. නමුත් එහෙම කළා කියලා මැතිවරණ දිනන්න පුළුවන්කමක් වුණේ නැහැ. මොකද, අපි තේරුම් ගන්නට ඕනෑ, ලංකාවේ තියෙන දේශපාලන ප්‍රවණතාවන් අනුව මැතිවරණයකදී ජනතාව හැසිරෙන්නේ ඒ අවස්ථාවේදී රටේ ඇති වන දේශපාලන ප්‍රශ්න මත බව. ඒ අවස්ථාවේදී ජාතික දේශපාලන ප්‍රශ්න මොනවාද, ඒ ජාතික දේශපාලන ප්‍රශ්න පිළිබඳව ජනතාවගේ මතය මොකක්ද කියන එක තමයි මැතිවරණයකින් පිළිබිඹු කරන්නේ. ඒ වාගේම සමස්ත ආර්ථිකයේ ප්‍රගතිය පිළිබඳවත් ජනතාව විශේෂයෙන් බලාගෙන සිටිනවා. ඒ නිසා ඔබතුමන්ලා ලබා දෙන මේ සහන කිසිසේත්ම අපට ප්‍රශ්නයක් නොවෙයි. අපි ඒවා ගැන සතුටු වෙනවා. ජනතාවට යම් සහනයක් ලබා දෙනවා නම්, අබාධිතයන්ට වැඩිපුර ගෙවනවා නම්, සමෘද්ධිලාභීන්ට වැඩිපුර ගෙවනවා නම්, ජනතාවට වැසිකිළි හදා දෙනවා නම් අපි ඒ ගැන සතුටුයි. මම කියන්නම් වැසිකිළි සෑදීම පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රිදීමාලියැද්ද කොට්ඨාසයට මම වැසිකිළි පහසුකම් 30,000ක් දුන්නා. මහවැලි ඇමතිවරයා වශයෙන් සිටියදී මම ඒ ප්‍රදේශයේ හැම ගෙදරකටම වැසිකිළි පහසුකම් ලබා දුන්නා. හැබැයි, ඡන්ද ගණන් කරනකොට මට ඒ පැත්තෙන් ඡන්ද 30,000ක් ලැබුණේ නැහැ. මේක තමයි යථාර්ථය. ඒ නිසා විපක්ෂය ඒ වාගේ කටයුතුවලින් බියට පත් වෙන්නෙත් නැහැ . ඒවා හොඳයි. ඒවා කරන්න. හැබැයි, මේවා කිරීමේදී නියම වේලාවට කරන්න ඕනෑ. මම දැක්කා, පොදු සනීපාරක්ෂක පහසුකම් සැලසීම පිළිබඳව මංගල සමරවීර ඇමතිතුමා එතුමාගේ අය වැය කථාවේ කියලා තිබෙන්නේ අවුරුදු දෙකක් ඇතුළත කරනවා කියලායි. හොඳයි. නමුත් මේ රජයට තව අවුරුදු දෙකක් නැහැ නේ. ඊළඟ රජය එන්න එච්චර කාලයක් නැහැ. කෙසේ වෙතත් ඒවා කරන එක හොඳයි. අපි මේ අය වැයේ ඇති සම්පූර්ණ දේම නරකයි කියන්නේ නැහැ.

සමහර ජනතාවට අවශ්‍ය ප්‍රතිලාභ ලබාදීමට ගත් ක්‍රියාමාර්ගය හොඳයි. නමුත්, සමස්ත ආර්ථිකය ගොඩදැමීමට, මේ තිබෙන ප්‍රශ්නවලින් රට බේරා ගැනීමට, ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනය තුළ නැහැයි කියන එක මම ඉතාමත්ම පැහැදිලිව කියනවා.

විශේෂයෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රය ගත්තොත්, හොඳට වැස්ස ලැබුණු නිසා විශාල වී අස්වැන්නක් මෙවර අපට ලැබෙනවා. නමුත්, මේ වී අස්වැන්න තුළින් අපේ ගොවි ජනතාවට වාසියක් ලැබෙනවාද? එය ලබා දෙන ක්‍රමයක් නැහැ. වී මිල පිළිබඳ ජනතාව පසු වන්නේ මහත් කනස්සල්ලෙන්. මේ අය වැය ලේඛනය ඇත්තවශයෙන්ම ඉලක්ක කරගත යුතු වන්නේ ඒ වැඩිවන අස්වැන්න ප්‍රමාණය තුළින් ජනතාවට සහනයක් සලසා දීමටයි. පිටි පරිභෝජනය අඩු කරන්න ඕනෑ. පිටි පරිභෝජනය අඩු කරන්න හොඳම අවස්ථාව මෙයයි. පිටිවලට වැඩියෙන් tax එකක් ගහලා එහි වාසිය අපේ ගොවි ජනතාවට ලබා දෙන්න ඕනෑ. ඒවා තමයි නිසි ආර්ථික ප්‍රතිපත්ති. ගොවි ජනතාව ශක්තිමත් කරන්න, දේශීය ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ මංගල සමරවීර ඇමතිතුමාගේ මේ අය වැය ලේඛනය තුළ දකින්න පුළුවන් වෙයි කියලා මම හිතුවා. මේ අය වැය ලේඛනයේ එහෙම නැහැ; නිසි ආනයන ප්‍රතිපත්තියක් නැහැ; අපනයන ප්‍රතිපත්තියක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනරාගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාත් මේ ගැන දන්නවා. අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, මම ලංකාවේ ගිය සෑම තැනකම ගොවි ජනතාව ගම්මිරිස් පිළිබඳ මොනතරම් කනස්සල්ලකින් ද පසු වෙන්නේ? අපි ඒ දවස්වල කැබිනට් මණ්ඩලයේදී ගම්මිරිස් පිළිබඳ දවස් ගණන් කථා කළා. නමුත්, ප්‍රතිඅපනයනය කිරීම කියලා කරන ලද මහා වංචාව නිසා මේ රටේ ගම්මිරිස් ගොවියා කබලෙන් ලිපට වැටුණා. අද විශාල මැසිවිල්ලක් තිබෙනවා. මේ ගොවීන්ට සමෘද්ධි සහනාධාරය අවශ්‍ය නැහැ. ඒ අය කියන්නේ අපේ ගම්මිරිස්වලට මිලක් ලබා දෙන්න කියලායි. එළවළු ගොවියා-

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)
ගම්මිරිස් ආනයනය කිරීම නවත්වලා තිබෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ආනයනය කිරීම නැවැත්තුවාට ගම්මිරිස් මිල තවම ඉහළ ගිහිල්ලා නැහැ නේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
නවත්වලා දැනට ටික කාලයයි වෙන්නේ. ගම්මිරිස් ආනයනය දැන් සම්පූර්ණයෙන්ම නවත්වලා තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඒ, අපේ උද්සෝෂණයෙන්. නමුත් මම කියන්නේ, ඒ නිසි ප්‍රතිපත්ති නිසි වෙලාවට ක්‍රියාත්මක කළේ නැහැ කියන එකයි. ඒක තමයි අපට තිබුණු ප්‍රශ්නය. [බාධා කිරීමක්] අපි කැබිනට් මණ්ඩලයේදී කොච්චර මේ ගැන කථා කළාද? නමුත් ඒක සිදු වුණේ නැහැ. ඒ නිසා නේ අපි එළියට ආවේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්මිරිස්, එක අංශයක් පමණයි.

දැන් බලන්න, එළවලු ගොවියාට එළවලු සඳහා හොඳ මිලක් ලැබෙනවාද? එළවලු ගොවියා අද ඉන්නේ ඉතාම කනස්සල්ලෙන්. මේ රටේ කෘෂි ආර්ථිකය නඟා සිටුවීම සඳහා සුවිශේෂී වූ වැඩ පිළිවෙළක් අපි බලාපොරොත්තු වුණා, මේ අය වැය ලේඛනයෙන්. නමුත්, මේ අය වැය ලේඛනය තුළ කෘෂිකර්මාන්තය ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළක් නැහැ.

ඊළඟ කාරණය දියර කිරි පිළිබඳ ප්‍රශ්නය. අද අපි කිරි පිටි ආනයනය කිරීම සඳහා රුපියල් බිලියන 50ක් වියදම් කරනවා. කිරි පිටි කියන්නේ මොනවාද? කිරි පිටි පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කළ පෝස්ටරයක් මා ළඟ තිබෙනවා. ඒකේ තිබෙනවා, "ප්‍රවේසම් වන්න. ඔබේ දරුවාට කිරි පිටි දීම ඇදුම, ආසාත්මිකතාව, කනේ ආසාධන, අධි රුධිර පීඩනය වැනි අනිටු විපාක සඳහා ඇති අවදානම වැඩි කරයි" කියලා. අද මේ රටට ගෙන්වනු ලබන කිරි පිටිවල තිබෙන්නේ කිරි නොවෙයි. ඒවායින් කිරි අරගෙන, මේදය සහ අනෙකුත් දේවල් දාලා හදන පිටි වර්ගයක් තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම දියර කිරි පිළිබඳව මේ රටේ- [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මව් කිරි දෙන්න පුළුවන්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඔව්. මව් කිරි ප්‍රවර්ධනය කරනවා නම් වඩාත් හොඳයි. එහෙම නැත්නම් දියර කිරි. දියර කිරි ප්‍රවර්ධනය කිරීම සඳහා දියර කිරි සඳහා විශේෂ මිලක් දිය යුතුව තිබුණා; incentive එකක් දිය යුතුව තිබුණා. ඒවා තමයි බජට් එකකින් කරන්න ඕනෑ. එතකොට තමයි ජාතික ආර්ථිකය දියුණු වෙන්නේ. එතකොට තමයි අපේ ආනයන හා අපනයන අතර තිබෙන පරතරය අඩු කර ගන්නට පුළුවන් වෙන්නේ. අපි ආනයන බිල අඩු කර ගන්න ඕනෑ. අපනයන බිල වැඩි කර ගන්න ඕනෑ. නමුත්, ආනයන බිල අඩු කර ගැනීම සඳහා අපට නිෂ්පාදනය කළ හැකි කෘෂි ද්‍රව්‍ය පිළිබඳ, කෘෂි භෝග පිළිබඳ ඇගයීමක් මේ අය වැය ලේඛනය තුළින් අපට පෙනෙන්නේ නැහැ. එහෙම තිබුණා නම් අපට ඒ පරතරය - gap - අඩු කර ගන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේ අය වැය ලේඛනය හුදෙක් මැතිවරණයක් ඉලක්ක කර ගනිමින්, සහනාධාර ටිකක් බෙදා දීම සඳහා ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනයක් මිස, ජාතික ආර්ථිකය ශක්තිමත් කරමින්, අපට මුහුණ පෑමට තිබෙන දැවැන්ත ආර්ථික අභියෝගවලට මුහුණ දීම සඳහා සකස් කරන ලද අය වැය ලේඛනයක් නොවෙයි.

ණය බර වාගේම, මහ බැංකු බැඳුම්කර සිද්ධිය තුළින් විශාල හානියක් මේ රටේ ජාතික ආර්ථිකයට වුණා. මම තමයි ඒ අවස්ථාවේදී විපක්ෂ නායකයා හැටියට අපේ මන්ත්‍රීවරුන් එක්ක ගිහිල්ලා මහ බැංකුව වට කරලා පළමුවැනි උද්සෝෂණය කළේ. අද ජනාධිපතිතුමා ඒ වංචාව හොයන්න කොමිසමක් දාලා තිබෙනවා. ඒ මුදල් නැවත අපේ ආර්ථිකයට ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරලා ඒ සිද්ධියට අදාළ අයට දඬුවම් දීම අනිවාර්යයෙන්ම කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කාර්මික ප්‍රතිපත්තිය මොකක්ද? අපේ රටේ මන්නාරම් ද්‍රෝණියේ තෙල් නිධි තිබෙනවා කියලා අවුරුදු ගණනාවක් තිස්සේ ගවේෂණ කළා; පරීක්ෂණ කළා. නමුත් මේ පිළිබඳ තිරසාර තත්ත්වයක් තවම ලබාගෙන නැහැ. රජය oil exploration පිළිබඳ උනන්දු වෙන්න ඕනෑ. අපේ තෙල් මිල යම් ප්‍රමාණයකින් අඩු කර ගැනීමට, අපේ රටේ තෙල් තිබෙනවාද නැද්ද කියලාවත් බලන්න අපේ උනන්දුවක් නැහැ. අපේ උනන්දුව තිබෙන්නේ වෙන වෙන දේවල් ගැනයි. අපේ ආනයන අඩු කර ගැනීම සඳහා මෙවැනි ස්වාභාවික ඉන්ධන ලබා ගැනීමේ ක්‍රියාවලිය අපි ඉක්මන් කරන්නට ඕනෑ.

දෙවැනි කරුණත් ඒ වාගේමයි. අපේ පොස්පේට් නිධියක් තිබෙනවා. මේ පොස්පේට් නිධියෙන් අපි ප්‍රයෝජන ගන්නවාද? අපි පොහොර මිලදී ගැනීම සඳහා වසරකට බිලියන 35ක් පිටරට යවනවා. ඇයි අපි අපේ පොස්පේට් නිධියෙන් ප්‍රයෝජන ලබාගෙන මේ තිබෙන gap එක නැති කර ගන්නේ නැත්තේ? එතකොට අපට මේ ණය ගෙවලා, ඒවායින් නිදහස් වෙලා මේ ආර්ථිකය වඩා හොඳ පැත්තකට හරවන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ඉල්මනයිට් නිධි කොපමණ තිබෙනවාද? පුල්මුඩේ පැත්තේ මුහුදේ හැම තැනම ඉල්මනයිට් තිබෙනවා. අපි ඉල්මනයිට්වලින් ප්‍රයෝජනයක් ගන්නවාද? මොනවාද කර්මාන්ත ඇමතිතුමා කරන්නේ? කර්මාන්ත ඇමතිතුමා මොනවාද කරලා තිබෙන්නේ ඉල්මනයිට් පිළිබඳව? කාලයක් තිස්සේ එතුමා කර්මාන්ත ඇමති වශයෙන් හිටියා. මේ ඉල්මනයිට්වලට අගය එකතු කරලා විශාල මුදල් ප්‍රමාණයක් සොයන්න පුළුවන්. ඒවා ගැන කිසිම සෙවිල්ලක්, බැලිල්ලක් නැහැ. මුදල් අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන සභා, මේ අමාත්‍යාංශ ඒවා ගැන හිත යොමු කරන්නේ නැහැ. තෙල් ගවේෂණය, පොස්පේට් නිධිය, ඉල්මනයිට් නිධි ගැන අවධානයක් යොමු කරන්නේ නැහැ. දැන් බලන්න, ඉල්මනයිට් පිළිබඳව Lanka Mineral Sands Limited ආයතනය අපි හදලා තිබෙන්නේ 1957දී. 1957 සිට අවුරුදු ගණනාවක් මොනවාද අපි කළේ? මෙවා තමයි අපට වැරදුණු තැන්. අපේ ආදායම් මාර්ග වැඩිකර ගැනීමට පලතුරු වවලා පිටරට යවන්න කියනවා. අපේ ගම් පැත්තේ වවන්න අලිගැටපේර හොඳයි කියලා, අලිගැටපේර වැව්වා. අලිගැටපේර හැදුනාම ඒවා එකක්වත් තියන්නේ නැහැ, වඳුරෝ ඇවිල්ලා ඒ ඔක්කෝම කාලා විනාශ කරනවා. අද මොනරු ඇවිල්ලා වී වගාව සම්පූර්ණයෙන් විනාශ කරනවා. අල ටිකක් වවන්න බැහැ, ඌරෝ ඇවිල්ලා අල ටික කාලා යනවා. අපේ අස්වැන්න විනාශ කරන මේ ක්‍රියාවලිය පිළිබඳව අපේ ජාතික වැඩ පිළිවෙළ මොකක්ද ? අපේ අස්වැන්නෙන් සියයට 40ක් විතර මේ විධියට විනාශ කරනවා. අද ගොවියෝ ගෙවත්තක කිසිම දෙයක් වවා ගන්නේ නැහැ. අද ගොවියෙක් තමන්ගේ ගෙවත්තේ පලතුරක්, එළවලුවක් වවා ගන්නේ නැහැ. සතුන්ට කන්න බැරි ඒවා විතරයි ඒ අයට වවන්න වෙලා තිබෙන්නේ. මේක විශාල ජාතික ප්‍රශ්නයක්; ජාතික ව්‍යසනයක්. ඔබතුමන්ලා export කරන්න මේවා හදන්න, මේවා හදන්න කියලා දැන් ණය දෙනවා. ණය අරගෙන වගා කරපු එක්කෙනාගේ වගාව වඳුරෝ ඇවිල්ල කෑවාම, ඌරෝ ඇවිල්ලා කෑවාම, මොනරු ඇවිල්ලා කෑවාම ඒ පුද්ගලයාට ගත්ත ණය ගෙවා ගන්නත් බැරි වෙනවා. මේක තමයි

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

යථාර්ථය. අපි බිම් මට්ටමේ දකින යථාර්ථය මේකයි. ඒ නිසා උඩ මට්ටම්වල ඉන්නේ නැතිව බිම් මට්ටමට බැහැලා, මේ රටේ ගොවි ජනතාවගේ හා ග්‍රාමීය ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව වඩාත් ගැඹුරින් කල්පනා කරලා, ඒවාට අවශ්‍ය ජාතික වැඩසටහන් සැදීමත්, ඒ සඳහා මුදල් වෙන් කිරීමත් තමයි අය වැයකින් කරන්න ඕනෑ. එවැනි ක්‍රියාවලියක් කිසිසේත්ම සිදු වුණා කියලා අපට පෙනෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඒ වාගේම, දැන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මේ රටේ විශාල ප්‍රශ්නයක්. අරුවක්කාරු කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. මම ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විධියට හිටපු කාලයේ අපේ ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමාට ඒ සඳහා දුම්රිය ලබාදීමෙන් සහ වෙනත් උපකාර කිරීමෙන් විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ ගැන අපි සතුටු වෙනවා. නමුත්, ඒක විතරක් කරලා මදි. දැන් අපේ බදුල්ල නගරය ගත්තොත්, කසළ බැහැර කිරීම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්න බණ්ඩාරවෙල නගරයේත් කසළ බැහැර කිරීම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ පිළිබඳව ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මේවා තමයි රටේ තිබෙන ප්‍රමුඛතා. මේ ප්‍රමුඛතා සඳහා තමයි මුදල් වෙන් කරන්න ඕනෑ. නමුත් රටේ තෝරා ගත් නගරවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිසි වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනය තුළින් ප්‍රදර්ශනය වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මුදල් ඇමතිවරයාගේ දක්ෂකම පෙන්වන්නේ පැරැණි ගතානුගතික ක්‍රමයට මිනිසුන්ට මොනවා හරි ද්‍රව්‍ය ටිකක් බෙදා දීලා නොවෙයි. ඊට වඩා ජාතික ආර්ථිකය හා ජාතික අවශ්‍යතා පිළිබඳව ගැඹුරින් තේරුම් අරගෙන, ඒ ප්‍රශ්න විසඳෙන ක්‍රියා මාර්ගයක් සඳහා ප්‍රමුඛතාව ලබාදීම තමයි අපි අය වැය ලේඛනයකින් බලාපොරොත්තු වන්නේ.

ඒක නිසා මෙන්න මේ කියන කාරණා ඉටු වෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම විශ්‍රාම වැටුප් විෂමතාවන් නැති කිරීම පිළිබඳවත් අපි සතුටු වෙනවා. නමුත් මම හිටපු ඇමතිවරයෙක් වශයෙන් දන්නවා, අපට හුඟක් strikesවලට මුහුණ දෙන්න සිදු වෙන්නේ මේ වැටුප් විෂමතාවන් සඳහා වූ ප්‍රශ්න නිසා කියලා. ජනාධිපතිතුමා විසින් පත් කරන ලද එම කමිටුව මඟින් නිර්දේශ ලබා ගෙන, රාජ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන මේ වැටුප් විෂමතාවන් ඉවත් කළොත්, අපට ඉක්මනින්ම ඒ කටයුත්ත කරන්න පුළුවන්. අනෙක් කාරණය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද රාජ්‍ය තන්ත්‍රය හිර වෙලා තිබෙන්නේ, ලේකම්තුමාගේ පටන් පියන් දක්වා කිසි කෙනෙක් වැඩ කරන්නේ නැහැ; තීරණ ගන්න බයයි. FCID එකට, Bribery Commission එකට ගහන නිර්නාමික පෙත්සම්වලට උත්තර දෙනවා ඇරෙන්නට වෙන වෙලාවක් නැහැ. මගේ ලේකම්වරයා වැඩි කාලයක් ගත කළේ, එම ආයතනවලට යවපු විවිධ නිර්නාමික පෙත්සම්වලට උත්තර දීමටයි. ඒවාට උත්තර දීමට කාලය ගත කළා මිසක් අමාත්‍යාංශයේ වැඩ කරන්න වෙලාවක් තිබුණේ නැහැ. මෙන්න මේ විධියට අපේ රාජ්‍ය සේවය අකර්මණ්‍ය වුණා. ඒ තත්ත්වයෙන් රාජ්‍ය සේවකයා මුදවා ගත්තේ නැත්නම් ඔය කියන කිසිම වැඩ පිළිවෙළක් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අපට අවස්ථාවක් ලැබෙන්නේ නැති බවත් ප්‍රකාශ කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු පී. හැරිසන් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා.10.28]

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම 2019 වසර සඳහා මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කරපු අය වැයේදී සමබරතාවක් ඇති කිරීම සඳහාත්, සංවර්ධනය වෙනුවෙනුත් අවස්ථා ගණනාවකදී එතුමා ගත් ක්‍රියාමාර්ග ගැන විස්තර වාර්තා කරලා තිබෙනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ කථාවේ දී එතුමා කියපු දේවල් මම අහගෙන හිටියා. එතුමාගේ මොළේ පෑදිලා තිබෙන්නේ විපක්ෂයට ගිය අවස්ථාවේ දීද කියලා මට සැකයක් හිතුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා අවුරුදු 30ක් පාර්ලිමේන්තුව නියෝජනය කරන කොට, අවුරුදු 25ක්ම ආණ්ඩුවේ හිටියේ. ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරයෙක්. ඒ කාලයේත් ඔය යෝජනා ක්‍රියාත්මක කරන්න තිබුණා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මගේ ක්ෂේත්‍රයන්වලට අදාළ තීරණයන් මම ක්‍රියාත්මක කළා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
එතුමා කැබිනට් මණ්ඩලයේ හිටපු ප්‍රධානියෙක්. අපි එතුමාට ගරු කරනවා, ජ්‍යෙෂ්ඨයෙක් හැටියට. මම එතුමාගේ ප්‍රශ්නයකට, දෙකකට උත්තර දුන්නේ නැත්නම් ඒක එච්චර හොඳ නැහැ. අපේ කිරි ගොවියා ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015න් පස්සේ අපි කිරි ගොවියාගේ කිරි ලීටරයක මිල තුන් වතාවක් වැඩි කළා. රුපියල් 40ට තිබුණු කිරි ලීටරය රුපියල් 70 දක්වා වැඩි කළා. රටේ දේශීය කිරි නිෂ්පාදනය වැඩි කරන්න විවිධ රටවලින් සතුන් ගෙනැවිත්, කිරි නිෂ්පාදනය වැඩි කරලා, කිරි කර්මාන්තය දියුණු කරන්න කටයුතු කළ අවස්ථා තිබෙනවා. මේ කාරණය කියපු ගමන් කියයි, පිට රටින් ගෙනාපු සතුන්ගේ කිරිවල ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. ඒක ඇත්ත. එහෙම ප්‍රශ්නයකුත් තිබෙනවා. හැබැයි, සමස්තයක් හැටියට ගත්තාම කිරි ගොවියා ආරක්ෂා කළා විතරක් නොවෙයි, ඒ අයගේ කිරිවලට මිලක් ලබා දුන්නා. ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුදු හතර ඇතුළත තුන් වතාවක් කිරි මිල වැඩි කළ බව ඔබතුමාත් දන්නවා ඇති. ඒ නිසා දැන් කිරි ලීටරයක මිල රුපියල් 70ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. සමහර

මහා පරිමාණයේ ව්‍යාපාරිකයන් නිෂ්පාදනය කරන කිරි ලීටරයකට රුපියල් 80ක්, රුපියල් 85ක් පමණ ලැබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ NLDB එක යටතේ තිබෙන ගොවිපොළවල කිරි ලීටරය රුපියල් 85ටත් විකුණන්න අපට පුළුවන්වෙලා තිබෙනවා. Tetra Pak ක්‍රමයට කිරි pack කරන නිසා ඒ කිරිවලට ඉහළ මිලක් තිබෙනවා. එවැනි අවස්ථාත් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ගරු නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමා මවු කිරි ගැන කථා කළා. මා ඒ ගැන වැඩිපුර විස්තර කරන්න යන්නේ නැහැ. මොකද, හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයකු හැටියට එතුමා මවු කිරිවල පෝෂණය ගැන මට වඩා හොඳින් දන්නවා. මේ වතාවේ මුදල් ඇමතිතුමා දරුවන්ගේ පෝෂණය සඳහා ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳු දරුවන්ට කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහනක් පටන්ගෙන තිබෙනවා. ඒ සඳහා මුදලක් වෙන්කර තිබෙනවා. ඒ තුළින් අපට පුළුවන් වෙයි, තවත් කිරි නිෂ්පාදනය -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
කැඳවල ඊට වඩා පෝෂණයක් තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අපි කැඳත් දෙන්න ලෑස්ති කරලා තිබෙනවා. කැඳත් දෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
අපි කියන්නේ කැඳ දෙන්න කියලායි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
කැඳත් දෙනවා, කිරිත් දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ කාලයේ කැඳ තිබුණේත් නැහැ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
දැන් කිරිත් දෙනවා.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පොස්පේට් නිධිය ගැන කථා කළා. පොස්පේට් නිධිය තිබෙන්නේ මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේයි. අවස්ථා ගණනාවකදී හිටපු ඇමතිවරු ගණනාවක් මේ සම්බන්ධයෙන් විවිධ පර්යේෂණ කළ බව මා දන්නවා. හැබැයි ඒක පටන් ගන්නකොට කොහෙන් හෝ බාධාවක් එනවා. මා එතුමාත් එක්ක එකඟ වෙනවා. ඇත්තටම පොහොර ආනයනය කරන්න අවුරුදු පතා රුපියල් බිලියන 38ක් විතර විදේශීය සමාගම්වලට දෙන්න වෙනවා. හැබැයි දේශීය වශයෙන් පොහොර නිෂ්පාදනය කරන්න මුදලක් වෙන්කර ගෙන අපි දෙගොල්ලන්ම එකතුවෙලා මේ ක්‍රමය පටන් ගන්න යම් වැඩ පිළිවෙළක් සකස් කළොත්, විදේශීය සමාගම්වලට ගෙවන මුදල් ප්‍රමාණය ඉතිරි කරගන්න අපට පුළුවන් වෙනවා. මොකද, හැමදාම සිදු වුණේ පවතින රජය ඒ සඳහා යෝජනා ගෙනෙනකොට, විරුද්ධ පක්ෂය එයට විරුද්ධ වීමයි. මේ කඹ ඇදිල්ල නිසා රටක් හැටියට අපට ආපස්සට යන්න සිද්ධ වුණා. එම කාරණයට මා එතුමාත් එක්ක එකඟ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ඉතිහාසයේ වැඩිම වී අස්වැන්න මෙවර වාර්තා වෙනවා. දළ වශයෙන් මෙට්‍රික් ටොන් මිලියන 3ක විතර අස්වැන්නක් අපි බලාපොරොත්තු වෙනවා. මේ අස්වැන්න නිකම්ම ආවේ නැහැ. එතුමා දැන් කිව්වා වර්ෂාව හොඳට තිබුණු නිසා අස්වැන්න වැඩි වුණා කියලා. වර්ෂාව හොඳට තිබුණු පළියටම අස්වැන්න වැඩි වෙන්නේ නැහැ. ඒ අස්වැන්න රැක ගන්නට කෘෂි කර්මාන්තය වෙනුවෙන් අපි විශාල මුදලක් වියදම් කරලා තිබෙනවා. මම ඔබතුමාට මතක් කරන්නම්. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් 2014දී සුළු වාරිමාර්ග සහ වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 1,284ක් දුන්නා. ඒ, ගොවියා ආරක්ෂා කරගෙන කෘෂි කර්මාන්තය දියුණු කරන්න. අපි 2015 වෙනකොට එය රුපියල් මිලියන 2,107ක් දක්වා වැඩි කරලා තිබෙනවා. 2017දී එය රුපියල් මිලියන 3,124ක් දක්වා වැඩි කර ලබා දීලා තිබෙනවා, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට. ග්‍රාමීය මට්ටමේ තිබෙන ඇළ වේලි සකස් කර ගන්නට, වැව් සකස් කර ගන්නට වාගේ වැඩවලට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2018 වර්ෂයේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට විතරක් අපි රුපියල් මිලියන 2,456ක් වියදම් කරලා තිබෙනවා.

ඒ තුළින් වර්ෂා ජලය එක් රැස් කර ගැනීමට, ඇළ වේලි නඩත්තු කිරීම සහ මේ ජලයෙන් උපරිම සාධාරණත්වයක් ලබා ගැනීමට අපට පුළුවන්කම ලැබුණා. ජලය අපතේ නොයවා ඒවා හරියාකාරව පරිහරණය කරන්නට අවස්ථාව ලබා දීලා තිබෙනවා. මේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට විතරක් ලබා දීපු මුදල්. ඒ වාගේම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 30,000කට වැඩිය දීලා තිබෙනවා, මේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරන්නට සහ කෘෂිකර්මාන්තයේ නවීන ක්‍රම අත්හදා බලලා, ඒ තුළින් ප්‍රතිඵල ලබා ගන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේගේ ප්‍රදේශයත් ඇතුළුව මේ අවුරුදු තුන ඇතුළත වාරිමාර්ග දෙපාර්තමේන්තුව කොපමණ වැඩ කොටසක් කරලා තිබෙනවාද කියලා මම ඔබතුමාට මතක් කර දෙන්නම්. වෙල්ලස්ස නවෝදය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව අලුතෙන් වැව් 60ක් අලුත්වැඩියා කරලා තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංවර්ධනයට රුපියල් මිලියන 4,000ක් දීලා තිබෙනවා. ඔබතුමාගේ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 2,500යි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළ වේලි පද්ධති නඩත්තුව සහ සංවර්ධනයට රුපියල් මිලියන 4,000යි. ඒ වාගේම මාතලේ ගොඩිගමුව ප්‍රදේශයට රුපියල් මිලියන 250ක් සහ මුන්දෙනිආරු යෝජනා ක්‍රමය ආරම්භ කිරීම සඳහා කුඹුක්කන්ඔයට රුපියල් මිලියන 152ක් වෙන් කරලා තිබෙනවා, ඒ වැව් තුනක් අලුත්වැඩියා කිරීම සඳහා. ඒ වාගේම කන්තලේ ප්‍රදේශයේ කින්නියාවල වැව් අලුත්වැඩියාව සඳහා රුපියල් මිලියන 33ක් ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මහවිලච්චිය වැව අලුත්වැඩියාවට සහ ඇළ වේලි අලුත්වැඩියාවටරුපියල් මිලියන 254ක් දීලා තිබෙනවා. ඒ වාගේම මහකනදරාවට රුපියල් මිලියන 113ක්, පදවියට රුපියල් මිලියන 160ක්, අංගමුවට රුපියල් මිලියන 212ක් සහ රාජාංගණයේ අදියර දෙකක් සඳහා රුපියල් මිලියන 530ක් වෙන් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, නැඟෙනහිර පළාතේ උන්නිච්චෙයි වැව සඳහා රුපියල් මිලියන 75ක්, නවසිරි වැව සඳහා මිලියන 111ක්, තුපූර් වැව සඳහා මිලියන 56ක්, ත්‍රිකුණාමලය වැව සඳහා මිලියන 82ක්, ජනරංජන වැව සඳහා මිලියන 124ක්, පුත්තලම දිස්ත්‍රික්කයේ කච්චිමඩු වැව සඳහා මිලියන 104ක්, කොට්ටුකච්චිය වැව සඳහා මිලියන 75ක්, හම්බන්තොට බඳගිරිය වැව සඳහා මිලියන 95ක්, මොනරාගල මුතුකණ්ඩිය වැව සඳහා මිලියන 24ක් සහ බදුලු ඔය සඳහා මිලියන 66ක් වෙන් කර තිබෙනවා.

[ගරු පී. හැරිසන් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආකාරයට එම වැව්වල සංවර්ධන කටයුතු වෙනුවෙන් අපි රුපියල් මිලියන 2,300ක් වෙන් කර තිබෙනවා.

කෘෂිකර්මයේ අද තිබෙන මේ මහා පරිමාණයේ වී අස්වැන්න ලැබෙන්න, විශේෂයෙන්ම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පසුගිය අවුරුදු තුන තුළදී රාජ්‍ය අය වැයෙන් මිලියන දහස් ගණනක් වෙන් කර තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි, මෙවර අපට විශාල අස්වැන්නක් ලැබී තිබෙන්නේ. වැස්ස ලැබීම නිසාම නොවෙයි එහෙම වෙලා තිබෙන්නේ. මීට කලිනුත් වැඩි වර්ෂාවක් ලැබී තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, ඒ වර්ෂා ජලය රඳවා ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා, අපේ ප්‍රදේශවල මෙවර ගංවතුර තත්ත්වයක් ඇති වුණත්, වැව් කැඩිලා ගියේ නැති බව. ඒ වැව්වලට සහ කෘෂි කර්මාන්තයට දෙන්න ඕනෑ ඉහළම තත්ත්වය අපි ලබා දීලා තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒක විතරක් සාධාරණයි කියා. නමුත්, ඒකේ ප්‍රතිඵලය අද අපට භුක්ති විඳින්න ලැබී තිබෙනවා. අද හොඳ වී අස්වැන්නක් ලැබී තිබෙනවා.

වී කිලෝවක් සඳහා ගොවීන්ට දැන් ලැබෙන මිල සාධාරණ නැහැය කියන කාරණය මම පිළිගන්නවා. ඒ මිල වැඩි වෙන්න ඕනෑ. හැබැයි, වී මිල වැඩි කිරීම කොයි විධියටද කරන්න ඕනෑ කියන එක පිළිබඳව හැම දාම අපට ප්‍රශ්නයක් තිබුණා. වී මිල වැඩි වෙනවා වාගේම, සහල් මිලෙන් පාරිභෝගික ජනතාවටත් සාධාරණයක් වෙන්න ඕනෑ. එහෙම නම් අපි ඒ සඳහා ක්‍රමවේදයක් හදන්න ඕනෑ. අපි හැම දාම මේ ක්‍රමවේදය ගැන කථා කළා; සාකච්ඡා කළා. අපි දන්නවා, නාඩු වී කිලෝව ගොවියාගෙන් රුපියල් 38ට ගත්තත්, සම්බා වී කිලෝව රුපියල් 41ට ගත්තත්, පාරිභෝගිකයාට යනකොට නාඩු සහල් මිල රුපියල් 100ට වඩා වැඩි වන බව; සම්බා සහල් කිලෝ එක රුපියල් 100ට වඩා වැඩි වන බව. හැබැයි, ඒ වැඩි වීමේ වාසිය පාරිභෝගිකයාට ලැබෙන්නෙත් නැහැ, ඒවා නිෂ්පාදනය කරන ගොවියාට ලැබෙන්නෙත් නැහැ. එම නිසා තමයි, වෙළෙඳ ව්‍යාපාරිකයන් සහ වී මෝල් හිමියන් සමඟ සාකච්ඡා කරලා, නාඩු වී කිලෝග්‍රෑම් එක රුපියල් 38ට ගන්නකොට නාඩු සහල් කිලෝග්‍රෑම් එකක වෙළෙඳ පොළේ උපරිම සිල්ලර මිල රුපියල් 80ක් කරලා සමබරතාවක් ඇති කළේ. ඒ වාගේම තමයි, සම්බා වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 41ට ගන්නකොට වෙළෙඳ පොළේ සම්බා සහල් කිලෝග්‍රෑම් එකක උපරිම සිල්ලර මිල රුපියල් 85ක් ලෙස නියම කර තිබෙනවා. අප්‍රේල් මාසයේ 1වන දා සිට ක්‍රියාත්මක වන පරිදි අපි ඒක ගැසට් කරනවා.

හැබැයි, මේ කන්නයට මේ ක්‍රමය පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. යල කන්නයේදී අනිවාර්යයෙන්ම වී මිලේ වැඩිවීමක් සිදුවෙයි කියා මම හිතනවා. රජය හැටියට අපි ඒ පිළිබඳව සාකච්ඡා කරලා සාධාරණ මිලක් නියම කරන්න ඕනෑ. වී කිලෝවක මිල රුපියල් 40ක් වුණොත්, ඒ හා සමානව හාල් මිලේත් සියයට 2.2ක වැඩිවීමක් වෙනවා. අපි වාර්ෂිකව මේ ක්‍රමය අනුගමනය කළොත්, ගොවියා ගොවිතැනෙන් ඈත්වන එක අඩු වෙයි කියා මා හිතනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි අපි මේ ක්‍රමය විතරක් අනුගමනය කරලා හරියන්නේ නැහැ. අද ලෝකයේ අනික් රටවල් සමඟ අපේ රට සංසන්දනය කරනකොට පෙනෙනවා, ඒ රටවල් අලුත් වී ප්‍රභේද මඟින් වැඩි අස්වැන්නක් ලබා ගන්නා බව. අපට තිබෙන ඉඩම් ප්‍රමාණය සීමාසහිතයි. සාමාන්‍යයෙන් ජපානය වාගේ රටක් වී බුසලකින්, බුසල් 400ක පමණ අස්වැන්නක් ගන්නවා. අපි තවම ඒ තාක්ෂණයට ගිහින් නැහැ. එහෙම කරන්න නම්, අපේ කෘෂිකර්මාන්තයට අලුත් වී ප්‍රභේද හඳුන්වා දිය යුතු වනවා. නවීන තාක්ෂණ ක්‍රමත් එක්ක ගිහින්, මීට වඩා වැඩි අස්වැන්නක් අපේ ගොවියා ලබා ගත්තොත්, ඒකේ සාධාරණත්වයක් අපට ගන්න පුළුවන් වෙයි කියන එකයි මගේ පෞද්ගලික විශ්වාසය. අපේ පර්යේෂණාගාර, අපේ විද්‍යාඥයන්, ලෝක බැංකු ආධාර, පිලිපීන රජයේ ආධාර ආදී සියල්ල එකතු කරගෙන, නව ක්‍රමවේද අනුගමනය කරමින්, කෘෂි කර්මාන්තයෙන් ගොවියා ශක්තිමත් කිරීමේ වැඩසටහනකට යන්න අපි ඉදිරියේදී කටයුතු කරනවාය කියන කාරණයත් මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

ගරු මුදල් ඇමතිතුමා මේ අය වැයෙන් සමෘද්ධි සහනාධාර පිළිබඳව තීන්දුවක් අරගෙන තිබෙන ආකාරය අපි දැක්කා. මම කාලයක් සමෘද්ධිය කියන විෂය භාර ඇමතිවරයා හැටියට කටයුතු කළා නේ. එතකොට මම දැක්කා, 1995න් පස්සේ සමෘද්ධියෙන් අසාධාරණයක් වූ අයට සාධාරණයක් ඉටු වීමේ අවස්ථාවක් තිබිලා නැති බව. 1995දී සමෘද්ධි සංවර්ධන නිලධාරින් හැටියට බඳවා ගත්තේ දේශපාලන වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළ අය බව මම දන්නවා. සමෘද්ධි සහනය ලබා දෙන පිරිස තෝරා ගැනීමේදීත් බොහෝ වෙලාවට ඒ පක්ෂයෙන් පිට අයට සාධාරණයක් වුණේ නැහැ. ඉඳලා හිටලා එක් කෙනෙකුට දෙන්නෙකුට සාධාරණයක් වෙන්න ඇති. හැම වෙලාවේම වාගේ ඒ නිලධාරියා බැලුවේ තමන්ගේ පාක්ෂිකයාව ශක්තිමත් කරන්නයි. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අපට ඒක පිළිගන්න වෙනවා. හැබැයි, ඒ තත්ත්වය 1995දී වෙනස් වුණා. එස්.බී. දිසානායක මැතිතුමා මට වඩා හොඳට ඒ ගැන දන්නවා. එතුමා අපේ ආණ්ඩුව පැත්තේ ඉන්නකොටත් කිව්වා, "සමෘද්ධියට බඳවා ගත්තේ ඒ පැත්තට වැඩ කරපු අයයි" කියා. මම ඒකට දොස් කියන්නේ නැහැ. මොකද, UNP ආණ්ඩුව කාලයේදී අපිත් ඒ විධියට බඳවා ගැනීම් කළා. අපි ඒ විධියට වගා නිලධාරින් බඳවා ගත්තා; විශේෂ සේවා නිලධාරින් බඳවා ගත්තා; කෘපනිස මහත්වරුනුත් බඳවා ගත්තා; සමෘද්ධි සංවර්ධන නිලධාරිනුත් බඳවා ගත්තා.

"සමෘද්ධිය" කියන්නේ, ජාතිය ශක්තිමත් කිරීමේ වැඩසටහනක්. හිටපු ජනාධිපති, දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා 1990දී මේ වැඩසටහන ආරම්භ කරනකොට, එතුමා පක්ෂ, පාට භේදයක් බැලුවේ නැහැ. එතුමා සාධාරණත්වයයි බැලුවේ. නියම දුගී දුප්පත් ජනතාව කවුද කියන එකයි එතුමා බැලුවේ. එතුමා එලෙස රටට ආදර්ශයක් ලබා දුන්නා. මුළු රටටම නැතත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක් තෝරා ගෙන, ඒ තුළින් මේ දුප්පත් ජනතාව ශක්තිමත් කිරීමේ වැඩසටහනක් එතුමා ක්‍රියාත්මක කළා. ඒ, "ජනසවිය" වැඩසටහනයි. එහි දේශපාලනයක් තිබුණේ නැහැ. ඕනෑම කෙනකුට අභියාචනයක් ඉදිරිපත් කරන්න හැකියාව තිබුණා. හැබැයි, එවැනි හැකියාවක් "සමෘද්ධි" ව්‍යාපාරය තුළ තිබුණේ නැහැ. ඒ නිසා තමයි මේ සමෘද්ධි ව්‍යාපාරය දිගින් දිගටම පවත්වාගෙන ඒමේදී අසාධාරණකම් ගොඩක් සිදු වුණේ. සමහරු -විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීතුමන්ලා- අහනවා මම දැක්කා, "සමෘද්ධිය දීලා නැවත හිඟන්නන් බෝ කරන්න හදනවාද?" කියා. එහෙම නැහැ. මෙම සහනාධාරය දීමට සුදුසු තවත් පුද්ගලයෝ විශාල පිරිසක් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මැතිවරණ කොට්ඨාසයට ගියත් එය දකින්න පුළුවන්. ඒ අය මොන පාටද, මොන පක්ෂයේද කියා නොවෙයි අප බලන්නේ. මේ දිළිඳු සහනාධාරය ලැබිය යුතු තවත් විශාල පිරිසක් ගම්වල ඉන්නවා. ඒ වාගේම, මේ සමෘද්ධි සහනාධාරයට මුවා වෙලා සිටින පිරිසකුත් ඉන්නවා. ඒ තමයි, ආර්ථික අතින් ශක්තිමත් වුණත් සමෘද්ධිලාභී තත්ත්වයෙන් ඉවත් වන්නේ නැති පිරිස. ඔවුන් එසේ ඉවත් නොවීමට හේතු තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමෘද්ධිය මඟින් ලැබෙන වරප්‍රසාද

ගණනාවක් තිබෙනවා. සමෘද්ධිලාභීන්ට විදුලිය සම්බන්ධතා, ජල සම්බන්ධතා ලබා ගැනීමේදී ගෙවිය යුතු ගාස්තු සඳහා සහන ලැබෙනවා. ඒ වාගේම, විවාහයකදී ගෙවීමක් කරනවා; දරු උපතකදී ගෙවනවා; මරණයකදී ගෙවනවා. තවත් පොදු පහසුකම් ගණනාවක් තිබෙන නිසා බොහෝදෙනෙක් -තමා ආර්ථික අතින් ශක්තිමත් වුණත්- එයින් නිදහස් වෙන්න කැමැති නැහැ.

සමහර තැන්වල සමෘද්ධිලාභීන් දේශපාලන අතකොලු බවට පත් කරගෙන තිබෙනවා. දේශපාලනඥයන්ගේ ඕනෑ එපාකම් ඉටු කරවා ගන්න, තම පක්ෂයේ දේශපාලන රැස්වීම්වල වේදිකාවලට ගෙන්වා ගන්න ඒ අය පොළඹවාගෙන තිබෙනවා. මේ ක්‍රමය තුළින් සාධාරණයක් ඉෂ්ට වනවාය කියා අපට බලාපොරොත්තු වන්න බැහැ. ඒ නිසා තමයි ගරු මංගල සමරවීර අමාත්‍යතුමා මෙවර අය වැයෙන් සමෘද්ධි සහනාධාරය තවත් ලක්ෂ 6කට දෙන්න යෝජනා කර තිබෙන්නේ. ඒ ගැන අපට බෙහෙවින් සතුටු වෙන්න පුළුවන්. ආණ්ඩුවේද, විපක්ෂයේද, මොන පක්ෂයේද, මොන පාටද කියා බලන්නේ නැතිව සහනාධාරලාභීන් තෝරා දීමට ප්‍රාදේශීය ලේකම්වරයාට සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දී තිබෙනවා. ග්‍රාම නිලධාරියාට, සමෘද්ධි නිලධාරියාට සහනාධාරලාභීන් තෝරා ගැනීමට සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දීලා මේ කටයුත්ත කළොත්, නියම සුදුස්සන් තෝරාගන්න හැකි වේවි කියා මම හිතනවා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අප සියලුදෙනාගේම වගකීම, නැති බැරි පවුල් ටික හඳුනාගෙන මේ කටයුත්ත කරන එකයි. එහෙම නැතිනම් මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? රටේ සල්ලිවලින් අවුරුද්දකට රුපියල් බිලියන 42ක් සමෘද්ධි සහනාධාරය වෙනුවෙන් වියදම් කරනවා. හැබැයි ඒවා නියම සුදුස්සන්ට යනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඔබතුමාට ප්‍රශ්නයක් මතු වේවි, මෙපමණ මුදලක් දීලාත් සහනාධාර ලැබිය යුතු තවත් කොටසක් ඉන්නේ ඇයි කියා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අමාත්‍යතුමනි, මට ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹாிசன்)
(The Hon. P. Harrison)
මට ටික වෙලාවයි තිබෙන්නේ. කෙටියෙන් ඇහුවොත්, මට පුළුවන් උත්තර දෙන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දැනට සමෘද්ධිය ලබන දහහතරලක්ෂය අතරින්, සුදුසුකම් නැතිව සමෘද්ධි සහනය ලබා ගන්නා අයගේ ප්‍රතිශතය කොපමණද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹாிசன்)
(The Hon. P. Harrison)
ඒ කාරණය ඇසීම ගැන ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාට මම ස්තුතිවන්ත වනවා. දැනට ලක්ෂ 14කට සමෘද්ධි සහනාධාරය ලබා දෙනවා. 1995 අවුරුද්දේ මේ වැඩසටහන පටන් ගත් දවසේ ඉඳලාම -අවුරුදු 24ක් තුළ- තවම මේ ප්‍රමාණය ඉන්නවා. හැබැයි, ඔබතුමාම කල්පනා කරලා බැලුවොත් මේ කාරණය තේරුම් ගන්න පුළුවන්. මේකෙන් සියයට සියයක් ඉවත් කරන්න ඕනෑය කියා මම කියන්නේ නැහැ, මේ සමෘද්ධි සහනාධාරය හැම දාම දිය යුතු කොටසක් ඉන්නවා. ඒ අය තමයි, ආබාධිත වුණු අය සහ අංග විකල වුණු අය. රජයක් හැටියට ඒ අයට දිගටම මේ සහනාධාරය දෙන්න ඕනෑය කියායි මම කියන්නේ. හැබැයි, සමහර තැන්වල මේ සමෘද්ධි සහනාධාරය ලබන රජයේ සේවකයනුත් ඉන්න බව මම කනගාටුවෙන් වුණත් ඔබතුමාට කියන්න ඕනෑ. ඒ වාගේම මේ සහනාධාරය ලබන කොටසේ විදේශගත වුණු අය, යාන වාහන තිබෙන අය, රජයේ ඉඩම් තිබෙන අය පවා ඉන්නවා. මම මේ විෂයය භාර ඇමතිවරයා හැටියට පත්වෙලා, මාස පහ හයක් කටයුතු කළ නිසා පෞද්ගලිකවම ඒ කාරණය ගැන දන්නවා. මගේ ආසනයේ, ග්‍රාම සේවා වසමක මේ වාගේ පවුල් හතරක් හිටියා. දරුවන් දෙදෙනෙකු කොරියාවට ගිහිල්ලා ඉන්නවා. හැබැයි, ඔවුන් සමෘද්ධි සහනාධාරය ගන්නවා. අන්න ඒ වාගේ අය තමයි මේකට නුසුදුස්සෝ කියන එකයි මම කියන්නේ. ඒ ගම්වලම සමෘද්ධි සහනාධාරය දිය යුතු විශාල පිරිසක් ඉන්නවා. එස්.බී. දිසානායක මැතිතුමා සමෘද්ධි ඇමතිවරයා හැටියට හිටපු කාලයේ ඒගොල්ලන්ගේ සමීක්ෂණය අනුව පවුල් ලක්ෂ අටක් හඳුනාගෙන තිබුණා, 'සමෘද්ධි සහනාධාරය දිය යුතු අය' කියලා. මෙවර අය වැයෙන් මුදල් ඇමතිතුමා තව ලක්ෂ හයකට සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න මුදල් වෙන් කර තිබෙනවා. අපි සියලුදෙනාම එකතුවෙලා, පක්ෂ, පාට භේදයකින් තොරව, සාධාරණ විධියට, සමෘද්ධි සහනාධාරය දිය යුතු පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම එය ලබාදෙන්න ඕනෑය කියා මම හිතනවා. එය රජයක් හැටියට අපි සියලුදෙනාගේම වගකීමක්ද වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹாிசன்)
(The Hon. P. Harrison)
ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කෘෂි කර්මාන්තය ගැන වාගේම, එළවලු සහ පලතුරු සම්බන්ධවත් කාරණා ගණනාවක් කිව්වා. විශේෂයෙන්ම මේ වන විට එළවලු අතිරික්තයක් තිබෙනවා. හැබැයි, මේ අවුරුද්ද තුළ එළවලු මිලේ විශාල ඉහළ යෑමක් සිදුවෙලා නැහැ. මේ එළවලු අතිරික්තය කොයි විධියටද පාවිච්චි කරන්න ඕනෑ කියා අපි කල්පනා කළා. ඒ අනුව පසුගිය අවුරුදු හතර ඇතුළත කිලිනොච්චියේ විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් ඇති කරන්න අපිට පුළුවන්කම ලැබුණා. අපි සිංහල අවුරුද්දට කලින් වවුනියාවේ ආර්ථික මධ්‍යස්ථානය විවෘත කරන්න ලෑහැස්ති කර තිබෙනවා. මඩකලපුවේ තවත් ආර්ථික මධ්‍යස්ථානයක් හදලා තිබෙනවා. ගොවීන්ගේ නිෂ්පාදන එකම තැනකට ගෙනැල්ලා, අළෙවි කර ගැනීමට ඒ තුළින් හැකියාව ලැබෙනවා. නමුත් ඒ තුළින් විතරක් ප්‍රශ්න විසඳෙනවාය කියා මම කියන්නේ නැහැ. දේශීය වෙළෙඳ පොළට වඩා විදේශීය වෙළෙඳ පොළ හොයා ගැනීමේ අවශ්‍යතාව අනුව, අලුතින් අපනයන බෝග ගණනාවක් හඳුන්වා දීම සඳහා දැනටමත් ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තුළින් අපනයන කෘෂි කර්මාන්තය සඳහා ගොවීන්ව දැනුවත් කිරීමටත් අපි බලාපොරොත්තු වනවා.

අපි ගොවීන්ට අපනයන කෘෂිකර්මාන්තය තුළ ඉල්ලුමක් තිබෙන භෝග වර්ග ගණනාවක් හඳුන්වා දෙනවා විතරක් නොව එම කටයුත්ත කරන්න අවශ්‍ය පහසුකම් පවා ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ තවත් කාරණා ගණනාවක් තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ මේ රටට තමන්ගේ ශ්‍රමය කැප කරමින් රාජ්‍ය සේවයේ ඉඳලා 2016 සිට 2018 දක්වා වූ කාල සීමාව තුළ විශ්‍රාම ගිය සංඛ්‍යාව මම හිතන විධියට 75,000කට වැඩියි. ඒ අයට හැම

[ගරු පී. හැරිසන් මහතා]

දාම ලොකු කනස්සල්ලක් තිබුණා, තරුණ කාලයේදී මේ රට වෙනුවෙන් සේවය කර, තමන්ගේ ශක්තිය කැප කළාට ඒ අයගේ විශ්‍රාම වැටුප් සම්බන්ධව පවතින විෂමතාව ගැන. ඒ අයට සාධාරණයක් වෙලා තිබුණේ නැහැ. මම හිතන විධියට මේ මුදල් ඇමතිතුමා මේ විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කර ඒ අයට සාධාරණයක් කිරීමට ඉතාම හොඳ තීන්දුවක් අරගෙන තිබෙනවා. මේක, විසඳිය යුතු ප්‍රශ්නයක්. මෙතැන පක්ෂ, පාට භේදයක් නැහැ. මේ රට වෙනුවෙන් තමයි ඒ අය සේවය කර තිබෙන්නේ. ඒ නිසා ඒ ගත් ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාට අපේ ප්‍රසාදය පළ කරන්න මා මෙය අවස්ථාවක් කරගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය තුළින් හැම ක්ෂේත්‍රයක්ම ආවරණය කර තිබෙන බව මම දැක්කා. යුද හමුදාවේ, පොලීසියේ පසුගිය කාලවල ලොකු අඳෝනාවක් තිබුණා. විශේෂයෙන්ම පොලිස් නිලධාරින් කියන්නේ, රට වෙනුවෙන් හැම දාම, පැය 24ම විශාල සේවාවක් කරන අය. ඔවුන් යුද්ධය පැවැති කාලයේදීත් විශාල සේවාවක් කළා. හැබැයි, අවුරුදු ගණනාවක් තිස්සේ ඒ අයගේ නොවිසඳුණු ප්‍රශ්නයක් තිබුණා. අපිට පුළුවන් වුණා, අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා පොලීසිය භාර ඇමතිවරයා හැටියට සිටින කාලයේදී, සියයට 40කින් පොලිස් සේවයේ වැටුප වැඩි කරන්න. ඉතිහාසයේ කවුරුවත් මේ ගැන හෙව්වේ නැහැ. හුහාක් අය දැක්කේ පොලීසියේ වැරැදි පැත්ත විතරයි. පොඩි ප්‍රශ්නයක් ඇති වුණොත්, ඔක්කෝම කුණු ටික පොලීසියට; පාරේ උද්ඝෝෂණයක් කළොත්, ඒකේ වැරැද්දත් පොලීසියට; රටේ වැරැද්දක් වුණොත් ඒකත් අවසානයට යන්නේ පොලීසියට. හැබැයි, ඒ පැත්තෙන් වැරැද්ද විතරක් සොයනකොට, ඒ අයගේ ශ්‍රේණි උසස්වීම් විතරක් නොව පොලීසියේ වැටුප් විෂමතාවත් ඉවත් කර සියයට 40කින් ඔවුන්ගේ පඩි වැඩි කරන්න අපට පුළුවන්කම ලැබුණා.

අනෙක් රාජ්‍ය සේවකයින් ගත්තාම, අපි දැක්කා රාජ්‍ය සේවකයාගේ වැඩිම වැටුප් වැඩි කිරීම කළේ, මේ රජයෙන් කියන එක. අපි එය පැහැදිලිව කියන්න ඕනෑ. එකවර රුපියල් 10,000ක වැටුප් වැඩිවීමක් කර තිබෙනවා. ඒ විධියට රාජ්‍ය සේවකයන් වෙනුවෙන් උනන්දු වුණු රජයක් ඉතිහාසයේ කවදාවත් මම දැකලා නැහැ. අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප මීට කලින් රුපියල් 10,000කින් වැඩි කළා වාගේම, මොන ප්‍රශ්න තිබුණත් මෙවර අය වැයේදීත් රජයක් හැටියට ඒ ගොල්ලන්ගේ සේවාව ගැන හිතලා දීමනා ලබා දීමකුත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒත් එක්කම මේ රටේ අවුරුදු 30ක් තිස්සේ පැවැති බිහිසුණු යුද්ධය අපට අමතක කරන්න බැහැ. යුද්ධය නිමා කරන්න මේ රටේ රණ විරුවන් කැප කිරීම් කළා. හැබැයි, සමහර අය හැම දාම රණ විරුවෝ යොදා ගත්තේ දේශපාලන වාසි ලබා ගන්න විතරයි. රණ විරුවෝ මහ පාරවල්වල උද්ඝෝෂණය කළා. හැබැයි, මෙවර අය වැයේදී ගරු මංගල සමරවීර මැතිතුමා මුදල් ඇමතිවරයා හැටියට ත්‍රිවිධ හමුදාවේ යම් යම් දීමනා වැඩි කිරීමට යෝජනා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හමුදා නිලධාරින්ගේ සමහර දීමනා අවුරුදු 20කින් වැඩි කර නැහැ. නිල ඇඳුම් දීමනාව වැඩි කර නැහැ. අපි හැම දාම හමුදා නිලධාරියාගේ uniform එක දැක්කා. හැබැයි, අවුරුදු 20ක් තිස්සේ බැරි වුණා ඒ අයගේ uniform දීමනාව වැඩි කරන්න. ඒ අයගේ ගෙවල් කුලී දීමනාවට සාධාරණයක් කරන්න අවුරුදු 20ක් යනතෙක් හම්බ වුණේ නැහැ. හැබැයි අපි හැම දාම කිව්වේ, "මේ අය, රට බේරා ගත්ත රණ විරුවෝ. මේ අයට සාධාරණය ඉටු කරන්න ඕනෑ." කියා. මෙවර අය වැයෙන් යුද හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවේ commandosලාගේ ඒ දීමනා වැඩි කරන්න මංගල සමරවීර ඇමතිතුමා කටයුතු කළා. එය ඉතාම ශ්‍රේෂ්ඨ කටයුත්තක් හැටියට මම දකිනවා. රණ විරුවන් ගැන අපි කථා කරනවා. ඒ අයගේ ජයග්‍රහණ ගැන උනන්දු වනවා. ඒ වාගේම උදම් අනනවා. හැබැයි, සමහර අය රණ විරුවෝ පාවිච්චි කර දේශපාලන වාසි ගන්න හැදුවාට, මුදල් ඇමතිතුමා ඒ අයට සාධාරණයක් ඉටු කර තිබෙනවාය කියන එක මම තමුන්නාන්සේට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්න තවත් බොහෝ විස්තර තිබෙනවා. කාරක සභා අවස්ථාවේදී ඒවා ඉදිරිපත් කරන්න අපි කටයුතු කරනවා. මුදල් ඇමතිතුමා රටේ සියලු අංශ ගැන සොයා බලා සමබර අය වැයක් ඉදිරිපත් කර තිබෙනවාය කියන එකත් මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුති කරමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Kaveendiran Kodeeswaran. You have eight minutes.

[மு.ப. 10.52]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ மங்கள சமரவீர அவர்களினால் சமர்ப்பிக்கப்பட்ட 2019ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்டம் இந்த நாட்டினுடைய பொருளாதாரம், இந்த நாடு பொருளாதார ரீதியாக எதிர்நோக்குகின்ற பிரச்சினைகளுக்கான தீர்வு என்கின்ற விடயங்களை மையப்படுத்தி அமைக்கப்பட்டிருக்க வேண்டும். ஆனாலும், இந்த வரவு செலவுத்திட்டமானது தற்காலிகமாக மக்களைத் திருப்திப்படுத்துகின்ற ஒரு வரவு செலவுத்திட்டமாக இருக்கின்றதே தவிர, இந்த நாட்டின் பொருளாதாரத்தை, ஏற்றுமதி வருமானத்தை ஊக்குவிக்கின்ற, வேலைவாய்ப்பை அதிகரிக்கின்ற, மக்கள் எதிர்நோக்கின்ற பிரச்சினைகளைத் தீர்க்கின்ற ஒரு வரவு செலவுத்திட்டமாக அமையவில்லை. ஆகவே, இந்த வரவு செலவுத்திட்டத்திலே பல மாற்றங்கள் கொண்டுவரப்படவேண்டிய அவசியப்பாடு இருக்கின்றது. இருந்தாலும், இந்த வரவு செலவுத்திட்டம் விசேடமாக வடக்கு, கிழக்கிலே வாழுகின்ற மக்களுக்குச் சாதகமாக அமைந்திருப்பதையிட்டு இந்த இடத்திலே நான் அமைச்சரைப் பாராட்டுகின்றேன். வடக்கு, கிழக்கிலே வாழுகின்ற நலிவுற்ற தமிழ் மக்களுக்காகச் சில வரப் பிரசாதங்கள் இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் வழங்கப் பட்டிருக்கின்றது. இந்த வகையிலே வடக்கு, கிழக்கு அபிவிருத்திக்கென்று 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கப் பட்டிருந்தாலும் அந்த நிதியானது இந்த வருடத்திலே 2,500 மில்லியன் ரூபாயாகவும் வருகின்ற வருடத்திலே 2,500 மில்லியன் ரூபாயாகவும் வேறுபடுத்திக் காட்டப் பட்டிருக்கின்றது. உண்மையிலே, வடக்கு, கிழக்கு அபிவிருத்திக்காக 'பனை நிதியம்' என்ற பெயரில் அந்த நிதியத்திற்கு வழங்கப்படுகின்ற இந்த 2,500 மில்லியன் ரூபாய் நிதி மிகவும் போதாததொன்றாகக் காணப்படுகின்றது. இந்த 5,000 மில்லியன் நிதியும் வடக்கு, கிழக்கு அபிவிருத்திக்கு இந்த வருடத்திலே வழங்கப்படுமென்றால் உண்மையாக அது பாராட்டக்கூடியதொரு விடயமாக இருக்கும். ஆகவே, இந்த விடயத்தைக் கருத்திற்கொண்டு 5,000 மில்லியனையும் இந்த வருடத்திலே வழங்குவதற்கான நடவடிக்கையினை மேற் கொள்ள வேண்டுமென்று இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகிறேன்.

இந்த நாட்டின் பொருளாதார ரீதியான முன்னெடுப்புக்களை மேற்கொள்வதற்கு எப்பொழுதும் வரவு செலவுத்திட்டமானது எதிர்காலத்தை நோக்கியதான, எதிர்காலத்தை மையப்படுத்தியதான, ஏற்றுமதி வருமானத்தை அதிகரிக்கத்தக்கதான, பொருளாதார ஸ்திரத்தன்மையை ஏற்படுத்துவதற்கான, தொழில்வாய்ப்புக்களை வழங்குவதற்கான ஒரு முன்னோடித் திட்டமாக அமைக்கப்பட்டிருக்க வேண்டும். அந்தவகையிலே, இந்த வரவு செலவுத்திட்டத்திலே சில மாற்றங்களைக் கொண்டுவரவேண்டிய அவசியப்பாடு இருக்கின்றது.

இன்று எங்களது மக்களின் அடிப்படைத் தேவையான பல விடயங்கள் முன்னெடுக்கப்பட வேண்டியிருக்கின்றன. அதாவது எங்களது உரிமை ரீதியான, சாத்வீக ரீதியான சில விடயங்கள் முன்னெடுக்கப்பட வேண்டியிருக்கின்றன. அந்த விடயங்களுக்கு முக்கியத்துவம் கொடுக்கவேண்டிய நிலைப்பாடிருக்கின்றது. அந்த வகையிலே, கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்துவதற்கான நடவடிக்கை முன்னெடுக்கப்பட்டிருக்கின்ற இந்தக் காலகட்டத்திலே - நாங்கள் ஏற்கெனவே கௌரவ பிரதமர் அவர்களிடம் விடுத்த வேண்டுகோளுக்கிணங்க அதனைத் தரமுயர்த்தித் தருவதாக அவர் வாக்குறுதியளித்திருந்தார் - நேற்று இந்தப் பாராளுமன்றத்திலே பேசிய பாராளுமன்ற உறுப்பினர் ஒருவர், இந்தக் கல்முனை வடக்குப் பிரதேசச் செயலகத்தைத் தரமுயர்த்தக் கூடாது, இதனைப் பிரிக்கக்கூடாது என்ற அடிப்படையில் பல முனைப்பான கோரிக்கைகளை முன்வைத்திருந்தார். இது தமிழ் மக்கள் மத்தியிலே மிகவும் மனவேதனைக்குரிய விடயமாகப் பார்க்கப்படுகின்றது. உண்மையிலே, தமிழ் மக்கள் நிர்வாக ரீதியான ஓர் அலகைப் பெறுவதற்காகக் கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்த முயற்சிக்கின்றார்கள். இந்தக் கல்முனை வடக்குப் பிரதேசச் செயலகமானது 29 கிராம சேவகர் அலுவலகங்களை உள்ளடக்கியதாக இருக்கின்றது. இப்பொழுதும் அந்தப் பிரதேசச் செயலகம் அதற்குரிய ஆளணியைக் கொண்டதாக, அதற்கான ஒரு பிரதேசச் செயலாளரைக் கொண்டதாக, பாரிய கட்டடத் தொகுதியைக் கொண்டதாக இருக்கின்ற நிலையிலும், 1999ஆம் ஆண்டிலிருந்து அந்தப் பிரதேசச் செயலகம் உப பிரதேசச் செயலகமாக இயங்கிவருகின்றது. அந்த வகையிலே, அந்தப் பிரதேச செயலகத்திற்குத் தேவையான சகல ஆளணியும் வழங்கப்பட்ட நிலையிலே, அதற்கென்று DCC கூட அமைக்கப்பட்ட நிலையிலே, அது தனியான internal transfer இனைக்கூடச் செய்கின்ற அதிகாரங்கொண்டதாக இருக்கின்றது. அதேநேரம் 29 GN Divisions களை உள்ளடக்கியதாக அந்தப் பிரதேசச் செயலகம் காணப்படுகின்றது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
இந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்துகின்ற இந்த நடவடிக்கைக்கு எதிராக -

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. H.M.M. Harees - State Minister of Provincial Councils and Local Government)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. State Minister, what is your point of Order?

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இங்கு பேசுகின்ற பாராளுமன்ற உறுப்பினர் என்னைச் சம்பந்தப்படுத்திப் பேசியதால் நான் ஒரு விடயத்தைக் குறிப்பிடுகின்றேன். அவர் குறிப்பிடுகின்ற கல்முனை வடக்குப் பிரதேசச் செயலகத்திற்கு அனைத்து அதிகாரங்களும் காணப்படுவதாக அவர் தன்னுடைய பேச்சிலே சொல்கின்றார்; அவரே அதை ஏற்றுக்கொள்கின்றார். உங்களுடைய பிரச்சினை நிர்வாக ரீதியான பிரச்சினையல்ல! அங்கிருக்கின்ற காணி சம்பந்தப்பட்ட பிரச்சினை ஒரு சர்ச்சைக்குரிய பிரச்சினை! அங்கிருக்கின்ற இரு சமூகங்களும் ஒற்றுமையாக வாழ்கின்றார்கள். *[இடையீடு]* இது சம்பந்தமாக கௌரவ பிரதமர் அவர்கள் உங்களுக்கு *[இடையீடு]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Hon. State Minister, he has only two more minutes. Please let him speak.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தனது வங்குரோத்து அரசியலை நிலைநிறுத்துவதற்காக ஹரீஸ் அவர்கள் இந்தக் கல்முனை தமிழ்ப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்துவதில் தடையாக இருக்கின்றார். இது மிகவும் கவலைக்குரியதும் வேதனைக்குரியதுமான ஒரு விடயமாக இருக்கின்றது. 29 தமிழ்ப் பிரதேசங்களை உள்ளடக்கிய இந்தப் பிரதேச செயலகம் தரமுயர்த்தப்படுவதைத் தடுப்பதற்கு இவருக்கு யார் அந்த அதிகாரத்தைக் கொடுத்தது? தமிழர்களின் நிலத்தை - காணியைப் பிரித்துப் போடுவதற்கு இவருக்கு யார் அதிகாரம் கொடுத்தது? *[இடையீடு]* எந்த விதத்திலாவது, சாய்ந்தமருதுப் பிரதேச சபையைப் பிரித்துக் கொடுக்க வேண்டும் என்பதற்காகத் தமிழ் நிலங்களையும் தமிழர்களையும் தமிழரின் ஒற்றுமையினையும் பிரித்துத் துண்டாடுகின்ற அந்தக் கேவலமான வங்குரோத்து அரசியலைச் செய்கின்ற

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ஹரீஸ் அவர்கள் இருக்கின்றார். தமிழ்ப் பிரதேசங்களின் முன்னேற்றத்தைத் தடுத்து நிறுத்துவதற்கு இவர் யார்? அந்தப் பிரதேசத்தைக் குறைப்பதற்கு இவர் யார்? கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ பிரதமர் அவர்கள் கல்முனை வடக்குப் பிரதேசச் செயலகத்தைத் தரமுயர்த்தித் தருவதாக எங்களுக்கு வாக்குறுதி தந்திருக்கின்றார். *[இடையீடு]* அதனை அவர் தரமுயர்த்தித்தர வேண்டும்; அதற்குரிய நடவடிக்கைகளை அவர் எடுக்கவேண்டும் என்பதனை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். *[இடையீடு]* இவர் கடந்த அரசியல் குழப்பகரமான சூழ்நிலையிலே, சாய்ந்தமருதுப் பிரதேச சபையைப் பிரித்துக் கொடுக்கக்கூடாதென்று பிரதமரிடம் வேண்டுகோள் விடுத்திருந்தார். *[இடையீடு]* அது

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

எங்களுக்குத் தேவையில்லை. இப்படியான செயற்பாடுகளிலே அவர் இறங்கியிருக்கின்றார். இது மிகவும் மனவேதனைக்குரிய விடயம். தமிழர்களின் நிலத்தை, தமிழர்கள் பிரதிநிதித்துவம் செய்கின்ற இடத்தைக் குறைப்பதற்கு அவர் யார்? கல்முனை நகரமானது 90 சதவீதமான தமிழர்களைக் கொண்ட பிரதேசம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have to conclude your speech now.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
90 சதவீதமான தமிழர்களைக் கொண்ட அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்கு அந்த உரிமையைக் கொடுக்காமல் தடுத்து நிறுத்துவதற்கு இவர் யார்? இவருக்கு அந்த அதிகாரத்தை யார் கொடுத்தது? இந்த வக்குரோத்து அரசியலைச் செய்து அவரது அரசியலை நிலைநிறுத்துவதற்கு யார் அவருக்கு அந்த அதிகாரத்தைக் கொடுத்தது? தமிழ் மக்களைப் பிரித்தாளுகின்ற தந்திரோபாயத்தை, தேசிய நல்லிணக்கத்திற்கு எதிரான விடயங்களைச் செய்கின்ற ஓர் அரசியல்வாதியாக இவர் இருக்கின்றார். *[இடையீடு]* இவரை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். இப்படியான விடயங்களை நீங்கள் நிலைநிறுத்தக்கூடாது. அடிப்படியான நிலைப்பாட்டிலிருந்து நீங்கள் மாற வேண்டும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! [බාධා කිරීමක්]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා.[බාධා කිරීමක්] ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා. [බාධා කිරීමක්] Hon. Member, please sit down.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana and Wayamba Development)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. Hon. Member, please sit down. This is my time. මගේ කාලය.
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට විනාඩි විස්සක කාලයක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මගේ command එකට තමයි වාඩි වුණේ. එහෙම නැත්නම් හරියන්නේ නැහැ. කථාව ඉවරයක් නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම හොඳයි.

[පූ.භා.11.03]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මම මේ දේ ප්‍රකාශ කරන්නේ ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය ගැන කිහිපදෙනෙක් අහලා තිබුණු නිසායි. මේ, දේශපාලන වශයෙන් ඡන්දයකට ඉදිරිපත් කළ අය වැයක් නොවෙයි. මගේ මිත්‍ර, මම බොහොම ආදරය කරන, නාලන්දයේ මා සමඟ ඉගෙන ගත් නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කථා කරමින් කිව්වා, ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ගම්මානවල වැසිකිළි 30,000ක් එතුමා හැදුවා; නමුත්, එතුමාට ඒ පළාතෙන් ඡන්ද 30,000ක්වත් ලැබුණේ නැහැ කියලා. උගත්, වැදගත්, පොහොට්ටුවේ දැන් සිටින මගේ මිත්‍ර නිමල් සිරිපාල මැතිතුමාට මම පැහැදිලිව කියනවා, ලංකාවේ දෙලක්ෂ හැත්තෑපන්දහසකට පමණ වැසිකිළි නැහැයි කියා සමීක්ෂණයකින් හෙළි වී තිබෙන බව. ඡන්දයක් ගන්න නොවෙයි අපි මේ විධියට වැසිකිළි ලබා දෙන්නේ. ඡන්දයක් බලාපොරොත්තුව මේ රජය -අපි- එහෙම කරලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මොණරාගල දිස්ත්‍රික්කයේ, මගේ මිත්‍ර රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමාගේ පළාත වෙනුවෙන් මංගල සමරවීර මුදල් ඇමතිතුමා විශාල සංවර්ධන වැඩ පිළිවෙළක් ඇති කළා. ග්‍රාම සේවා මට්ටමෙන් කළ සමීක්ෂණවලින් හෙළි වී තිබෙනවා, වැසිකිළි නැති පවුල් 25,000ක් ඉන්නවාය කියා. මෙය ඉටු කර ගැනීමේ අවශ්‍යතාව තිබුණත්, තමන්ගේ ආර්ථික දුබලතාව නිසා වැසිකිළියක් සකසා ගන්න බැරි එවැනි අයට ඒ වැසිකිළි 25,000ම වෙනුවෙන් අද මුදල් ලබා දීලා තිබෙනවා. ඒ අනුව, මොණරාගල දිස්ත්‍රික්කයේ ඒ පවුල්වලට වැසිකිළි ලබා දීමට පියවර ගෙන තිබෙනවා.

දැන් මේ ගැලරියේ පාසල් දරුවෝ හිටියා. මැටිවලින් තැනූ නිවසක ජීවත් වන, වැසිකිළියක් හදාගන්න බැරි අහිංසක පවුලක් වුණත්, තමන්ගේ දරුවන්ට නිදහස් අධ්‍යාපනය ලබා දෙන්න මධ්‍ය මහා විද්‍යාලයට හෝ ජාතික පාසලකට යවනවා. තමන්ගේ ගෙදර වැසිකිළියක් නැහැ කියලා ඒ දරුවන් ලජ්ජාවෙන්, කනගාටුවෙන් මිරිකෙමින් පාසල් යන්නේ. එවැනි දරුවකුගේ මානසිකත්වය කොහොමද?

මේ අය වැය "මංගලගේ මඟුල් අය වැයක්" කියායි මම කියන්නේ. ජනතාවගේ සුබසාධනයට, ජනතාවගේ ආර්ථික සංවර්ධනයට කටයුතු කරන, තරුණ අසහනය නැති කරන, තරුණ, තරුණියන් සංවර්ධනයට හවුල් කරගන්න අය වැයක් විධියට මම දකිනවා. ඒකයි මම මෙය 'මඟුල් අය වැයක්' කියා හැඳින්වූයේ.

1977 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඉඳලා දේශපාලනය කළ කෙනෙක් විධියට මම දකිනවා, එක්සත් ජාතික පක්ෂය ඡන්දය දිහා බලලා වැඩ කරනවා නම්, අපට හැම වෙලාවේම ජනතාව රවටන්න දේවල් කරන්න තිබුණාය කියා. නමුත්, එහෙම කළේ නැහැ. හැම දාම අපි බලයට ආවොත් එන්නේ, ඒ වන තෙක් බලයේ සිටි අය රට බංකොලොත් කරලා, ආර්ථිකය කාබාසිනියා කළාට පසුවයි. එවැනි රජයකුයි අපි භාර ගන්නේ. එසේ භාරගෙන අපි මොකද කළේ? අපි ආර්ථිකය ශක්තිමත් කළා; වත්කම් වැඩි කළා; රටේ සංවර්ධනය වේගවත් කළා. එසේ කිරීම තුළින් නැවතත් අර විපක්ෂය, පොහොට්ටුව ඔක්තෝබර් 26 වැනිදා කළා වාගේ, එස්.බී. දිසානායක වැනි අය ගිය ගිය තැන කාලා, වමාරාලා තමයි එන්නේ කියලා මම දන්නවා.

එතුමා 2002දීත් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ රජයේ ඉඳලා යූඑන්පී එකට ඇවිල්ලා, ජී.එල්. පීරිස්, බන්දුල ගුණවර්ධන මැතිතුමන්ලා ඔය ඔක්කෝම ඇවිල්ලා රජයක් ඇති කෙරුවා. ඊළඟට, යූඑන්පී එක ඇතුළේ ඉඳගෙනම මේ අය මොනවාද කළේ? ඒවා ගැන මම දන්නවා. ඒ වන විට මම සභාපති. මේ අය ඇවිල්ලා ඇතුළේ ඉඳගෙන මොනවාද කරන්නේ, Working Committee එකට ඉස්සෙල්ලා දවසේ? ඉස්සෙල්ලා දවසේ රාත්‍රියේ ඔය අය හුඟක් කල්ලි හදලා, Working Committee එකේ භේද කරනවා. ඒ අය හුඟාක් දෙනෙක් අද අනික් පැත්තට ගිහිල්ලා ඉන්නවා. මේ වාගේ මේ රටේ අස්ථාවරත්වයක් ඇති කිරීමේ කටයුතු යූඑන්පී එක කවදාවත් කර නැහැ.

අපි දන්නවා, පසු ගිය ඔක්තෝබර් 26වෙනි දා වෙච්ච දේ ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චීනයේ තිබෙනවා, බුදුරජාණන්වහන්සේගේ ධාතූන් වහන්සේලා. 1961දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ ධාතූන් වහන්සේලා සතියකට ලංකාවට වැඩමවා නිදහස් චතුරස්‍රයේ තියලා ජනතාවට වන්දනාමාන කරන්න අවස්ථාව උදා කරලා දුන්නා. මම අපේ ජනාධිපතිතුමාගෙන් චීන ජනාධිපතිතුමාට ලියුමක් අරගෙන ගියා, ඒ ධාතූන් වහන්සේලා අපේ රටේ ජනතාවට වන්දනාමාන කරගන්න ලංකාවට මාස එකහමාරකට වැඩමවා ගැනීම සඳහා ඉල්ලන්න. නමුත් රෑ ආරංචි වුණේ මොකක්ද? රජය වෙනස් කරලා හොර පොහොට්ටුවේ නීති විරෝධී කැබිනට් මණ්ඩලයක් සමඟ අගමැතිවරයෙක් පත් කළා කියලා. මම ඒ ලියුම යවන්න කියා නිලධාරින්ට දීලා ආපසු ආවා. මේ මාස දෙකේ වෙච්ච පාඩුව කොයිතරම්ද? මම කියනවා, අවුරුදු එකහමාරකින් මේ රට ආපස්සට යැව්වා කියලා.

එස්.බී. දිසානායක මැතිතුමන්ලා 1994දී සමෘද්ධි වැඩසටහන ආරම්භ කළා. නමුත් 2017 වෙනතුරු සමෘද්ධි නිලධාරින්ගේ සේවය ස්ථිර කෙරුවේ නැහැ. කළේ මොකක්ද? මේ අහිංසක සමෘද්ධි නිලධාරින් ආණ්ඩුවේ අතකොළු විධියට තියාගෙන ආණ්ඩුවේ වැඩ කරන්න, උද්ඝෝෂණ කරවන්න ගෙනයෑම තමයි කළේ. අහිංසක කාන්තා නිලධාරිනියන් පවා එහෙම අරගෙන යෑමයි කළේ. සමාජ සවිබලගැන්වීම් අමාත්‍යවරයා විධියට අපේ හැරිසන් ඇමතිතුමා තමයි 2018දී සමෘද්ධි නිලධාරින් ස්ථිර කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන ඔක්කෝම කටයුතු කළේ. අනේ! එස්.බී. දිසානායක මැතිතුමා අර නීති විරෝධී ආණ්ඩුවේ ඇමති වෙලා ඒ පත්වීම් ලිපි ටික දුන්නා. මේ වාගේ බොරු සෝබන වැඩ තමයි මේ අය කරන්නේ.

මැතිවරණයක් තිබිලා පාර්ලිමේන්තු වෙනසක් වුණා නම් අන්න ඒ වර්ෂයේ තාවකාලිකව අතුරු වැයක් ගෙනෙනවා, ස්ථිර අය වැයක් ගෙනෙනතුරු. නමුත් ඒක නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වුණේ. අර නීතිවිරෝධී හොර ආණ්ඩුවක් පත් කර ගත්ත නිසා අපට අපේ අය වැය ඉදිරිපත් කරන්න බැරි වුණා. අපි අය වැය ඉදිරිපත් කරන්න හිටියේ 2018 නොවැම්බර් මාසයේ. නමුත් ඒක කරන්න බැරි වුණා. අද අපි මේ මාර්තු මාසයේ මේ අය වැය ගෙනැල්ලා, අප්‍රේල් 05වෙන තුරු විවාදය පවත්වනවා. රටේ සංවර්ධන කටයුතු ඔක්කෝම ඇණහිටලා. රට සම්පූර්ණයෙන් පසුබෑමකට ලක් වෙලා. හොර ආණ්ඩුවක් පත් කරලා එදා පාලකයන් කරපු විපත නිසා රටේ ජනතාවට අද බර උසුලන්න වෙලා තිබෙනවා.

අපේ ආණ්ඩුව තිබියදී ලෝක සංචාරක සඟරාවක් කෙළින්ම කිව්වා, "යන්න, ලංකාව සංචාරක පාරාදීසයක්" කියලා. නමුත් මොකද වුණේ? ඔක්තෝබර් 26වෙනි දා ඒ කරපු විපත නිසා ලෝකයේ රටවල් සංචාරකයන්ට කිව්වා, "ලංකාවට යන්න එපා" කියලා. ඒ හොර නීතිවිරෝධී කැබිනට් මණ්ඩලය සහිත ආණ්ඩුව කිසිම රටක් පිළිගත්තේ නැහැ. මුළු ආර්ථිකයම විනාශ වුණා. ඇමෙරිකන් ඩොලර් බිලියන ගණනක් නැති වුණා. විදේශිකයන් ලංකාවේ තැන්පත් කළ මුදල් ආපසු අරගෙන ගියා. ආයෝජකයන් යන්න ගියා.

අද මුදල් ඇමතිතුමාට පින් සිදුවෙන්න අපේ රටේ ස්ථාවරත්වයක් ඇතිවෙලා තිබෙනවා. දැන් රට ආර්ථික වැඩ පිළිවෙළකට බැහැලා විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතුමා විශ්වකර්ම විධියට මේ අය වැයෙන් අපට මහා සංවර්ධනයක් දීලා තිබෙනවා. මොකක්ද, මේ සංවර්ධනය? එක පැත්තකින් ජනතාවට සුබසාධනය දෙනවා. ලෝකයේ කිසිම රටක නැති විධියට ජනතාවට සුබසාධන සලසනවා. අනික් පැත්තෙන් රට සංවර්ධනය කරනවා. මේ අය වැය ගැන කථා කරනවා නම්, අද තිබෙන ආර්ථික දුගීභාවය තුරන් කිරීමට මේ මුදල් ඇමතිතුමා අරගෙන තිබෙන පියවර රාශිය ගැන මට විනාඩි 20කින් කියන්න බැහැ.

ගරු මුදල් ඇමතිතුමා මෙවර අය වැයෙන් ආර්ථික සංවර්ධනය සඳහා පියවර රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, 2014ට ඉස්සෙල්ලා තිබුණු තත්ත්වය මොකක්ද? එදා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 11ක් ලෙස අඩු මට්ටමක පැවැති රජයේ ආදායම 2019 වර්ෂයේදී සියයට 15 දක්වා වැඩි කිරීමට පුළුවන් වුණා. අන්න එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ස්ථාවරත්වය. අද තනි UNP Cabinet එකක් තිබෙන්නේ.

නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමනි, මම ඔබතුමාට බොහොම ආදරෙයි. ඔබතුමාට මම ගරු කරනවා. මගේ මිත්‍ර කෑගල්ලේ මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා. සාමාන්‍යයෙන් කැබිනට් මණ්ඩලයේ න්‍යාය පත්‍රයට යෝජනා 60ක්-70ක් ගේනවා. ඔබතුමන්ලා දන්නවා එදා ඒ ඉදිරිපත් කළ යෝජනාවලට කොච්චර විරුද්ධ වුණාද කියලා. හැම දාම වුණේ තීරණයක් නොගෙන කල් දමන එකයි. අවුරුදු තුනහමාරක් එලෙස සිදු වුණා. හිටපු ඇමතිතුමනි, මම ඔබතුමාට කියනවා. මම ජනාධිපතිතුමාටත් මෙය කිව්වා. අද අපි කැබිනට් මණ්ඩලයට යෝජනා 80ක් විතර ගෙනෙනවා. අවුරුදු තුනහමාරක් සිදු වුණේ මොකක්ද? මත ඉදිරිපත් කරනවා, භේද වෙලා, කල් දමනවා. තීරණයක් ගත්තේ නැහැ. අද මේ එක්සත් ජාතික පක්ෂ රජයේ කැබිනට් මණ්ඩලයේ ජනාධිපතිතුමා මුලසුනේ ඉන්නවා. කිසිම වාදයක් හෝ භේදයක් නැහැ. අපි යෝජනා 70-80ක් පැය දෙකෙන් හෝ දෙකහමාරෙන් අනුමත කරලා ක්‍රියාත්මක කරනවා. මුදල් ඇමතිතුමා වැඩිම වුණොත් සතියයි ඉල්ලන්නේ. මෙන්න වෙනස. අවුරුදු තුනහමාරක් අපි එකට හිටියාට, තනතුරු ලබාගෙන පුටුවේ වාඩි වෙලා හිටියාට, රටේ අවශ්‍ය සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ගන්නා තීරණවලදී මතවාද දාලා විරුද්ධ වුණා. මට සැකයක්, ප්‍රශ්නයක් ආවා. මොකද, මම ජ්‍යොෂ්ඨයෙක්. මේ ගැන මම කල්පනා කළා. අපි හොඳ සැලසුම් හදලා කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කරද්දී ඔබතුමන්ලාගේ ඇතැම් අය plan කරලා ඇවිල්ලා ඒවාට විරෝධතාව ප්‍රකාශ කරනවා. ජනාධිපතිතුමාටත් කරන්න දෙයක් නැහැ. පසුව එම යෝජනා ගැන සලකා බලන්න කමිටුවකට දානවා. හිටපු ඇමතිතුමනි, අද කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ නිසායි අද අපට හොඳ අය වැයක් ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ. මම පැහැදිලිව කියනවා. මම අවංකව කථා කරන්නේ. මම ඔබතුමාටවත්, කාටවත් මඩ ගහන්නේ නැහැ. රට දිහා බලලායි අපි වැඩ කරන්න ඕනෑ. දිගටම කැබිනට් මණ්ඩලයේ සිටි ඔබතුමා දන්නවා, සියයට 9-10 පොලියට පසුගිය රජය ණය ගත්ත බව. පසුගිය රජයේ එම පව් සම්පූර්ණයෙන් අපේ කර පිටට ආවා. නමුත්, අද විදේශ වත්කම් එක්ක බැංකුවල ස්ථාවරත්වයක් තිබෙනවා. මම ඊයේ රෑ TV එකේ news අහගෙන හිටියා. අද උදේ "දෙරණ" නාළිකාවෙත් කිව්වා, "ලොකු වැඩ කෙරුවා ලූ". ඔව්, ඇත්ත; කළා. ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමනි, ඔබතුමා විදුලිබල ඇමතිවරයා විධියට හිටියා.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේර මහතා]

නොරොච්චෝලේ හදලා තිබෙන coal power plant එකේ තත්ත්වය මොකක්ද? අලුත් machines ද ගෙනාවේ? නැහැ නේ. චීනයේ පට්ට ගහපු second-hand machines ගෙනැල්ලා ඒ සමාගම සවි කළා. හයි කරපු දවසේ ඉඳලා කැඩෙනවා, කැඩෙනවා. තවම ඒක හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එක අධිකරණයයි තවම පිහිටුවා තිබෙන්නේ. තව අධිකරණ දෙකක්-[බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු ඇමතිතුමනි, නොරොච්චෝලේ බලාගාරය නොතිබුණා නම් අද අපේ රට කරුවලේ.ඒවාගේම මතක තියා ගන්න-[බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු මන්ත්‍රීතුමා, කරුවල එක හරි. කරුවල නාමයෙන් ඔබතුමාට මේ ප්‍රශ්නය මඟ හරින්න බැහැ. [බාධා කිරීමක්] ඔබතුමන්ලා අලුත් කොම්පැනි ගෙනැල්ලා අලුත් ඒවා සවි කරන්න උත්සාහ කළේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමා චෝදනා කරපු නිසා,- [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒ ආණ්ඩුවේ ඇමතිවරු පිළිගත්තා; කිව්වා. ඒ නිසා-, [බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු ඇමතිතුමනි, [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මගේ කාලය- [බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
වැරදියි ඒ ප්‍රකාශය.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වෙලාවේ උත්සාහ කරන්නේ දුප්පත්කම නැති කරන්නයි. අපි ගන්න වැඩ පිළිවෙළ තුළ දුප්පත්කම නැති කරන්න හදන්නේ ඡන්ද ගුන්ඩුවලින් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මංගල අය වැයෙන් කරන කටයුතුවලට බලන්න කොච්චර වියදම් කර තිබෙනවාද කියලා. සමෘද්ධිය හය ලක්ෂයකට දෙනවා. ඉදිරි මාස තුළ හැම ආසනයකටම පක්ෂ භේදයෙන් තොරව, දුප්පත්කමේ අඩිතාලම තුළ හැම කෙනෙකුටම සමෘද්ධිය දීමටයි අපි කටයුතු කරන්නේ. එදා පක්ෂයේ අයට විතරයි සමෘද්ධිය දුන්නේ. මම නිදර්ශනයක් කියන්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වයඹ සංවර්ධන ඇමති හැටියට මීට මාස එකහමාරකට කලින් මම දිසා ලේකම්ලා, ඒජීඒලා ඔක්කොම කැඳෙව්වා. මම ගල්ගමුව ඒජීඒ ගෙන් ඇහුවා, පසුගිය අවුරුදු විස්සේ සමෘද්ධි වැඩ පිළිවෙළ තුළින් රටේම ජනතාවගේ සල්ලි බිලියන ගණනක් දීලා පවුල් කීයක් ධනවත් කරලා සමෘද්ධි දීමනා ලැයිස්තුවෙන් අයින් කළාද කියලා. අනේ, නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු විසි ගණනටම සමෘද්ධි දීමනා ලැයිස්තුවෙන් අයින් කර තිබෙන්නේ පවුල් සියයයි. අපි අපේ හදවතින් අහමු. අපි මේ අයගේ ආර්ථික දියුණුවට වැඩ පිළිවෙළක් ඇති කළා ද? නැහැ. ඒ මුදල දුන්නා මිසක් එහෙම දෙයක් කළේ නැහැ. චීනයේ කියමනක් තිබෙනවා, "මාළුවා කන්න දෙන එක නොවෙයි, මාළුවා අල්ලාගන්න බිලී පිත්ත දෙන්න ඕනෑ" කියලා. වයඹ සංවර්ධන ඇමති හැටියට මම ඒ වැඩ පිළිවෙළයි -ආර්ථිකය දියුණු වෙන වැඩ පිළිවෙළයි- ක්‍රියාත්මක කරන්නේ. මම වයඹ ප්‍රධාන ඇමති විධියටත් එහෙමයි කළේ. අපි මේ රටේ ජනතාවට සහනාධාර දෙනවා කියලා ඡන්ද ගුංඩුවක් දෙන්නේ නැහැ කවදාවත්. ඒක නොවෙයි අපේ අරමුණ වෙන්න ඕනෑ. අපේ අරමුණ වෙන්න ඕනෑ ජනතාව ආර්ථික වශයෙන් නැඟිට්ටවන එක.

අපි දැන් අඹ ගම්මාන ඇති කරන්න යනවා. ඒ ගැන සැලසුම් හදනවා විතරක් නොවෙයි, ඒවා ක්‍රියාත්මක කරනවා. ඒ ගම්මාන තුළින් එක පවුලක් නොවෙයි, ගම්මාන ගණනාවක් දියුණු කරනවා. මම එදා ප්‍රධාන ඇමති හැටියට හිටපු කාලයේත් කළේ එහෙමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අය වැය ලේඛනයෙන් හැම අංශයක්ම දියුණු කිරීමේ වැඩ පිළිවෙළවලට මුදල් දීලා තිබෙනවා. ගම් දියුණු කිරීමේ වැඩ පිළිවෙළට විශාල මුදලක් දීලා තිබෙනවා. මන්ත්‍රීවරයෙකුට දුන්නේ ලක්ෂ සියයයි පසුගිය රජය කාලයේ. මිලියන 200ක් දුන්නා ගිය අවුරුද්දේ. මේ අවුරුද්දේ මිලියන 300ක් දෙනවා. අපි ඒවාට සැලසුම් හදා තිබෙනවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
අපටත් දෙනවාද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒවා ඕනෑ නම් මේ පැත්තට එන්න. ආවොත් දෙනවා. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] ආවොත් දෙන්නම්. බොහොම ආදරයෙන් දෙන්න පුළුවන්. ආවොත් දෙනවා.

දරුවන්ට රක්ෂණ ක්‍රමයක් ගෙනාවේ කවුද? ඒ රක්ෂණ ක්‍රමය තුළින් දරුවාට විතරක් නොවෙයි, අම්මාට තාත්තාටත් පෞද්ගලික රෝහලකින් ප්‍රතිකාර ගන්න පුළුවන්.

අපි දරුවන්ට වෘත්තීය අධ්‍යාපනය දෙන්නයි යන්නේ. ඇයි ඒ? වෘත්තීය අධ්‍යාපනය ඕනෑ. නැත්නම් අද උපාධියක් අරගෙනත් මොකද වෙන්නේ? අපි ඔක්කෝම දේශපාලනඥයන් මේ වරදට වුදිතයෝ. නිදහස් අධ්‍යාපනය ඇති කළේ කවුද? සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා, යූඑන්පීයෙන්. මහපොළ ශිෂ්‍යත්වය ගෙනාවේ කවුද? මහපොළ ශිෂ්‍යත්වය ගෙනාවේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ

රජය කාලයේදී. එදා මහපොළ ශිෂ්‍යාත්වයෙන් රුපියල් 2,500යි ගෙව්වේ. 2015 වසරේ බලයට පත් වූ මෛත්‍රී-රනිල් රජය කිව්වා, අපි මහපොළ ශිෂ්‍යාත්වය රුපියල් 5,000ක් කරනවා කියලා. 2015දී පිහිටු වූ මේ රජය යටතේ මා ආහාර සුරක්ෂිතතාව ඇමති විධියට පත් වුණා, සමුපකාරත් ඇතුළුව. මටයි ඒ ගැසට් එක අදාළ වුණේ. ඒ කමිටුවේ සභාපති විධියට සිටියේ අපේ අග්‍රවිනිශ්චයකාරතුමායි. මහපොළ දීමනාව වශයෙන් රුපියල් 5,000ක් අද අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ගෙවනවා. මට කියන්න, ලෝකයේ කොයි රටේද එහෙම දෙන්නේ? මට කියන්න, ලෝකයේ කොයි රටේද පළමුවෙනි ශ්‍රේණියේ ඉඳලා විශ්වවිද්‍යාල අධ්‍යාපනයට එනතෙක් නිදහස් අධ්‍යාපනය දෙන්නේ කියලා?

ලංකාවේ සුබසාධන කටයුතු සහ සෞඛ්‍ය සේවය දිහා බලන්න. වකුගඩු රෝගීන්ගේ ඖෂධවලට අද කවුද සම්පූර්ණ වියදම දරන්නේ? ඒ සම්පූර්ණ වියදම දරන්නේ රජයේ රෝහලෙන්. පිළිකාවක් හැදුණොත්, එහෙමත් නැත්නම් හදවත් රෝගයක් හැදුණොත් රජයේ රෝහලක් මඟින් රුපියල් ලක්ෂ 200ක් දක්වා වියදම් කිරීමට සෞඛ්‍ය ඇමති රාජිත සේනාරත්න ඇමතිතුමා යෝජනා කර තිබෙනවා. එහිදී දුප්පත්, පොහොසත් කියලා භේදයක් බලන්නේ නැහැ. පොහොසත් කෙනාට වඩා දුප්පත් කෙනාට රජයේ රෝහලෙන් මේ සුබසාධනය සැලසෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මේ විධියට අපි බලන්නේ ඇයි? මනුස්සකම නිසා. ඒක අපේ ආගම තුළින් ආපු ආභාෂයක්.

අනුරාධපුරයේ -රජරට ප්‍රදේශයේ- ඉන්න ගරු මන්ත්‍රීතුමෙක් වන එස්.සී. මුතුකුමාරණ මැතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ඒ ප්‍රදේශත් අපි දියුණු කරනවා. දේශගුණික විපර්යාස ඇති වුණාට අපි ඒවා නිදහසට කාරණයක් කර ගන්නේ නැහැ. අපි ජලාශ ඇති කරනවා. අපි දැදුරු ඔය, මා ඔය සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ගෙනෙනවා.

නියෝජ්‍ය කථානායකතුමනි, සඳලංකාවේ "යකා බැඳි ඇල්ල" කියලා එකක් තිබෙනවා. ගෝඨයිම්බර යෝධයා මාඔයෙන් එහාට වතුර ගෙනියන්න මාඔය හරහා ගල් බැම්මක් හැදුවා. එදා කොන්ක්‍රීට් තිබුණේ නැහැ. ඒ බැම්ම දැන් කැඩිලා. අද එතැන ඔක්කෝම තිබෙන්නේ මහා ගල්. වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ක එකතු වෙලා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 200ක් ඒ සඳහා ලබා ගන්න මම කටයුතු කරනවා. ඒ සඳහා අමාත්‍යාංශයේ ලේකම්තුමා මැනිලා නුවරට යනවා කිව්වා මාර්තු මාසයේ. ගිහිල්ලා ඒ ගැන කථා කරලා එනවා. මහා යාය කිව්වේ මේ යකා බැඳි ඇල්ල සම්බන්ධ යායට. මාකඳුරේ වැවේ ඉඳලා හලාවත, පුත්තලම, වෙන්නප්පුව, නාත්තන්ඩිය, බිංගිරිය ප්‍රදේශවල ගොඩ මඩ අක්කර 30,000කට විතර ජලය ගෙනියනවා. අද මා ඔයේ ජලය සියයට 99.9ක්ම යන්නේ මුහුදට. එක්සත් ජාතික පක්ෂ රජයක් කටයුතු කරන්නේ මේ විධියටයි. රටක් හදන්න දේශපාලන ඇහැකින් නොවෙයි බලන්න ඕනෑ. "Enterprise Sri Lanka" තුළින් රුපියල් මිලියන 300ක් අපට දීලා තිබෙනවා. මේවා ඔංචිල්ලා හදන්න නොවෙයි, ගම හදන්න, පවුල හදන්න, පුද්ගලයා හදන්නයි. අපි මොනවාද කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මුදල්වලින් තිබෙන මිනිහා නැඟිට්ටවන එක නොවෙයි කරන්න ඕනෑ. ගමේ ඉන්න තරුණ තරුණියන් බංකු උඩ කාලය ගත කරන එකෙන් වළක්වා යම් කිසි ව්‍යාපාරයකට අපි ඔවුන් යොමු කරනවා. මම බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන ඇමති විධියට වයඹ හැම ආසනයකම 'චේම්බර්' එකක් ඇති කරනවා. ඒ මුදල් ඔක්කෝම ඒ චේම්බරයට ගන්නවා. අරගෙන, "Enterprise Sri Lanka" තුළින් අපි තරුණ තරුණියන් සහ ව්‍යාපාරිකයන් සංවර්ධනයට යොමු කරනවා. ඊයේ මගේ නිල කාමරයේදී දයා ගමගේ ඇමතිතුමා එක්ක මේ සම්බන්ධයෙන් කතා කළා. අපි හදනවා, අපනයන ගම්මාන. දයා ගමගේ ඇමතිතුමා කිව්වා පැළ 20,000ක් පවුල්වලට දීලා ග්‍රාම සංවර්ධනය ව්‍යාප්ත කරනවා කියලා. මුරුංගා ගහේ කොළ ඉල්ලනවා, පිටරටට. අන්න මාදම්පේ ඉන්නවා ජීවක කියලා ඩොක්ටර් කෙනෙක්. එතුමා GMOA එක එක්ක වර්ජනය කරන කෙනෙක් නොවෙයි. එතුමාගේ ෆැක්ටරි 13ක් තිබෙනවා. මුරුංගා කොළ අපනයනය කරනවා. මගෙන් ඉල්ලනවා, කන්ටේනර් ගණන්. එහෙම නම් අපි ඒක ව්‍යාප්ත කරන්න ඕනෑ. දෙහි කොළය ඉල්ලනවා; මුරුංගා කොළය ඉල්ලනවා; කරල ඉල්ලනවා. ඒවායේ high protein තිබෙනවා. අනෝදා වාගේ දේවල් පැවිල්ලට හරියන දේවල්. ඒවා යම් කිසි කළමනාකරණයක් ඇතිව යම් කිසි සැලැස්මක් අනුව වගා කළ යුතුයි. අපි මිනිස්සු රවටන්න නොවෙයි, පැහැදිලි වැඩ පිළිවෙළකට යන්න ඕනෑ.

ඒ වාගේමයි පශු ගම්මාන.

අපේ මිත්‍ර ගරු පී.හැරිසන් ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතට කෘෂිකර්ම, වාරිමාර්ග මේ ඔක්කෝම අයත් වෙනවා. ඔබතුමන්ලාගේ කාලයේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ගිවිසුමක් ගහලා New Zealand Jersey ගවයින් ගෙන්නුවා. 1980 කාලයේ මගේ නෝනා Jersey ගවයෙකු ගත්තා. අනේ! ඇට කටු ටික විතරයි. කිරි ලීටර් දෙකක්වත් ගන්න බැහැ. දැන් අපේ ආණ්ඩුවක් ඇවිල්ලා තිබුණත්, ඒ ගහලා තිබෙන ගිවිසුමේ හැටියට මේක නවත්වන්න බැහැ කියලා හැරිසන් ඇමතිතුමා මට කිව්වා. මම කැබිනට් එකේදී ජනාධිපතිතුමාට කිව්වා, "සර්, ගෙනෙන්න එපා" කියලා. ඒ New Zealand Jersey ගවයින් හරි යන්නේ නුවරඑළියට විතරයි. ගමේ අයට වැඩක් නැහැ. මේක නැවැත්තුවා නම් ඩොලර් මිලියන 800ක් වන්දි ගෙවන්න අපට සිද්ධ වෙනවා ලු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳයි. මම එම ගිවිසුමට අදාළ ලියවිලි ගරු පී. හැරිසන් ඇමතිතුමාගෙන් ඉල්ලා තිබෙනවා, ගිවිසුමත් එක්ක. බැසිල් රාජපක්ෂ මහත්මයා අත්සන් කරපු ඒ ගිවිසුම මම සභාවට ගෙනෙනවා. මම දැනුත් කිව්වා, මට දෙන්න කියලා. මම කවුරුවත් විවේචනය කරනවා නොවෙයි. අපේ අය වුණත් කමක් නැහැ, හොරකම් කර තිබෙනවා නම්; වංචා කර තිබෙනවා නම් අධිකරණය ඉදිරියට ගෙනෙන්න. මේ පාර්ලිමේන්තුව ශුද්ධ භූමියක් වෙන්න ඕනෑය කියන තැනයි මම ඉන්නේ. මම දේශපාලනයෙන් අයින් වෙන්නේ ඒ දේ සිද්ධ වුණාමයි. දෛනිකව නඩු ටික අහලා අවසන් කරන්න විශේෂ මහාධිකරණ තුනක් ඇති කරනවා කිව්වා. තවම එකයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ ඇයි කියලා මට තේරෙන්නේ නැහැ. මම ඒ ගැන ඊළඟ කැබිනට් මණ්ඩල රැස්වීමේ දීත් අහනවා. වැරදි කරන අය දෙපැත්තේම ඉන්න පුළුවන්. නමුත්, මේක පිරිසිදු භූමියක් වෙන්න ඕනෑ. ගරු

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

නියෝජ්‍ය කථානායකතුමනි, එදා මෙතුමන්ලා මිරිස්කුඩු ගහපු නිසා මගේ ඇසකට කාවයක් දමන්න සිද්ධවුණා. ඒ සිදුවීම් සම්බන්ධව දාලා තිබෙන පැමිණිලිවලට මොකද වෙන්නේ කියලා මා ඔබතුමාගෙන් අහනවා. ඒ සම්බන්ධයෙන් නඩු දමන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කථානායකතුමා ඒකට අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
පියවර ගන්න ඕනෑ. නීතිය තිබෙන්නේ ගමේ පොඩි මිනිහාට විතරක් ක්‍රියාත්මක වෙන්න නොවෙයි. මෙතැන ඉන්නේ විශේෂ වරප්‍රසාද ලබන පන්තියක් නොවෙයි. මේකේ ඉන්නේ ජනතාව පත් කරලා එවන අය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් නීති සම්පාදනය කරන මෙතැනින් ආදර්ශයක් දෙන්න බැරි නම්, ගමේ මිනිහාගෙන්ද අපි ඒක බලාපොරොත්තු වන්නේ? ඒ නිසා වැරදි කරන අයට එරෙහිව නඩු දමන්න ඕනෑ. මම ඒක බලාපොරොත්තු වෙනවා. මම පැමිණිලි කර තිබෙනවා. මම ගරු කථානායකතුමාටත් ඒක කිව්වා. ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමාත් ඒ වෙලාවේ හිටියා. නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. අන්න එතකොට විනයක් හැදෙනවා. අධිකරණය ඒක පෙන්නුවා. ජනාධිපතිතුමා විසින්ම පත් කළ තුන්දෙනකු ඉන්න, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලේ හත් දෙනාම කිව්වා, "නීති විරෝධී ආණ්ඩුවක් පත් කළේ" කියලා. අන්න, ස්වාධීන අධිකරණයක් ඇති වෙලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය, ශිරාණි බණ්ඩාරනායක මහත්මිය මම වයඹ පළාතේ ප්‍රධාන ඇමති කාලයේ මට උදව් කළ කෙනෙක්. එතුමිය එවකට නීති විද්‍යාලයේ විදුහල්පතිනිය. පරිසර පනත් හදන්න එතුමිය මට උදව් වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳයි, තව තත්පර කිහිපයක් දෙන්න.

එතුමියට මොකද වුණේ? බැසිල් රාජපක්ෂ උන්නැහේ ගෙනාපු දිවිනැගුම පනත් කෙටුම්පත දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය ඒක ප්‍රතික්ෂේප කළාම, අනේ! අයියා ජනාධිපති නිසා මල්ලි බලය පාවිච්චි කරලා එතුමියව මෙහෙට ගෙනැල්ලා ප්‍රශ්න කරලා පැය අටෙන් සේවයෙන් නෙරපුවා. මම දැක්කා, එතුමිය ආපු හැටි. එතුමිය ඉතා නිහතමානී කෙනෙක්. එක දවසක් අපේ කොළඹ ගෙදරට ආවා. එතුමිය ආවේ ත්‍රීවීලර් එකකින් එතකොට නීති විද්‍යාලයේ විදුහල්පතිනිය. මම ඇහුවා, "ඔබතුමිය දැන් යන්නේ කොහොමද?" කියලා. "මම ආවේ ත්‍රීවීලර් එකක. ත්‍රීවීලර් එකකම නැඟලා යනවා" කියලා කිව්වා. බලන්න, ඔන්න ඕකයි තත්ත්වය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටේ නීතිය යුක්ති සහගතව ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගරු මංගල සමරවීර ඇමතිතුමා මෙවර ගෙනාවේ තනි එක්සත් ජාතික පක්ෂයේ මංගල අය වැයයි කියලා මම කියනවා. මේක තුළින් අපි රට හදනවා; රටේ දුප්පත්කම නැති කරනවා; ආර්ථිකය දියුණු කරනවා. අපේ අරමුණ ඒකයි. මේ රට ලෝකයේ සංචාරකයින්ගේ පාරාදීසයක් බවට පත් කරනවා. වංචා, දූෂණ, මත් කුඩු, මත්ද්‍රව්‍ය ඔක්කෝම නැති කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු තිලක් මාරපන මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Tilak Marapana -Minister of Foreign Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

[පූ.භා.11.30]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ අය වැය ලේඛනය සම්බන්ධව දැනට විශාල සාකච්ඡාවක් රට තුළ සිද්ධ වෙමින් තිබෙනවා. ඒ ගැන දැනට ගොඩක් කථා කර තිබෙනවා. අද ජාත්‍යන්තර කාන්තා දිනය.

ඒ වගේම අය වැය කථාවේ දී මංගල සමරවීර මුදල් ඇමතිතුමා කියලා තිබෙනවා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් - gender-responsive - අය වැයක් විධියටයි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ කියලා. ඒක වැදගත් කියා මම හිතන නිසා, ඒ පැත්ත ගැන වැඩිපුර අවධානයට ලක් වී නොමැති නිසාත්, ඒ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන අද දවසේ මුලින්ම ශ්‍රී ලාංකික දියණියකගේ දක්ෂතාවන් පිළිබඳ සඳහන් කරන්න මා කැමතියි. ශ්‍රී ලාංකික පවුලක දියණියක් වන නිශා උග්ගල්ල බ්‍රිතාන්‍යයේ දීප්තිමත්ම ශිෂ්‍යාව බවට පත් වී තිබෙනවා. මම ඇයගේ දක්ෂතාවන්ට සුබ ප්‍රාර්ථනා කරනවා. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගෙන හදපු අය වැයක් කියන මේ අය වැය ඉදිරිපත් කර තිබෙන වේලාවේ මේ පිළිබඳවත් සඳහන් කරන්න මා කැමැතියි. ඇය විසින් සනිටුහන් කරලා තිබෙනවා, "පිරිමියා සහ ගැහැණිය කියන වෙනස හැමදේටම ඉස්මතු කර ගන්න ලෝකයක්, සමාජයක් අපට තිබෙන්නේ. එහෙම වකවානුවක ස්ත්‍රී පුරුෂභාවය මත

මිනිසුන්ගේ දක්ෂතා, හැකියාවන්වල වෙනසක් වෙන්නේ නැහැ" කියලා.

ඒ එක්කම අද තව විශේෂත්වයක් තිබෙනවා. මගේ අම්මාගේ උපන් දිනයත් යෙදී තිබෙන්නේ අදයි. මේ අය වැය මංගල සමරවීර මැතිතුමා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගෙන හැදුවා කියා කියන නිසා මම ඒ පැත්තෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අය වැයෙන් ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය ගැන කථා කරනවා. මංගල සමරවීර ඇමතිතුමා මෙම අය වැය ලේඛනයේ පිටු එකහමාරක පමණ ස්ත්‍රීන්ගේ ප්‍රශ්න පිළිබඳව, එහෙම නැත්නම් ස්ත්‍රිය මුල් කරගත් ප්‍රතිපත්ති සකස් කිරීමට උත්සාහ කර තිබෙන එක අපි අගය කරනවා. IMF එකේ ප්‍රධාන විධායක නිලධාරිනිය වන ක්‍රිස්ටියන් ලගාඩ් මහත්මිය gender-based නැත්නම් gender-responsive විධියට මේ අවුරුද්දේ අය වැය හදන්න කියලා සඳහන් කරලා තිබෙනවා මම දැක්කා. සමහර විට මංගල සමරවීර මැතිතුමා ක්‍රිස්ටියන් ලගාඩ් මැතිනියගේ අදහස් පදනම් කරගෙන මේ අය වැය හැදුවා වෙන්නත් පුළුවන්. ඒකේ ප්‍රශ්නයක් නැහැ. IMF එක කියන අනෙක් ඒවා නම් හොඳ නැහැ. අඩු ගණනේ gender-based පදනම් කරගෙන මෙම අය වැය සකස් කිරීමට උත්සාහ කිරීම අපි අගය කරනවා. නමුත් එතුමා මේ අය වැයේ එහෙම සඳහන් කරලා තිබුණාට, සැබෑ ලෙසම කාන්තාවන්ට අදාළව ගත්තොත් එතුමා ප්‍රායෝගිකව ඉදිරිපත් කරලා තිබෙන්නේ මොනවාද කියන ප්‍රශ්නය තිබෙනවා.

එතුමා මාධ්‍ය ඇමතිවරයා නිසා පසුගිය අය වැය නීල හරිත කියලා ගෙනාවා. ඒ කියන්නේ පරිසරය සංරක්ෂණය කරන්න ඕනෑ කියන ඉතා වැදගත් අදහස ගෙනාවා. පසුගිය අවුරුද්දේ නීල හරිත කියලා අය වැයක් ගෙනාවාට, මේ අවුරුද්දේ අය වැයේ නීල හරිත කියන වචනයවත් නැහැ. ලංකාව දැන් සම්පූර්ණයෙන්ම සොබා දහම සම්බන්ධ ගැටලු විසඳලාද? එතුමා මුදල් ඇමතිවරයා වශයෙන් මාධ්‍ය ඇමතිවරයාගේ කාර්ය භාරය තමයි වැඩිපුරම කරන්නේ කියන එකයි මට හිතෙන්නේ. [බාධා කිරීමක්] ඔව්. එතුමා එක එක අවුරුද්දට propaganda පැත්තෙන් එක එක මාතෘකා දමනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සම්බන්ධව එකිනෙක ගෙන පෙන්නුම් කරන්නම්. පළමුවැනි කරුණ තමයි, අද අපේ රටේ කාන්තාවන් - දෙමවුපියන් කවුරුත් - මුහුණ දෙන විශාල ප්‍රශ්නයක් තමයි දරුවන් රැක බලා ගැනීම සහ ඔවුන් හදා වඩා ගැනීම පිළිබඳ ප්‍රශ්නය. ලෝකයේම කාන්තාවන්ට වෘත්තීයමය වශයෙන් ඉදිරියට යන්න බැරි ප්‍රධානම හේතුවත් මේකයි. ශ්‍රම බලකායට එන්න බැරි හේතුවත් මේකම තමයි. ශ්‍රම බලකායට ඇතුළත් වෙලා ඉදිරියට යන්න බැරි හේතුව ගත්තොත්, දරුවන් රැක බලා ගැනීම; ඇති දැඩි කිරීම තනිකර කාන්තා විෂයයක් බවට කාන්තාවනුත් හිතනවා; පිරිමිත් හිතනවා; රටත් හිතනවා. එහි යම් කිසි විශේෂ තත්ත්වයක් තිබෙනවා කියන එක මම පිළිගන්නේ නැතිව නොවෙයි. නමුත් එය සම්පූර්ණයෙන්ම කාන්තාවන්ට අදාළ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, budgeting කරලා තිබෙන්නේ gender-responsive විධියට නම්, දරුවන් රැක බලා ගැනීම සහ හදා වඩා ගැනීම කියන්නේ කර්මාන්තයක්; සේවාවක්. එසේ කරන සේවාවන් කිහිපයක් අපේ රටේ තිබෙනවා.

එමගින් දළ ජාතික නිෂ්පාදිතයට එකතු කරන මුදල, එය ගණනය කිරීමේදී සේවා ක්ෂේත්‍රයක් විධියට එකතු වෙනවා. ඒ කියන්නේ, day care centre එකක් තිබුණොත් ඒකෙන් ලැබෙන ආදායම්, ඒ සඳහා කරන වියදම් -එයින් කෙරෙන දායකත්වය- අනිවාර්යයෙන්ම දළ ජාතික නිෂ්පාදනය ගණනය කිරීමේදී එකතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ වාගේම ලංකාවෙත් දරුවන් රැක බලා ගැනීම සහ ඔවුන් ඇති දැඩි කිරීම පිණිස කරන්නා වූ සියලු දේවල් -ඔවුන්ට කවන පොවන ඒවා, ඔවුන් ගෙන යන ඒවා, ඔවුන් රැකබලා ගන්නා ඒවා සියල්ලම- ගත්තොත්, එයින් සියයට 85කට වඩා ආර්ථිකයට ගණනය වෙන්නේ නැහැ. ගෙවල්වල අම්මලා, ආත්තම්මලා, නැන්දලා තමයි ඒ දේවල් කරන්නේ. එක රුපියලක්වත් ගෙවන්නේ නැතිව - unpaid - තමයි ඒ අය ඒ කටයුතු කරන්නේ. ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. ගෙදර ඉන්න ඒ අයට ඒ සේවය වෙනුවෙන් ගෙවන්නය කියා කිව්වොත්, මම හිතන්නේ නැහැ ඒවා වෙයි කියා. වැඩ කරන අයටත් ගෙවන්නේ නැති පාලනයක් නේ තිබෙන්නේ. දරුවන් රැක බලා ගැනීම ආර්ථික කටයුත්තකුත් වෙනවා. ඒකට ගෙවීමක් නැතිවයි මේ කාන්තාවන් එය කරන්නේ. 2019 අවුරුද්ද අවසානයේ ඔබතුමන්ලාට අය වැයක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබුණොත්, සැබෑ ලෙසම එම අය වැය gender-responsive ලෙස ඔබතුමන්ලා ඉදිරිපත් කරන්න සිතනවා නම්, අඩුම ගණනේ ගෙවල්වල සිටින මේ අම්මලා, ආත්තම්මලා, නැන්දලා ඇතුළු මේ කාන්තාවන් දරුවන් රැකබලා ගැනීම මගින් ආර්ථිකමය වශයෙන් කොපමණ දායකත්වයක් ආර්ථිකයට එකතු කරනවාද කියන ඉලක්කම රටට කියන්න; ඒක අය වැයට ඉදිරිපත් කරන්න. එතකොට, අන්න ඒ හා සමාන මුදලක් කාන්තාවන්ට එරෙහිව තිබෙන අසමානතාව දුරු කරන්න වෙන වෙන අංශවලටත් වෙන් කරන්න කියා අපි ඔබතුමන්ලාට යෝජනා කරනවා.

ලෝකයේ උද්ඝෝෂණය තිබෙන්නේ ඒ ගෙදර කරන දෙයට ගෙවන්න කියායි. “මොකද කරන්නේ?” කියා රැකියාවක් නැති සමහර කාන්තාවන්ගෙන් ඇහුවාම, ඒ අය කියනවා, "මොනවත් නැහැ" කියා. හැබැයි, ඒ කාන්තාවන් ගෙදරට වෙලා රැකියා 25ක් විතර කරනවා. නමුත් කාන්තාව කියන්නේත්, "රක්ෂාවක් කරන්නේ නැහැ, නිකම් ඉන්නවා" කියායි. එහෙම නොවෙයි, අඩුම ගණනේ ඇයගේ අසමානතාව වෙනස් කරන්න මේ ගණනය කරලා එන මුදලවත් යොදා ගන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, ඔබතුමන්ලා "Gender-based Budgeting" කියන එකේ දමා තිබෙනවා, ශ්‍රම දායකත්වය අඩුයි කියලා. ලෝකයේම අඩුයි; ලංකාවෙත් අඩුයි. නමුත්, ලංකාවේ එක හොඳක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාලවල සියයට 73ක් ගැහැනු ළමයි තමයි ඉන්නේ; අවුරුදු 20න්, 21න් විශ්වවිද්‍යාලවලට එන ළමයින්ගෙන් සියයට 73ක් ගැහැනු ළමයි. මේ ගොල්ලන්ට අවුරුදු 35 වෙනකොට මොකද වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මම අද සොයා බලන ලද ආකාරය නිවැරැදියි නම්, දැනට අමාත්‍යාංශ ලේකම්වරු 30දෙනෙක් ඉන්නවා. ඒ 30දෙනා අතරේ එකම ලේකම්වරියයි ඉන්නේ. මම දන්නා දෙයක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තොත්, වැඩිපුර ඉන්නේ වෛද්‍යවරියන් සහ හෙදියන්. උපස්ථාන සේවාවේත් වැඩිපුර ඉන්නේ කාන්තාවෝයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සියයට 80ක් විතර ඉන්නේ කාන්තාවන්. නමුත්, ඉහළට යනකොට ඒ තත්ත්වයට මොකද වෙන්නේ? මා දන්නා තරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ තනතුරු 80කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මගේ දැනීමේ හැටියට ඉන් දහයකවත් කාන්තාවෝ නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්තව සිටින 250,000ක් පමණ වන ගුරුවරුන්ගෙන් ලක්ෂ දෙකකට වඩා කාන්තාවන්. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේත් ඉහළ තනතුරුවලට යනකොට කාන්තාවන් නැහැ. අපි ඒකයි කියන්නේ. ඔබතුමන්ලා කියා

[ගරු බිමල් රත්නායක මහතා]

තිබෙනවා, සමාගම් අධ්‍යක්ෂවරියන් ප්‍රමාණය වැඩි කරන්නය කියා. සමාගම් අධ්‍යක්ෂවරියන් වෙන්න පුළුවන් ප්‍රමාණය අද අඩුයි. ඒක කරන්න. අපි ඒකට විරුද්ධ නැහැ. නමුත්, සමාගම් අධ්‍යක්ෂවරියන් වෙන්නේ යම්කිසි වරප්‍රසාදිත පවුල්වල ගැහැනු අයයි. ඒක ඔවුන්ට දෙන්න; කමක් නැහැ. නමුත්, ඊට වඩා වැදගත් වෙන්නේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ඉහළට යන සාමාන්‍ය කාන්තාවන් බොහෝදෙනෙකුට තිබෙන ප්‍රශ්නය තමයි, ඔවුන්ට දරුවන් රැක බලා ගැනීම වෙනුවෙන් තමුන්ගේ වෘත්තීය අනාගතය කැප කරන්න වෙලා තිබෙන එක. මේක ආර්ථික පැත්තෙන් බලන්නේ. මනුෂ්‍යත්වය පැත්තෙන්ම පමණක් මේ ප්‍රශ්නය දිහා බලලා හරි යන්නේ නැහැ. අද ස්ත්‍රී පුරුෂ සමානතාව කියන කාරණය ආර්ථිකමය වශයෙන් ගන්නවා. ස්ත්‍රී පුරුෂ සමානතාව වැඩිපුර තිබෙන ආයතනවල ලාභ වැඩියි; කාර්යක්ෂමතාව වැඩියි. එවැනි රටවල කාර්යක්ෂමතාව වැඩියි. අප්‍රිකාව ගණනය කර තිබෙනවා, ස්ත්‍රී පුරුෂ සමානතාව අඩු ගණනේ සියයට 80කට ගෙනෙන්න පුළුවන් නම්, තමන්ගේ රටේ ආර්ථික වර්ධනය සියයට 34කින් වැඩි වෙනවාය කියා. ඔබතුමන්ලාට එච්චර ලොකු වැඩ කරන්න බැහැ. අඩුම ගණනේ මේ දරුවන් රැක බලා ගැනීම පිළිබඳ ප්‍රශ්නයටවත් විසඳුමක් ඕනෑ. ඒ සඳහා day care centres ආරම්භ කිරීමට "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ණය දෙනවාය කියලා ඔබතුමන්ලා මේ අය වැය ලේඛනයේ කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුළු අය වැය ලේඛනයේම මැක්කා වාගේ ඉන්නේ, "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" කියන වැඩසටහනයි. ලංකාවේ ලොකුම ආයතනය ඒකයි. මේ වැඩ ටික කරන්න නම් අඩුම ගණනේ සේවක - සේවිකාවන් 50,000ක්වත් දමන්න ඕනෑ. "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" නෙවෙයි, පාර්ලිමේන්තුවෙන් පටන් අරගෙන, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පටන් අරගෙන, මුදල් අමාත්‍යාංශයෙන් පටන් අරගෙන අපි මෙන්න කටයුත්ත කරන්න ඕනෑ. Day care centres පටන් ගන්න. ඒකත් හොඳයි. හැබැයි, day care centres ආරම්භ කිරීම පමණක්ම නොවෙයි, මෙන්න මේ කටයුත්ත අපට විධායක ශ්‍රේණිවල සිටින කාන්තාවන්ගෙන් පටන් ගන්න පුළුවන්; අමාත්‍යාංශවල අධ්‍යක්ෂවරියන්ගෙන්, ස්ථිර ලේකම්වරියන්ගෙන්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඉහළ නිලධාරිනියන්ගෙන් පටන් ගන්න පුළුවන්.

වෘත්තීය මට්ටමින් ඉහළ තැනකට පැමිණි කෙනෙක් වුණත් ඒ අය දරුවන් රැක බලා ගැනීම වෙනුවෙන් දරන්න ඕනෑ පිරිවැයක් තිබෙනවා. අන්න ඒක compensate කරන්න; ඒක ගෙවන්න. මාතෘ නිවාඩු දෙන්නේ නැති සමාගම්වල සේවය කරන සේවිකාවන්ට පඩියක් ගෙවනවා. ඒක මානුෂික අර්ථයෙන් හොඳ වුණාට සමාගම කරන්නේ අමනුස්ස දෙයක්. ඔබතුමන්ලා රජයේ බදු මුදල් සමාගම්වලට දෙනවා. මාතෘ නිවාඩු කාන්තාවන්ට හිමියි කියා රටේ නීතියක් තිබෙනවා. ඒක දෙන්නේ නැති සමාගම්වල සේවය කරන කාන්තාවන්ට රුපියල් 10,000ක් ගෙවනවා. කමක් නැහැ, එහෙම හරි දෙන්න. මම යෝජනා කරන්නේ මෙයයි. සමාගම්වලට ගෙවන්න පුළුවන් නම් ඒ අවස්ථාව අපේ අයටත් දෙන්න. ඉහළ තනතුරු දරන කාන්තාවන් දස දහස් ගණනක් මේ රටේ ඉන්නවාය කියා මම හිතන්නේ නැහැ. අඩු ගණනේ රාජ්‍ය අංශයෙන් හෝ පටන් ගන්න. ඔවුන්ට දරුවන් රැක බලා ගැනීම වෙනුවෙන් වෙනම දීමනාවක් දෙන්න. සියයට සියයක් උත්තර නැතත්, එහෙම තමයි ලෝකය මේ ප්‍රශ්නයට උත්තර හොයා තිබෙන්නේ.

මම මේ මාතෘකාව ගැන මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අවසාන වශයෙන් තව එක කරුණක් විතරක් කියන්න කැමැතියි. මේක කාන්තාවන් ඉලක්ක කර ගත්, නැත්නම් ස්ත්‍රී - පුරුෂ සමානතාව ගැන හිතලා ඉදිරිපත් කළ අය වැයක් කියා ඔබතුමන්ලා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, ලංකාවේ වැඩියෙන් අසංවිධානාත්මක රැකියා ක්ෂේත්‍රයේ ඉන්නේ ගැහැනු ළමයි බව; කාන්තාවෝ බව. වැඩිපුරම රැකියා අතර මාරු වෙන්නේ - job migration එක තිබෙන්නේ - කාන්තාවන් අතරයි. මොකද, එක්කෝ දුරයි; එක්කෝ හිරිහැරයි; නැත්නම් අපයෝජනයට ලක් වෙනවා. එහෙම නැත්නම් පඩි නැහැ; එක්කෝ ගණන් ගන්නේ නැහැ. මේ නිසා හොඳ job එකක් හම්බ වුණේ නැත්නම් ගැහැනු ළමයින්ගේ වැඩේම කසාද බඳින තුරු jobsවලින් මාරු වෙමින් ඉන්න එකයි. ඔබතුමන්ලා එක එක supermarketsවලට යනවා නේ. බලන්න, අද එතැන ඉන්න ගැහැනු ළමයා තව මාස දෙකකින් එතැන නැහැ. ඒකට හේතුව තමයි, ඒ ගොල්ලන් එක රැකියාවක ස්ථිර වෙන්නේ නැති එක. Informal sector එක විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේත් පහළ රැකියාවල ඉන්න කාන්තාවන්ගේ වැටුප් වැඩි වීම වෙනුවෙන් තමුන්නාන්සේලා එක සතයක් වෙන් කර නැහැ; සමාගම්වලට බලපෑමක් කරලාත් නැහැ.

රැකියා විරහිත උපාධිධාරින් අතරත් වැඩිපුරම ඉන්නේ කාන්තාවන්. රැකියා විරහිත උපාධිධාරින් කියලා ජාතියක් මේ ලංකාවේ ඉන්නවාය කියන එකවත් ඔබතුමන්ලා සලකලා නැහැ. එහෙම වචනයක්වත් අය වැයේ නැහැ. ආණ්ඩුවේ ආයතනවල ඇති වෙන්න පුරප්පාඩු තිබෙනවා. ඔබතුමන්ලා ඒවායේ කිසිම රැකියා ලබා දීමක් ගැන අය වැයේ සඳහන් කරන්නේ නැහැ. රුපියල් 1,000ක වැටුප් වැඩි වීමක් ඉල්ලා වතුකරයේ අය උද්ඝෝෂණය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ 140,000ක් වශයෙන් දැනට සිටින ස්ථිර සේවකයන්ගෙන් -මගේ දැනීමේ හැටියට- 111,000ක් විතර කාන්තාවෝ. ඔබතුමන්ලා ඒ ගැන කියා තිබෙන්නේ, "කථා කරලා උත්තර දෙනවා" කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, gender-responsive කියලා කිව්වාට ඒක තිබෙන්නේ පොතේ විතරයි. ප්‍රායෝගිකව මොකුත් කරලා නැහැ. මම ඒකයි කියන්නේ. මම නිෂේධනාත්මකව නොවෙයි මේ කියන්නේ. ඒක නිසා අනිවාර්යයෙන් පෞද්ගලික අංශයේ කාන්තාවන්ට, කම්කරුවන්ට නිශ්චිත අයිතිවාසිකම් ප්‍රමාණයක් නීතිගත කරන්න. ඔබතුමන්ලා හැම වෙලාවේම ඉල්ලනවා විතරයි. එහෙම කරන්නේ නැතිව තමුන්නාන්සේලා කියන ශ්‍රම බලකාය ගොඩ නඟන්න බැහැ. ඒක නිසා තමයි, "ඇබෑර්තු ඇත" කියා හැම දාම garment factories ඉස්සරහා බෝඩ් ගහලා තිබෙන්නේ. ගෙවල්වල ගැහැනු ළමයින් ඉන්නවා, රැකියා නැතිව. "ඇබෑර්තු ඇත" කියා garment factoriesවල බෝඩ් ගහලා තිබෙනවා. නමුත් ඔවුන් ඒ රැකියාවලට එන්නේ නැහැ. ඔබතුමන්ලා අනිවාර්ය වශයෙන්ම ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය, නිසි වැටුප්, අයිතිවාසිකම් එක්ක ඒ රැකියා දුන්නොත් මේ ගැහැනු ළමයි ගොඩාක් ඒ තැන්වලට යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට තවත් කරුණක් කියන්න කැමැතියි. ලංකාවේ වැඩියෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ණයවලින් විනාශ වෙලා තිබෙන්නේ කාන්තාවෝයි. ඒවා දෙන්නේත් කාන්තාවන්ට විතරයි. ගම්වල පුංචි සමිති හදන්නේ ගැහැනු අය එකතු කරලායි. "ලංකාදීප" පුවත්පතේ ඒ සම්බන්ධයෙන් තිබෙන වාර්තාවක් මම **සභාගත*** කරනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

එම වාර්තාවේ තිබෙනවා, "ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලින් ගිනි පොලියට ණය ගත් කාන්තාවන් 169ක් දිවි නසා ගෙන, ණය අය කර ගන්න අයුතු යෝජනා කරලා" කියා. ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි මේ ගැන පාර්ලිමේන්තුවේදී කථා කළා. මංගල සමරවීර ඇමතිවරයා මාස කිහිපයකට කලින්, මේ ගැන යම්කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරනවාය කියා කිව්වා; ඒ ණය කපනවාය කිව්වා, රුපියල් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක්. නමුත් ඔබතුමන්ලා ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ වෙලාවට යම්කිසි දෙයක් කිව්වාට, කරන්නේ නැහැ. කාන්තාවන් ගැන සලකා බලා ඉදිරිපත් කළ අය වැයක්ය කියා කිව්වාට, ඔවුන් සඳහා මොනවාද මෙහි ඉදිරිපත් කර තිබෙන්නේ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි අවස්ථාවක් දෙනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම මට තිබෙන්නේ කෙටි වෙලාවයි. ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙනවා නම් වඩාත් කැමතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මට තත්පර 10ක් දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි. තත්පර 10කින් කියන්නකෝ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඇත්තටම ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. ණය කපා හැර තිබෙනවා. අපි ඒ වැඩ පිළිවෙළ තවත් ඉදිරියට ගෙන යනවා. උතුරේ විතරක් නොව අනුරාධපුර ප්‍රදේශයේත් ඒ වැඩ පිළිවෙළ කරගෙන යනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා කිහිපයක් කර ඇති. මා ඉතා වග කීමෙන් කියනවා, වැඩ පිළිවෙළක් වශයෙන් මෙය ක්‍රියාත්මක වන්නේ නැහැයි කියා. ඒ නිසා කරුණාකර, මේ ගැන සොයා බලන්න.

මේ රටේ පීඩාවට ලක්වෙලා තිබෙන්නේ කාන්තාවන් පමණක් නොවෙයි. පිරිමි නොවන, ගැහැනු නොවන වෙනත් ලිංගිකත්වයන් ලෝකය පුරාම ජීවත් වෙනවා. පසු ගිය දවස්වල පාර්ලිමේන්තුවේ පුස්තකාලයේ තිබෙන "The Hindu" පත්‍රයේ පළ වූ ලිපියක් මා දැක්කා. ඒ ලිපියේ තිබුණේ මොකක්ද? අපට වඩා පසුගාමී ඉන්දියාවේ තමිල්නාඩුවේ State Government එක ව්‍යාපාර පටන් ගන්න transgender communitiesවලට ලක්ෂ 20 සිට ලක්ෂ 50 දක්වා ණය දෙනවාය කියා ඒ ලිපියේ තිබුණා. මොකද, gender-based කිව්වාම එයට හැම කෙනාම අයිතියි. ඒ නිසා ගරු රාජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාට කියන්න කැමැතියි ඔබතුමන්ලාට ලොකු වැඩ කරන්න බැරි නිසා අඩු ගණනේ එවැනි දේවල් කරන්න හිතන්න, රුපියල් මිලියන 100ක්, රුපියල් මිලියන 200ක් යොදවා කරන්න පුළුවන් දේවල් කරන්න කියා.

අපේ මන්ත්‍රීතුමා දැන් මට කියනවා, ඔබතුමන්ලා කාන්තාවන් ගැන කථා කළාට, -මෙය පාර්ලිමේන්තුවට අදාළ දෙයක්.- පාර්ලිමේන්තුවේ මාධ්‍යවේදිනියන් සඳහා තිබුණු විවේක කාමරයත් වසා දමා තිබෙනවාය කියා. ඒ විවේක කාමරය විවෘත කර දෙන්නය කියා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මාධ්‍යවේදිනියන්ගෙන් මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මා මේ කාරණයත් කියන්න හිතාගෙන හිටපු දෙයක්. අවසාන කරුණ වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් කියන්න කැමැතියි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මා ඉල්ලා සිටිනවා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ආර්ථික ප්‍රතිපත්තියක්, gender-based budgeting එකක් හදනවා නම්, එය රජයේ ආයතනවලටත් යෝජනා කරන්නය කියා. ඒක ආණ්ඩුව විතරක් හැදුවාට වැඩක් නැහැ. ඒක පෞද්ගලික අංශයේත් තිබෙන්න ඕනෑ, ඒක රාජ්‍ය අංශයේත් තිබෙන්න ඕනෑ, තමන්ගේ ආයතනයේ budgetingවලදී බලන්න.

අනික් පැත්තෙන්, මිනිසුන්ගේ ඔළු ශුද්ධ කරන්න. කාන්තාවකට මොනවා හෝ වුණාම ඉතාම කුණු ආකාරයටයි, ඉතාම කළු ආකාරයටයි ඒ පිළිබඳව මාධ්‍ය වාර්තා කරන්නේ. මෑත කාලයේ වෛද්‍යවරියකගෙන් රිය අනතුරක් සිදු වුණු වෙලාවේ ඒ රිය අනතුර පිළිබඳව, එතුමියගේ ඇඳුම් පැළඳුම් පිළිබඳව ඉතාම පහත් මට්ටමින් තමයි වාර්තා කළේ. මාධ්‍යවේදිනියන්ට විවේක කාමරය දෙන්නය කියා ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටින ගමන්ම, මා බොහොම නිහතමානීව, බොහොම ගරුත්වයෙන් මාධ්‍යවේදිනියන්ගෙන් අහන්න කැමැතියි, මාධ්‍යවේදිනියන්ගේ පැත්තෙන් ඒ වාර්තාකරණයේදී ඔබතුමියන්ලා මොනවාද ලිව්වේ කියා. කාන්තාවන්ට සහ පොදුවේ මිනිසුන්ට අපහාස කරන්නේ නැතුව ලියන්නේ කොහොමද කියන එක ගැනත් මාධ්‍යවේදීන්ට උගන්වන්න මුදලක් වෙන් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඉතිරිවෙලා තිබෙන කාලය තුළ මා ඊළඟ කාරණයට එන්නම්. අය වැය ලේඛන ගත්තොත්, ඇත්තටම වාර්තා විතරයි. අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කළා. සුමන්තිරන් මැතිතුමා සභාපතිත්වය දරන ඒ කාරක සභාවේ මමත් සාමාජිකයෙක් වශයෙන් සිටියා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අපි එක දෙයක් හඳුනා ගත්තා. ඇස්තමේන්තු ඉදිරිපත් කළාට ඒවා සියයට 100ක්ම සිද්ධ වෙන්නේ නැහැයි කියා අපි පිළිගන්නවා. සියයට 100ක් නොවෙයි, සමහර විට සියයට 95ක්වත් සිද්ධ වෙන්නෙත් නැහැ. සමහර විට සියයට 90ක්වත් සිද්ධ වෙන්නේ නැහැ. ඒකත් අපට පිළිගන්න පුළුවන්. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලැබී තිබුණු සීමිත පහසුකම් මත, අඩු ගණනේ හරියාකාරව පරිවර්තනය කර ගන්න කාර්ය මණ්ඩලයවත් නැතිව ඒ කාරක සභාව අමාරුවෙන් හඳුනා ගත්තේ මොනවාද? මා ළඟ ඒ වාර්තාව තිබෙනවා. මේ ඉදිරිපත් කරන යෝජනාවලින්, මේ ඉදිරිපත් කරන ඇස්තමේන්තුවලින්, අපේ මේස මත ගොඩ ගසා තිබෙන පොත් පත්වලින් කියන්නේ එක දෙයක්, නමුත් කරන්නේ සහමුලින්ම ඊට වෙනස් දෙයක්. ඒ කියන්නේ, මේ මුදල්වලට වග කීමක් නැහැ. එහෙම තමයි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව කියන්නේ.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව කියන්නේ මොකක්ද? ඒ වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

"2017 අයවැය සපයන ලද සංඛ්‍යා දත්තයන් මගින් 2017 තථ්‍ය වියදම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව යළිත් වරක් නොමඟ යවා ඇත."

[ගරු බිමල් රත්නායක මහතා]

ඒ කියන්නේ කලිනුත් නොමඟ යවා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවයි, කරන දෙයයි අතර අහසට පොළොව වාගේ වෙනසක් තිබෙනවා. මේ බලන්න, අපේ සොයාගැනීම්. යම්කිසි අරමුණකට, යම්කිසි ඇස්තමේන්තුවකට මුදල් වෙන් කළාම, ඒ අවුරුද්ද අවසානයේ කර තිබෙන්නේ මොනවාද? රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ කිහිපයක් මා කියන්නම්. මේවා දේශපාලන වශයෙන් නොවෙයි, යම්කිසි විද්‍යාත්මක පදනමක් මත කරපු දේවල්. කෘෂිකර්ම අමාත්‍යාංශය සම්බන්ධයෙන් අපේ නිරීක්ෂණය වන්නේ, අය වැය කළමනාකරණය පැත්තෙන් අසතුටුදායක බවයි. "යන්නෙ කොහෙද, මල්ලෙ පොල්" වාගෙයි කටයුතු කර තිබෙන්නේ. ඊට පස්සේ අධ්‍යාපන අමාත්‍යාංශය ගත්තොත්, අසතුටුදායකයි. "අධ්‍යාපනය මත වැය වැඩි කිරීමේ අරමුණ සාක්ෂාත් නොකෙරේ." කියා සඳහන් කර තිබෙනවා. ඊට පස්සේ ජනාධිපතිතුමාගේ පරිසර අමාත්‍යාංශය ගැන සඳහන් වෙනවා. අනතුරු හැඟවීමක්ද සහිතව සඳහන් කර තිබෙනවා සතුටුදායකයි කියා.

ප්‍රවාහන අමාත්‍යාංශය අසතුටුදායකයි. මම දැක්කා, දැන් ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කථා කරනවා. එතුමා තමයි කලින් ඒ අමාත්‍යාංශය භාරව සිටියේ. පශ්චාත් යුද බලමු. පුනරුත්ථාපන විෂය භාර අමාත්‍යාංශයට යුද්ධයෙන් පසුව අනාථ වුණු මිනිසුන් වෙනුවෙන් කරන්නට තිබුණු දේ අසතුටුදායකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ, පොදුවේ අය වැයෙන් ඉදිරිපත් වන දේ අනුව නොවෙයි, අමාත්‍යාංශ වැඩ කරන්නේ කියන එකයි. ඉන් පසුව කෘෂිකර්ම අමාත්‍යාංශය තිබෙනවා. රජය කථා කරන විට කියනවා, කෘෂිකර්ම අමාත්‍යාංශය පොහොර සහනාධාරය දෙනවා; ඔක්කොම කරනවා; ගොවියා ගොඩ ගන්නවා කියා. නමුත් මොකක්ද අපේ නිරීක්ෂණය? රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණය මෙන්න මේකයි:

"සමස්තයක් වශයෙන් කෘෂිකාර්මික වියදම් 2018දී අඩු කර ඇති අතර, සමස්ත වියදමේ සහ දළ දේශීය නිෂ්පාදනය යන දෙකෙහිම කොටසක් වශයෙන් එය පස් අවුරුදු සාමාන්‍යයට වඩා පහත වැටෙනු ඇත. "

සරලව ගත්තොත් පසුගිය අවුරුදු පහේදී කෘෂි කර්මාන්තයට ආණ්ඩුවලින් වෙන් කළ මුදලට වඩා 2018දී ඔබතුමන්ලා ප්‍රායෝගික වශයෙන් වෙන් කර තිබෙන්නේ අඩු මුදලක්. රටේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයේ දායකත්වයත් අඩුවෙලා තිබෙනවා. "මෙවන් අඩු කිරීම් ප්‍රතිපත්තිමය අරමුණුවලට සහ මෙම අංශයට රජය දක්වන කැපවීමට එරෙහි වේ."

දැන් මෙතැන ගොවියාට එකක් කියනවා, නමුත් කරන්නේ වෙන එකක්. එම නිසා අය වැය කථාව එකක්. නමුත් කරන්නේ තව එකක්.

අධ්‍යාපන අමාත්‍යාංශය ගැන බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයට අය වැයෙන් මුදල් වෙන් කරනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ බලන්න, රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව මෙන්න මෙහෙම කියනවා:

"දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කිරීම සමහරවිට දුෂ්කර ඉලක්කයක් විය හැක. කෙසේ වෙතත් ඒ සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.5කට අඩුවෙන් තිබූ, ඉතා අඩු මට්ටමකට ළඟා වී තිබූ අතර එය වැඩි කිරීමට රජය පොරොන්දු වී තිබේ. එබැවින් වර්තමාන සහ අනාගත අය වැයවලදී මෙම අංශය සඳහා වෙන් කරනු ලබන මුදල සෑම වසරකම ක්‍රමිකව වැඩිවීම බලාපොරොත්තු විය යුතුය. නමුත් දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වියදම අඩු කිරීම ප්‍රතිපත්තිමය අරමුණුවලට මුළුමනින්ම පටහැනි වේ. "

ඔබතුමන්ලා එන්න එන්නම අඩු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බොහෝ අය අගය කළා, උසස් පෙළ විභාගයෙන් ලංකාවෙන් වැඩියෙන්ම ලකුණු ගන්නා දරුවන් 14 දෙනාට පිට රට විශ්වවිද්‍යාලවලට යන්න අවස්ථාව ලබා දීලා තිබෙන එක ගැන. අපි පිළිගන්නවා, ඒක හොඳ දෙයක් කියා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේකේ ඇත්ත මොකක්ද කියා බැලුවොත් ඔබතුමාට තේරෙයි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මිලියන 882ක් කපලා තිබෙනවා සිසුන් සඳහා ශිෂ්‍යත්ව සහ ණය ආධාර - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඉල්ලා සිටිනවා ඔබතුමා මූලාසනයට පැමිණීමට ගත වුණු කාලයත් මට ලබා දෙන වෙලාවට එකතු කර දෙන්න කියා, මගේ වේලාව පටන් ගත්තේ ඊට කලින් වන නිසා.

රුපියල් මිලියන 882ක් කපලා තිබෙනවා, ඒ කියන්නේ සියයට 61ක අඩුවීමක්. දැන් මම ශිෂ්‍යත්ව ගැන කථාව කියන්නම්. වෙනත් රටවල් සමඟ ශිෂ්‍යත්ව අධ්‍යාපන වැඩසටහන සඳහා තිබුණු මුදලින් 2018දී, ඊට කලින් අවුරුද්දට වඩා රුපියල් මිලියන 19ක් කපලා තිබෙනවා.

රාජ්‍ය විශ්වවිද්‍යාලවල හොඳම දක්ෂතා දැක්වූ උපාධි අපේක්ෂකයන්ට ලොව ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලවලට ඇතුළුවීම පිණිස වන ශිෂ්‍යත්ව වැඩසටහන ගැන බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසස් පෙළ විභාගය කළ, විශ්වවිද්‍යාලයේ ගිය හැම කෙනාම දන්නවා අපි පුංචි කාලයේ ඉඳන්ම, අපට කලින් ඉඳන්ම එවැනි වැඩ පිළිවෙළක් තිබුණු බව. මට මතකයි, මා විභාගය කළ අවුරුද්දේ Mathsවලින් Island first වුණු ශිෂ්‍යයා ශිෂ්‍යත්වයකින් ඕස්ට්‍රේලියාවට ගියා. මේ අලුත් වැඩ පිළිවෙළ එන්න කලිනුත් එහෙම වැඩ පිළිවෙළක් තිබුණා. ඔබතුමන්ලා මොකක්ද කර තිබෙන්නේ? 2017දී මේ ශිෂ්‍යත්ව වැඩ පිළිවෙළට රුපියල් මිලියන 500ක් වෙන් කර තිබුණා. 2018දී ඒ සඳහා රුපියල් මිලියන 100යි. ඒ කියන්නේ පසු ගිය අවුරුද්දේ ඔබතුමන්ලා රුපියල් මිලියන 400ක් අඩු කර තිබෙනවා.

රාජ්‍ය විශ්විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි සිසුන් සඳහා ඇති ණය යෝජනා ක්‍රමය බලමු. 2017දී ඒ සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කළා. පසු ගිය අවුරුද්දේ රුපියල් මිලියන 135යි දීලා තිබෙන්නේ. ඒ කියන්නේ රුපියල් මිලියන 165ක් කපලා තිබෙනවා. මම ඔබතුමන්ලාට කියන්නේ මේකයි. ඔබතුමන්ලාට බොරු කරන්නට පුළුවන්, ඔබතුමන්ලා ඒ සඳහා දක්ෂයි. නමුත් අපි කියන්නට ඕනෑ, හැම දාම හැම කෙනාම රවටන්නට බැහැ කියා. එම නිසා අපට කියන්නට තිබෙන්නේ, මේ අය වැයවලට වගකීමක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල තිබෙනවා. හැබැයි, ඇමතිවරු පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන නිසා සම්මත කරගෙන ගිහිල්ලා තමන්ට ඕනෑ ඕනෑ දේවල් කරනවා.

මම වේලාව නැති නිසා කෙටියෙන් කියන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුවෙන් ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා, අවුරුද්දට වාහන මිලදී ගන්න මෙපමණයි කියා. මට මතක විධියට 2018 අය වැයේ වාහන සඳහා තිබුණු ඇස්තමේන්තුව වාගේ අතිවිශාල ප්‍රමාණයක්, මට මතක විධියට සියයට විසි ගණනකට වැඩියෙන් ඔබතුමන්ලා මුදල් පාවිච්චි කර තිබුණා. අවසාන වශයෙන් එම නිසා මට කියන්නට තිබෙන්නේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය දැන් අවසන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩියක කාලයක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමන්ලාගේ ඉලක්ක දිහා බලන්න. ඔබතුමන්ලාගේ "Vision 2025" කියන එකේ තිබුණේ මොනවාද? 2020 වෙනකොට -ඔබතුමන්ලා අවුරුදු 5ක් පාලනය කරන කොට- රැකියා දසලක්ෂයක් ගේනවා, Foreign Direct Investments ඩොලර් බිලියන 5ට ගේනවා, අපනයනය ඩොලර් බිලියන 10 සිට ඩොලර් බිලියන 20ට ගේනවා, ඒක පුද්ගල ආදායම ඩොලර් 5,000ට ගේනවා කියලා තමයි ඒකේ තිබුණේ. තව මාස 7යි තිබෙන්නේ. එම ඉලක්ක ආසන්නයටවත් ඔබතුමන්ලා ගෙනැල්ලා නැහැ; කිට්ටු වෙලාවත් නැහැ. ඔබතුමන්ලා කියන විධියට රැකියා දසලක්ෂය දැන් සොයා ගන්නත් නැහැ.

එම නිසා මට කියන්න තිබෙන්නේ, ඔබතුමන්ලාගේ මේ අය වැය තවත් මාධ්‍ය සන්දර්ශනයක් මිසක්, වෙනත් දෙයක් නොවෙයි කියන එකයි. එකම එක දෙයක් කියන්න කැමැතියි. දුර්වල පුද්ගලයන් ගැන, දුර්වල සමාජ කණ්ඩායම් ගැන අවධානය යොමු කරලා යම් යම් සහන ලබා දීම අගය කරන්න ඕනෑ. නමුත්, සමස්තයක් හැටියට ගත්තොත් මේ අය වැය රට ඉස්සරහට ගෙනයන්න බැරි අය වැයක් කියන එක තමයි අපේ අදහස. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ස්තුතියි. මීළඟට ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා.11.57]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிருவாக மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Disaster Management)
මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමනි, 2019 වර්ෂය සඳහා මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා මේ රජය වෙනුවෙන් ගෙනා අය වැය සම්බන්ධයෙන් ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා බොහොම දීර්ඝ විස්තරයක් කළා. මුදල් ඇමතිතුමාගේ අය වැය මේ රටේ සෑම කොටසක් වෙනුවෙන්ම, ඒ කියන්නේ රජයේ සේවකයා, ගොවියා, ධීවරයා, දුප්පත් මනුස්සයා වාගේම, අධ්‍යාපනය වැනි හැම අංශයක් වෙනුවෙන්ම සහන දෙන, සංවර්ධනය කරන අය වැයක් ලෙස මා හඳුන්වනවා.

රටක සංවර්ධනය තිබෙන්නේ, රටක දියුණුව තිබෙන්නේ ඒ රටේ ආයෝජන අනුව බව අපි දන්නවා. අපි ආණ්ඩුව භාරගන්න කොට විශාල ණය කන්දක් එක්ක භාර ගත්තා වාගේම, රටේ ජාතික ආදායම ණය ගෙවන්න බැරි තත්ත්වයකයි තිබුණේ. ඒ නිසා තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා අවුරුදු දෙකකට කලින් මැතිවරණය පැවැත්තුවේ. ආණ්ඩුව ගෙනයන්න බැරි තත්ත්වයක් එදා තිබුණේ. අද අපි ඒ ආණ්ඩුව ගත් ණය ගෙවමින් රටට එන ආයෝජන වැඩි කරලා තිබෙනවා.

2014 වෙනකොට මේ රටේ මූලධන වියදම් -capital expenditure- විධියට තිබුණේ රුපියල් බිලියන 487යි. අපි ඒක අවුරුද්දෙන් අවුරුද්ද වැඩි කරලා තිබෙනවා. ඒ රුපියල් බිලියන 487, 2015 දී බිලියන 603 කරලා තිබෙනවා; 2017 වෙනකොට බිලියන 657 කරලා තිබෙනවා. මෙවර අය වැයෙන් අපි රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම ක්ෂේත්‍රයක් සඳහාම බිලියන 756ක් ආයෝජනය කරනවා. අපි දන්නවා, රටක ආයෝජනය කරද්දී, සේවකයින්ගේ පඩි වැඩි කරද්දී, ගොවියාගේ වී මිල වැඩි කරද්දී, බඩ ඉරිඟු මිල වැඩි කරද්දී රටේ උද්ධමනය වැඩි වෙන්න ඕනෑ. පසුගිය අවුරුද්දේ අපේ රටේ උද්ධමන වේගය සියයට 4යි. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට අපි පාලන මිලක් ගෙනැල්ලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයට වැඩිය රටේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල තවමත් පහළින් තිබෙන්නේ. පරිප්පු කිලෝ එක, සීනි කිලෝ එක, පිටි කිලෝ එක, කිරි පිටි පැකට් එක 2015ට ඉස්සෙල්ලා, ඒ කියන්නේ 2014 දී තිබුණාට වඩා තවමත් පහළ මිලකයි තිබෙන්නේ. ඩීසල්, පෙට්‍රල් මිල සඳහා අපි මිල සූත්‍රයක් හදලා එදා ගත් අධික ලාභය වෙනුවට සහන මිලට ජනතාවට ලබා දෙනවා. ඒ අය ගෑස් ටැංකියක් වික්කේ රුපියල් 2,500ට; අපි තවමත් විකුණන්නේ රුපියල් 1,800ට. මේ රටේ උද්ධමනය පාලනය කරපු එකම ආණ්ඩුව තමයි අපේ ආණ්ඩුව. ඒ විතරක් නොවෙයි, අපි රජයේ සේවකයාගේ පඩි වැඩි කරද්දී අධ්‍යාපනය සඳහා වෙන් කර තිබෙන මුදල දිහා බලන්න. 2014 දී මූලධන වියදම් විධියට අධ්‍යාපන අමාත්‍යාංශය වියදම් කර තිබෙන්නේ රුපියල් මිලියන 44,000යි. එදා වෙන් කළ රුපියල් මිලියන 44,000 වෙනුවට "ළඟම පාසල හොඳම පාසල" වැඩ පිළිවෙළ යටතේ මේ අවුරුද්ද වෙනකොට අධ්‍යාපනය සඳහා වන මූලධන වියදම රුපියල් මිලියන 105,000 දක්වා වැඩි කර තිබෙනවා. අධ්‍යාපනයට වෙන් කරන මුදල දෙකහමාර ගුණයකින් වැඩි කරලා තිබෙනවා. අපි අද ගමේ පාසල්වල සියලු අවශ්‍යතාවන් සපුරාගෙන යනවා. ඒ විතරක් නොවෙයි.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මුතුකුමාරණ මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේට මම ඉඩ දෙන්නේ නැහැ. තමුන්නාන්සේ පසුව කථා කරන්න.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මම පොඩි පැහැදිලි කර ගැනීමක් කරන්නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මොකක්ද? තමුන්නාන්සේගේ වෙලාවේදී තමුන්නාන්සේ කථා කරන්න. මේ මගේ වෙලාව. මම වැරැද්දක් කිව්වා නම්, කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ඔබතුමන්ලා කිව්වා, "ළඟම පාසල - හොඳම පාසල" කියන එකට සල්ලි වියදම් කරලා තිබෙන බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නේ නැහැ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මේ වෙනකොට ගොඩනැඟිලි හදා පාසල් ආරම්භ කරලා තිබෙනවා. නමුත්, කොන්ත්‍රාත්කරුවන්ට තවම මුදල් ගෙවා නැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි කථා කරන්නේ අධ්‍යාපනය ගැන. තමුන්නාන්සේ කථා කරනවා, කොන්ත්‍රාත්කරුවා ගැන. ඔන්න, මන්ත්‍රීතුමාගේ වැඩය. මන්ත්‍රීතුමනි, ඔබතුමා සංවර්ධනය ගැන කථා කරන්න. තමුන්නාන්සේ කථා කරන්නේ කොන්ත්‍රාත්කරුවා ගැන. වාඩි වෙන්න. අපි සල්ලි දෙනවා. අධ්‍යාපනයට වෙන් කරන මුදල් ප්‍රමාණය දෙකහමාර ගුණයකින් අපි වැඩි කරලා තිබෙනවා. සමෘද්ධිය තමුන්නාන්සේලාගේ ව්‍යාපාරයක්. තමුන්නාන්සේලා අවුරුදු 24ක් තිස්සේ මේක දේශපාලන ව්‍යාපාරයක් කළා. තමුන්නාන්සේලා මේක දේශපාලන ඡන්ද ගැනීමේ ව්‍යාපාරයක් කළා. තමුන්නාන්සේලා සමෘද්ධිය දුන් අයටත් අපි, එය තුන්ගුණයකින් වැඩි කරලා දුන්නා. මෙන්න, ඒ දුන් මුදල් ගැන සඳහන්ව තිබෙනවා.

සමෘද්ධියට වෙන් කරපු මුදල 2014 වර්ෂය වෙනකොට රුපියල් බිලියන 14යි; අපි අද දෙනවා, රුපියල් බිලියන 40ක්; මේ අවුරුද්දේ තව රුපියල් බිලියන 10ක් වැඩි කරනවා. මෙලෙස තවත් රුපියල් බිලියන 10ක් අපි වැඩි කරන්නේ ඇයි? සමෘද්ධියට දෙන ආධාරය 3.5කින් වැඩිවෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා මැතිවරණය ආසන්නයේ හදපු පාරවල්වල සල්ලි ඒ කොන්ත්‍රාත්කරුවන්ට ගෙව්වේ අපි. තමුන්නාන්සේලා ගමේ ගොඩනැඟිලි හැදුවා. තමුන්නාන්සේලා ඒවා හැදුවේ ණයට. අපි ඇවිල්ලා මහාමාර්ගවලට පමණක් රුපියල් බිලියන 22ක් ගෙව්වා. ඒ වාගේ පොලු තියලා ගිය ආණ්ඩුවක අය දැන් කථා කරනවා, කොන්ත්‍රාත්කරුවන්ට සල්ලි ගෙව්වේ නැහැයි කියලා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකර වාඩිවෙන්න. ඒ විතරක් නොවෙයි. [බාධා කිරීමක්] මම ඔබතුමාට ඉඩ දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. පසුගිය අවුරුදු හතරේත් සමෘද්ධිය භාර ඇමතිවරයා විධියට සිටියේ එස්.බී. දිසානායක ඇමතිවරයායි. මේ රටේ ගම්වල සමෘද්ධිය ගන්නා අහිංසක දුප්පත් උදවිය ඉන්නවා. නමුත්, ඔබතුමන්ලා සමෘද්ධි ආධාර ගන්න සුදුසුකම් තිබෙන අයට ඒක දුන්නේ නැහැ. තමුන්නාන්සේලා කළේ දේශපාලනය. අපි මේ සැරේ තවත් පවුල් ලක්ෂ 6කට සමෘද්ධිය දෙනවා. ඒ අනුව, හැම වසමකම පවුල් 40ත්, 50ත් අතර ප්‍රමාණයකට අපි සමෘද්ධිය දෙනවා. අසාධාරණයට ලක් වූ දුප්පත් මනුස්සයාටත් සමෘද්ධිය දෙන්න දැන් අපි ලෑස්ති වනවා. මේ විධියට අපි විශාල දෙයක් කරලා තිබෙනවා.

රජයේ සේවකයා වෙනුවෙන් වැඩියෙන්ම වැඩ කරපු ආණ්ඩුව අපේ ආණ්ඩුව. අපි එනකොට රජයේ පහළම ශ්‍රේණියේ කම්කරුවා මූලික වැටුප විධියට ගත්තේ රුපියල් 11,730යි. ලබන අවුරුද්ද වනකොට ඒ සේවකයාගේ වැටුප රුපියල් 24,250ක් වෙනවා. ඊට අමතරව මේ සැරේ අපි තව රුපියල් 2,500කුත් දෙනවා. ඔබතුමන්ලා මේවා ගැන කථා නොකරන්නේ ඇයි? රජයේ සේවකයාට යම් ආත්ම ගරුත්වයක් ඇතිව ජීවත් වන්න පුළුවන්කම අද අපේ ආණ්ඩුව දීලා තිබෙනවා. හෙදියකගේ මූලික වැටුප රුපියල් 15,620යි. ඒක වැඩි වෙනවා, රුපියල් 32,525ක් වන තෙක්. ඒ කියන්නේ දෙගුණයකට වඩා වැඩිවනවා. අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ මූලික වැටුප රුපියල් 47,515යි. ඒක වැඩිවනවා, රුපියල් 98,650ක් වන තෙක්. ඊට අමතරව අපි මේ සැරේ එම වැටුප් තවත් වැඩි කරනවා. තමුන්නාන්සේලා ඉන්න කාලයේ රජයේ සේවකයන්ගේ වැටුප් බිල තිබුණේ රුපියල් බිලියන 440යි. අපි මේ අවුරුද්ද වනකොට රජයේ සේවකයින්ගේ වැටුප් බිල රුපියල් බිලියන 697ක් වන තෙක් වැඩි කරනවා. අපේ ආණ්ඩුවට මොන අමාරුකම් තිබුණත්, අපි රජයේ සේවකයාට සලකා තිබෙනවා.

තමුන්නාන්සේලාගේ කාලයේ වැඩි කළ විශ්‍රාම වැටුප -2006 වෙච්ච වැටුප් වැඩිවීම- 2015 දී ලබා දීලා විශ්‍රාමිකයාගේ වැටුප් විෂමතාව වෙනස් කළේ අපේ ආණ්ඩුවයි.

මේ සැරේ විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරන්න රුපියල් බිලියන 12ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ, 2017 වන කල් විශ්‍රාම ගිය හැමෝගේම විශ්‍රාම වැටුප වැඩි කරනවා කියන එකයි. ගිය සැරේ විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි කළා, රුපියල් 3,500කින්. මේ සැරේ රුපියල් 1,600 සිට රුපියල් 12,000 වන කල් විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි වනවා. එහෙමයි අපේ ආණ්ඩුව වැඩ කරන්නේ. 2014 වර්ෂයේදී මේ රටේ විශ්‍රාම වැටුප් සඳහා ගියේ රුපියල් බිලියන 150යි. මේ අවුරුද්දේ විශ්‍රාම වැටුප් සඳහා යන ගණන රුපියල් බිලියන 252ක් වනවා. කුමන ප්‍රශ්න තිබුණත් අපි රජයේ සේවකයාට සලකා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසිය ගත්තත් එහෙමයි. මා දැක්කා අද සමහර අය කරපු කතා. පොලීසිය භාරව හිටපු ඇමතිවරුන් පොලීසියෙන් සැලියුට් ගස්සවාගැනීම විතරයි කර තිබෙන්නේ කියලා කියා තිබෙනවා. මා ළඟ තිබෙනවා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් හදපු, වැටුප් ලේඛනය. පොලීසියේ රාළහාමි කෙනෙකු RS 1 වැටුපයි ගත්තේ. පොලීසියේ රාළහාමි කෙනකුගේ මූලික වැටුප රුපියල් 14,280යි. ලබන අවුරුද්ද වෙන කොට එම මුදල රුපියල් 29,580යි. මීට අමතරව, පොලීසියේ රාළහාමි කෙනකුට සියයට 40ක් දෙනවා. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ හිටපු ඇමතිවරයා හැටියටයි මා මෙය කියන්නේ. සියල්ල එක්කාසු වුණාම ලැබුණු රුපියල් 23,000 වෙනුවට රුපියල් 55,000ක්, 60,000ක් දැන් පොලීසියේ රාළහාමිකෙනෙක් ගන්නවා. සමහර අය කියනවා, රාළහාමි කළේ සැලියුට් ගහපු එක විතරයි කියා. අවුරුදු 20ක් ආණ්ඩු කරපු උදවියයි මෙහෙම

කියන්නේ. ඔබතුමන්ලාට සැලියුට් ගහපු එක වෙනුවෙනුත් අපි පොලීසියේ රාළහාමිලාට, පොලීසියේ ASP මහත්වරුන්ට, SP මහත්වරුන්ට පඩි වැඩි කර තිබෙනවා. පොලීසියට ආත්ම ගරුත්වයක් ඇතිව ජීවත් වෙන්න, වැඩ කරන්න හැකි වන පරිදි අපි ස්වාධීන පොලිස් කොමිෂන් සභාව පිහිටුවා තිබෙනවා. දැන් අපේම මන්ත්‍රීවරු අපට බණිනවා, "අපිට පොලීසියෙන් මොකුත් කරගන්න බැහැ" කියා. ඉස්සර එහෙම නොවෙයි. දේශපාලනඥයන් පොලීසියට ගිහින් පොලීසියේ පුටුවල වාඩි වෙලා පොලීසියට බලපෑම් කරපු කාලයක් තිබුණා. දැන් මූලාසනයේ සිටින අපේ ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා ඒ කියන බලපෑම්වලින් හොඳට ගුටි කාපු කෙනෙක් නේද? නමුත් අද අපට පුළුවන්කම ලැබී තිබෙනවා, පොලීසියේ සියලුදෙනාට ස්වාධීනව රාජකාරි කරන්න අවස්ථාව ලබා දෙන්න. රාළහාමිට, OICට, ASPට, SPට පුළුවන් -ඒ සියලුදෙනාට පුළුවන්- ස්වාධීනව රාජකාරි කරන්න. පොලීසියේ අයට අද ආත්ම ගරුත්වයක් ඇතිව ජීවත් වෙන්න හැකි වන පරිදි අපි පොලීසියේ අයගේ වැටුප් වැඩි කර තිබෙනවා. එහෙම කර තිබියදී තමයි කියා තිබෙන්නේ, "පොලීසිය භාරව සිටි ඇමතිවරුන් තමන් පොලීසිය බාර ඇමති යැයි පෙන්වමින් ඔටුන්නක් දමාගෙන සැලියුට් ගස්සවා ගැනීම පමණක් කර ඇත" කියා. කොහොමද මේවා කියන්නේ? සමහර අය කියා තිබෙන්නේ එහෙමයි.

අපි පොලීසියට පඩි වැඩි කර තිබෙනවා; පොලීසියට උසස් වීම් ක්‍රමවේද හැදුවා; උසස්වීම්වලදී දේශපාලනය ගැව්වේ නැහැ; බඳවාගැනීම්වලට දේශපාලනය ගැව්වේ නැහැ. පොලීසියේ ස්වාධීනත්වයයි, ආත්ම ගරුත්වයයි අපි ඇති කර තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය මේවා කරන කොට සමහර අයට පොඩ්ඩක් රිදෙනවා. එක්සත් ජාතික පක්ෂය මේවා කරන කොට සමහර අය එක්සත් ජාතික පක්ෂයට ගහන්න යනවා. ඒ දේ කරන්න එපා කියා අපි ඒ අයට කියනවා. ඒ විතරක් නොවෙයි. මේ සියල්ල කරද්දීත් අපට පුළුවන්කම ලැබී තිබෙනවා, ගමේ සංවර්ධනය වේගවත් කරන්න. රුපියල් දසලක්ෂ 42,000ක් - රුපියල් බිලියන 42ක්- "ගම්පෙරළිය" වැඩසටහන යටතේ වෙන් කරනවා. හැම මැතිවරණ කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ 3,000ක් වෙන් කර තිබෙනවා. පාරවල් හදන්න, ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න, පිට්ටනි හදන්න, ස්වයං රැකියා ඇති කරන්න, නිවාස සඳහා ණය දෙන්න, රුපියල් මිලියන 42,000 යි. ඒ විතරක් නොවෙයි. මේ රටේ ඉතිහාසයේ ප්‍රථම වරට මේ රටේ ව්‍යාපාරිකයා, මේ රටේ තරුණයා, මේ රටේ කාන්තාව, මේ රටේ ගොවියා ගන්නා ණයවල පොලියෙන් භාගයක් ආණ්ඩුව ගෙවනවා. ඉතිහාසයේ කවදාවත් එහෙම වෙලා නැහැ. පොලිය සියයට 13යි නම් ආණ්ඩුව එයින් සියයට 6.5ක් ගෙවනවා. අපේ ආණ්ඩුව රුපියල් දසලක්ෂ හැටදාහක් ණය දී තිබෙනවා, "Enterprise Sri Lanka" ණය ක්‍රමය යටතේ. මංගල සමරවීර අමාත්‍යතුමා කතා කරමින් කිව්වා, මේ ණය සියල්ල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයත් අරගෙන තිබෙනවා කියා. මාතර ප්‍රාදේශීය සභාවේ සභාපතිත් "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගෙන තිබෙනවා. මෙහෙමයි අපි කටයුතු කරන්නේ.

සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීම සම්බන්ධයෙන් අද තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ. පසුගිය ඔක්තෝබර් මාසයේ 25වැනි දා වනකොට ලෝකයේ සංචාරක ආයතන කියන්න පටන් ගත්තා, "ලෝකයේ තිබෙන හොඳම සංචාරක ගමනාන්තය ශ්‍රී ලංකාව" කියලා. ඒ කාලයේ ආණ්ඩුව බලෙන් පෙරළුවා. නීතියක්, අයිතියක් නැතිව, ව්‍යවස්ථා විරෝධීව, නීති විරෝධීව ආණ්ඩුව පෙරළුවා. ඒ නිසා සංචාරකයන් අපේ රටට එන එක නැවතුණා. එහෙම නැති වුණා නම් ඉතිහාසගත වන සංචාරකයන් ප්‍රමාණයක් අපේ රටට එන්න පුළුවන්කම තිබුණා. ඒ වන විට සංචාරකයන් අපේ රටට එන කාලය - season එක - පටන් ගත්තා විතරයි. මේ හේතුව නිසා අපිට ලැබෙන්න තිබුණු ඩොලර් බිලියන ගණනක් නැති වුණා.

ඊළඟට සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධයෙනුත් මම කියන්න කැමතියි. වැසිකිළි දෙනවා කිව්වාම සමහරු හිනා වුණා. අවුරුදු 20ක් ආණ්ඩු කළත් ඔබතුමන්ලාට සනීපාරක්ෂක පහසුකම්වත් ජනතාවට ලබා දෙන්න බැරි වුණා. හම්බන්තොට නිවාස 15,000කට වැසිකිළි නැහැලු. මොනරාගල නිවාස 25,000කට වැසිකිළි නැහැලු. ඒ අයට වැසිකිළි ලබා දෙන්න හදනකොට හිනා වෙනවා. කොළඹ හොඳ මාළිගා හදාගෙන ඉන්න අයට නොවෙයි ඒකේ අමාරුව තිබෙන්නේ. ගමේ දුප්පත් මනුස්සයාට තමයි මේවායේ අමාරුව තිබෙන්නේ. වායු සමීකරණය කරපු වැසිකිළි තිබුණු සමහර අය ඒ කාලයේ සිටියා. සමහර ඇමතිවරු හිටියා, - මමත් ඒ නිල නිවාසයේ සිටියා. මම ඒවා ඉවත් කළා. -තමන්ගේ නිල නිවාසයේ වැසිකිළියත් වායුසමීකරණය කළ ඒ ඇමතිවරයා කවුද කියලා මම කියන්නේ නැහැ. [බාධා කිරීමක්] එහෙම අයට නම් මේක තේරෙන්නේ නැහැ. නමුත් ගමේ මනුස්සයාට තේරෙනවා, මේකෙන් මොකක්ද වෙන්නේ කියලා. ඕවා කියනකොට සමහර අයට රිදෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා (ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனோ கணேசன் - தேசிய ஒருமைப்பாடு, அரசகரும மொழிகள், சமூக மேம்பாடு மற்றும் இந்து சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mano Ganesan - Minister of National Integration, Official Languages, Social Progress and Hindu Religious Affairs)
ගරු ඇමතිතුමා, නම කියන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
බැහැ. එහෙම නම කියන එක හොඳ නැහැ. ඒ නිසා මම කවුද කියලා නම කියන්නේ නැහැ. [බාධා කිරීමක්] අපි එහෙම පහර ගහන්නේ නැහැ. අපි පෞද්ගලිකව මඩ ගහන්නේත් නැහැ. නමුත් වෙච්ච දේ අපි කියන්න ඕනෑ. ඒ ගෙදර air conditioners 14ක් තිබුණා. [බාධා කිරීමක්] බය වෙන්න එපා, අපි ඒවා ඉවත් කළා.

ඊළඟට විශේෂ හැකියාවන් සහිත පුද්ගලයන්ගේ -ආබාධිත පුද්ගලයන්ගේ- මාසික දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා මෙවර අය වැයෙන් වැඩි කරලා තිබෙනවා. ඒ අය පෞද්ගලික අංශයේ වැඩ කරනවා නම් ආණ්ඩුව විසින් ඒ අයට දීමනාවක් ලබා දෙනවා. පසුගිය කාලයේ හැම දාම වාගේ පාඩු ලබපු, දේශපාලනීකරණය වෙලා තිබුණු අපේ ප්‍රවාහන සේවය - SLTB එක - ලාභ ලැබෙන තැනට ගෙනෙන්න අපිට පුළුවන්කම ලැබිලා තිබෙනවා. බලන්න, අද ඒවායේ කොච්චර විනයක්, කොච්චර පාලනයක් තිබෙනවාද කියලා. අද හැම ඩිපෝවකම ගිණුමේ රුපියල් ලක්ෂ 60ක්, 70ක්, 100ක් තැන්පත්වෙලා තිබෙනවා. ආණ්ඩුවක් වැඩ කරන්න ඕනෑ මෙහෙමනේද? පසුගිය ආණ්ඩුව කාලයේ පඩිය ගන්න මාස ගණනක් -මාස දෙක තුනක්- ඔවුන් බලාගෙන හිටියා. දැන් පඩි ගෙවලා සල්ලි ඉතුරු වෙලාත් තිබෙනවා. පසුගිය කාලයේ SLTB එකෙන් 35,000ක් විශ්‍රාම යනකොට - pension යනකොට - තමන්ගේ පාරිතෝෂික ගන්න බැරිව ඔවුන් අවුරුදු ගණනක් -අවුරුදු පහ හයක්- බලාගෙන හිටියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

නමුත් දැන් ලංගම සේවකයා විශ්‍රාම යන දවසට -දිනයට- ඔහුගේ පාරිතෝෂිකය, විශ්‍රාම වැටුප් දීමනාව ලබා ගන්න පුළුවන් වන විධියට අපි සැලසුම් කර තිබෙනවා. මෙහෙම තමයි රටක් පාලනය කරන්න ඕනෑ. රජයේ සේවකයා විශ්‍රාම යන දවසට ඔහුගේ ලිපි ලේඛනවල අඩුපාඩුවක් නැති නම් පාරිතෝෂිකය ගෙවනවා. පසුගිය කාලයේ මේ කටයුත්ත කරන්න බැංකුවලට දුන්නා. අපි රජයේ සේවකයාට මේ විධියට සහන ලබා දීලා තිබෙනවා. ඒ එක්කම මම මුදල් ඇමතිතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. මම මොනරාගල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස පළාත ගැන මේ අවස්ථාවේදී කියන්න කැමතියි. වෙල්ලස්සේ විමුක්ති අරගළයට පසුගිය අවුරුද්දට අවුරුදු 200ක් සම්පූර්ණ වුණා. මේ රටේ නිදහස වෙනුවෙන් වැඩියෙන්ම සටන් කළේ ඌව - වෙල්ලස්සේ මිනිසුන්. වාරිමාර්ග කටයුතු වෙනුවෙන්, "වෙල්ලස්සේ නවෝදය" වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 2,500ක් අපිට මෙවර අය වැයෙන් ලබා දුන්නා. නමුත් යටිතල පහසුකම් වැඩි කරන්න මම අමතර මුදලක් ඉල්ලුවා. ඒ වෙනුවෙන් අවශ්‍ය මුදල් ලබා දෙන්න කියලා මම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම රජයටත්, මුදල් ඇමතිතුමාටත්, අගමැතිතුමාටත් මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා, මේ අවුරුද්දේ මොණරාගල දිස්ත්‍රික්කයේ පාරවල් කාපට් කරන්න විතරක් අපට මිලියන 15,000ක් "iRoad" ව්‍යාපෘතිය යටතේ ලබා දීම ගැන. මේ වාගේම විශාල සංවර්ධනයක් අධ්‍යාපනය ක්ෂේත්‍රය තුළ, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කරලා තිබෙනවා.

පසුගිය කාලයේ රෝහල්වල බෙහෙත් තිබුණේ නැහැ. ෆාමසිවලින් ඒවා ගත්තේ. අද රෝහල්වල අවශ්‍ය හැම බෙහෙතක්ම තිබෙනවා. ඒ වාගේම එදා අක්ෂි රෝගීන් අක්ෂි කාචය ගත්තේ රුපියල් 20,000ට, 30,000ට, 40,000ට. නමුත් අද රජයෙන් ඒවා නොමිලේ ලබා දෙනවා. ස්ටෙන්ට් අද නොමිලේ ලබා දෙනවා. එදා ඒවා ලක්ෂ හතරට විකුණුවේ. අද ලක්ෂයට, ලක්ෂ එකහමාරට ගන්න තිබෙනවා, සල්ලි දීලා ගන්නවා නම්. රෝහලෙන් නම් අද ඒවා නොමිලේ ලබා දෙනවා. ඉස්සර පිළිකා රෝගීන්, වකුගඩු රෝගීන් ආධාර පත්‍ර මුද්‍රණය කරගෙන යනවා, සල්ලි සම්මාදම් කරන්න. දැන් පිළිකා රෝගීන්ට වැය වන මුදල ලක්ෂ 80 වුණත්, 100 වුණත් ඒ සියලු මුදල් වියදම් කරන තත්ත්වයට අපේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව සුබසාධනයත්, සංවර්ධනයත්, අධ්‍යාපනයත් කියන මේ සියල්ල දියුණු කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. එහෙම නම්, මේ අය වැය ගැන කථා කරන්න දෙයක් නැහැ. කාන්තා ප්‍රශ්න ගැනත් කිව්වා. නමුත් මට ඒ ගැන කථා කරන්න වේලාව නැහැ. කොහොම නමුත් අපි සහනත් ලබා දෙමින්, ගොවියාත් ශක්තිමත් කරමින්, රජයේ සේවකයාත් ශක්තිමත් කරමින් රටේ සංවර්ධනයට වැඩි මුදලක් ආයෝජනය කරන්න කටයුතු කරලා තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි. මීළඟට, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 12.17]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රමුඛව එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කර තිබෙන මේ අය වැය සම්බන්ධව අදහස් දැක්වීමට අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ බරපතළ ආර්ථික අර්බුදයක් තිබෙනවාය කියන කාරණය රහසක් නොවෙයි. අපේ රටේ සියලු ජනතාව -ආර්ථික වශයෙන් ශක්තිමත් වෙලා හිටපු අයත්, ඒ වාගේම ආර්ථික වශයෙන් දුර්වල වෙලා හිටපු අයත්- අද බරපතළ ආර්ථික පසුබෑමකට ලක් වෙලා තිබෙනවා.

අපි සතුටු වෙනවා, රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා ප්‍රකාශ කරපු ආකාරයට රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන්. ඒ ගැන අපේ විරෝධතාවක් නැහැ. ඔබතුමන්ලා අවුරුදු පහක කාල සීමාවක් තුළ දිගින් දිගටම කොටස් වශයෙන් ඒ වැඩි කිරීම සිදු කරනවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවධානය යොමු කරනවා, 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට. 2018 මහ බැංකු වාර්තාව තවම එළියට ඇවිල්ලා නැහැ. 2017 මහ බැංකු වාර්තාවේ කියනවා, මූර්ත වැටුප සම්බන්ධයෙන්. මූර්ත වැටුප කියන්නේ තමන්ට ලැබෙන මුදලින් මිලදී ගැනීමට හැකි භාණ්ඩ හා සේවාවල ප්‍රමාණය. එතකොට මේ කියන ආකාරයට වැටුප් වැඩිවීමක් සිදු වුණා නම්, සැබැවින්ම ඒ වැටුප් වැඩිවීම රාජ්‍ය සේවකයා ඇතුළු අනෙක් සියලුදෙනාට ඔවුන්ගේ වාසියට භාවිත කරන්න පුළුවන් නම්, මේ වැඩිවීම හරහා ගන්න පුළුවන් භාණ්ඩ හා සේවා ප්‍රමාණයත් වැඩි වෙන්න ඕනෑ. හැබැයි, මහ බැංකු වාර්තාව කියන්නේ මොකක්ද?

2017 මහ බැංකු වාර්තාවේ 131 සහ 132 පිටුවල මෙසේ සඳහන් වෙනවා:

"රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සලකා බලන කළ, 2016 වසරේ මූර්ත වැටුප්හි සිදු වූ සියයට 0.1ක සුළු පහළ යෑමට සාපේක්ෂව, උද්ධමන ප්‍රවණතා හේතුවෙන් 2017 වසරේදී එය සියයට 7.2කින් පහළ යන ලදී."

ඒ කියන්නේ, මේ වැටුප් වැඩි කිරීම සිදු කළත්, මිලදී ගන්න පුළුවන් භාණ්ඩ හා සේවා ප්‍රමාණය සියයට 7.2කින් පහළට ගිහිල්ලා තිබෙනවා කියන එකයි. ඊළඟට, පෞද්ගලික අංශය සම්බන්ධවත් මහ බැංකු වාර්තාවේ සඳහන් වෙනවා. එහි සඳහන් වෙන්නේ මෙහෙමයි.

"පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් 2016 වසරේ සිදු වූ සියයට 3.6ක පහළ යෑමට සාපේක්ෂව 2017 වසරේදී සියයට 5.9කින් පහළ යන ලදී."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් ආණ්ඩුව කථා කළාට, සැබැවින්ම එම වර්ධකය ජනතාවට ප්‍රයෝජනවත් ද කියන එකයි තිබෙන ප්‍රශ්නය. මේ මහ බැංකු වාර්තාව අනුව ලබා දී තිබෙන වර්ධකයට වඩා වැඩි ප්‍රමාණයක් ඔවුන් මේ වනකොට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වියදම් කරනවා. ඒකට හේතුව මේ ආණ්ඩුව, නාස්තිකාර ආණ්ඩුවක් හැටියට බලයට පැමිණි දවසේ ඉඳලා ජනතාවට බදු ගැසීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 වසරේ සමස්ත රාජ්‍ය වියදම 2019 වසරේ යෝජිත රාජ්‍ය වියදම හා සංසන්දනය කරද්දී, රාජ්‍ය වියදම සියයට 70ක් වැඩි කරලා තිබෙන බව පෙනී යනවා, කිසිම දෙයක් කරන්නේ නැතුව. මෙසේ සියයට 70ක් රාජ්‍ය වියදම වැඩි කරද්දී, ඒ තුළ වර්තන වියදම් -දෛනික පරිභෝජනය සඳහා කරන වියදම්- සියයට 75ක් වැඩි කරනවා. එතකොට මොකක්ද

මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ? එක පැත්තකින්, මේ රටේ ජනතාවගේ ණයබර දිගින් දිගටම ඉහළ යනවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තමුන්නාන්සේලාට ආණ්ඩුව භාර දෙද්දී රුපියල් ට්‍රිලියන 7ට තිබුණු ණයබර, මේ වනකොට ට්‍රිලියන 11 දක්වා අරගෙන ගිහිල්ලා තිබෙනවා. ණය බර ට්‍රිලියන 11 දක්වා වැඩි කළා විතරක් නෙවෙයි, මේ අය වැය තුළින් නැවත යෝජනා කරනවා, තවත් ට්‍රිලියන 2ක අමතර ණයක් ගන්න. රුපියල් බිලියන 7,300 ඉඳලා අපේ රටේ සමස්ත ජනතාවගේ ණයබර රුපියල් බිලියන 11,000කට අරගෙන ගිය ආණ්ඩුව, තවත් බිලියන 2,000ක් ණයට ගන්න කටයුතු කරනවා. අපි අහන්න කැමැතියි ආණ්ඩුවෙන්, මොකක්ද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කියලා? ණය ගෙවන්න ණය ගත්තා කියලා ඔබතුමන්ලා කිව්වාට, අපේ රටේ ණය ප්‍රමාණය අඩු වෙන්නේ නැහැ, ණය ප්‍රමාණය ශීඝ්‍රයෙන් වැඩි වෙනවා. වර්තන වියදම් සියයට 75කින් වැඩි වීම තමයි අපේ රට ණය උගුලක හිර වෙන්න මූලික හේතුව බවට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව දිගින් දිගටම ජනතාව රැවැට්ටුවා. 2015 ඉඳලා 2019 දක්වා ඉදිරිපත් කරපු සෑම අය වැයක් තුළම ජනතාව මුළා කිරීමක් තිබ්බා. එක අවුරුද්දක සිට ඊළඟ අවුරුද්දට යද්දී ජනතාවට තවත් අලුත් සිහිනයක් දුන්නා; අලුත් බලාපොරොත්තුවක් දුන්නා. හැබැයි, පෙර කී කිසිම දෙයක් ඉටු කළේ නැහැ. ඒ නිසා අද අපේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් බරපතළ විධියට කඩා වැටිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සුමන්තිරන් මන්ත්‍රීතුමා තමයි මේ ආණ්ඩුවේ සුක්කානම හසුරුවන්නේ. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ප්‍රධාන උපදේශකයා බවට පත් වෙලා තිබෙන්නේ, සුමන්තිරන් මන්ත්‍රීතුමා. එතුමා කියනවා, දෙමළ ජාතික සන්ධානය -එතුමාගේ කණ්ඩායම- මේ අය වැය සම්මත කර ගන්න ඡන්දය දෙනවාය කියලා. එහෙම නොදුන්නොත් මේ ආණ්ඩුවට ඉතුරු වෙලා ඉන්න මන්ත්‍රීවරු සංඛ්‍යාව එක්ක මේ අය වැය සම්මත කර ගන්න බැහැ. හැබැයි, ප්‍රශ්නය මේකයි. පසුගිය දා "ලංකාදීප" පුවත් පතට එතුමා මෙවැනි ප්‍රකාශයක් කර තිබෙනවා. එතුමා මෙහෙම කියනවා.

"ඇත්ත කථාව ගත්තොත් මේ දත්ත වාර්තා සියල්ල බොරු ය. ඇත්ත අය වැයට අදාළ ප්‍රසිද්ධ නොකළ දත්ත ලේඛනයක් මේවා සකසන්නන් අත ඇති බව අපට පැහැදිලිය. මේ ඇත්ත දත්ත රටටත්, ජනතාවටත් හෙළිදරව් කරන්නේ නැත."

මෙන්න මේක තමයි ප්‍රශ්නය. එතුමා තවදුරටත් මෙහෙම කියනවා.

"අන්තිමේදී නැති ආදායමක් ද ඇත්තටම කර ඇති වියදම්වලට වඩා අඩු වියදමක් ද මවා පෙන්වන දත්ත සෙල්ලමක් බවට මෙය පත්ව ඇත. ඒ නිසා රටටත් ජනතාවටත් වියදම් කිරීමට ඉතුරු වන්නේ ඉතාම සුළු මුදලකි."

සුමන්තිරන් මන්ත්‍රීතුමා සතියකට කලින් "ලංකාදීප" පත්තරයට මෙවැනි ප්‍රකාශයක් කරලා, මෙවැනි සම්මුඛ සාකච්ඡාවක් දීලා, තිබියදී එතුමාට සදාචාරාත්මකව පුළුවන්ද දෙමළ ජාතික සන්ධානයත් එක්ක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආරක්ෂා කරන්න මේ අය වැයට ඡන්දය දෙන්න?

අද මේ රටේ ආර්ථිකය කඩා වැටීමට බලපාන ප්‍රධාන සිද්ධිය මොකක්ද? මේ රටේ සිදු වෙච්ච මහ බැංකු කොල්ලයයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකේ ඍජු චූදිතයා බවට පත් වෙන්නේ අගමැතිතුමා. එතුමා පාරිශුද්ධ පුද්ගලයෙක් නම්, අඩුම ගණනේ මේ පරීක්ෂණය ඉවර වනතෙක් රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අගමැති පුටුවේ වාඩි වෙන්නවත් බැහැ. එතුමාට තමයි ඒ චෝදනාව එල්ල වෙන්නේ. එතුමා කළේ බරපතළ අපරාධයක්. අද අර්ජුන් ඇලෝසියස්, අර්ජුන මහේන්ද්‍රන් කණ්ඩායමට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ අයට එක්සත් ජාතික පක්ෂයේ රැකවරණය ලැබෙනවා. අද අර්ජුන් මහේන්ද්‍රන් අල්ලන්න රතු නිවේදන නිකුත් කළාට, මේ ආණ්ඩුව ඒ පුද්ගලයා ගෙනෙන්න කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා අද මේ රටේ ආර්ථිකය කඩා වැටීමට ඍජුවම බලපාන්නේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා අවුරුදු හතරකට පෙර අපේ රටේ මහ බැංකුවත් එක්ක කරපු බරපතළ වංචාවයි. බලයට ඇවිල්ලා දවස් 30ක් ගියේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හොරකම් නවත්වනවාය කියලා බලයට ආපු ආණ්ඩුව කළ පළමුවැනි ක්‍රියාව මොකක්ද? මේ රටේ ආර්ථිකය මෙහෙවන -ආර්ථික මර්මස්ථානය- මහ බැංකුව කොල්ල කන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කළා. ඒ ඇති වෙච්ච බලපෑම නිසා අවසානයේ මේ ආණ්ඩුවට අවුරුදු හතරක් ගිහිල්ලා මොකක්ද ඉතුරු වුණේ? ඉතිරි වුණේ මහ බැංකුව කැඩීම සැමරීම විතරයි; මහ බැංකුවේ හොරකම සැමරීම විතරයි. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ඒ ක්‍රියා කලාපය සහ එතුමා අර්ජුන මහේන්ද්‍රන් ආරක්ෂා කරන ක්‍රියා කලාපය බලන්න. එතුමා මේ ගෞරවනීය සභාවම භාවිත කළා අර්ජුන් මහේන්ද්‍රන්ට චරිත සහතික දෙන්න. මේ රටේ මහ බැංකුව බිඳලා, එක්සත් ජාතික පක්ෂයට ඒ අවශ්‍ය ශක්තිය ලබා දෙන්න කටයුතු කළ මහා මොළකරු ආරක්ෂා කළේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමායි. එතුමා අර්ජුන මහේන්ද්‍රන්ව ආරක්ෂා කළේ ඇයි? අද වන කල් නිහඬ ක්‍රියාවලියක් පොලීසිය හා අනෙකුත් ආයතන අරගෙන යද්දී, මේ පුද්ගලයාව ලංකාවට ගෙනැල්ලා ඒ පරීක්ෂණ කරන්න බැරි හේතුව මොකක්ද කියලා එතැනින්ම පෙනෙනවා නේද? ඒ නිසා, සත්‍ය වශයෙන් ගත්තොත්, නීතිය සැමට සාධාරණව ක්‍රියාත්මක වුණා නම් අද රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් අත්අඩංගුවට පත් වෙන්න ඕනෑ. මේ බරපතළම චෝදනාවක්; මුළු රටක් අපකීර්තියට පත් කළ චෝදනාවක්. ආයොජකයෝ මේ රටට එන්නේ නැත්තේ ඇයි? අග්‍රාමාත්‍යවරයාගේ මූලිකත්වය යටතේ මහ බැංකුව හොරකම් කළා නම්, මොන ආයෝජකයාද මේ රටට ඇවිල්ලා තමන්ගේ ශ්‍රමය සහ මුදල් ඒ වෙනුවෙන් යොදවන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමා පොලීසිය සම්බන්ධයෙන් කථා කළා. නිලධාරින් කිහිප දෙනෙක් නිසා අද පොලීසිය බලවත් අපකීර්තියට පත් වෙලා තිබෙනවා. 2019.03.08 වැනිදා "ලංකාදීප" පුවත් පත කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"කොළඹ අපරාධ කොට්ඨාස ඕඅයිසීට ස්ථාන මාරුවක්.

කොළඹ අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක නෙවිල් සිල්වා මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි පොලිස් මූලස්ථානයට මාරු කර ඇතැයි පොලිස් ආරංචි මාර්ග කියයි."

මේ මාරු කිරීම සිදු කර තිබෙන්නේ පොලිස් කොමිසමේ අනුමැතියක් නැතිවයි. පොලිස් කොමිසමේ අනුමැතියට යටත්ව නොවෙයි මෙය කර තිබෙන්නේ. එහි තවදුරටත් මේ විධියට වාර්තා කර තිබෙනවා:

"අත් අඩංගුවට ගත් සැකකරුවෙකු සම්බන්ධයෙන් ඉහළින් ලැබුණු නීති විරෝධී නියෝගයක් ක්‍රියාත්මක නොකිරීම නිසා ඔහුට මෙම ස්ථාන මාරුව ලබා දී ඇති බව කොළඹ අපරාධ කොට්ඨාසයේ ආරංචි මාර්ගවලින් පැවසේ."

මොකක්ද මේ කරන්න හදන්නේ? අපි දැක්කා, පසුගිය දා රත්ගම ඇති වුණු සිද්ධිය. අපි දැක්කා, අපරාධකරුවන් අත්අඩංගුවට ගන්නා පුද්ගලයන්ට පොලීසියේ ඉහළ නිලධාරින් හරහා ඇති වන අඩන්තේට්ටම්.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් වන චානක මන්ත්‍රීතුමා ඊයේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ වෙනුවෙන් මොකක්ද රජය ගන්නා වැඩපිළිවෙළ? අද මේ ආණ්ඩුව මේ රට පොලිස් රාජ්‍යයක් බවට පත් කරලා තිබෙනවා විතරක් නොවෙයි, තමන්ට අභියෝගයක් විය හැකි ඕනෑම පුද්ගලයෙක්, තෝරා ගත් උසස් පොලිස් නිලධාරින් හරහා දේශපාලන දඩයමකට ලක් කිරීමට අවශ්‍ය වැඩ කටයුතු කරනවා. ඒ නිසා තංගල්ල පොලීසිය භාර පොලිස් අධිකාරිවරයා එතුමාගේ නිර්දෝෂීභාවය ඔප්පු කරන්නත්, ඒ වාගේම මේ චෝදනාව සම්බන්ධයෙන් පරීක්ෂණය කරන්නත්, සාධාරණ පරීක්ෂණයක් කරනවා නම් වහාම ස්ථාන මාරුවකට ලක්වීමත් සිදු වෙන්න ඕනෑ. හැබැයි, එහෙම වෙන්නේ නැතිව මොකක්ද කරන්නේ? උද්ඝෝෂණ සම්බන්ධයෙන් රටට ප්‍රකාශ කරන්න කියා එතුමා මාධ්‍ය දැනුවත් කරන බවට අපට තොරතුරු තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පොලිසියේ සමහර උසස් නිලධාරින් මේ ආණ්ඩුවේ දේශපාලන පළි ගැනීම් සිදු කිරීම සඳහා භාවිත කරන තැනකට අද ගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා අපි ඉතාම කනගාටු වනවා, මේ රටේ නීතිය හා සාමය බරපතළ ලෙස හානියට පත් වෙලා තිබෙන යුගයක අපට ගමන් කිරීමට සිදුවීම ගැන. අපට නැවත 1988-1989 ප්‍රේමදාස මහත්මයාගේ යුගය මතක් වෙනවා. එදා වෙච්ච සිද්ධීන් අද මේ රටේ සිදු වෙමින් පවතිනවා. ඒ සිදුවෙමින් පවතින්නේ, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා මේ ගෞරවණීය සභාවේ ඇමතිවරයෙක් හැටියට කටයුතු කරද්දීයි. එතුමාගේ පියාගේ යුගයේ ඇති වුණු තත්ත්වය නැවත හිස ඔසවමින් පවතිනවා නම්, ඒ තත්ත්වය මර්දනය කිරීම සඳහා රජයේ ඇමතිවරයෙක් හැටියට මැදිහත්වීමේ වගකීමක් එතුමාට තිබෙනවා. හැබැයි, එතුමා එහෙම මැදිහත් වෙන්නේ නැහැ, එතුමා මඟ හැරලා; කර ඇරලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන්ම ආණ්ඩුවෙන් මේ කාරණය අහන්න කැමැතියි. මේ රටේ 71,000ක් රැකියා විරහිත උපාධිධාරින් ඉන්නවා. අවසාන වරට රැකියා විරහිත උපාධිධාරින්ට රැකියා ලබා දුන්නේ, අද විපක්ෂ නායකතුමා වන මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමායි.

උසස් පෙළ විභාගයෙන් ඉහළම ප්‍රතිඵල ගන්නා ශිෂ්‍යයන් 14 දෙනෙකුට ඔක්ස්ෆර්ඩ්, හාර්වඩ් වැනි විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීමට විදේශ ශිෂ්‍යත්ව ලබා දෙන්න යෝජනා කර තිබෙනවා. ඒ සඳහා ආණ්ඩුවේ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ලංකාවේ ඉහළම ප්‍රතිඵල ගත්තත්, ඔක්ස්ෆර්ඩ්, හාර්වඩ් විශ්වවිද්‍යාලවලට එම ශිෂ්‍යයන් බඳවා ගැනීමට බැඳිලා නැහැ. ඔවුන්ගේ බඳවා ගැනීමේ වෙනම ක්‍රියාවලියක් තිබෙනවා. හැබැයි ඒකට ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ? තෝරා ගන්නා 14දෙනෙකුට එම ශිෂ්‍යත්ව ලබා දීම සම්බන්ධයෙන් අපේ විරෝධතාවක් නැහැ, ඒක හොඳයි. නමුත්, අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂ 2,500ක් වෙන් කරද්දී, මේ රටේ 71,000ක් වන රැකියා විරහිත උපාධිධාරින්ට මොකද වෙන්නේ? අද උපාධිධාරින් ඔවුන්ගේ වගකීම රජය භාර ගත යුතුයි කියා පාරක් පාරක් ගානේ යනවා. එහෙම යද්දී පොලීසිය දම්මලා තමුන්නාන්සේලා ඔවුන්ට පහර දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයත් පසුගිය අවුරුදු හතර තුළ ඉදිරිපත් කළ අය වැයට වෙනස් නැහැ. බොරුවක් තමයි මේ මතු කරලා තිබෙන්නේ. ඉටු කළ නොහැකි, ඉතාම අසාර්ථක අය වැයක් බවට මේ අය වැය පත් වෙනවාය කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාවේ කටයුතු දහවල් 1.30 දක්වා අත් හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப.1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්තුමිය**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රවින්ද්‍ර සමරවීර මහතා (කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமரவீர- தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - Non Cabinet Minister of Labour and Trade Unions Relations)
"ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு அனுரா சிட்னி ஜயரத்னதலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 20ක් දෙනවාය කියා ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩි 15ක් තිබෙන බව තමයි සඳහන් කර තිබෙන්නේ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

ඔබතුමා පොඩ්ඩක් ඒක බලන්න. මගේ නම හතරවැනියාට මාරු කර මට විනාඩි 20ක් කියා දැම්මා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සාර්ථක අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ ගරු මුදල් ඇමතිතුමාට සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සුබ පතන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. රජයටත් මගේ සුබ පැතුම් පිරිනමනවා.

අපි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ ඡන්දය දිනන අය වැයක් හැටියට නොවෙයි. විරුද්ධ පක්ෂය නම් හිතාගෙන ඉන්නේ අපි මේ ඔක්කොම කරන්නේ ඡන්දය ගන්න, ඡන්දය දිනන්න කියායි. නමුත් අපි ඡන්දය දිනන අය වැයක් ඉදිරිපත් කර නැහැ. ජනතාව ආර්ථික බරෙන් මුදාගෙන ඔවුන්ට අත්‍යවශ්‍ය සුබසාධන සේවා ලබා දී රට ඉදිරියට ගෙන යන්න, දුර ගමනක් යන්න තමයි අපි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ; ඒ සඳහායි අපි උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු මේ අය වැය ලේඛනයට තදින් පහර දෙන හැටි මම අහගෙන හිටියා. අපි විරුද්ධ පක්ෂය ආණ්ඩු කළ ඒ අවසාන අවුරුදු දහය අරගෙන බලමු. ඒ අය කථා කරන විධියට නම් ඒ කාලය තුළ මේ රටේ ජනතාවට ආර්ථික පීඩනයක් තිබිලා නැහැ. ඒ අවුරුදු දහය තුළ හැම දෙයකින්ම සුඛිත මුදිත වුණු, සර්ව සම්පූර්ණ වෙලා තිබුණු රටක ජීවත් වුණු අය වාගේ තමයි එතුමන්ලා කථා කරන්නේ.

බොහෝ මන්ත්‍රීවරු ණය බර ගැන කථා කළ නිසා මා අමුතුවෙන් ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත් ඒ කාලයේ ආර්ථිකයට බලපෑ කරුණු ගැන මෙහි සිටින මන්ත්‍රීවරුන්ට නැවත මතක් වෙන්න උදාහරණ කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. රට පාන් භාගයකුයි පරිප්පුයි කාලා ජීවත් වෙන බෙහෝ පිරිසක් මේ රටේ ඉන්නවා. ටීවී එකේත් සමහර වැඩසටහන්වල මම දකිනවා, "මොනවාද රට කෑවේ?" කියා කර්මාන්තශාලාවල වැඩ කරන අයගෙන් ඇහුවොත් ඒ අය කියන්නේ, "පාන් භාගයයි පරිප්පුයි" කියලායි. පසුගිය ආණ්ඩුව කාලයේ -ඒ අවුරුදු දහය ඇතුළත- පාන් රාත්තල රුපියල් 10 සිට රුපියල් 60 දක්වා වැඩි වුණා. පාන්වල විතරක් නොවෙයි නේ, මිල වැඩි වුණේ. ඒවාට සමගාමීව භූමිතෙල් ගැලුමක මිල දෙගුණයකින් වැඩි වුණා; පෙට්‍රල් ගැලුමක මිල දෙගුණයකින් වුණා. ඒ ආකාරයට හැම දෙයකම මිල දෙගුණ තෙගුණ වුණා. සංවර්ධනය පැත්තෙන් බැලුවත් එහෙමයි. අධ්‍යාපනය එහෙම කඩා වැටී තිබුණු ආකාරය ගැන මම පසුව කථා කරන්නම්. හැම වෙලාවේම ආගම ධර්මය ගැන වර්ණනා කරන කට්ටියක් තමයි ඉන්නේ. ඒ අය හැම වෙලාවේම බුද්ධාගම විකුණලා තමයි ඡන්ද ගන්න හදන්නේ. බුද්ධාගම කඩා වැටුණු ආකාරයත් මම ඉදිරියේදී ටිකක් වැඩියෙන් විස්තර කරනවා.

ඒ කාලයේ කථා කළේ චින්තනයෙන් ජනතාවගේ බඩ පිරෙනවා වාගේයි. ජනතාවට කන්න බොන්න නැති වුණත්, චින්තනය දියකර පොවනවා. තමුන්නාන්සේලාගේ නායකයාගේ චින්තනය! චින්තනයේ පිහිටෙන් තමයි ඒ කාලයේ හැම දෙයක්ම සිදු වුණේ. බඩගිනි වුණාම ජනතාවට කරන්න තිබුණේ කට අරින්න විතරයි. චින්තනයේ පිහිටෙන් කටට කෑම වැටෙනවා; චින්තනයේ පිහිටෙන් බඩට කෑම ගිහින් දිරවනවා. ටොයිලට් යන්නේත් චින්තනයේ පිහිටෙන්. ඊට පස්සේ සෝදා ගන්න වෙන්නේත් චින්තනයේ පිහිටෙන් තමයි. ඒ වාගේ කාලයක් තිබුණාය කියා තමයි මේ ගොල්ලෝ කියන්නේ. නමුත් ඒ කාලයේ රටේ ජනතාව විශාල ආර්ථික පීඩනයකට අහුවෙලා තමයි ජීවත් වුණේ.

අපේ රජය බලයට පත්වෙලා කළ ප්‍රධානම දෙය තමයි, මේ රටේ සංවර්ධනයට අවශ්‍ය පරිසරය ගොඩනැඟීම. අය වැයෙන් පමණක් රටක් ඉදිරියට ගෙනයන්න බැහැ. සංවර්ධනය වෙන රටක් වුණොත්, ඒ රටට අවශ්‍ය කරන පරිසරයක් තිබෙනවා. ඒ පරිසරය ජනහිතකාමී පරිසරයක් වෙන්න ඕනෑ; එහි ජනතාවට ජීවත් වෙන්න පුළුවන් වෙන්න ඕනෑ. තමුන්නාන්සේලාට මතක ඇති, අපි මේ රජය භාරගත් ගමන්ම නිදහස් කොමිෂන් සභා ස්ථාපිත කළ බව. ඒවා කළේ ජනතාවගේ ආරක්ෂාව සහ ජනතාවගේ නිදහස සනාථ කරන්නයි. අපි ස්වාධීන පොලිස් කොමිසම පිහිටෙව්වා. දැන් පොලීසි නිදහසේ වැඩ කරනවා. කැලණියේ මගේ හිතවත් මන්ත්‍රීතුමා එහා පැත්තේ වාඩි වෙලා ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි වැරදිලාවත් පොලීසියකට ගිහිල්ලා OICගේ පුටුවේ වාඩි වෙන්නේ නැහැය කියා. මේ අවුරුදු දෙකහමාරටම මම කැලණිය පොලීසියට ගොඩවෙලා නැහැ. ඒ වාගේම අපි අධිකරණ සේවා කොමිෂන් සභාව හැදුවා. අපි ඒවාට ඇඟිලි ගහන්නේ නැහැ. අද අධිකරණය නිදහසේ තීන්දු දෙනවා. මේ රටේ ප්‍රධාන පුරවැසියා වැරදි වැඩ කළාමත්; ව්‍යවස්ථා විරෝධී වැඩ කළාමත් අධිකරණය ඒවාට විරුද්ධව තීන්දු දුන්නා. ඒ තරමට අපි අධිකරණයට නිදහසක් ලබාදී තිබෙනවා. අද ස්වාධීන මැතිවරණ කොමිසමක් තිබෙනවා. ඒ ස්වාධීන මැතිවරණ කොමිසම හරහා අපි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර තිබෙනවා. මේ කාලයේ පැවැත්වෙන මැතිවරණවලදී අතීතයේ වාගේ ගල්, පොලු, මුගුරු අරගෙන පහර දීලා, හොර ඡන්ද දමලා, හොරෙන් ඡන්ද පෙට්ටි උස්සලා,- [බාධා කිරීමක්]මොකක්ද ඔබතුමා කිව්වේ? ආපසු කියන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

කොමිසම මැතිවරණ පවත්වන්නේ නැහැ නේ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

ගරු මන්ත්‍රීතුමනි, ඒවා තියන්න වෙලාව එනතුරු ඔබතුමන්ලා ඉවසාගෙන ඉන්න ඕනෑ. හදිසි වුණාට ඒවා එහෙම පවත්වන්න බැහැ. ඒවා වෙලාවට පවත්වනවා. ඕනෑ වෙලාව මොකක්ද කියා ජනතාව තමයි තීරණය කරන්නේ. ඉදිරියේදී ඒවා ආවාම අපි තරගයට බහිමු.

මේ රටේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස කවදාවත් නොතිබුණු විධියට අපි අද අරගෙන දීලා තිබෙනවා. තමුන්නාන්සේලාට මතක ඇති, අතීතයේ උද්ඝෝෂණ පැවැත්වෙනකොට සිද්ධ වුණු දේවල්.

[ගරු සරත් ෆොන්සේකා මහතා]

කටුනායක රොෂේන් චානකට වෙඩි තියපු හැටි; හලාවත ඇන්ටනිට වෙඩි තියපු හැටි; රතුපස්වල ජනතාව වතුර ඉල්ලුවාම වෙඩි තියපු හැටි තමුන්නාන්සේලාට මතක ඇති. හැබැයි අපේ ආණ්ඩුව ආවාට පස්සේ ඒ වාගේ ප්‍රහාර, දාමරික මැර ක්‍රියා සිද්ධ වෙන්නේ නැහැ. ජනතාවට අපි ඒ නිදහස දීලා තිබෙනවා.

මීට දවස් තුන හතරකට කලින් අපිට මේ පාර්ලිමේන්තුවටත් එන්න බැරිව තිබුණා. මොකද, පාර්ලිමේන්තුවට එන මාර්ගයේත් උද්ඝෝෂණයක් තිබුණා. ඒ අතිනුත් අපි නිදහස ලබාදීලා තිබෙනවා.

ඊළඟට, අපි මාධ්‍ය නිදහස ලබා දීලා තිබෙනවා. අතීතයේදී වාගේ මාධ්‍යවලට පහර දෙන්නේ නැහැ; මාධ්‍ය ආයතනවලට ගිනි තියන්නේ නැහැ; කැමරා පොළොවේ ගහන්නේ නැහැ; පහර දෙන්නේ නැහැ. ඒ නිසා මාධ්‍ය දැන් නිදහසේ අපට මඩ ගහනවා. මාධ්‍යවලට දුන්න නිදහස ඒ අය සාධාරණව පාවිච්චි කරනවාය කියා මම හිතන්නේ නැහැ. හැබැයි, ඒකෙනුත් තමුන්නාන්සේලාට තමයි වාසි වුණේ. මාධ්‍ය දැන් ලිහා දමලා වාගෙයි වැඩ කරන්නේ. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. අපි ප්‍රතිපත්තියක් හැටියට මාධ්‍ය නිදහස ලබා දුන්නා.

ඊළඟට, මේ රජය මේ අය වැය හරහා ලබන ප්‍රගතිය පිළිබඳව මම ඉතා කෙටියෙන් කියන්නම්. කාල වෙලාව පිළිබඳ ප්‍රශ්න තිබෙන නිසා මම දීර්ඝ වශයෙන් ඒ ගැන කථා කරන්නේ නැහැ. බොහෝ අය මේ කාරණා දීර්ඝ වශයෙන් විස්තර කළා. ඉතා වැදගත් කියා මා හිතන දේවල්, ජනතාවට ඇඟට දැනෙනවාය කියා හිතන දේවල් කීපයක් පමණක් මම කෙටියෙන් සඳහන් කරන්නම්. 2019 වසර වෙනකොට අපි ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය ආදායම දෙගුණයක් කරගෙන තිබෙනවා. 2014දී රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,232යි. මේ වෙනකොට රාජ්‍ය ආදායම දෙගුණයක් වන තත්ත්වයට අපේ ආර්ථිකය ඉදිරියට අරගෙන ඇවිත් තිබෙනවා; ගොඩනඟා තිබෙනවා.

සමෘද්ධි සහනාධාරය ලබාදීම ගැනත් මම කියන්න ඕනෑ. මේ රටේ දුප්පත්කම නැති කරන්න ඒ ජනතාව වෙනුවෙන් සුබ සාධන කටයුතු ක්‍රියාත්මක කළාය, දුප්පතුන්ට පිහිට වුණාය කියන තමුන්නාන්සේලාගේ රජය කාලයේ, මේ රටේ සමෘද්ධිලාභීන් දහහතරලක්ෂයක් හිටියා. දුප්පතාට පිහිට වෙනවාය කියන්නේ සමෘද්ධිය වැඩි වැඩියෙන් දෙන එක නොවෙයි. දුප්පත්කම තුරන් කරන්න ක්‍රියාමාර්ග ගන්න ඕනෑ; ජනතාවට ආදායම් ලැබෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒවා කරන්නේ නැතිව තමුන්නාන්සේලා දහහතර ලක්ෂයකට සමෘද්ධිය දුන්නා. ඒ අතරේ, දේශපාලන පළි ගැනීම් තිබුණු ආකාරය අපි දැක්කා. එක්සත් ජාතික පාක්ෂිකයන්ට සමෘද්ධිය ලබා ගැනීමේ හැකියාවක් තිබුණේ නැහැ. දහහතරලක්ෂයකට සමෘද්ධිය දීලා ඒ ගොල්ලන් දේශපාලන ග්‍රහණයට අල්ලා ගෙන, ඒ ගොල්ලන් උද්ඝෝෂණවලට ගෙනෙනවා; දේශපාලන රැස්වීම්වලට ගෙනෙනවා. තමුන්නාන්සේලා ඒ හරහා දේශපාලන වාසි ලබා ගත්තා. එසේ වාසි ලබා ගන්න ඒ ගොල්ලන් හැම දාම දුප්පත් කරලා එතැනම තියලා තිබ්බා. ඒ ගොල්ලන්ට ඔළුව උස්සන්න දුන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ කාලයේ සිට අසාධාරණයට ලක් වුණු ලක්ෂ 6ක පිරිසකට අපි මෙවර අලුතින් සමෘද්ධිය ලබා දෙනවා.

මෙවර අය වැය හරහා අලුතෙන් ලක්ෂ 6කට සමෘද්ධිය ලබා දෙනවා. අපේ දින 100 ආණ්ඩුව ආපු හැටියේම දේශපාලන භේදයකින් තොරව ලක්ෂ 14ක් වූ සමෘද්ධිලාභීන්ගේ ප්‍රතිලාභ දෙගුණයක් කළා. දුප්පතුන්ට සහනයක් වෙන ආකාරයට ඉතා සද්භාවයෙන් යුතුව මේ රජය දුප්පතුන් දිහා බ ලා තිබෙනවා. ඒ අනුව තමයි මම ඉස්සෙල්ලා කිව්වේ, අපේ පරමාර්ථය සමෘද්ධිලාභීන් වැඩි කරන එක නොව දුප්පතුන්ට ආදායම් මාර්ග වැඩි කරන එකයි කියා. අගමැතිතුමාගේ ආර්ථික සංකල්පනා මත රටේ දුප්පත් බව තුරන් කර ආදායම් මාර්ග වැඩි කරන්නයි අපි හදන්නේ. සමහරු කියන ඒවා අපට ඇහෙනවා. "තව දෙනවා. මම අරක නිකම් දෙනවා. මේක නිකම් දෙනවා." කියනවා. එවැනි කථා කියනවා. අපේ පැත්තේ අයත් සමහර අවස්ථාවලදී කියනවා. දැන් පාසල් ළමයෙකුට දෙන්නේ එක නිල ඇඳුම නම්, "මම ආවොත් නිල ඇඳුම් දෙක දෙක දෙනවා." කියනවා. ඊට පස්සේ තවත් එකක් නිකම් දෙනවා කියනවා. ඒ ක්‍රමය අපි අනුමත කරන්නේ නැහැ. පොහොර නිකම් දෙනවා කියනවා. ඉඩම් නිකම් දෙනවා කියනවා. ඒක අපි අනුමත කරන්නේ නැහැ. දුප්පතුන්ට හැමදේම නිකම් දෙන එක නොවෙයි රටක් දියුණු කිරීමට කළ යුතු දේ. දුප්පත්භාවයෙන් මුදා ගෙන, ඔවුන්ට මධ්‍යම පන්තිය දක්වා ඉහළට යාමට අවස්ථාවක් සැලසීමයි. ඒ නිසා අගමැතිතුමාගේ සංකල්පය අනුව අපේ ප්‍රාර්ථනාව තිබෙන්නේ, දුප්පතුන් දුප්පත්භාවයෙන් මුදවා ගන්නයි. ඔවුන්ගේ ආදායම් මාර්ගය වැඩි කර, අවුරුදු 5ක්, 6ක් ඇතුළත දුප්පතුන්ගේ හිඟයක් ඇති වන තැනට මේ රට ඉදිරියට ගෙන යන්නයි, මධ්‍යම පන්තිය වැඩි කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටියන්ට සලකන සංස්කෘතියක් අපට තිබෙනවා. එම නිසා වැඩිහිටි දීමනාව වැඩි කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ වකවානුවේ අවසාන අවුරුදු 10දීවත් වෙනස් වුණු නැති වැඩිහිටි දීමනාව රුපියල් 1,000 ඉඳලා රුපියල් 2,000 දක්වා වැඩි කර තිබෙනවා. විශේෂ හැකියා ඇති පුද්ගලයින් සම්බන්ධයෙනුත් පියවර අරගෙන තිබෙනවා. ඒ කියන්නේ, යම් කිසි ශාරීරික ආබාධවලට ලක් වෙලා, ඔවුන්ට තිබෙන්නේ විශේෂිත වූ හැකියාවන් පමණයි. එවැනි පුද්ගලයින් පෞද්ගලික අංශයේ රැකියාවලට යොදවනවා නම්, ඔවුන්ගේ වැටුපට රුපියල් 15,000ක් රජයෙන් එකතු කිරීමට පියවර අරගෙන තිබෙනවා. ඒක ඉතාම වැදගත් දෙයක්. එවැනි අය වෙනුවෙන් අපි මානුෂීයභාවයේ නාමයෙන් ඔවුන්ගේ පැවැත්ම සඳහා ඔවුන්ට අත හිත දීමක් හැටියට, ඔවුන්ව මේ සමාජයේ කොන් කරන්නේ නැතිව ඔවුන්ට පිළිසරණක්වීම සඳහා අපි ගත් පියවරක්. මාසයක වැටුපට අමතරව රුපියල් 15,000ක් ලබා දීමට ක්‍රියා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය රජය කාලයේදී ගැබිනි මව්වරුන්ට රුපියල් 500ක දීමනාවක් දුන්නා. අපි ඒක 2000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ රුපියල් 500 යථාර්ථයක් නොවෙයි. ඒ මුදලෙන් කරන්න පුළුවන් දෙයක් නැහැ. මම හිතන්නේ ළදරුවෙකුට අවශ්‍ය ඇඳුම් ටික හදා ගන්නත් බැහැ. මවකගේ පෝෂණය වැඩි කිරීමේ අරමුණින් යුතුව අපි ඒ මුදල රුපියල් 500 ඉඳලා රුපියල් 2,000 දක්වා වැඩි කර තිබෙනවා.

අපි රජයේ සේවකයා ආරක්ෂා කර තිබෙනවා. රජයේ සේවකයින්ට ලැබෙන ප්‍රතිලාභ වැඩි කර තිබෙනවා. මමත් අවුරුදු 40ක් තිස්සේ රජයේ සේවයේ හිටපු කෙනෙක්. මටත් විශ්‍රාම යනකොට මාසයකට අතට ආවේ රුපියල් 65,000ක් පමණයි. හොඳ වෙලාවට ඒ කාලයේ මගේ දරුවෝ දෙන්නා ගෙදර හිටියේ නැහැ. දරුවෝ දෙන්නා අපෙන් වෙන් වෙලා ගිහින් රැකියා කරනවා. ඒ නිසා මටයි, බිරිඳටයි යමතම් කාලා ඇඳලා ජීවත් වෙන්න ඒ මුදල ඇති වුණා. නමුත්, රජයේ සේවකයාට අත හිත දීමක් හැටියට අපේ ආණ්ඩුව ආපු ගමන්ම -දින 100 ආණ්ඩුවේදී- රජයේ සේවකයාට රුපියල් 10,000කින් වැටුප් වැඩි කළා. රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීම් ගැන බැලුවොතින්, කාර්යාල කාර්ය සහායක කෙනෙකුට අපේ ආණ්ඩු කාලය තුළ රුපියල් 11,730 ඉඳලා රුපියල් 21,746ක් දක්වා වැටුප් වැඩි වෙලා තිබෙනවා,

හෙදියකට රුපියල් 15,620 ඉඳලා රුපියල් 29,144ක් දක්වා වැටුප් වැඩි වෙලා තිබෙනවා; එම වැඩිවීම දෙගුණයකට කිට්ටුයි. උපාධිධාරි ගුරුවරයෙකුට රුපියල් 16,100 ඉඳලා රුපියල් 29,860ක් දක්වා වැටුප් වැඩි වෙලා තිබෙනවා. අමාත්‍යාංශ ලේකම් කෙනෙකුට රුපියල් 40,515ක ඉඳලා රුපියල් 88,423ක් දක්වා වැටුප් වැඩි කර තිබෙනවා. මේවා වාර්තාගත වැටුප් වැඩිකිරීම්. පසුගිය අවුරුදු 4ක් ඇතුළත කරපු වැටුප් වැඩිකිරීම් මීට පෙර අවුරුදු 15ක් ඇතුළතවත් සිදුකළ වැටුප් වැඩිකිරීම්වලට වඩා වැඩියි. මේ මඟින් අපි රජයේ සේවකයාට ඉතා විශාල සේවයක් කර තිබෙනවා. රජයේ සේවයේ යෙදෙන සියලු දෙනාටම ජීවත්වීම සඳහා -ඔවුන්ගේ ආර්ථිකය ගොඩනැඟීම සඳහා- වැඩි ආදායම් ලබා දීමට ක්‍රියා කර තිබෙනවා. විශ්‍රාමිකයින් සඳහාද අපි පියවර ගෙන තිබෙනවා. 2006 පැවති විශ්‍රාමික වැටුප් විෂමතාව 2015 වසර වන විට අපි ඉවත් කළා. ඊළඟට, 2017ට පෙර විශ්‍රාම ගිය අයවලුන්ගේ විශ්‍රාම වැටුප 2017 වසර පදනම්කොට ගළපා සකස් කළා.

2017 වසරට ගැළපූ විශ්‍රාම වැටුප 2019 වසරට අදාළ පරිදි නැවතත් වැඩි කළා. මේ ආකාරයට විශ්‍රාමිකයින්ට ජීවත් වීමට තිබුණු දුෂ්කරතාව නැති කළා. විශ්‍රාම වැටුපකින් ජීවත් වෙන්න හරි අමාරුයි. මම හමුදාපති වෙලා ඉඳලා විශ්‍රාම ගියාට පසු මට විශ්‍රාම වැටුප හැටියට මාසයකට රුපියල් 55,000යි ලැබුණේ. මට ඒකෙන් විදුලිබිල ගෙවා ගන්න පුළුවන්, වතුර බිලෙන් භාගයක් ගෙවන්න පුළුවන්, එච්චරයි කරන්න පුළුවන්. ඒ මුදල කන්න, බොන්න, අඳින්න ප්‍රමාණවත් නැහැ. ඒ නිසා රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප වැඩි කිරීම ඉතාම ගුණවත්, කෙළෙහි ගුණ දැක්වීමේ ක්‍රියාදාමයක පියවරක් හැටියටයි මම දකින්නේ.

පසුගිය රජය කාලයේ අපට කන්න බත සපයන ගොවි මහත්වරුන්ගේ විශ්‍රාම වැටුප් පවා අහෝසි කළ බව තමුන්නාන්සේලාට මතක ඇති. ගොවි මහත්වරුන්ගේ විශ්‍රාම වැටුප් හිටපු ගමන්ම නැවැත්තුවා. ගොවියා අවුරුදු ගණනක් අතරමං කර සිටියා. ගොවියාට යන එනමං නැතිව හිටියා. වයෝවෘද්ධ ගොවි මහත්වරුන්ට කිසිම ආදායමක් නැතිව ජීවත් වෙන්න බැරි කාලයක් ඇති වෙලා තිබුණා. ඒ නිසා වයෝවෘද්ධ, විශ්‍රාම වයසේ සිටින අය එවැනි තත්ත්වයට පත් නොකරන්න අපි වැඩ කර තිබෙනවා.

අධිකරණ ක්ෂේත්‍රයේ විනිසුරුවරුන්ගේ වැටුප අපි තුන්ගුණයකින් පමණ වැඩි කළා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු රුපියල් ලක්ෂ දෙකකට අඩු වැටුපක් ලැබුවේ. අපි ඒ වැටුප රුපියල් ලක්ෂ 5ක් පමණ දක්වා වැඩි කර තිබෙනවා. ඒ ආකාරයට එතැනින් පහළට අභියාචනාධිකරණවල, මහාධිකරණවල විනිසුරුවරුන් කාටවත් අත පාන්නේ නැතිව, කොන්ද කෙළින් තියාගෙන ජීවත් වන අතරේ රැකියාව ස්වාධීනව කරන්න පුළුවන් පරිසරයක් ගොඩ නැඟීම සඳහා අපි කටයුතු කර තිබෙනවා.

මීට ඉස්සෙල්ලා පොලිස් නිලධාරින් ගැනත් කථා කරනවා මම අහගෙන හිටියා. පොලිස් නිලධාරින් දැනගෙන හිටියේ සැලියුට් ගහන්න විතරයි කිව්වාලු. ඒ ගැන පොලිසිය භාර හිටපු ඇමතිතුමා කිව්වා. අපි පොලිස් නිලධාරින්ගේ වැටුපෙන් සියයට 40ක දීමනාවක් ඒ අයට ලබා දෙනවා. රජයේ සේවකයින්ට වැඩි වුණු රුපියල් 10,000 ඒ අයටත් ලැබුණා. ඊට අමතරව, තව සියයට 40ක දීමනාවක් ලබා දී තිබෙනවා. ත්‍රිවිධ හමුදාවේ අයට අවශ්‍ය දීමනා කිහිපයක්ම වැඩි කළා. ඔවුන්ට දීර්ඝ කාලයක් තිස්සේ වැඩි නොකළ නිල ඇඳුම් දීමනාව ඇතුළු අනෙකුත් දීමනා වැඩි කර තිබෙනවා. කමාන්ඩෝ සෙබළුන්ට, විශේෂ බලකායේ සෙබළුන්ට ලබා දුන් රුපියල් 1,000ක විශේෂ දීමනාව අපි රුපියල් 5,000 දක්වා වැඩි කළා. නමුත්, මීටත් වඩා ඒ අයට අවශ්‍ය යම් යම් දේවල් තිබෙන බව මා දන්නවා. අපි රණ විරුවා බලා ගන්නවා. අපි රණ විරුවන්ගෙන් පළි ගන්නේ නැහැ. රණ විරුවන් හිරේ දමන්න ලැහැස්ති වෙන්නේ නැහැ. හමුදාපතිවරුන්ගේ චරිත ඝාතනය කරන්නේ නැහැ. රණ විරු පවුල්වලින් පළි ගන්නේ නැහැ. නමුත්, රණ විරුවෝ මිනී මරලා තිබෙනවා නම් ඒ අයට විරුද්ධව අපි නීතිය ක්‍රියාත්මක කරනවා. මේ දවස්වලත් තමුන්නාන්සේලා දකිනවා ඇති, යුද කාලයේ හිටපු නාවික හමුදාපති උසාවි ගානේ බඩගානවා අත්අඩංගුවට ගන්න එපා කියා ඉල්ලමින්. නමුත්, ඔහුට විරුද්ධව චෝදනාවක් තිබෙනවා, යුද සමයේ කප්පම් ගන්න දරුවන් 11දෙනෙකු පැහැර ගෙන ගිහිල්ලා, ඒ කප්පම් නොලැබුණු නිසා ඔවුන් ඝාතනය කිරීමේ සිද්ධිය පිටුපස එතුමාත් සිටියා කියා. එහෙම නම් ඉතින් එතුමාටත් අනෙක් අයට වාගේ අනිවාර්යයෙන් දඬුවම් ලැබිය යුතුයි. මනුෂ්‍ය ඝාතනය වෙනුවෙන් ලැබිය යුතු දඬුවමට එතුමාට මුහුණ දෙන්න සිද්ධ වේවි. අපි රණ විරුවෝ ආරක්ෂා කරනවා. නමුත්, රණ විරුවන් මුවාවෙන් ඉඳගෙන මිනී මරාපු අය, අපරාධ කරපු අය ආරක්ෂා කරන්න අපි ඉදිරිපත් වන්නේ නැහැ.

හැම දේම රජයේ සේවය හරහාම කරන්න බැහැ. හැම කෙනාටම රජයේ සේවකයකු වෙන්න බැහැ. දියුණු වන රටක අනිවාර්යයෙන්ම ව්‍යාපාර ඉදිරියට යන්න ඕනෑ. ඒ නිසා "Enterprise Sri Lanka" වැඩසටහන හරහා අපි තරුණ තරුණියන්ට, නොයෙකුත් ව්‍යාපාරවල යෙදෙන සියලුම දෙනාට රුපියල් 30,000 සිට ඉහළට රුපියල් මිලියන 300 දක්වා -රුපියල් කෝටි 30- දක්වා ණය මුදල් ලබා ගැනීමට ක්‍රමවේදයක් හදා තිබෙනවා. ඒ ණය මුදල් මේ වනකොටත් වැඩි හරියක්ම අරගෙන තිබෙන්නේ, පොහොට්ටුව පක්ෂයේ අයගේ යහළුවන්, හිතවතුන්. අපේ අයටත් වඩා ඒ අයයි අරගෙන තිබෙන්නේ. ඒ ණය මුදලට අය කරන්නේ සියයට 6ක පොලියක්. ඒ කියන්නේ, සාමාන්‍යයෙන් අය කරන පොලියෙන් සියයට 50ක් අඩු කර සියයට 6ක පොලියට මේ ණය මුදල ලබා දෙනවා. මේ ආකාරයට ව්‍යාපාර දියුණු කිරීම සඳහා ඉතාම හොඳ දුර දක්නා නුවණින් යුතුව මුදල් ඇමතිවරයා මේ කටයුත්ත කර තිබෙනවා. අපි අධ්‍යාපනයට විශාල මුදලක් වැය කරනවා. මම හිතන විධියට අපේ Budget එකෙන් මහාමාර්ග සඳහා වෙන් කරන මුදලට පසු වැඩියෙන්ම මුදල් වෙන් කරන්නේ අධ්‍යාපනය දියුණු කරන්නයි.

පාසල් ගොඩනැඟිලි, උපකරණ, කාර්ය මණ්ඩල ආදී හැම දේම අපි විශාල වශයෙන් දියුණු කළා. අනෙක් පැත්තෙන් මහපොළ ශිෂ්‍යත්වය රුපියල් 2,500ට සිට රුපියල් 5,000 දක්වා, දෙගුණයකින්, වැඩි කරලා තිබෙනවා. ශිෂ්‍යාධාර රුපියල් 2,000 සිට රුපියල් 4,000 දක්වා වැඩි කරලා තිබෙනවා. අපි පාසල් ගොඩනැඟිලි හදාගෙන ශක්තිමත් කරගෙන ගියත්, පසුගිය ආණ්ඩුව කාලයේ -රාජපක්ෂ යුගයේ- මේ රටේ පාසල් 2,000ක් වැහුණු බව මම මේ වේලාවේ මතක් කරන්නට ඕනෑ. එම අවුරුදු දහය ඇතුළත පාසල් 2,000ක් වැහුණා. නමුත් අපි තිබෙන පාසල් දියුණු කරලා "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ පාසල් ශක්තිමත් කිරීමේ ක්‍රියාදාමයක් කරගෙන යනවා.

රටක දියුණුවට මාර්ග සංවර්ධනය අත්‍යවශ්‍ය දෙයක්. මාර්ග සංවර්ධනය සඳහා අපි රුපියල් බිලියන දෙසීයකට අධික මුදලක් වෙන් කරලා තිබෙනවා. අපේ අය වැයෙන් අපි වැඩිම මුදලක් වෙන් කරන්නේ මාර්ග සංවර්ධනය වෙනුවෙන්. රුපියල් බිලියන 200ක මුදලින් මධ්‍යම අධිවේගී මාර්ගය -මහනුවර දක්වා යන අධිවේගී මාර්ගය- දැනට හදාගෙන යනවා. අනෙක් පැත්තෙන් මාතර සිට හම්බන්තොටට යන අධිවේගී මාර්ගය හදාගෙන යනවා. අනෙක් පැත්තෙන් කොළඹ අවට තදාසන්න ප්‍රදේශවල වාහන තදබදය අවම කිරීම සඳහා සැහැල්ලු දුම්රියක් ආරම්භ කිරීමට අවශ්‍ය මුදල් වෙන් කරලා මේ වන විට අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යනවා.

'ගම් පෙරළිය' වැඩසටහන ඉතා ජනහිතකාමී වැඩසටහනක්; බිම් මට්ටමේ යටිතල පහසුකම් දියුණු කිරීමට හැකි වැඩසටහනක්.

[ගරු සරත් ෆොන්සේකා මහතා]

පසුගිය වසරේ සෑම ආසනයකටම රුපියල් මිලියන 100 ගණනේ වෙන් කළා. ඒකෙන් බොහෝ දේවල් කර ගන්න අපට බැරි වුණා. මොකද, පසුගිය වසරේ අවසාන කාලයේදී මේ රටේ පාලකයා කරපු දේශපාලන කුමන්ත්‍රණය නිසා, ප්‍රජාතන්ත්‍ර විරෝධී, ව්‍යවස්ථා විරෝධී කුමන්ත්‍රණය නිසා අපි කරගෙන ආපු සමහර වැඩ නැවතුණා. තාවකාලිකව ආපු නීති විරෝධී රජය ගම් පෙරළිය වැඩසටහන සම්පූර්ණයෙන් නවත්වන්න කියලා නියෝගයක් නිකුත් කළා. එම නිසා රුපියල් බිලියන 16ක් වෙන් කරලා තිබුණු ගම් පෙරළිය වැඩසටහනින් රුපියල් බිලියන 5ක් පමණයි අපට පසුගිය වර්ෂයේ වියදම් කරන්න ලැබුණේ. ඒකට සම්පූර්ණ වගකීම ගත යුත්තේ මේ රටේ ජනාධිපති සහ ඒ අවස්ථාවේ ආපු නීති විරෝධී රජයයි. මේ වර්ෂයේ අපි ගම් පෙරළිය වැඩසටහනට, ආසනයකට රුපියල් මිලියන 300 ගණනේ රුපියල් බිලියන 48ක්, වෙන් කරලා තිබෙනවා. මේ වැඩසටහන ක්‍රියාත්මක වුණාම මේ රටේ සියලුම ස්ථානවල යටිතල පහසුකම් අවශ්‍යතාවයෙන් සියයට 90ක් මේ වසර අවසන් වන විට අනිවාර්යයෙන් සම්පූර්ණ කර ගන්න පුළුවන්. එම නිසා මේ අවස්ථාවේ ආණ්ඩු පෙරළීම ගැන කථා නොකර අපි සියලුදෙනා, විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් පවා, මේ රට දියුණු කර ගැනීම ගැන සිතා මේ ගම් පෙරළිය වැඩසටහන සාර්ථක කර ගැනීමට අපට ශක්තිය දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, අපි නිහඬව බුද්ධාගමට විශාල සේවයක් කරනවා. අපි නොයෙක් නොයෙක් සන්දර්ශන පැවැත්වූවේ නැති වුණාට, බුද්ධාගම ආරක්ෂා විය යුතුයි කියන එක ව්‍යවස්ථානුකූලව අපි පිළිගෙන තිබෙනවා. ඊට ප්‍රමුඛත්වය දිය යුතුයි. බුද්ධාගම ආරක්ෂා කිරීම සඳහා විශාල මුදල් ස්කන්ධයක් වෙන් කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට මම පසුගිය අවුරුදු දෙක තුන ඇතුළත මගේ ආසනයේ පන්සල් 40කට පමණ රුපියල් මිලියනයකට වැඩි මුදලක් හැම පන්සලකටම ලැබෙන ආකාරයට වෙන් කර දුන්නා. ඒ ආකාරයටම අගමැතිතුමාගේ වැය ශීර්ෂය හරහා එතුමාත් විශාල මුදලක් පන්සල්වල සංවර්ධනය සඳහා වෙනම වෙන් කරන බව මම දන්නවා.

අපි පසුගිය දවස්වල උපන් දින සාදයක් පවත්වන ආකාරය මාධ්‍යයෙන් දැක්කා. ඒ උපන් දින සාදයේ ප්‍රධාන අමුත්තන් වශයෙන් සිටියේ විපක්ෂ නායකතුමා සහ තමුන්නාන්සේලාගේ අනාගත ජනාධිපති අපේක්ෂකයායි. බුදුරජාණන් වහන්සේ කාම සුඛල්ලිකානුයෝගය එපා කියලා තිබෙනවා නේ. ඒ, කාම සුඛල්ලිකානුයෝගයේ කෙළවරටම ගිය උපන් දින සාදයක්. එම උපන් දින සාදයට එන අයට දෙන්න තෑගි භෝග පෙට්ටිවල දමලා pack කරලා තිබෙනවා මම දැක්කා. 'ලුවි විටොන්' කියලා වෙළඳ භාණ්ඩ නාමයක් තිබෙනවා. ඒක ලෝකයේ තිබෙන මිල අධිකම වෙළඳ භාණ්ඩවල නාමය. ඒවා තමයි තෑගි දෙන්න පෙට්ටිවල දමලා තිබුණේ. ලුවි විටෝන් ඩෙනිම් කලිසමක් ගත්තොත් එහි මිල ලක්ෂ දෙකක් විතර වෙනවා. එම ස්වාමීන් වහන්සේගේ උපන් දින සාදයේ තෑගි භෝග වශයෙන් දීලා තිබුණේ ඒ වර්ගයේ ඒවා.

විපක්ෂ නායකතුමාත්, අනාගත ජනාධිපති අපේක්ෂකතුමාත් දෙකට නැමිලා ඒවා පූජා කරනවා අපි දැක්කා. ඒවා ටිකක් අත ගාලාවත් එන්න අපට වාසනාව තිබුණේ නැහැ. මොකද, මේ රටේ සාමාන්‍ය ජනතාවට ලුවී විටෝන්වලින් උපන්දින සාද පවත්වන්න බැහැ. ඒ වාගේ තැන්වලට ආධාර කරන්න අපි ලැහැස්ති වෙලා නැහැ. ඊට අමතරව, constructive criticismවලට අනුව අපි අපේ අඩු පාඩුත් හදාගෙන තමයි ඉදිරියට යන්න ඕනෑ. ඒ නිසා අපේ පැත්තෙත් අඩු පාඩු කිහිපයක් ගැන මම කථා කරනවා. මේ කථා කරන්නේ සද්භාවයෙන්. මේ අඩු පාඩු හදා ගත්තොත් තමයි අපට ජනතාවට හොඳට සේවය කරන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම, අපේ රජය ශක්තිමත් කරගෙන, අපට තවත් ශක්තිමත් වෙලා ඉදිරි ජයග්‍රහණ ලබාගෙන ඉදිරියට යන්න පුළුවන් වන්නේ එතකොටයි. ඒ නිසා අපේ තිබෙන අඩු පාඩු ගැනත් මම හිතට එකඟව කථා කරනවා. ඒ කථා කරන්නේ කවුරුවත් එක්ක වෛරයකින්වත්, ක්‍රෝධයකින්වත් නොවෙයි. කවුරුවත් ගැන ඊර්ෂ්‍යා සහගතවත් නොවෙයි. නමුත්, මේ අඩු පාඩු නිසා අපට යම් යම් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නවලට මුහුණ දීමට අපේ ඉන්න බොහෝ මැති ඇමතිවරුන්ටත් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපේ මේ අඩු පාඩුත් හැදෙන්න ඕනෑ.

මම හිතනවා, මේ සංවර්ධනය හොඳයි කියලා. විශාල සංවර්ධනයකට මේ අය වැයෙන් මාර්ගය සකසලා තිබෙනවා. නමුත් මේක තව තවත් විධිමත් විධියට කරන්න පුළුවන්කම තිබුණා කියලා මම හිතනවා. විශේෂයෙන්ම අය වැයෙන් මුදල් වෙන් කිරීමේදී, මේ මුදල් වෙන් කිරීම ගැන අදාළ මන්ත්‍රීවරු, අමාත්‍යාංශවල ඇමතිවරු එක්ක සාකච්ඡා කළා නම්, සමහර විට මේ මුදල් වෙන් කිරීමේ යම් යම් වෙනස් තැන්, අවශ්‍ය තැන්, අඩු පාඩු වෙලා තිබෙන තැන් හඳුනා ගත හැකිව තිබුණා.

එවැනි සාකච්ඡාවකින්, එවැනි කතිකාවකින් තොරව මුදල් වෙන් කරපු නිසා සමහර තැන්වල අඩු පාඩු තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා ඉදිරියේදී අපේ ආණ්ඩුව ඒ වරද හදා ගනියි කියලා මම හිතනවා.

ඊළඟට, මේ සංවර්ධනයේ ප්‍රතිලාභ සාධාරණව බෙදී යනවා ද යන්න ගැන මට ප්‍රශ්නයක් තිබෙනවා. සමහර වෙලාවට එවැනි ප්‍රශ්නයක් තිබෙනවා. සාධාරණව බෙදී නොයෑමේ කරුණු කාරණා තිබෙනවා. ඒවාට එක පැත්තකින් අපේ රජය වග කියන්න ඕනෑ; අනෙක් පැත්තෙන් අපේ අදාළ ඇමතිවරු වග කියන්න ඕනෑ. ඒ නිසා හැම තැනකදීම සාධාරණ ආකාරයට මේ ප්‍රතිලාභ බෙදිලා ගිහිල්ලා නැහැ. ඒවා හරියට බෙදිලා නොගියොත් ඒකෙන් අන්තිමට වෙන පාඩුවට, හානියට මුහුණ දෙන්න වෙන්නේ, අපි ජනතා නියෝජිතයෝ හැටියට ඉන්න ප්‍රදේශවල ජීවත්වන ජනතාවටයි. ඒ නිසා ප්‍රතිලාභ සාධාරණව බෙදිලා යන ක්‍රමවේදයක් අනිවාර්යයෙන්ම අපේ පක්ෂය හදා ගන්න ඕනෑ. එහෙම නොවුණොත්, අපෙන් සේවය බලාපොරොත්තු වන ජනතාවට, අපි මහජන නියෝජිතයෝ වශයෙන් පෙනී සිටින ප්‍රදේශවල ජනතාවට සාධාරණයක් ඉෂ්ට නොවෙන්න ඉඩ තිබෙනවා. එහෙම වුණොත්, ඒක අපේ දුර්වලකමක් හැටියටයි මම දකින්නේ. හැම ආසනයකටම, හැම මන්ත්‍රීවරයෙකුටම ඉදිරි මැතිවරණවලදී ජයග්‍රහණ ලැබීමේ අවශ්‍යතාව තිබෙනවා. හැම ආසනයක්ම අපි ජයග්‍රහණය කරන්න ඕනෑ. අපට කවුරුවත් අතහැරලා දමන්න බැහැ. මේ ඉන්න ඇමතිවරු පමණක් නොවෙයි, අපේ ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනාම ජයග්‍රහණය කරන්න ඕනෑ. -[බාධා කිරීමක්]- මට ඇහුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමා?

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
එතකොට අපි ජයග්‍රහණය කරන්න එපා ද?

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ජයග්‍රහණය කරන්න පුළුවන් නම් හොඳයි. තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ ඉන්නකම් තමුන්නාන්සේලාට කරන්න පුළුවන්,-[බාධා කිරීමක්]-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක පමණ කාලයක් තිබෙන්නේ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඔබතුමාට ඇසුණා නේ, ගරු මනූෂ නානායක්කාර මැතිතුමාගේ විනාඩි 15ත් මම ලබා ගන්නා බව කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාගේ කාලයත් එක්ක ගත්තාම තමයි ඔබතුමාට තව විනාඩි 02ක් තිබෙන්නේ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
එතකොට දැන් විනාඩි 30ක් ගියා ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්. ගරු මනූෂ නානායක්කාර මැතිතුමාගේ කාලයත් එක්ක ගත්තාම ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මට විනාඩි 5ක් වැඩිපුර දෙනවා කියලා කිව්වා. ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් check කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය වෙන් කරලා තිබෙන්නේ ඒ විධියටයි, ගරු මන්ත්‍රීතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඉතා වැදගත් කාරණා ටිකක් මට කියන්න තිබෙනවා. කරුණාකරලා ඔබතුමා ඒ සඳහා මට ඉඩ දෙන්න. ගරු මුතුකුමාරණ මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට විරුද්ධ පක්ෂයේ සිට කරන්න පුළුවන් එකම දේ තමයි, දූරකථනවලට උත්තර දෙන එකයි, මරණ ගෙවල්වල යන එකයි. ඒවා කරලා ඡන්දයක් දිනන්න අමාරුයි, මුතුකුමාරණ මන්ත්‍රීතුමා. අපි ඒකයි වැඩ කරන්න උත්සාහ කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු වසන්ත අලුවිහාරේ රාජ්‍ය ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් විනාඩි කීපයක් දෙන්න පුළුවන් ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමන්ලාගේ කාලයෙන් දෙන්න එතුමන්ලා කැමති වෙන්නේත් නැහැ. අනෙක් අයට වැඩිය ඔබතුමාට පැය භාගයක් ලැබිලා තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි පහක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය වෙන් කරලා තිබෙන ආකාරය අනුව ඔබතුමාට මීට වඩා වෙලාව දෙන්න පුළුවන්කමක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
කථාවේ හොඳම කෑල්ල තවම එළියට ආවේ නැහැ. ඔබතුමාටත් අදාළ කෑල්ලක් තිබෙනවා කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙලාව සකස් කරලා තිබෙන ආකාරය අනුව ඔබතුමාට මීට වඩා කාලය දෙන්න මට පුළුවන්කමක් නැහැ.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා කියනවා කථා කරන්න කියලා. එම නිසා ඒ ආකාරයට යන්න ඕනෑ. උදාහරණයක් හැටියට ගත්තොත්, ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අපේ රජය යොමු වෙලා තිබෙනවා මදියි කියලයි මම දකින්නේ. ඒකට මම සාපේක්ෂව උදාහරණයක් අරගෙන පෙන්වන්නම්. පසුගිය අවුරුදු තුනහමාරට ගම්පහ දිස්ත්‍රික්කයේ රුපියල් බිලියන 10ක පමණ වැඩ තමයි උපරිමව වෙලා තිබෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කය කියන්නේ, මේ රටේ ජනතාවගෙන් සියයට 10ක් ජීවත් වෙන දිස්ත්‍රික්කය. මිලියන 2.2ක ජනතාවක් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්නවා. ඒ දිස්ත්‍රික්කයේ පසුගිය අවුරුදු තුනහමාරටම රුපියල් බිලියන 10ක විතර වැඩ තමයි උපරිමව වෙලා තිබෙන්නේ.

නමුත්, ඒකේ අනෙක් පැත්ත ගත්තාම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ජීවත්වන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලක්ෂ 5කටත් අඩු ජනතාවක් තමයි ඉන්නේ. ඡන්ද දායකයන් ලක්ෂ 3යි ඉන්නේ. මේ අවුරුද්දේ රුපියල් බිලියන 10ක් වෙන්කරලා තිබෙනවා. ගිය අවුරුද්දේ රුපියල් බිලියන 12ක් වෙන්කරලා තිබෙනවා. ඊට කලින් අවුරුද්දේ රුපියල් බිලියන 13ක් වෙන්කරලා තිබෙනවා. ජනතාවට ලැබෙන්න තිබෙන ප්‍රතිලාභ සාධාරණව බෙදී යන්නේ නැහැයි කියන එකට උදාහරණයක් තමයි මා දුන්නේ.

ඊළඟට, අපේ රජයෙන් රැකියා නිර්මාණය වුණා. නමුත් මේ රැකියා නිර්මාණය වීමේ ප්‍රතිලාභ හැම ජන කොට්ඨාසයකටම, රට පුරාවටම සාධාරණව ලැබුණේ නැහැ. සමහර ඇමතිවරු ඒ අමාත්‍යාංශ හරහා රැකියා 2,000ක්, 3,000ක් දීලා තිබෙනවා.

[ගරු සරත් ෆොන්සේකා මහතා]

නමුත් මගේ ආසනයේ මට දෙන්න පුළුවන් වුණේ රැකියා 100යි. මට යාබද ආසනයේ ඉන්නේ රුවන් විජේවර්ධන ඇමතිතුමා. එතුමාට රැකියා 100ක්වත් දෙන්න බැරි වුණා. ඒ ආකාරයට රැකියා නිර්මාණය සිද්ධ වෙන්නේ ඇමතිවරු ගොඩ නැඟීමට හෝ ඇමතිවරු ආරක්ෂා කිරීමට නම්, රටේ යම්කිසි ජන කොට්ඨාසයකට, බහුතරයකට සාධාරණය ඉෂ්ට වෙන්නේ නැති තත්ත්වයක් ඇති වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මෙතුමන්ලා කිව්වා, මට කථා කරන්නය කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමන්ලා කිව්වොත් කාලය දෙන්නම්.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මට තව විනාඩි 5ක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 5ක් දෙන්න බැරි වෙනවා. ඔබතුමාට නියමිත කාලය අවසානයි. ඒ නිසා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
අපට මේ රජය පවත්වාගෙන යැමට ප්‍රධානම බාධකයක් තිබෙනවා. මේ වනකොට අපේ ආණ්ඩුවට තිබෙන ප්‍රධානම බාධකය තමයි, මේ රටේ ප්‍රධානියා. අපට ආණ්ඩුවක් තිබෙනවා. අපේ ආණ්ඩුවේ ප්‍රධානියා රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. අපි කරන වැඩවලට රටේ ප්‍රධානියා යම් යම් ආකාරයෙන් අකුල් හෙළනවා. ඒ නිසා අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි, මේ වෙලාවේ මේ රටේ ප්‍රධානියාගේ ආශීර්වාදය අපේ රජයට ලැබෙන්නේ නැති එක. ඒ ප්‍රධානියා බොහෝ අවස්ථාවල අපේ රජය ගැන වැරදි මතයක් ගොඩ නඟන්න උත්සාහ කරනවා. "රජය දූෂිතයි" කියන මතය තදින්ම ගෙනයන්න හදනවා. රජය මොන හොඳ දෙයක් කරන්න ගියත් හැම වෙලාවකම කථා කරන්නේ "රජය දූෂිතයි" කියලායි. එවැනි ප්‍රකාශ හරහා එතුමා දේශපාලන න්‍යාය පත්‍රයේ ගමන් කරනවා. ඒ දේශපාලන න්‍යාය පත්‍රයේ ගමන් කිරීමට උත්සාහ කිරීමේදී -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඒ දේශපාලන න්‍යාය පත්‍රයේ ගමන් කිරීමේදී රටට සිදුවන හානිය එතුමා තේරුම් ගන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. මධ්‍යම අධිවේගී මාර්ගය හදන්න කඳු කපනවාය කියලා එතුමා ඊයේ පෙරේදා රූපවාහිනියෙන් කියනවා මා දැක්කා. එතුමා කිව්වාලු, කඳු කපන්න එපාය කියලා. කඳු කපන්නේ නැතුව කඳුකරයේ අධිවේගී මාර්ග හදන්නේ කොහොමද? අධිවේගී මාර්ගවල වංගු නැහැ. එක්කෝ කඳු කපන්න ඕනෑ, එහෙම නැත්නම් කඳු හිල් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් ඉංජිනේරුවෝ තීරණ ගන්න ඕනෑ.

ඊළඟට, "අද" පත්‍රයේ පළමුවන පිටුවේම සඳහන් වෙනවා, එතුමා කියන දේවල් අමාත්‍යවරු අහන්නේ නැහැයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක මේ රටේ දේශපාලනයේ හැටියි. තව මාස 6ක් යනකොට එතුමා කියන දේවල් කවුරුවත්ම අහන එකක් නැහැ. ඊට පස්සේ එතුමාට "බායි, බායි" කියන්න පටන් ගනියි, එතුමා ළඟින් ඉන්න කෝන්ගහගේ වැනි මිනිස්සු. ඒක එතුමා තේරුම් ගන්න ඕනෑ. ඒක තමයි යථාර්ථය. ඒ ආකාරයට එතුමා රජයට ඇඟිලි ගැසීම් එක පැත්තකින් පාඩුවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඊළඟට, "පුබුදමු පොළොන්නරුව" ව්‍යාපෘතිය සඳහා වෙන්කරන මුදල අසාධාරණයි. මේ අවුරුද්දේ රුපියල් බිලියන 10ක්, ගිය අවුරුද්දේ රුපියල් බිලියන 12ක්, ඊට කලින් අවුරුද්දේ රුපියල් බිලියන 13ක් වෙන්කර තිබෙනවා. ඊට අමතරව තවත් රුපියල් බිලියන 13ක් එතුමාගේ ව්‍යාපෘතිවලට වෙන්කර තිබෙනවා. එයින් රුපියල් බිලියන 8ක් වෙනත් කරුණු යටතේ තමයි සඳහන් කර තිබෙන්නේ. අලි වැටක් ගහන්නත් එතුමා විශාල මුදලක් වෙන්කරලා තිබෙනවා. වනජීවී ඇමති කෙනෙක් ඉන්නවා. වනජීවී දෙපාර්තමේන්තුවක් තිබෙනවා. අලි වැටක් ගහලා පොළොන්නරුව විතරක් ආරක්ෂා කළාට මදියි. ඊට පස්සේ අලි ටික දඹුල්ලට ගිහිල්ලා ගහන්න පටන් ගන්නවා; මාතලේට ගහන්න පටන් ගන්නවා. ඒ අලි ගිහිල්ලා අනුරාධපුරය කුඩු කරනවා. ඒවාට වෙනම සංකල්ප තිබෙන්න ඕනෑ. ඒ සංකල්වලින් බැහැරට ගිහින්, වනජීවී ඇමතිතුමා පැත්තක සිටියදී එතුමා අලි වැටවල් ගහන්න යනවා. එතුමා මේ ආකාරයට මේ වැඩ කරන ගමන්ම අපට අමාත්‍යාංශ දෙන්නේ නැහැ. අපේ රජයක් තිබෙනවා. යූඑන්පී රජයක් තිබෙනවා නම් යූඑන්පී ඇමතිවරුන් පත් කර ගැනීමට යූඑන්පී රජයට හැකියාව තිබෙන්න ඕනෑ; අපේ නායකතුමාට හැකියාව තිබෙන්න ඕනෑ. එතුමා පෞද්ගලික වෛරය මත අපට ලැබිය යුතු අමාත්‍යාංශ නොදී අපෙන් පළිගැනීම මා හිතන හැටියට රාජ්‍ය තාන්ත්‍රික නායකයකු විසින් නොකළ යුතු දෙයක්; සදාචාරයෙන් තොර දෙයක්. එවැනි දේ කරන්න එපාය කියා මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමාට.

මීළඟට, ගරු රංජිත් සියඹලාපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 2.04]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 වර්ෂය සඳහා රුපියල් බිලියන 3,149ක් වියදම් කිරීමට සූදානම් බව රජය පසුගිය දා ඉදිරිපත් කළ අය වැය ලේඛනයෙන් කියවුණා. එයින් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 2,445ක් සහ රාජ්‍ය ආයතන සඳහා රුපියල් බිලියන 756ක් වශයෙන් සඳහන් වෙනවා. ඒ නිසා මේ අය වැය ලේඛනය අපට හඳුන්වන්නට පුළුවන් පරිභෝජනය මුල් කර ගත් අය වැය ලේඛනයක් හැටියට. මීට පෙර කථා කළ අපේ හිතවත් ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා කිව්වා මේක ඡන්ද අය වැය ලේඛනයක් නොවෙයි කියලා. ඒ නිසා මම මේ අය වැය ලේඛනය ඡන්ද අය වැය ලේඛනයක් කියලා කියන්නේ නැහැ. හැබැයි, මෙය පරිභෝජනය මුල් වුණු අය වැය ලේඛනයක්. අපි වාගේ සංවර්ධනය වෙමින් පවතින රටක එවැනි අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීමට යම්කිසි අරමුණක් තිබෙන්නට අවශ්‍යයි. මේ රට නැඟිටින්නට හදන රටක්. එම නිසා අපට අරමුණ මොකක්ද කියලා සඟවන්නට බැහැ; අරමුණ පැහැදිලියි. ඒ අරමුණ තුළත් වැදගත් වෙන්නේ මේ රටේ අත්‍යවශ්‍යම, සැලකිය යුතුම ප්‍රශ්නවලට රජයට පිළිතුරු සොයන්නට පුළුවන් වුණාද කියන එක නොවෙයි, අඩුම තරමින් අවධානයට ලක් කරන්නට පුළුවන් වුණාද කියන එකයි. වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කරනවා කියලා කිව්වා, එච්චරයි. මොකක්ද විසඳුම, කොහොමද කරන්නේ, දින වකවානු මොනවාද කියන ඒවා මොනවත් නැහැ. මේක සංකීර්ණ ගැටලුවක්. ඒකත් කළා. ඇයි, වතුකරයේ ලක්ෂ ගණනක් ඉන්නවානේ.

මේ රටේ 50,000කට වඩා රැකියා විරහිත උපාධිධාරින් ඉන්නවා. මේ අය වැය ලේඛනය තුළ ඒ අය ගැන එකම වචනයක්වත් සඳහන් වන්නේ නැහැ. නමුත් ඒක මේ රටේ දැවෙන ප්‍රශ්නයක්. ඒ වාගේම මේ රටේ යැපුම් මට්ටමේ ගොවීන් ලක්ෂ 40ක් ඉන්නවා. මේ කන්නය පාඩු වුණොත් ඔවුන්ට ලබන කන්නය ජීවත් වෙන්නට බැහැ. ඒ අය ගැන මේ අය වැය ලේඛනයේ මොනවත් සඳහන් වන්නේ නැහැ. පරිභෝජන අය වැය ලේඛනයක් වුණත් අපි සතුටු වෙනවා, හැබැයි අවශ්‍ය කාරණා කථා නොකළ පරිභෝජන අය වැය ලේඛනයක් ගැන අපට සතුටු වෙන්නට බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම කථා කරන්නට යන්නේ ඒ ගැන නොවෙයි. මට ලැබී තිබෙන කෙටි වේලාවේ මම කථා කරන්නේ මේ අය වැය ලේඛනයේ තිබෙන වැය නොවෙයි, අය සොයා ගන්නට මේ ආණ්ඩුවට පුළුවන්ද කියන එක ගැනයි. අපි දන්නවා සාමාන්‍යයෙන් රජයේ ආදායමෙන් සියයට 85ක් බදු ආදායම බව. ආසන්නතම ගණන් පෙන්වූ වර්ෂය වන 2017දී රජයේ මුළු ආදායම රුපියල් බිලියන 1,927යි. එයින් බදු ආදායම රුපියල් බිලියන 1,671යි. ඒ කියන්නේ අවසානයට ගණන් බැලූ වර්ෂය වන 2017දී සියයට 86.7ක් බදු ආදායම. 2019 වර්ෂයේත් ඒක වෙනස් වෙන්නේ නැහැ, තව වැඩි වෙනවා මිස. දැන් 2019 වර්ෂයේ බදු ආදායම රුපියල් බිලියන 2,077ක් ලැබෙයි කියලා මුදල් අමාත්‍යතුමා උපකල්පනය කරනවා. හැබැයි අපට ආසන්නතම 2018 වර්ෂයේ ලැබුණේ රුපියල් බිලියන 1,712යි. ඒ අනුව අපි 2019 වර්ෂයේ රුපියල් බිලියන 365ක් වැඩියෙන් බදු ආදායම ලැබෙයි කියලා උපකල්පනය කරනවා; හිතනවා; ප්‍රාර්ථනා කරනවා. කොපමණද මේ වැඩිවීම? ළඟම වර්ෂය වන 2018ට සාපේක්ෂව සියයට 21.3කින් බදු ආදායම වැඩි කර ගන්නට පුළුවන් කියලා මුදල් ඇමතිතුමා විශ්වාස කරනවා.

අපි බලමු ආසන්නතම වර්ෂවල බදු ආදායම වැඩිවෙලා තිබෙන්නේ කොහොමද කියලා. 2016 වර්ෂයේදී 2015 වර්ෂයට වඩා බදු ආදායම වැඩි වුණේ රුපියල් බිලියන 108යි; සියයට 7.9කින් වැඩි වුණා. 2017 වර්ෂයේදී 2016 වර්ෂයට වඩා බදු ආදායම වැඩි වුණේ රුපියල් බිලියන 207යි. හොඳ වර්ධනයක්, සියයට 14.1ක්. හැබැයි, අමතක කරන්නට එපා ඒ වර්ෂය තමයි බදු කියන එක මේ රටේ මිනිසුන්ට එපා වුණු වර්ෂය. ආණ්ඩුවට සිද්ධ වුණා දහ පහළොස් වතාවක් තමන් ඉදිරිපත් කළ බදු ආපහු කැඳවා ගන්නට. ජනතාව ඒවා ප්‍රතික්ෂේප කළා, ජනතාව පාරට බැස්සා. පාක්ෂික භේදයකින් තොරව වෙළෙන්දෝ පාරට බැස්සා. ඒ වර්ෂය තමයි මේ. ඊළඟට, 2018 වර්ෂයේදී 2017 වර්ෂයට වඩා බදු ආදායම වැඩි වුණේ රුපියල් බිලියන 41යි; සියයට 2.4යි. 2018දී සියයට 2.4ක් බදු ආදායම වැඩි වුණු රටක අපි අද හීන බලනවා, 2019දී සියයට 21.3ක් බදු ආදායම වැඩි කරගෙන මේ අය වැය ලේඛනය ඉදිරියට ගෙන යන්නට අපිට පුළුවන්වෙයි කියලා. මේ අය වැයේ තිබෙන සමහර දේවල් නරක නැහැ, හොඳයි. හැබැයි, ඒවා කළ හැකිද කියන ප්‍රශ්නය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනයේ හරි ලස්සන වචන ටිකක් තිබෙනවා. මේ අය වැය ලේඛනයේ තිබෙනවා, ජය ඉසුර, නංවමු ලංකා, රන් අස්වැන්න, රැකවරණ, "Home Sweet Home", මාගේ අනාගතය, සුබිත පුරවර ප්‍රජා ජල අභිමන්, සහසර, "City Ride", රන් මාවත, විරුලිය ශක්තිය, හරිත සංගම්, නිල්වලා එළිය, සිහින මාළිගා වැනි හරි ලස්සන වචන.

හරි ලස්සන වචන. හරි ලස්සනයි ඇමතිතුමනි. අරිසෙන් අහුබුදු ශූරීන් සිටියා නම් එතුමාත් පරදින ලස්සන වචන තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. හැබැයි, "සිහින මාළිගා" කියන එක ඉතාම වැදගත්. මෙහි සඳහන් කරලා තිබුණේ, විදේශ රැකියා කරන අයට නිවාස සාදා ගැනීමට ණයක් ලබා දෙනවා කියායි. එක පැත්තකින් පාස්පෝට් එකක් ලබා ගන්නා ගණනත් රුපියල් 5,000කින් වැඩි කරලා, ගුවන්ගත වීමේ ගාස්තුත් වැඩි කරලා තිබෙනවා. අපේ රටේ කම්කරුවන් විසිලක්ෂයක් පමණ විදේශගත වෙලා ඉන්නවා. අපේ රටේ කාන්තාවන්ගෙන් සියයට 75ක්ම නුපුහුණු සේවිකාවන් හැටියටයි රැකියාවලට යන්නේ. ඔවුන්ගේම පර්ස් එකෙන් ඇදලා "සිහින මාළිගා" හදන්න යනවා. ඒක වෙනම කථාවක්. හැබැයි, "සිහින මාළිගා" කියන එක මේ අය වැයට ගැළපෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 වර්ෂයේ බදු වැඩි වීම සියයට 2.4 තියාගෙන, මේ වර්ෂයේ බදු වැඩි වීම සියයට 21 දක්වා වැඩි කරගන්න පුළුවන් කියලා යම් කෙනෙක් ප්‍රකාශ කරනවා නම්, ඒකට ගැළපෙනම වචනය තමයි "සිහින මාළිගා" කියන්නේ. එම නිසා මේ වචන අතරින් ඒ වචනය මෙම අය වැය යෝජනාවලියට ඉතාම ගැළපෙනවාය කියා මම යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඊළඟට බලන්න ඕනෑ වැදගත්ම ප්‍රශ්නය මෙයයි. මේ රටේ රාජ්‍ය ආදායමෙන් සියයට 85ක්ම සොයා ගන්නේ බදුවලින් බව අපි දන්නවා. අපි ඒක හැමදාමත් කියනවා. ඒක වෙනස් කරන්න ඕනෑ. බදුවලින් වැඩි ප්‍රමාණයක් සෘජු බදු බවට පත් කරගත යුතුයි කියලා අපි බොහෝ කාලයක් තිස්සේ කියනවා. හැබැයි, අපි දන්නවා, තවමත් සමස්ත බදුවලින් ඉතා විශාල ප්‍රමාණයක් වක්‍ර බදු හැටියටයි අය කර ගන්නේ කියලා. වක්‍ර බදු කියන එකේ තේරුම මොකක්ද? කෙනෙකුගේ ආදායම් ප්‍රතිශතය, ඔහුගේ තරාතිරම, ඔහුගේ වත්කම කියන ඒ කිසිවක් නොසලකා භාණ්ඩයක් හෝ සේවාවක් මිලදී ගන්නා හැම අවස්ථාවකම ඔහු ඒ බද්ද ගෙවිය යුතුයි. පාරේ සිටින යාචකයා වෙන්න පුළුවන්, අතිධන කුවේරයා වෙන්න පුළුවන්, ඒ හැම කෙනෙකුගෙන්ම එක සමානව අය කරන බද්දට අපි වක්‍ර බද්ද කියලා කියනවා. අපි කනගාටු වෙන්නට ඕනෑ, අපට තවමත් ඒ ක්‍රමය වෙනස් කර ගන්නා පෙරළිය කරගන්න

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

බැරිවෙලා තිබෙන එක ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වක්‍ර බදු අය කරන එක තමයි හරිම පහසු. ඒ ගැන කවුරුත් දන්නේ නැහැ, කවුරුවත් අහන්නේ නැහැ, බදු උපදේශකයන් සොයන්න කවුරුවත් යන්නේ නැහැ, නිලධාරින් හම්බවෙලා මේ සඳහා සටන් කරන්නේ නැහැ, ඒ පිළිබඳ සම්මුඛ සාකච්ඡා නැහැ. කඩේට ගිහිල්ලා භාණ්ඩ හෝ සේවා ගනිද්දී අපි දන්නේම නැතුව ඒ බද්ද ගෙවනවා. එම නිසා හැම විටම රාජ්‍ය ආදායම උපයා ගැනීමේදී හරි පහසුවෙන් වක්‍ර බද්දත් එක්ක,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක පමණ කාලයක් තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
හොඳයි, මම විනාඩි දෙකෙන් කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම කියන්න හැදුවේ, මේ සිහින මාළිගාව කඩාගෙන වැටෙන්නේ කාගේ හිස මතද කියන එකයි. අපි කිව්වා, 2018 වර්ෂයට වැඩියෙන් 2019 වර්ෂයේදී රුපියල් බිලියන 365ක් ආණ්ඩුව සොයන්න ඕනෑ කියලා. ඒ කියන්නේ, දවසට එක බිලියනයක් බදු හැටියට ආණ්ඩුව අලුතින් සොයන්න ඕනෑ. බිලියනයක් කියන්නේ සියක් කෝටියක්. මේ සියක් කෝටිය ආණ්ඩුව ජනතාවගෙන් ගන්න ඕනෑ. පසුගිය වර්ෂයට වැඩිය 2019 වර්ෂයේ හැම දවසකම අලුතින් රුපියල් කෝටි 100ක් මේ රටේ ජනතාවගේ සාක්කුවෙන් ආණ්ඩුව උදුරාගත යුතු වෙනවා, ආණ්ඩුවේ සංඛ්‍යාලේඛන අනුව ඉදිරියට යන්න නම්. දළ වශයෙන් බැලුවොත්, මේ රටේ ජනතාව දෙකෝටි දසලක්ෂයක් නම්, 2019 වර්ෂය තුළ මේ රජය බලාපොරොත්තු වන ආදායම ගන්න බාල, මහළු, තරුණ ජනතාව වාගේම රෝගී ජනතාව, -මේ රටේ සමස්ත ජනතාව- අතර ඒ බදු මුදල බෙදී යා යුතුයි. ඒ විධියට බෙදී ගියොත්, ළදරුවන් ඇතුළු හැම පුද්ගලයෙක්ම එක් වර්ෂයකට අඩුම ගණනේ රුපියල් 17,380.95ක් ආණ්ඩුවට අලුතින් ගෙවිය යුතු වෙනවා. මේ සිහින මාළිගාව ඉටු කරගන්නවා නම්, එය මේ රටේ සමස්ත ජනතාව මත දරන්න බැරි බදු බරක් හැටියට පතිත වෙනවා. එම නිසා ගරු මුදල් ඇමතිතුමාට, රජයට මේ ගැන සලකා බලන ලෙස අපි ඉල්ලා සිටිනවා. අපේ රටේ විවිධ සහන ලබන කණ්ඩායම් සහ රටේ සමස්ත ජනතාව සලකා බැලූ විට ඉතා සුළු පිරිසක් ගැන තමයි මේ අය වැයෙන් කථා වෙලා තිබෙන්නේ.

මම රබර් කිරි නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කයක ජනතා නියෝජිතයෙක්. මේ අය වැය ලේඛනයෙන් කථා කරලා තිබෙනවා, අපේ රබර් කිරි නිෂ්පාදනය මේ රටේ කර්මාන්ත සඳහා මදි කියලා. එම නිසා නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ කියලා තිබෙනවා. නමුත්, එහෙම ප්‍රශ්නයක් නැහැ. අපේ රබර් කිරි නිෂ්පාදනය අපට විකුණා ගන්න බැරුවයි තිබෙනවා. එම නිසා සමහර අවස්ථාවල අදාළ ප්‍රශ්නය අවබෝධ කරගෙනත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය දැන් අවසන්.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මට තව තත්පර 10ක කාලයක් දෙන්න.

සරත් ෆොන්සේකා මැතිතුමා සිටියා නම් මම සතුටු වෙනවා.

පොළොන්නරුවට වැඩිපුර මුදල් වෙන් වනවාය කියලා එතුමා කනගාටුවෙන් කථා කළා. පොළොන්නරුව කියන්නේ දරිද්‍රතාවෙන් පෙළෙන ජන කොට්ඨාසයක් ජීවත් වන දිස්ත්‍රික්කයක්. ඒ වාගේම මායිම් ගම්මාන සහිත, එල්ටීටීඊ යුද සමයේ වැඩිම කරදරයට පත් වූ දිස්ත්‍රික්කය. ගම්පහ කියන්නේ මේ රටේ තිබෙන දිස්ත්‍රික්ක අතර ඉහළින් තිබෙන දිස්ත්‍රික්කයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ඉතා අඩු ආදායම්ලාභී, අඩුම සංවර්ධිත දිස්ත්‍රික්කයකට මුදල් වෙන් කිරීම බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක එක්ක සංසන්දනය කරන්න යනවා නම්, ඒක සපුරා වැරදි බවත් ප්‍රකාශ කරමින්, කථා කරන්න අවස්ථාව සලසා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු ලකී ජයවර්ධන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.16]

**ගරු ලකී ජයවර්ධන මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lucky Jayawardana - State Minister of City Planning and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015දී එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක් වෙලා ඇති කරපු ජාතික ආණ්ඩුව 2018 ඔක්තෝබර් 26වෙනි දා විසිරුණා. එය විශාල කුමන්ත්‍රණයක්. ප්‍රජාතන්ත්‍ර විරෝධී එම ක්‍රියාව තුළින් සිදු වූ ඒ ඛේදනීය තත්ත්වය මහ හැර නැවත දෙසැම්බර් 20 වෙනි දා පිහිටු වූ එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව තුළින් ඉදිරිපත් කරන අය වැය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් සලසා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මට පෙර කථා කළ, ජාතික ආණ්ඩුවේ ප්‍රධාන අමාත්‍යවරයෙකු විධියට කටයුතු කළ, රංජිත් සියඹලාපිටිය මහතාගේ කථාව තුළින් මේ අය වැය සිහින අය වැයක් විධියට හුවා දක්වන්න යෙදුණා. මා හිතන විධියට මේ අය වැය සිහින අය වැයක් නොවෙයි. මේ අය වැය රටේ ජනතාවට බරක් නොදී සහන සලසන අය වැයක්ය කියන එක මට මේ අවස්ථාවේදී සතුටින් ප්‍රකාශ කරන්න පුළුවන්. විශේෂයෙන්ම මේ අවස්ථාව ඇති කරන්න කටයුතු කළේ මේ පාර්ලිමේන්තුව වසර තිහක් නියෝජනය කරමින් මේ රටට විශිෂ්ට සේවාවක් කළ අපේ මුදල් ඇමතිතුමා වන මංගල සමරවීර මැතිතුමායි. මේ අය වැය එතුමාගේ මංගල අය වැය. 'මංගල' කියන වචනයේ පරිසමාප්තයෙන්ම මේ අය වැය රටට ඉතාම වැදගත් අවස්ථා සලසන අය වැයක් විධියට මා දකිනවා. 2004 වසරෙන් පස්සේ, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති අනුව රටට අය වැයක් ඉදිරිපත් කරන්න ලැබුණු ප්‍රථම අවස්ථාව මෙයයි. වසර 15කට පස්සේ ලැබුණු මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති මත තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරන කාලවලදී රටටත්, රටේ ජනතාවටත් ආදරය කරමින් රටට විශිෂ්ට සේවාවක් කළාය කියන එක අපි අමුතුවෙන් කිවයුතු වන්නේ නැහැ. විශේෂයෙන්ම තිස් වසරක දේශපාලන අත්දැකීම් සහිතව මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කරපු අය වැය පිළිබඳව අපි සතුටු වන අතර, එතුමාගේ තිස් වසරක දේශපාලන දිවියටත් සුබ පතන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයට එක්වන විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු මේ සභා ගර්භය තුළ අය වැය විවේචනය කළ නමුත්, සභා ගර්භයෙන් එළියට ගියාට පසුව කියන්නේ මෙවන් මූල්‍ය අර්බුද ඇති කාලයක ජනතාවට සහන සලසන අය වැයක් ඉදිරිපත් කිරීම ගැන එතුමන්ලාත් සතුටුවන බවයි. [බාධා කිරීමක්] නැහැ, අපට එළියේදී සමහර අය කථා කරලා කියනවා. විශේෂයෙන් මේ අය වැය ඒ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඔවුන් එළියේදී අපිත් එක්ක පෞද්ගලිකව මේ බව කියනවා. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාත් එදා මට ලිෆ්ට් එකේදී කිව්වා නේද මේ අය වැය ටිකක් හොඳයි කියලා? ඇත්තටම ඒක අපට සතුටට කාරණයක්. ඔබතුමාම කිව්වා, "විපක්ෂයේ යුතුකම තමයි, මේ අය වැය විවේචනය කරන එක. නමුත්, ඒ විවේචනය පාර්ලිමේන්තුව ඇතුළේ කළත්, මේවා සාධාරණ වැඩ" කියලා. ඒ මතය ඔබතුමන්ලා ළඟ තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1948 වර්ෂයේ ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පස්සේ මුළු ලොවම ශ්‍රී ලංකාව පිළිබඳව විශාල බලාපොරොත්තුවක් තබා ගත් අතර, ඔවුන් අනාවැකි කිව්වේ ඉතා ඉක්මනින් අප රට "ආසියාවේ ස්විට්සර්ලන්තය" බවට පත්වේවා කියායි. 1965දී එවකට සිටි සිංගප්පූරු අගමැති ලී ක්වාන් යූ මැතිතුමා එතුමාගේ අය වැය කථාවේදී වසර පහකින් සිංගප්පූරුව ලංකාවට වඩා දියුණු රටක් බවට පත් කිරීම මූලික අරමුණ බව පවසා සිටියා. එකල ලෝක ජනතාව පූර්වාදර්ශයට ගත්තේ අපේ රට. අප රට නිදහස ලබා වසර 71කින් පසුව පත්ව ඇති තත්ත්වය පිළිබඳව හෘදය සාක්ෂියට එකඟව අප කථා කළ යුතුව ඇත. විපක්ෂය එක් ඇඟිල්ලක් අපේ පැත්තට දිගු කරන කොට ඇඟිලි හතරක් ඒ අයගේ පැත්තට හැරවෙනවාය කියන එක අමතක කරලා තමයි කථා කරන්නේ.

ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. අවුරුදු 71ක කාලය තුළ මේ රට පාලනය කරපු පාලන යුගයන් ගැන කථා කරන්න මා කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 71ක රාජ්‍ය පාලනය ගැන කථා කරන කොට, ඉන් වසර 35ක් මේ රට පාලනය කරලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පෙරමුණු රජයන් වන බවත්, වසර 41ක විධායක ජනාධිපති ධුර කාලයෙන් වසර 25ක්ම විධායක ජනාධිපති බලය දරලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයන් බවත් අමතක කරන්න එපා. වසර 32ක පාලන කාලයක් තමයි එක්සත් ජාතික පක්ෂය මේ රට පාලනය කෙරුවේ. වසර 16ක් එක්සත් ජාතික පක්ෂයේ විධායක ජනාධිපතිවරුන් යටතේ කටයුතු කළා. වසර 4ක පමණ කාලයක් එක්සත් ජාතික පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමඟ සහසම්බන්ධ වෙලා කටයුතු කළා. දේශපාලන ඉතිහාසයේ මුල්වරට ජාතික ආණ්ඩු සංකල්පයක් තුළ මේ රට පාලනය ගෙන ගියා. මේ කාලයේ රටේ නායකයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපති කියන එකත් අමතක කරන්න එපා. එවැනි තත්ත්වයකට තමයි අද මේ රට පත් වෙලා තිබෙන්නේ. වැඩි කාලයක් මේ රට පාලනය කරලා තිබෙන්නේ අද විපක්ෂයේ ඉන්න අය කියන එක අපි අමතක කළ යුතු වෙන්නේ නැහැ. ඒක නිසා විපක්ෂය අද මොනවා කථා කෙරුවත්, මේ රටේ මෙවන් තත්ත්වයක් ඇති වීමට ඒ අයත් වග කිව යුතුයි කියන එකත් අපි මතක් කර දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාලන කාලයන් තුළ රටට සිදු වූ සේවාවන් පිළිබඳව සංසන්දනාත්මකව බලනවා නම්, එම පාලන කාලයන් තුළ රටට විශිෂ්ට සේවාවක් කළේ එක්සත් ජාතික පක්ෂය කියන එක කවුරුත් අවිවාදයෙන් පිළිගත යුතු වෙනවා. ඒක කාටවත්, "නැහැ" කියන්න බැහැ. ඒවා එකින් එක ගෙනහැර දක්වන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන් හිතට එකඟව කල්පනා කරනවා නම් ඒක පිළිගත යුතු වෙනවා.

අපේ රටට නිදහස ලබා ගන්නටත් මුල් වූයේ එක්සත් ජාතික පක්ෂ නායකයන් බව අමතක කරන්න එපා. නිදහස් අධ්‍යාපනය අප රටට ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂ නායකයන්. ආසියාතික රටවල් අතරින් මුල්වරට ශ්‍රී ලංකාව තුළ විවෘත ආර්ථිකය ක්‍රියාත්මක කළේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේයි. ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි වශයෙන් තර කළේද එක්සත් ජාතික පක්ෂ රජයන් යටතේයි.

කෘෂි කර්මාන්තය දියුණු කළා. කඩිනම් මහවැලිය ක්‍රියාත්මක කර වසර 30කින් නිම කළ යුතු මහවැලි ව්‍යාපාරය වසර හයකින් අවසන් කළේ එක්සත් ජාතික පක්ෂයයි. ගල්ඔය සංවර්ධනය, මිනිපේ සංවර්ධනය, පදවි - පරාක්‍රම ආදී පළාත් ගොවි ගම්මාන සංවර්ධනය කළේ එක්සත් ජාතික පක්ෂය කියන එක අමතක කරන්න එපා. ඒ අතර ත්‍රිවිධ හමුදාව ශක්තිමත් කළා. හොඳ ත්‍රිවිධ හමුදාවක් වාගේම ශක්තිමත් පොලීසියක් ඇති කළේ එක්සත් ජාතික පක්ෂය කියන එක අමතක කරන්න එපා.

විශ්වවිද්‍යාල රාශියක් අලුතින් ආරම්භ කරලා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති කළේ එක්සත් ජාතික පක්ෂයයි. මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය මේ රටට දායාද කෙරුවේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ තුළ අද උසස් අධ්‍යාපනය හදාරන දරුවන්ට විශාල අවස්ථා සැලසිලා තිබෙනවා කියන එක මතක් කළ යුතුයි. ඒක නිසා අද මේ රටේ අහිංසක දරුවන්ට ඒ උගත්කම් ඇති කරගන්නට ඒක හොඳ පන්නරයක් වෙලා තිබෙනවා කියන එකත් අපි සඳහන් කළ යුතු වෙනවා.

නිදහස් වෙළෙඳ කලාප ඇති කළා. නිදහස් වෙළඳ කලාප එකක් නොවෙයි, ගණනාවක් ඇති කළා. විශේෂයෙන් බියගම, කටුනායක, පල්ලෙකැලේ, කොග්ගල ආදී ප්‍රදේශවල නිදහස් වෙළෙඳ කලාප ඇති කරලා අපේ රටේ තරුණ - තරුණියන්ට රැකියා ඇති කෙරුවේ එක්සත් ජාතික පක්ෂ පාලන කාලය තුළ කියන එක අපි මතක් කළ යුතු වෙනවා. මේවා අලුත් සංකල්ප විධියටයි ක්‍රියාත්මක කළේ. එක්සත් ජාතික පක්ෂය ඒ අවස්ථා ඇති කෙරුවා කියන එක මා මතක් කරන්න ඕනෑ.

හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ "ගමට කර්මාන්ත" කියන සංකල්පය තුළ කර්මාන්ත 200ක් ගමට ගෙනාවා කියන එකත් මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම ඇඟලුම් කර්මාන්තය දියුණු කරලා මේ රටේ විශාල වැඩ කොටසක් සිදු කළා. සංචාරක සේවාව දියුණු කරන්නත් එක්සත් ජාතික පක්ෂය කළ සේවාව වැදගත්. රූපවාහිනිය ආරම්භ කළා. ඒ වාගේම විදුලිය නැති ප්‍රදේශවලට විදුලිය ලබා දුන්නා. විශේෂයෙන්ම විදුලිය ලබා දීම සම්බන්ධයෙන් ලොකු පරිවර්තනයක් ඇති කරලා මේ රටේ විදුලි පද්ධතියට විශාල මෙගා වොට් ප්‍රමාණයක් එකතු කළේ එක්සත් ජාතික පක්ෂය කියන එකත් මතක් කරන්න ඕනෑ.

දුරකථන ලබා දීම ගැන කථා කරනවා නම්, මේ රටට දුරකථන පහසුකම් ඇති කරන්නත් කටයුතු කළා. ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කරන්න කටයුතු කළා. ලංගමට පමණක් සීමා වෙලා තිබුණු බස් සේවාව පෞද්ගලික අංශයත් එක්ක එකතු කරලා ජනතාවට සේවාවක් සලසන්න අවස්ථාවක් ඇති කෙරුවේ එක්සත් ජාතික පක්ෂයයි.

ගම් මට්ටමින් නිවාස වැඩ පිළිවෙළවල් ඇති කරලා දැවැන්ත විධියට ඒ නිවාස වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කෙරුවේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ ආකාරයට කියා නිම කළ නොහැකි සේවාවන් රාශියක් අප රටට එක්සත් ජාතික පක්ෂ පාලන කාලයන් තුළ ඇති කෙරුවා කියන එක අපි මතක් කළ යුතු වෙනවා. අපේ පාලන යුගයන්වලදී අපේ රටේ ආර්ථිකය උඩට උස්සන කොට, අද විපක්ෂයේ ඉන්න අය රට භාර ගන්න

[ගරු ලකී ජයවර්ධන මහතා]

අවස්ථාවේදී රට කඩා වැටුණා කියන එකත් අපි අමතක කළ යුතු නැහැ. 2001 වසරේ දී අපි රට භාර ගන්නකොට තිබුණේ සෘණ ආර්ථිකයක්. ඒ, සෘණ ආර්ථිකය ධන කරලා 2004 දී අපේ ආණ්ඩුව විසුරුවන අවස්ථාව වන විටත්, ආර්ථිකයේ ඉතා හොඳ තත්ත්වයක් ඇති කරලා තිබුණා කියන එකත් මතක් කරන්නට ඕනෑ. පැවැති සෘණ ආර්ථිකය ධන ආර්ථිකයක් බවට පත් කරලා රට ගොඩ නැඟුවේ එක්සත් ජාතික පක්ෂයයි කියන එක මතක් කරන්නට ඕනෑ. අපට පාලන බලය ලැබුණු ටික කාලය තුළ වුණත් රටට විශිෂ්ට ගණයේ සේවාවන් ඇති කරන්න අප ක්‍රියා කළා කියන එක ඉතාම සතුටින් මතක් කරන්න ඕනෑ. එවන් පක්ෂයක් තමයි එක්සත් ජාතික පක්ෂය. අද එක්සත් ජාතික පක්ෂයට නැවත එම අවස්ථාව ලැබී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය මැතිවරණ අය වැයක් කියලා සමහර අය හඳුන්වනවා. නමුත් මෙය මැතිවරණ අය වැයක් නොවෙයි. මෙය රට කරවන අය වැයක් කියන එක මතක් කරන්න ඕනෑ. අපි මැතිවරණවලටත් සූදානමින් සිටින්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය මැතිවරණවලට කිසිම අවස්ථාවක බය නැහැ. අපි ඕනෑම මැතිවරණයකට සූදානම් කියන එකත් මතක් කරන්නට ඕනෑ. පසු ගිය කාලවල මැතිවරණ කල් දමන්න සිදු වුණේ අපේ වරදින් නොවේය කියන එකත් අප මතක් කළ යුතු වෙනවා. පළාත් පාලන මැතිවරණය කල් ගියේ අපේ වරදකින් නොවෙයි. පළාත් සභා මැතිවරණය කල් දැමෙන්නේත් අපේ වරදකින් නොවේය කියන එක අප මතක් කරන්න ඕනෑ. ඒවාට සියලුදෙනාම වග කිව යුතුයි කියන එකත් අප මතක් කරන්න ඕනෑ. ඒ නිසා එක් පැත්තකට චෝදනා එල්ල කරන්න එපා කියන එකත් අප මේ අවස්ථාවේ දී සඳහන් කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනාධිපතිවරණය මේ රටේ ඉතිහාසගත වන මැතිවරණයක් බව අප අමතුවෙන් කිව යුතු වන්නේ නැහැ. එම ජනාධිපතිවරණය පැවැති අවස්ථාව වන කොට මේ රට පත් වෙලා තිබුණු තත්ත්වය පිළිබඳව කල්පනා කරනවා නම්, එදා මේ රටේ තිබුණේ ඉතාම අඳුරු තත්ත්වයක්. හිටපු ජනාධිපතිතුමාට තවත් වසර දෙකක කාලයක් ඉතිරිව තිබියදී තමයි ජනාධිපතිවරණයට ගියේ. 2014 වර්ෂය වන විට අප රට පත්ව තිබූ අරාජික තත්ත්වය ගැන සිතා බැලීමේදී එදා පැවැති පාලන කාලය තුළ රට ඉතා අසීරු තත්ත්වයක තිබූ බව අමුතුවෙන් කිව යුතු වන්නේ නැතැයි මම සිතනවා. විශේෂයෙන්ම එකල පැවැති අවිචාරවත් පාලනය තුළ රටේ ජනතාවගේ නිදහස අහිමි වී තිබුණා; ජාතිවාදී අවස්ථා උත්සන්න වී තිබුණා; ජාත්‍යන්තරයෙන් අප රටට සම්බාධක පවා පනවන්නට අවස්ථා නිර්මාණය වෙලා තිබුණා. එවන් අවස්ථාවක තමයි එම ජනාධිපතිවරණය පැවැත්වූයේ. ඒ වාගේම සමහර ජාතීන්ට නිදහසේ තම ආගම අදහන්නට පවා අපහසු තත්ත්වයන් එදා තිබුණා. ඉන්ධන සහ ගෑස්වල මිල ද අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ද ඉතා අධික ලෙස ඉහළ යෑම නිසා එදා ජීවන බර වැඩි වෙලායි තිබුණේ. දැඩි ආර්ථික අපහසුතාවකට රට පත් වෙලා තිබුණා. ඒ ආකාරයට ඉතා බැරෑරුම් තත්ත්වයක තිබූ මේ රට එක්සත් ජාතික පක්ෂයේ සහයෝගයෙන් 2015 වර්ෂයේ දී යථා තත්ත්වයට පත් කරන්න අවස්ථාව සලසා ගත්තා කියන එකත් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ බාධා මැද විශාල ණය කන්දක් අරගෙන තමයි අපේ රට ඉදිරියට ගෙන යන්න අප කටයුතු කළේ. නැවත රට ගොඩ නැඟීමට දැන් කටයුතු කරගෙන යනවා කියන එකත් අප මතක් කළ යුතු වෙනවා. ජාතික ආණ්ඩු වැඩ පිළිවෙළ තුළයි අප ආණ්ඩුව කළේ. අපි තනිවම ආණ්ඩුව කළේ නැහැ. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්ව ආණ්ඩුව කරන කොට අපට විවිධ ගැටලු, බාධක තිබුණා. නමුත් ඒ බාධක අභිභවා යමින් අපි කටයුතු කළා කියන එකත් මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ වර්ෂයක් වන මේ වර්ෂය තුළ ගෙන ආ මෙම අය වැය අප රටට ඉතාම වැදගත් අය වැයක් ලෙසයි මා දකින්නේ. සාම්ප්‍රදායික ලෙස හුදෙක් මැතිවරණ ජයග්‍රහණ කිරීම සඳහා විවිධ ආණ්ඩු ගෙන ආ අය වැයවලින් ඔබ්බට ගොස් රටේ ආර්ථිකයට දරා ගත හැකි, රටේ ආර්ථිකය ශක්තිමත් කරන, රටේ පුරවැසියන් සවිබල ගන්වන අය වැයක් ලෙස මා මේ අය වැය දකිනවා. සිය දෙපයින් නැඟී සිටිය හැකි පුරවැසියන් බිහි කරන අය වැයක් ලෙසත් මේ අය වැය හැඳින්වීමට මා කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඈත ඉතිහාසයක් ඇති අප රට සමඟ ග්‍රීකවරුන් සහ රෝමවරුන් ගනු දෙනු කළා. ඔවුන් අප රට "තැප්‍රොබේන්" ලෙසද, අරාබිකාරයන් "සෙරන්ඩිබ්" ලෙස ද අප මව් රට හඳුන්වා තිබුණා. පුරාණයේදී අප රට නැඟෙනහිර දොරටුව ලෙස ද හඳුනාගෙන තිබුණා. අප රට එකල ලෝක නැඟෙනහිර වෙළඳාමේ කේන්ද්‍රස්ථානය ද වී තිබුණා කියන එක මතක් කළ යුතු වෙනවා. පුරාණයේ සිට වෙළඳාම් කළ, ඉතා ශක්තිමත් ආර්ථිකයක් පැවැති ලෝක ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට අප රට පත් වෙලා තිබුණා. වර්තමානයේ දී අපගේ අගමැති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපගේ රජය මෙහෙයවමින් සිටින්නේ පුරාණයේ අප රටේ අභිමානය අප මව් බිමට යළිත් තහවුරු කර දීමටයි. ආසියාවේ කේන්ද්‍රස්ථානය බවට අප රට පත් කර ලෝක සැපයුම් දාමයට සම්බන්ධ කිරීම තුළින් කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් ආරම්භ කිරීම, අප රටේ තරුණ ජවය රටේ ප්‍රගමණයට සම්බන්ධ කර ගැනීමට රැකි රක්ෂා බිහි කිරීම, අපනයන ආදායම ඉහළ නංවා ආසියාවේ මෙන්ම ලෝකයේ ප්‍රබල ආර්ථිකයක් ඇති රාජ්‍යයක් බවට පත් කිරීම තමයි අපේ පක්ෂයේ අරමුණ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම උපයා ගැනීමට හැකි වීමද, සියයට 35කින් මත්ස්‍ය අපනයන වැඩි කර ගැනීමට හැකි වීමද මේ කාලයේ සිදු වුණා. ලංකා ධීවර සංස්ථාව පාඩු ලබපු ආයතනයක්. ඉතිහාසයේ ප්‍රථම වතාවට අද ඒ ආයතනය ලාභ ලබන ආයතනයක් බවට පත් කර තිබෙනවා. ඒ වාගේම කඩා වැටුණු ආයතන ලාභ ලබන ආයතන බවට පත් කළා. විශේෂයෙන්ම අපේ ලංකා ගමනාගමන මණ්ඩලය -SLTB එක- පසු ගිය කාලවල පඩි දෙන්නත් බැරි තත්ත්වයකට කඩා වැටිලා තිබුණා.

නමුත් වර්තමානයේ -මේ අවුරුදු තුනක පාලන කාලය තුළ- එවන් ආයතන අපි ශක්තිමත් කළා. විශේෂයෙන්ම පාඩු ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පත් කරන්න අද අපි විශාල වැඩ පිළිවෙළක් දියත් කර තිබෙන බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. වරාය ලාභ ලබන ආයතනයක් බවට පත් කර තිබෙනවා. ලංකා මිනරල් සැන්ඩ්ස් ආයතනයේ නිෂ්පාදනය සියයට 117කින් ඉහළ නංවා තිබෙනවා. එම ආයතනවල ආදායම් වැඩි කරලා, වසර 63කට පසුව මූල්‍ය ගිණුමේ රුපියල් බිලියන 22ක අතිරික්තයක් ඇති කර ගැනීමටත් හැකිවෙලා තිබෙනවා. ඒ අනුව ශක්තිමත් ආර්ථිකයක පෙර නිමිති පහළ කරන්න අද අපට හැකිවෙලා තිබෙනවා. ශක්තිමත් ආර්ථිකයක් බිහි කිරීම උදෙසා වූ අප රජයේ වැඩ පිළිවෙළ සාර්ථක බවත්, ඒ තුළින් අප රට යළි සිය දෙපයින් නැඟී සිට ලොවට ණය නැති රාජ්‍යයක් බවට පත් කිරීම තුළින් අප මව්බිමට ආර්ථික නිදහස ලබා දීමට කටයුතු සැලසීම අප රජයේ බලාපොරොත්තුව බවත් මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ තරුණ ප්‍රජාව කේන්ද්‍ර කර ගනිමින් ව්‍යවසායකත්ව සමාජයක් බිහි කිරීම සඳහා, අපගේ බැංකු මඟින් සහනදායී පොලී අනුපාත මත

ප්‍රාග්ධනය ලබා දීමට "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන පරිදි 2018 ජනවාරි මාසයේදී හඳුන්වා දුන්නා. මෙම යෝජනා ක්‍රමය තවදුරටත් පුළුල් කිරීමට සහ ව්‍යාප්ත කිරීමට කටයුතු සලස්වන්න මෙම අය වැය තුළින් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මේක ඉතාම වැදගත් වනවා. පසුගිය කාලයේ මේ පිළිබඳව යම් යම් ගැටලු තිබුණා. බැංකුවලින් ණයක් ගැනීමේදී අපහසුතා තිබුණා. අපේ ජනතාව බැංකුවකට ගිහිල්ලා ණයක් ගන්න දරන උත්සාහයන් අඩාළ වුණු අවස්ථා තිබුණා. නමුත් ඒවා ක්‍රමවත් කරලා, මේ අය වැයෙන් ඒ වෙනුවෙන් විශාල සහනයක් සලසා දීම මේ රටේ තරුණ තරුණියන්ට කළ විශාල උපකාරයක් හැටියටයි අප දකින්නේ. එය ශක්තිමත් කිරීමට සියලුදෙනාගේම සහයෝගය අවශ්‍ය වනවා.විශේෂයෙන්ම මේ රටේ රාජ්‍ය බැංකුවලට ඒ අවස්ථා වඩ වඩාත් ශක්තිමත් කරන්න අවශ්‍ය පහසුකම් සලස්වන්නය කියාත් අපි කාරුණිකව ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම බැංකු තිබෙන්න ඕනෑ මේ රටේ පොඩි මිනිසුන් වෙනුවෙනුයි. මෙතෙක් කල් ඒ බැංකු තිබුණේ ලොකු මිනිසුන්ටයි. ඒ නිසා පොඩි මිනිසුන්ට ඒ අවස්ථා සලසන්න අපි මෙය අවස්ථාවක් කරගනිමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිරසර ආර්ථික වර්ධනයට හා ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩි කිරීම පිණිස කඩිනමින් අපනයන වර්ධනය කිරීමත්, අනිකුත් විදේශ ආදායම් නංවාලීමත් අත්‍යවශ්‍ය වනවා. මීට පෙර අය වැය මඟින් යෝජනා කළ පරිදි, අපනයන වෙළෙඳ පොළ ප්‍රවේශ යෝජනා ක්‍රමය හා ජාතික අපනයන ක්‍රමෝපාය දියත් කරනු ලැබූ අතර, අපනයන වෙළෙඳ පොළට පිවිසීමේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 400කුත්, ජාතික අපනයන ක්‍රමෝපාය සඳහා රුපියල් මිලියන 250ක් ද වෙන් කිරීමට කරන ලද අය වැය යෝජනාව පිළිබඳවත් මම ඉතා සතුටින් මතක් කරනවා. ජාතික අපනයන ක්‍රමෝපාය තුළ, භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය නංවාලීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳව අන්තර්ගත වනවා. එය රාජ්‍ය - පෞද්ගලික දෙඅංශයේ සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක වනවා. ඒ අනුව, අපනයන නිෂ්පාදන හා ආනයන භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වන තාක්ෂණික පහසුකම් වර්ධනය කිරීමට මෙවර අය වැයෙන් පියවර ගෙන තිබෙනවා. මේ ආකාරයට මෙම අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනා පිළිබඳව අපි සතුටු වනවා.

පසුගිය කාලවලදී මේ රටේ පැවති තත්ත්වයන් මඟ හරවන්නට අපේ රජය ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළවල් ගැන අපි කථා කරනවා. එහිදී ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව ස්ථාවර කරන්න කළ වැඩත් අපි අගය කළ යුතු වනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගෙන ඒම, ජාතික විගණන පනත හඳුන්වා දීම වැනි කරුණු තුළින් අද ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව රට තුළ ක්‍රියාත්මක වනවාය කියන කාරණය අපට සතුටින් මතක් කරන්න පුළුවන්. විශේෂයෙන්ම ආර්ථික සංවර්ධනය සඳහා වාගේම දුප්පත් බව තුරන් කිරීම සඳහා මෙවර අය වැය තුළින් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. එය ඉතා වැදගත්.

2015 වර්ෂයට පෙර ලබා දුන් සමෘද්ධි දීමනාව දෙගුණ තෙගුණ කරන්න අපේ රජය යටතේ කටයුතු කළා. ඒ වාගේම නව සමෘද්ධිලාභීන් හයලක්ෂයකට සමෘද්ධිය දෙන්න යෝජනා කර තිබෙනවා. මේ ගැන විපක්ෂයෙන් ලොකු කතන්දර කිව්වත්, මේක අත්‍යවශ්‍යයෙන් සිදු විය යුත්තක්ය කියන කාරණය කවුරුත් පිළිගත යුතුයි. මෙතෙක් කල් අසාධාරණයට ලක් වූ මේ රටේ දුප්පත්කමින් පීඩා විඳින අයට සමෘද්ධි දීමනාව කඩිනමින් ලබා දීම වැදගත් වනවාය කියන කාරණයත් මා මතක් කරන්න ඕනෑ. මෙවර අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් ස්තුතිය පළ කරන අතර, ඒ වෙනුවෙන් ඉතා ඉක්මනින් කටයුතු කරන්න ඒ අදාළ අංශවලට අවස්ථාව සලසන්න කියාත් මා ඉල්ලීමක් කරනවා.

මෙවර අය වැය, ඉතා වැදගත් අය වැයක්. අපි අවුරුදු ගණනාවක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කර තිබෙනවා; අය වැය විවාදවලට සහභාගි වෙලා තිබෙනවා. එම අය වැය විවාද ගැන බලනකොට, මෙවර අය වැය විවේචන අඩු අය වැයක් විධියටයි මා දකින්නේ.

විපක්ෂය වුණත්, බොහොම අඩුවෙන් තමයි මේ අය වැය විවේචනය කරන්නේ. ඒ, අයට කියන්න දෙයක් නැති නිසායි. සමහර අවස්ථාවල එතුමන්ලා මේ අය වැය සුළු විවේචනයකට පමණයි ලක් කළේ. එතුමන්ලාගේ විවේචන අඩු වීම ගැන අප සතුටු වෙනවා. ගරු මංගල සමරවීර ඇමතිතුමා ඉතාම සාර්ථක අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. මෙවන් අය වැයක් අපේ රටට ඉදිරිපත් කිරීම ගැන ගරු අග්‍රාමාත්‍යතුමාටත්, මුදල් අමාත්‍යතුමාටත්, විශේෂයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරින්ටත් ස්තුතිය පළ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.36]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීම මහ ගැඹුරු කාරණයක් විධියට තමයි අපේ පාසල් ජීවිත කාලයේදී නම් අපි දැක්කේ. අපි ගුවන්විදුලි යන්ත්‍රය ළඟට ගිහින්, ඒ පවත්වන ශාස්ත්‍රීය දේශනයට, විෂයානුබද්ධ දේශනයට බොහොම උනන්දුවෙන් ඇහුම්කන් දුන්නා; රටේ ජාතික ආර්ථිකය මෙහෙයවන ඉලක්ක පිළිබඳව අප අසා සිටියේ හරිම සතුටකින්. හැබැයි, අද එය හිස්, ප්‍රලාප ලියවිල්ලක් බවට පත් වෙලා තිබෙනවා. මංගල සමරවීර ඇමතිතුමා තමන්ගේ අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී, කිකිළියක් බිත්තර දමනකොට සද්ද කරනවා වාගේ මහා හයියෙන් කෑ ගැසුවා. කිකිළියක් දමපු නිසරු බිත්තරයක් වාගේ, මංගල සමරවීර ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනයත් හිස් එකක්; පුස් එකක්; නිසරු එකක්. මේ ආර්ථිකයට අලුත් ජීවයක් ලබා දෙන්න මංගල සමරවීර ඇමතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනයට පුළුවන්කමක් නැහැ. ඒක නිසරුයි; සරු නැහැ. ඒ වාගේම පුස්. ආර්ථිකයට උපතක් ලබා දෙන්න ඒකට බැහැ. රටේ රැකියා ප්‍රශ්නයට; එතුමන්ලා පොරොන්දු වුණු ආකාරයට දස ලක්ෂයක රැකියා ලබා දෙන වැඩ පිළිවෙළට යෝජනාවක් මේ තුළ නැහැ. රටේ විදේශ ආයෝජන දෙගුණ කරනවාය කියා ඉදිරිපත් කළ මැතිවරණ පොරොන්දුවලට; ඒ අරමුණට මේ තුළින් ළඟා වෙන්න බැහැ.

ගරු ලකී ජයවර්ධන රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී සඳහන් කළා, එතුමන්ලා 2015දී රට භාර ගන්න කලින් මේ රට වැටී තිබුණාය කියා. මම හිතන විධියට එතුමාට මහ බැංකු වාර්තා සහ අය වැය ලේඛනවලින් ඉදිරිපත් වන කරුණු පිළිබඳව අවබෝධයක් නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන කියන්නේ නැති බව අපි දන්නවා. 2015 වනවිට අපේ රටේ සංවර්ධන වේගය සියයට හයේ ඉලක්කය ඉක්මවා ගියා. රටේ

[ගරු සිසිර ජයකොඩි මහතා]

ජාතික ආර්ථිකය මහා පරිමාණයෙන් වර්ධනය වෙන්න පටන් ගත්තා. නමුත් 2017 වර්ෂය වනවිට රටේ සංවර්ධන වේගය සියයට 3.1කින් කඩා වැටී තිබෙනවා. ඒ වාගේම රටේ කොටස් වෙළෙඳ පොළ කඩා වැටී තිබෙනවා. [බාධා කිරීමක්] අසත්‍ය නොවෙයි. 131ට තිබුණු ඩොලරය රුපියල් 180 දක්වා ඉහළ යනවා. ඒ නිසා [බාධා කිරීමක්] ඉතින්, දෙයියනේ, මේක අපි කියන එකක්යැ? ඩොලර් එකේ වාර්තාව මොකක්ද? කොටස් වෙළෙඳ පොළේ වාර්තාව මොකක්ද? මහ බැංකුවේ නිලධාරින් ඉන්නවා නේ, ඔවුන්ගෙන් අහගන්න. එහෙම නම් මේවාට මහ බැංකුවේ නිලධාරින් වග කියන්න ඕනෑ. සංවර්ධනය කඩා වැටිලාය කියන එක අපි ඔප්පු කරද්දී, තමුන්නාන්සේලා ඒක "නැහැ" කියා කියනවා නම්, මහ බැංකුවේ නිලධාරින්ගෙන් ඒ ගැන අහගන්න. තමුන්නාන්සේලා ඒක දැන ගත යුත්තේ ඒ අයගෙන්.

රට ආර්ථික වශයෙන් විහිළුවක් බවට පත් කරලා, පරායීන කරලා, විනාශ කරලා, රටේ සංවර්ධන වේගය කඩා දමලා දැන් කියනවා, 2015දී පැවැති තත්ත්වයට වඩා රට ගොඩගත්තා ලු. මොන අංශයෙන්ද, ගොඩගත්තේ? මොන ක්ෂේත්‍රයෙන්ද, ගොඩගත්තේ? කුමන අංශයකද, සංවර්ධනයක් ලබා තිබෙන්නේ? කුමන ප්‍රගතියක්ද ලබා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ මැතිවරණ යෝජනාවල සඳහන් ඉලක්ක සංවර්ධනය කරන්න අද අනුගමනය කරන ක්‍රියාමාර්ග මොනවාද? දැන් කියා ගන්න දෙයක් නැතිවට කියනවා, 2018 වර්ෂයේ මාස දෙකක් -දින 52ක්- ආණ්ඩුව වෙනස් වුණු නිසා, සංවර්ධන වේගය වෙනස් වුණාය කියා. දෙයියනේ, මහ බැංකු වාර්තාවෙන් කියන්නේ 2017 වර්ෂයේ සංවර්ධන වේගය සියයට 3.1කින් කඩා වැටුණු එක ගැනයි. 2018 වර්ෂයේ ඔක්තෝබරයක් ගැන ඒකේ කියන්නේ නැහැ. ඒකත් මේ මන්ත්‍රීවරුන් පටලවා ගෙනයි ඉන්නේ. මහ බැංකු වාර්තාවෙන් ඉදිරිපත් කරන්නේ 2017 වර්ෂයේ සංවර්ධන වේගය කඩා වැටීම පිළිබඳවයි. 2018 වර්ෂය ගැන නොවෙයි එහි කියන්නේ. 2018 වසරේ ඔක්තෝබර් මාසයේ සිදු වූ කාරණය තමයි දැන් මෙතුමන්ලා කියන්නේ.

2018 වසරේ ඔක්තෝබර් මාසයේ සිදුවුණු එක සිදුවීමක් ගැන අපි දන්නවා. අවුරුදු තුනහමාරක් තිස්සේ පැවැති නියගය නිසා ඉරිතලා ගිය, වියළුණු මහ පොළොවට, වැහි පොදක් නැතිව තිබුණු මේ රටට ඔක්තෝබර් මාසයේ වහින්න පටන් ගත්තා. ඒ නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රය මේ අවුරුද්දේ යම් අස්වැන්නක් ලබා තිබෙනවා. එසේ අස්වැන්නක් ලැබීමත් එක්ක මෙන්න, "හයවැනි පරාක්‍රමබාහු වාගේ, අහරින් රට ස්වයංපෝෂිත කළේ මගේ යුගයේ" කියා අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා. එක්සත් ජාතික පාක්ෂිකයෝත් ඒකට හිනා වෙනවා.

ආහාරයෙන් රට ස්වයංපෝෂණය කළා ලු! පසුගිය වර්ෂයේ පිටරටින් ආහාර ගෙන්වන්න බිලියන 215ක් වියදම් කර තිබෙනවා. බිලියන 215ක් ආහාර පිට රටින් ගෙන්වීම සඳහා වියදම් කරන නායකයෙක් කියනවා, "රට ආහාරවලින් ස්වයංපෝෂණය කළා." කියලා. 6 වැනි පරාක්‍රමබාහු ලු! මෙහෙම කියන අය මේ රටේ නායකයෝ වෙනවා කියා දන්නවා නම්, හයවැනි පරාක්‍රමබාහු හිටියා නම්, වහ කාලා මැරෙනවා.

රටේ සමස්ත ආර්ථිකය බිඳ වට්ටලා ඉවරයි, විනාශ කර ඉවරයි. ආයෝජකයෝ රට හැර දමා යනවා. දැන් අපි ඔප්පු කරනවා ඒක. මේ රටේ අලුත් නිෂ්පාදකයෝ, අලුත් ව්‍යවසායකයෝ, ස්වදේශීය කර්මාන්තකරුවෝ සියලුදෙනා විනාශ වෙලායි තිබෙන්නේ. ඔබතුමන්ලා කියන විධියට අද බුලත් විට කඩයක්වත් අලුතෙන් පටන් ගන්නේ නැහැ. බුලත් විට කඩයක්වත්! ඇයි පටන් ගන්නේ නැත්තේ? ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාරයක් කරන්න නිදහස දීලා නැහැ. ව්‍යාපාරික යාන්ත්‍රණය තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ රජතුන් කට්ටුවක් මෙහෙයවනවා. පාස්කරලිංගම්, චරිත රත්වත්තේලා. ඒ අය තමයි මේ අමාත්‍යාංශ මෙහෙයවන්නේ. තමුන්නාන්සේලා නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා, මංගල සමරවීර මහත්මයා යන මේ අය තමයි ආර්ථිකය මෙහෙයවන්නේ. ඔවුන්ගේ සමහර ක්‍රියා මාර්ග සමඟ රටක්, රටට අලුත් දෙයක්, රටට ආදරයක්, රටට ගෞරවයක්, ඉදිරි පරම්පරාව පිළිබඳ විශ්වාසයක් නැහැ. ට්‍රිලියන් ගණන් ඉක්මවා ගිය හොරකම් ප්‍රමාණයක් රටට ඉතුරු කරපු එක තමයි මේ තුන්කට්ටුව එකතු වෙලා කළේ. තමුන්නාන්සේලා කිහිපදෙනෙක් හොරකම් කර නැහැ. අපි ඒ චෝදනාව කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක ව්‍යාපාරය ගැන තමුන්නාන්සේලා කථා කළා නේ. අපේ රටේ ආර්ථික ක්ෂේත්‍රයේ සුවිශේෂ තැනැත්තෙක් වන, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ නිල්මිනි නානායක්කාර මහත්මයා ගැන කියන්න ඕනෑ. මම මේ කාරණය ඇමතිවරුන්ට නොවෙයි, නිලධාරින්ටයි කියන්නේ; මේ රටේ රාජ්‍ය සේවයේ නිරතව සිටින නිලධාරින්ටයි මේ අනතුරු ඇඟවීම කරන්නේ. නිල්මිනි නානායක්කාර මහතා සම්බන්ධ පුවතක් පසුගිය දවසක පුවත් පතක පළවුණා, "මගේ නඩුව ඉවත් කරගෙන මා නිදොස්කොට නිදහස් කළා. මගේ ව්‍යාපාරවලට වූ හානිය මැනීම අසීරුයි." කියා.

වංචා කිරීම සම්බන්ධයෙන් ඔහුට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙන් චෝදනාවක් ඉදිරිපත් කළා. ඔහුගේ බිරිඳ ලියුකේමියා රෝගය හැදිලා පිළිකා රෝහලේ ප්‍රතිකාර ලබනවා. ඇයව බලන්න අවස්ථාව දුන්නේ නැහැ, ඔහු රිමාන්ඩ් බන්ධනාගාර ගත කළා. තාත්තා රිමාන්ඩ් භාරයේ නිසා දරුවෝ දෙදෙනාට පාසල් යන්න විධියක් නැහැ. අන්තිමට කියනවා, "චෝදනාව වැරදියි. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට අපරාදේ යැව්වේ. නිදොස් කොට නිදහස් කළා." කියා. මේ රටේ ව්‍යාපාරිකයෝ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය නැමැති ආයතනයට ගෙන ගිහිල්ලා දණගස්වලා. මේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ස්වදේශික කර්මාන්තකරුවන්ට මේ රටේ ව්‍යාපාර කිරීම එපා කර තිබෙනවා. විදේශීය හොර ජාවාරම්කාරයින්ට, මලික් සමරවික්‍රම ඇමතිතුමන්ලා එක්ක හොර ගනුදෙනු කරන බිස්නස්කාරයින්ට, මහපොල ශිෂ්‍යත්ව අරමුදල,- මම ඉගෙන ගත්තේ මහපොල ශිෂ්‍යත්ව අරමුදලින්. මිලියන දහසක හොරකමක්.

ඊළඟට, SLIIT ආයතනය මිලදී ගැනීමේදී මහපොල භාරය විනාශ කර දැම්මා. මේ රටේ මහ ජන දේපොළ හොරකම් කරමින් මේ අහිංසක නිලධාරින්ව දඩයම් කරනවා. මේවා කියන්න මට ඉතාම ඕනෑකමක් තිබෙනවා. මේ නිලධාරින් වෙනුවෙන් තමයි මම මේ කථා කරන්නේ. ඒ නිසා මේ පාලකයෝ ගැන තඹ සතයක් විශ්වාස කරන්න එපා. මේ පාලකයෝ ද්‍රෝහීන්.

ලලිත් වීරතුංග මහත්මයා කියන්නේ මේ රටේ සිටි ඉහළම රාජ්‍ය නිලධාරියා. එතුමාට අධිකරණයෙන් දඬුවම් නියම කළා. සිල් රෙදි සම්බන්ධ සිද්ධියේදී මොනවාද ඉදිරිපත් කළ කරුණු? හොරකම් කළොත් ඒ ආකාරයට දඬුවම් ලැබෙනවාය කියා නිලධාරින්ට පෙන්වන්න ඕනෑ නිසා තමයි ලලිත් වීරතුංග මහත්මයා අවුරුදු පහළොවකට හිරේට දැම්මේ. දැන් ඒකට ඇපැල් අධිකරණයේ තීන්දුවක් දෙන තුරු බලාගෙන සිටිනවා. හැබැයි, මේ ආණ්ඩුවේ නායකයින් අර්ජුන මහේන්ද්‍රන්ට දී තිබෙන නිදහස ලලිත් වීරතුංගට දීලා තිබෙනවාද? මොකක්ද තත්ත්වය, මොකක්ද වෙනස?

මට මේ සියල්ල කියන්න වෙලාව නැහැ. සුළු ව්‍යාපාරිකයාගේ ඉඳලා මේ රටට ආදරය කරපු ස්වදේශීය සියලු කර්මාන්තකරුවන්ට, ව්‍යාපාරිකයන්ට මේ රටේ ව්‍යාපාර කිරීම

එපා කර තිබෙනවා. මේ රටේ ව්‍යාපාරයක් කරන්න බැහැ. තමුන්නාන්සේලාට මම ඔප්පු කරන්නේ, ආර්ථික වශයෙන් රාජ්‍ය අංශයේ නිෂ්පාදනයක්, කර්මාන්තයක් වර්ධනයක් නැති බවයි. පෞද්ගලික අංශයේ නිෂ්පාදනයක්, කර්මාන්තයක්, ව්‍යාපාරයක්, ව්‍යවසායකයන්ට අතදීමක් නැහැ. එහෙනම් මේ රට ගමන් ගන්නේ කොහාටද? ඒ නිසා තමුන්නාන්සේලාට මෙවර අය වැය දිනාගන්න ඡන්දය දෙන්නේ කවුද?

මේ ආණ්ඩුවට මෙම අය වැය ලේඛනය සම්මත කරගන්න බහුතරයක් නැහැ. ඒ සඳහා දැන් එකම එක යැපීම් මාර්ගයක් තිබෙනවා. ද්‍රවිඩ ජාතික සන්ධානයට පුළුවන් තමුන්නාන්සේලාට සහයෝගය දෙන්න. ඒ සඳහා දැන් ඉදිරිපත් වෙලා ඉන්නේ කවුද? මා අද දවසේ කිව යුතුම දෙයක් තිබෙනවා. මම මේ ප්‍රකාශය කරන්නේ, රට වෙනුවෙන් කරන්න ඕනෑ ප්‍රකාශයක් නිසායි. ද්‍රවිඩ ජාතික සන්ධානයේ සුමන්තිරන් මන්ත්‍රීතුමා පසුගිය කාල සීමාවේ හැම තිස්සේම මන්නාරම සමූහ මිනී වළ ගැනයි කිව්වේ. "අපේ ආරක්ෂක හමුදාව විසින් සිදු කළේ. ඒකට යුද අපරාධ චෝදනා එල්ල කරන්න ඕනෑ. ජිනීවා එක්ක යන්න ඕනෑ. චෝදනා පත්‍ර ලැයිස්තුවේ ඒක තියෙන්න ඕනෑ." කියා සුමන්තිරන් මන්ත්‍රීතුමා මන්නාරම සමූහ මිනී වළ ගැන කිව්වා. විදේශීය විශේෂඥ කණ්ඩායමක් අද කියනවා, "පෘතුගීසි කාලයට තමයි ඒ සමූහ මිනී වළ අයිති." කියා. ඒ මැරුණු මිනිස්සු දැන් වළෙන් නැඟිටලා ඇවිත් කිව්වත්, "පෘතුගීසි කාලයට තමයි මේ ඇට කටු අයිති." කියා, දෙවියනේ සුමන්තිරන් මන්ත්‍රීතුමා කැමැති නැහැ ඒක කියන්න. ඒක එතුමා කියන්නේ නැහැ. ඒ චෝදනාව නැවතත් අපේ ආරක්ෂක හමුදාවල කර පිටට දමන්න තමයි සුමන්තිරන් මන්ත්‍රීතුමාට ඕනෑ. මෙතුමන්ලාට ද්‍රවිඩ ජනතාවගේ ආර්ථික ප්‍රශ්න විසඳන්න වැඩ පිළිවෙළක් නැහැ.

අපි දන්නවා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව උතුරු ප්‍රදේශයේ දුම්රිය මාර්ග සහ යුද්ධයෙන් විනාශ වුණු පාරවල් ප්‍රතිසංස්කරණය කළ බව. පාලම් 400කට අධික ප්‍රමාණයක් හැදුවා. ධීවර ක්ෂේත්‍රයේ 'නැඟෙනහිර උදානය' වැඩ සටහන ඇති කළා. 'උතුරු වසන්තය' මඟින් සෑම ප්‍රදේශයකටම අවශ්‍ය යටිතල පහසුකම් සැපයුවා. මේ රටේ ජනතාවගෙන් සියයට 90කට විදුලිය තිබුණේ නැහැ. විදුලිය නොමැති එම ජනතාවට විදුලිය ලබා දුන්නා. නමුත්, අද තමුන්නාන්සේලා අහිංසක ද්‍රවිඩ ජනතාවට සහන දෙන්නේ නැහැ. තමුන්නාන්සේලා එල්ටීටීඊ, අන්තවාදී, ජාතිවාදී සංවිධානවල වුවමනාවන් වෙනුවෙන් කප්පම් දීලා දැන් ඔන්න අය වැය ලේඛනය සම්මත කර ගන්න යනවා. යෝජනා මොනවාද? සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයට රුපියල් මිලියන 200යි. සංහිඳියා කාර්යාලයට! මසකට රුපියල් 6,000ක් දෙන්නේ කාටද? අහිංසක ද්‍රවිඩ ජනතාවට උදවු කරනවාට අපි කැමැතියි. පීඩාවට පත් වුණු මේ රටේ අහිංසක ද්‍රවිඩ ජනතාවට සහන දෙන්න ඕනෑ. සංහිඳියා කාර්යාලය වෙනුවෙන් රුපියල් මිලියන 200ක් වෙන් කරනවා. අතුරුදහන්වූවන් සඳහා මසකට රුපියල් 6,000ක දීමනාවක් දෙනවා. ඒ දෙන්නේ, මිය ගිය සහ අතුරුදහන් වූ එල්ටීටීඊ සැකකරුවන්ද ඇතුළත්ව. ආර්ථික වශයෙන් නැඟිටින්න උත්සාහ කරන උතුරු නැඟෙනහිර නිරායුධ, අහිංසක මිනිසුන්ගේ ජීවනෝපාය සැකසීම සඳහා වැඩ පිළිවෙළක් නැහැ. හැබැයි, අන්තවාදී ජාතිවාදී දේශ ද්‍රෝහී කල්ලිවලට කප්පම් දෙනවා. මේ දේශ ද්‍රෝහී කල්ලිවලට අත් බැඳ ගන්න එක එච්චර අමාරු නැහැ. ද්‍රෝහීන්ට - ද්‍රෝහීන් හැම දාම එකතු වෙන්න පුළුවන්. ඒ නිසා මෙවර අය වැය ලේඛනය පුරාම එක දෙයක් තිබෙනවා. මව් බිමට ආදරය කරන්නේ නැති ප්‍රකාශය තමයි මෙවර අය වැය ලේඛනය තුළත් තිබෙන්නේ. යම් ඇමතියෙක් ජිනීවා නුවරට ගිහිල්ලා තමුන්ගේ රටේ හමුදාව යුද අපරාධ කළාය කියා අත්සන් කර එනවා නම්, එවැනි ඇමතියෙක් රට හෝ රටේ ආර්ථිකය හදයි කියා බලාපොරොත්තු තබන්න විදියක් නැහැ. එවැනි පාලකයෝ හදන අය වැය ලේඛනයක් ගැනවත් අපට විශ්වාසයක් නැහැ.

දැන් "තල් අරමුදල" කියා අරමුදලක් පිහිටුවන්න යෝජනා කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 5,000ක මුදලක් වෙන් කර තිබෙනවා. හැබැයි, ප්‍රථම වතාවට ඩයස්පෝරාවෙන් -දෙමළ කියන වචනය පාවිච්චි කර නැහැ. හරි කපටි ආකාරයෙන් ඒක මෙවර අය වැය ලේඛනයේ තිබෙන්නේ.- මුදල් ලබා ගන්නත් ආරාධනා කර තිබෙනවා.

අය වැයේ ඒ අයට ආරාධනා කර තිබෙන්නේ මෙලෙසයි:

> "... මෙම අරමුදලට දායකත්වය ලබා දීම සඳහා හිතෛෂීන්ට, ත්‍යාගශීලීන්ට විශේෂයෙන්ම ඩයස්පෝරාවට අපි ආරාධනා කරනවා. මෙම අරමුදල මහා භාණ්ඩාගාරය විසින් පරිපාලනය කරනවා."

මෙන්න ඡන්දය ලබා ගැනීම සඳහා ඩයස්පෝරාවට, අන්තවාදී, ජාතිවාදී කල්ලි කණ්ඩායම්වලට ආරාධනා කරනවා. ඒ අයගේ මනදොළ පුරවලා ඒ අයගේ මනදොළ පිරවීම තුළින් තමුන්ගේ පටු ඉලක්ක, අරමුණු සාර්ථක කර ගැනීමටයි උත්සාහ දරන්නේ. තම පැවැත්ම මිසක් රටක් පිළිබඳව, රටේ වර්ධනය පිළිබඳව, රටේ ආර්ථික ප්‍රගමනය පිළිබඳව, මේ රටේ තරුණයින්ට රැකියා ලබා දීම පිළිබඳව සිතන්නේ නැහැ. සුනඛයින්ට බෙහෙත් එන්නත් කරන්න රුපියල් මිලියන 100ක් වෙන් කරන මේ රජය උපාධිධාරින්ට රැකියා ලබා දෙන්න මෙවර අය වැය ලේඛනයෙන් රුපියලක්වත් වෙන් කර නැහැ. මේ රටේ උපාධිධාරින් 70,000ක් සිටිනවා. ඒ අයට රැකියා ලබා දෙන වැඩ පිළිවෙළක් නැහැ. ඔවුන්ගෙන් ආර්ථිකයට ප්‍රයෝජනයක් නැත්නම් පසුගිය කාලසීමාවේ මෙවැනි අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම පිළිබඳව අපිට රටක් වශයෙන් ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. එම නිසා සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයම අසත්‍ය ව්‍යාජ සංඛ්‍යාලේඛන මත පැටවිලා තිබෙන්නේ. මේ ආණ්ඩුව පසුගිය වසර ගණනාවක් තිස්සේ අය වැය ලේඛනය කියා ඉදිරිපත් කරපු සියලු ලේඛන හිස් ප්‍රලාප, පුස් ප්‍රලාප; මංගල සමරවීර ඇමතිතුමාගේ ප්‍රකාශයත් හිස්, පුස්, නිසරුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පසුගිය වසරේ රුපියල් මිලියන 57,000කට ආසන්න මුදලක් වෙන් කළා. නමුත් වියදම් කර තිබෙන්නේ මිලියන 3,600කට ආසන්න ප්‍රමාණයක්. මිලියන 57,000ක් වෙන් කරනවා, මිලියන 3,600ක් වියදම් කරනවා, සුරංගනා කථා ටිකක් කියනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගමනය, ප්‍රගතිය, අහස් මාළිගා, සිහින මාළිගා ගැන කියනවා. කාටද, මේ බොරුව කරන්නේ? කාත් එක්කද මේ රැවටිල්ල සිද්ධ කරන්නේ? කාටද මේ ගොනාට අන්දන්නට යන්නේ? එයින් මේ රටේ ඉදිරි ගමනට ඇති ඵලය කුමක් ද? එම නිසා වියදම් නොකරන, වියදම් කරන්නට බැරි, බොළඳ, දියාරු ඇස්තමේන්තු ටිකක් විතරක් ඉදිරිපත් කරනවා. මේ ඇස්තමේන්තු ටික විතරයි තමුන්නාන්සේලාට තිබෙන්නේ. ලොකු ප්‍රකාශ කරනවා, 'සිහින මාළිගා', 'සුරක්ෂා රක්ෂණ' කියලා.

සුරක්ෂා රක්ෂණය ජනාධිපතිතුමා නවත්වනවා. ඇයි නවත්වන්නේ? "සුරක්ෂා ටෙන්ඩරය අවලංගු කරන්නැයි ජනාධිපතිතුමා කියයි" ඇයි? ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුව තිබුණ මේ ටෙන්ඩරය විදේශීය සමාගමකට පවරන්නට යනවා. ඒ නිසා මේ අධ්‍යාපන ඇමතිත් එකයි, මේ අගමැතිත් එකයි, ආයෝජන ප්‍රවර්ධන භාර ඇමති මලික් සමරවික්‍රමත් එකයි, මංගල සමරවීර ඇමතිතුමාත් එකයි. මේ සියලු කට්ටිය මේ රටේ සියලුම දේවල් පිටරටට විකුණන්න පුළුවන් නම් විකුණනවා. ඒ නිසා ඒ, බටහිරට විකුණන ගැති ප්‍රතිපත්තියයි. රක්ෂණය කියන්නේ මූල්‍ය ක්ෂේත්‍රයේ ඉහළම ලාභ. එම නිසා විකුණන්න පුළුවන් නම් ඒක තමයි ඔවුන්ගේ එකම කාර්යය.

මේ අය තරුණයින්ට, විදේශ රැකියා ශ්‍රමිකයින්ට මේ සියලුම දෙනාට ව්‍යාජ ණය උගුලක් මවා පෙන්වනවා, මේ ණය ලබා

[ගරු සිසිර ජයකොඩි මහතා]

ගන්න පුළුවන් කියා. ඒ ඔස්සේ මේ රටේ රාජ්‍ය බැංකු පද්ධතියත් ක්ෂයකර අවසානයේ එයත් විදේශීය සමාගම්වලට විකුණා දැමීම හැර මොවුන්ට ඊට වඩා මේ රටේ තරුණයින්ට හෝ වෙනත් අයට සේවය කිරීමට අවස්ථාවක් නැහැ. එහි අවසාන අරමුණත් මේ ජාතියේ හදවත බඳු රාජ්‍ය බැංකු පද්ධතිය විකුණා දැමීමේ කූට වැඩ පිළිවෙළයි. එයයි, ඒ තුළින් සිද්ධ වෙන්නේ. එම නිසා රටට ඉලක්කයක් නැහැ; අරමුණක් නැහැ; ගමනක් නැහැ; වැඩ පිළිවෙළක් නැහැ. එම නිසා අරමුණක් නැතිව, වැඩ පිළිවෙළක් නැතිව, රට විනාශ කරපු ආණ්ඩුවට කියනවා, "ගෙදර යන්න" කියා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු අබ්දුල් හලීම් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ANURA SIDNEY JAYARATHNE *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබ්දුල් හලීම් අමාත්‍යතුමා කථා කරන්න.

[අ.භා.2.54]

**ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Postal Services and Muslim Religious Affairs)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගරු මංගල සමරවීර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ මේ දෙවන අය වැය ලේඛනය සම්බන්ධව අදහස් කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ලේඛනය සම්බන්ධව පසුගිය දවස් කිහිපය පුරාම විවිධ විවේචන ඉදිරිපත් වුණා අපි දැක්කා. මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නට පෙරත් මේ අය වැය ලේඛනය සම්බන්ධව සමහර අයගේ අදහස් පළ වුණා.

විශේෂයෙන්ම විපක්ෂය කියා සිටියේ මේ අය වැය මැතිවරණය ඉලක්ක කර ගත් අය වැයක් හැටියටයි. නමුත් අද හැමෝටම පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ අය වැය ලේඛනය මැතිවරණ ඉලක්ක කර නොගත්, රට වැටිච්ච තැනින් ගොඩ ගෙන ආර්ථිකය ශක්තිමත් කරන අය වැයක් බව. ඒ වාගේම මහජනතාවට සහන රැසක් සලසමින්, අපේ විවිධ ක්ෂේත්‍රවල තිබෙන අඩුපාඩුකම් සම්බන්ධයෙන් අධ්‍යයනය කරමින්, ඒ අඩුපාඩුකම් සම්පූර්ණ කරමින් මේ අය වැය ඉදිරිපත් කර ඇති බව අද කවුරුත් පිළිගෙන හමාරයි. අපි කාටත් අමතක කරන්න බැහැ, ඔක්තෝබර් 26 වෙනිදා මේ රටේ දේශපාලන වශයෙන් ඇතිවුණු ව්‍යාකූලතාව. ඒ වාගේම ඒ තුළින් අපි හැමෝටම හොඳ පාඩමකුත් ඉගෙන ගන්න ලැබුණා. රටේ මූලික නීතිය වන ව්‍යවස්ථාව කාටවත් හිතුමතයේ හසුරුවන්න බැරි බව ඒකෙන් ඔප්පු වුණා. රටේ ජනාධිපතිතුමා වෙන්න පුළුවන්, රටේ අග්‍රාමාත්‍යතුමා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අමාත්‍යවරුන් වෙන්න පුළුවන් ඒ කාටවත් රටේ මූලික නීතිය වෙනස් කරන්න බැරි බවයි අපට දැන ගන්න ලැබුණේ. ඒ ව්‍යාකූලතාව පැවැති ඒ මාස දෙකක කාලය නැත්නම් දවස් 52ක කාලය තුළ අපේ රටේ සියලුම කටයුතු ඇනහිටියා. විශේෂයෙන්ම අපි රජයක් හැටියට කරපු සංවර්ධන වැඩ සියල්ල වාගේම ඇනහිටියා. ඒ නිසා සිදුවූ පාඩුව දිහා බලනකොට මම හිතන්නේ බිලියන ගණනාවක්.

මම ඊයේ පෙරේදා අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කථාවට ඇහුම්කන් දුන්නා. එතුමාගේ කථාවට පෙර කථා කළේ අපේ බන්දුල ගුණවර්ධන ශූරීන්. බන්දුල ගුණවර්ධන මැතිතුමා විශාල තර්කයක් ගෙන ආවා, අපේ රජයේ ආර්ථිකය හැසිරවීමේ තත්ත්වය වැරදි බව පෙන්වීමට. හැබැයි, ආචාර්ය හර්ෂ ද සිල්වා ඇමතිතුමා ආර්ථික විශේෂඥයෙක් හැටියට එතුමාගේ ඒ තර්කය එක වචනයකින් බිඳ හෙළූ බව අපි හැමෝම දැක්කා. ඒ ගෙන ආ බොරු තර්කය නිසා බන්දුල ශූරීන්ට මේ සභා ගර්භයෙන් පිටත්වන්න සිද්ධ වුණා.

මම දැකලා තිබෙනවා, අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විශේෂයෙන් පන්සල්වලට ගියාම එතුම කථා කරන විශේෂ මාතෘකාවක් වන්නේ රුපියල් අවප්‍රමාණය වීම සම්බන්ධයෙන් බව. හැබැයි, අපේ අමාත්‍ය හර්ෂ ද සිල්වා මැතිතුමා එක ප්‍රශ්නයක් ඇහුවා, හිටපු ජනාධිපතිතුමාගෙන්, එතුමා මේ බලයට පත් වෙච්ච දින 52 ක කාලවකවානුව තුළ මේ රටට එක ඩොලරයක් හෝ ගෙන ආවාද කියලා. ඒ ප්‍රශ්නය ඇහුවාම හිටපු ජනාධිපතිතුමා මේ සභා ගර්භයෙන් පිටත් වුණා. මෙන්න මේකයි තත්ත්වය. විශේෂයෙන්ම මේ කවුරුත් දන්නවා, බදු ගැසීම සම්බන්ධව කවුරු විවේචනය කළත් රජයක් හැටියට රට පාලනය කිරීම සඳහා බදු ගැසීම අවශ්‍ය බව. මම හිතන්නේ ඕනෑම රජයක්, අද විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් පවා එදා ආණ්ඩු කරන කාලයේ, ඒ බදු ගැසීම සිදු කළා. එහෙම නැතුව රටක් ඉස්සරහට ගෙනියන්න බැහැ.

මට මතකයි, බන්දුල ශූරීන් එදා අය වැය විවාදයේදී කිව්වේ, මේ බදු ගැසීම නවත්වන්න සක්‍රයාගේ පුතා වයිමාටවත් නොහැකි බවයි. එහෙම කියපු බන්දුල ගුණවර්ධන මැතිතුමා දැන් බදු සම්බන්ධව ලොකු විග්‍රහයක් කරනවා. රටක් හැටියට ඉදිරියට යන්න නම් ආදායම් ලැබෙන පුද්ගලයන්ගෙන් බදු ලබා ගැනීම අවශ්‍ය වන බව පොදුවේ අපි කවුරුත් දන්නවා. එදා සිදු වුණේ ඒ කාර්යයයි. යම් රජයක් අය වැය ඉදිරිපත් කිරීමේදී තමන්ට යම් සහනයක් ලැබෙනවාද කියා ඒ රටේ ජනතාව බලාපොරොත්තුවෙන් සිටීම සාමාන්‍ය දෙයක්. අපි රජයක් හැටියට ආර්ථික වශයෙන් කොතරම් දුෂ්කරතාවන්ට මුහුණ දුන්නත්, අපේ රජයෙන් කොතරම් සහන මේ ජනතාව වෙනුවෙන් ලබා දීලා තිබෙනවාද කියලා මම ටිකක් මතක් කරන්න කැමැතියි.

රජයේ සේවකයින්ට පඩි වැඩි කිරීමක් කලින් වතාවකදීත් සිදු කළා. මෙවරත් ඔවුන්ට රුපියල් 2,500ක දීමනාවක් ලබා දීමට මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. පසුගිය කාලයේදී ලබාදුන් රුපියල් 10,000 ඔවුන්ගේ වැටුපට එකතු වුණා. ඒ වාගේම විශ්‍රාමිකයන්ගේ වැටුප් ප්‍රශ්නයත් බොහෝ කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක්. දැන් ඒ ප්‍රශ්නය විසඳලා, ඒ අයගේ වැටුප් වැඩි කිරීමකුත් කරලා තිබෙනවා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාවලට කොමාන්ඩෝ දීමනාව වැනි දීමනා ඉහළ දමා තිබෙනවා. ඒ වාගේම අලුතෙන් ජල යෝජනා ක්‍රම 1,000ක් සඳහා මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. අලුතින් විවාහ වන අයට සහ විදේශ ශ්‍රමිකයන්ට සහනදායි පොලියකට ණය ලබා දීමේ වැඩ පිළිවෙළක් අලුතෙන් ආරම්භ කරලා තිබෙනවා. මම අද පත්තරයේ තිබෙනවා දැක්කා, අපේ හිටපු ජනාධිපතිතුමාගේ පුතාත් ඒ ණය මුදල මේ වර්ෂයේ ලබා ගන්න බලාපොරොත්තු වන බව. ඒ වාගේම ග්‍රාමීය පාසල්වල ළමයින්ට කිරි වීදුරුවක් ලබා දීම සඳහා මේ අය වැයෙන් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම හැම නිවාසයකටම වැසිකිළි පහසුකම් ලබා දීම, උසස්පෙළ සමතුන්ට විදේශ අධ්‍යාපනය සඳහා ලෝකයේ තිබෙන ප්‍රසිද්ධ විශ්වවිද්‍යාලවල -හාවර්ඩ්, ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් වාගේ- ඉගෙන ගැනීමට ශිෂ්‍යත්ව ලබා දීම, ඒ වාගේම සරසවි වරම් අහිමි වුණු දරුවන්ට සහන පොලියට ණය ලබා දීම වාගේ සහන රැසක් මේ අය වැය තුළින් අපි දකිනවා. මම විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි, තමුන්නාන්සේලා කියන්නේ මේ සියල්ලම අපි නතර කළ යුතුයි කියලාද? ඒ වාගේම සහන ලබා දීමට මේ විපක්ෂය විරුද්ධයිද? මේකයි මම අහන ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයෙන් තවත් හොඳ පියවරක් අරගෙන තිබෙනවා. ඒ තමයි තවත් සමෘද්ධිලාභීන් ලක්ෂ හයකට සමෘද්ධි සහනාධාරය ලබාදීමට කටයුතු කිරීම. "සමෘද්ධි" කියලා අපි අද නාමික වශයෙන් කිව්වාට, එදා කාලයේ "ජනසවිය" වැඩසටහන කියලායි කිව්වේ. එදා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් ආරම්භ කළ එම වැඩසටහන මේ රටේ ඉන්න දුප්පත් ජනතාව "නැති බැරි අය ඇති හැකි අය කිරීම" සඳහා ආරම්භ කරපු වැඩසටහනක්. අද සමෘද්ධිය කියලා නම වෙනස් වෙලා තිබෙනවා. එදා ඒ ජනසවිය වැඩසටහන ක්‍රියාත්මකවීමේදී මේ රටේ විශාල පිබිදීමක් තිබුණා වාගේම දුප්පතුන්ගේ අත සරු කරන වැඩ පිළිවෙළක් විධියට අපි දැක්කා. ඒ තුළින් එදා සමාජයේ විශාල වෙනසක් දකින්න තිබුණා. ඒ වාගේම ඒ දුප්පතුන් ඇති හැකි අයට බවට පත්වුණාට පසු තවත් පිරිසක් ඒකට අලුතින් එකතු වුණා. නමුත්, මේ "සමෘද්ධි" කියන වැඩ පිළිවෙළේ ප්‍රතිලාභ එදා -1994- සිට අද දක්වාම එකම කොටසයි බුක්ති විඳින්නේ. නමුත්, අද සමාජයේ දුප්පත් විශාල පිරිසක් ඉන්න බව අපි කවුරුත් දන්නවා. ඒ අයට කිසිම දෙයක් නැහැ. අද සමෘද්ධිලාභී සමහර අයට තට්ටු දෙකේ ගෙවල් තිබෙනවා; ඒ වාගේම වාහන තිබෙනවා. ඒ සියල්ල තිබෙන අය තමයි අද සමෘද්ධි සහනාධාරය ලබා ගන්නේ. නමුත්, දුප්පත් අයට කිසිම දෙයක් නැහැ. ඒ නිසා මෙවර අය වැයෙන් ලක්ෂ 6ක පිරිසක් අලුතින් සමෘද්ධි වැඩ පිළිවෙළට එකතු කර ගැනීම මම ඇත්තටම අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ සංචාරක කටයුතු අද කඩා වැටිලා තිබෙනවා. විශේෂයෙන් පසුගිය කාලයේ මේ රටේ දේශපාලනික වශයෙන් ප්‍රශ්න ඇති වෙන්න කලින් ලෝකයේම ඉතා හොඳ destination එක හැටියට නම් කරපු ලංකාවට එන්නට සිටි විදේශිකයන් නොපැමිණීමෙන් විශාල පාඩුවකට මුහුණ පාන්න සිදු වුණා.

මම දකින තවත් රජයේ විශේෂ වැඩ පිළිවෙළක් තමයි "ගම්පෙරළිය" වැඩ පිළිවෙළ. ඒ තුළින් අපේ බොහෝ ගම්මානවල, බොහෝ ප්‍රදේශවල තිබුණු අඩු පාඩුකම් සම්පූර්ණ කිරීමට අපට අවස්ථාව ලැබී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

හොඳයි. මේ තුළින් අපේ ගම්බද ප්‍රදේශවල විශාල වැඩ පිළිවෙළක් දියත් කරන්න පුළුවන්. ගරු මංගල සමරවීර මැතිතුමා අය වැය කථාව ඉදිරිපත් කිරීමේදී සඳහන් කළා, දින 52ක හොර ආණ්ඩුව පැවැති කාලසීමාව තුළ ඉස්සෙල්ලාම කළේ, ගම්පෙරළිය වැඩ පිළිවෙළ නතර කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ එකයි කියලා. එහෙම නම් අපි ගමට, සමාජයට සිදු කළ සේවාව නතර කිරීමට උත්සාහ දැරීමකුයි එදා සිදු කළේ. අපි අවුරුදු තුනහමාරක පමණ බොහොම අමාරු කාලයක් ගත කළා. එනමුත්, ඒ අවුරුදු තුනහමාරක කාලය අවසන් කරලා අපි අද නැවත නැඟිටලා ජනතාවට සහන සලසමින්, අඩු පාඩුකම් සම්පූර්ණ කරමින් යන මේ ගමනේදී, මේ අය වැය ජයග්‍රහණය කිරීම සඳහා සියලු දෙනාගේම සහය ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Seeniththamby Yoheswaran. You have ten minutes.

[பி.ப. 3.08]

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். இவ்வரவு செலவுத் திட்டத்தில் சிறுவர்களுக்கானது, மாணவர்களுக்கானது, தொழிலாளர்களுக்கானது, கீழைத்தேய நாடுகளில் தொழிலுக்குச் சென்றவர்களுக்குரியது, புதிதாகத் திருமணமானவர்களுக்குரியது, வறியோர்களுக்குரியது, ஓய்வூதியம் பெறுவோருக்குரியது, சமுர்த்தி பெறுவோருக்குரியது, விசேட தேவையுடையவர்களுக்குரியது, தனியாருக்குரியது என்று பல்வேறு தரப்பினர்களுக்குப் பலவிதமான சலுகைகள் முன்மொழியப்பட்டு, அவற்றுக்கு நிதியும் ஒதுக்கீடு செய்யப்பட்டமையை நான் முதலில் வரவேற்கின்றேன். ஆனாலும், யுத்தத்தால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மக்களின் துரித அபிவிருத்தி என்ற ரீதியில் முன்மொழியப்பட்டுள்ள 5,000 மில்லியன் நிதியானது, உண்மையிலே பாதிக்கப்பட்ட அம்மக்களுக்குப் போதுமானதாக இல்லை என்பதனையும் நான் இந்தச் சபையிலே தெரிவித்துக்கொள்ள விரும்புகிறேன். இருந்தபோதிலும், இந்த 5,000 மில்லியன் ரூபாயையும் இவ்வருடத்துக்குள்ளே அந்த மக்களுக்கான அபிவிருத்தி வேலைகளுக்குச் செலவிடுவதற்கு அரசாங்கம் வழங்கிவைக்க வேண்டுமென இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த 2018ஆம் ஆண்டு யுத்தத்தால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கிலுள்ள மாற்றுத் திறனாளிகள், பெண் தலைமைத்துவக் குடும்பங்கள், புனர்வாழ்வு அளிக்கப்பட்டவர்கள் சார்பாக ஒதுக்கப்பட்ட நிதிகள், எவ்வகையிலும் உரியவர்களின் நலன்கருதிச் செலவழிக்கப்படாத நிலைமை

[ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා]

யையே நாங்கள் காண்கின்றோம். வரவு செலவுத் திட்டத்தின் மூலம் திட்டங்கள் முன்மொழியப்படுகின்றன. ஆனால், அவற்றை நடைமுறைப்படுத்துவதில் காலதாமதம் செய்யப் படுகின்ற அல்லது அத்திட்டம் இல்லாமலே செய்யப்படுகின்ற நிலைமையே காணப்படுகின்றது. 2017ஆம் ஆண்டு வரவு செலவுத் திட்டத்தில் வடக்கே முல்லைத்தீவிலுள்ள ஒட்டு சுட்டான் ஓட்டுத் தொழிற்சாலையின் புனரமைப்புக்கென நிதி ஒதுக்கீடு இடம்பெற்றது. ஆனால், அந்த ஒதுக்கீட்டின்மூலம் அங்கு பெரிதாக எந்தச் சாதனையும் ஏற்படுத்தப்படவில்லை. தென் பகுதியில் இருப்போர் தென் பகுதியிலிருந்து ஓடுகளைக் கொண்டுவந்து, ஒட்டுசுட்டானில் வைத்து, அவை ஒட்டு சுட்டான் ஓடு என்றும் அதனை வாங்குமாறும் கூறி மக்களுக்கு விற்கின்றார்கள். அங்கு இந்த நிலைமைதான் காணப்படு கின்றது. எனவே, வரவு செலவுத் திட்டத்தில் ஒதுக்கப்படும் நிதிகள் பூரணமாகவே உரிய திட்டங்களுக்குச் செலவழிக் கப்பட வேண்டுமென நான் இந்தச் சபையிலே தெரிவித்துக்கொள்கின்றேன்.

அரசு 'கம்பெறலிய' எனப்படும் ஊரக எழுச்சித் திட்டத்தின்மூலம் பல அபிவிருத்தி வேலைகளை மேற் கொள்வதை முதலிலே நான் வரவேற்கின்றேன். ஆனாலும், சென்ற 52 நாள் சதிப் புரட்சியால் தடைப்பட்ட திட்டங்களுக்கான நிதியை இவ்வருடத்தில் மீள வழங்குவதற்கு அரசாங்கம் முன்வர வேண்டும் என்பதனையும் இந்தச் சபையில் கேட்டுக்கொள்கின்றேன். அது மாத்திரமன்றி, சென்ற வருடம் வழங்கப்பட்ட பன்முகப்பட்ட நிதி ஒதுக்கீட்டின் சில நிதிகள்கூட 52 நாள் சதிப் புரட்சி காரணமாக முடக்கப்பட்டிருக்கின்றன. இன்றுவரை அது விடுவிக்கப்படாத நிலையில் இருக்கின்றது. ஆகவே, சென்ற வருட இறுதிப் பகுதியில் ஏற்பட்ட அந்தச் சதிப் புரட்சியின் காரணமாகச் செலவிடப்படாமல் இருக்கின்ற நிதியை இவ்வருடப் பன்முக நிதியோடு சேர்த்து வழங்குவதற்கு அரசாங்கம் முன்வர வேண்டுமென்றும் கேட்டுக்கொள்கிறேன்.

இந்நாட்டின் அபிவிருத்திக்கு அவசியமான பல விடயங்கள் காணப்படுகின்ற நிலையில், மொத்த வரவு செலவுத்திட்ட நிதியில் 17 சதவீதமான நிதி பாதுகாப்புக்கு ஒதுக்கப் பட்டிருக்கின்றது. இந்நாட்டில் தற்போது யுத்தம் இல்லாத நிலையிலும் அரசாங்கம் பாதுகாப்புக்கு மிகக் கூடுதலான நிதியை ஒதுக்கியது ஏன்? என்ற கேள்வி எழுகின்றது. யுத்தம் மௌனித்த பின் மஹிந்த ராஜபக்ஷ அரசாங்கத்தில் ஒதுக்கப்பட்ட நிதியைவிட கூடுதலான நிதி தற்போது பாதுகாப்புக்காக ஒதுக்கப்பட்டுள்ளது. 2010ஆம் ஆண்டு 202 பில்லியன், 2011ஆம் ஆண்டு 215 பில்லியன், 2012ஆம் ஆண்டு 229 பில்லியன், 2013ஆம் ஆண்டு 289 பில்லியன், 2014ஆம் ஆண்டு 253 பில்லியன், 2015ஆம் ஆண்டு 285 பில்லியன் என மஹிந்த ராஜபக்ஷ ஆட்சிக் காலத்தில் பாதுகாப்புக்கு நிதி ஒதுக்கப்பட்டது. தற்போதைய அரசாங்கக் காலத்தில், 2016இல் 306 பில்லியன், 2017இல் 284 பில்லியன், 2018இல் 290 பில்லியன் என நிதி ஒதுக்கப்பட்டது. ஆனால், 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் இதற்கென 393 பில்லியன் ஒதுக்கப்பட்டுள்ளது. 2018ஆம் ஆண்டைவிடக் கூடுதலாக 103 பில்லியன் பாதுகாப்புக்கு நிதி ஒதுக்கப் பட்டிருக்கின்றது. ஆகவே, இந்த அரசாங்கம் ஏதாவது யுத்தத்திற்கு ஆயத்தமாகின்றதா? என்று நான் கேட்க விரும்புகின்றேன்.

குறிப்பாக, கல்வியை எடுத்துக்கொண்டால், கல்விக்காக கிட்டத்தட்ட 4.54 வீதம்தான் ஒதுக்கப்பட்டிருக்கின்றது. சுகாதாரத்திற்கு 8.11 சதவீதம் ஒதுக்கப்பட்டுள்ளது. இன்று வீடில்லாமல் பலர் இருக்கிறார்கள். இந்நிலையில் வீடமைப் புக்கு ஒதுக்கப்பட்ட நிதி 0.72 சதவீதம்தான். விவசாயம், மீன்பிடி, கால்நடை, நீர்ப்பாசனம் போன்ற அமைச்சுக்களுக்கு 4.94 சதவீதமும் மலைநாட்டு புதிய கிராமங்கள் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்திக்கு 0.17 வீதமும் ஒதுக்கப்பட்டிருக்கின்றது. பிரதமரின் கீழ் இருக்கும் தேசியக் கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி, தொழில் பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சுக்கு 4.25 சதவீதம் ஒதுக்கப்பட்டிருக்கின்றது. மிக முக்கியமான துறைகளுக்கான இவ்வாறான குறைந்தளவு ஒதுக்கீடுகள் இந்நாட்டின் அபிவிருத்தியின்மீது கரிசனை காட்டாத நிலைமையையே காட்டுகின்றது. அதேநேரம் பாதுகாப்புக்குக் கூடுதலான நிதி ஒதுக்கப்பட்டுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கு, கிழக்குப் பகுதிகளில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பல தொழிற்சாலைகள் இன்று புனரமைக்கப்பட வேண்டிய நிலையில் உள்ள அதேவேளை, வரவு செலவுத் திட்டத்தில் கைத்தொழில், வாணிப அமைச்சுக்கு 0.56 வீத நிதியை ஒதுக்குவதன்மூலம் இவற்றுக்கான கரிசனை கண்துடைப் பாகக் காட்டப்பட்டிருக்கின்றது. வடக்கு, கிழக்குப் பகுதிகளில் பல தொழிற்சாலைகள் புனரமைக்கப்பட வேண்டியதுடன் புதிதாக உருவாக்கப்படவும் வேண்டும். ஆனால், 2016ஆம் ஆண்டு வரவு செலவுத் திட்டத்தில் கைத்தொழிற்சாலை களுக்கான இயந்திர இறக்குமதிக்கு வரிவிலக்கு அளிக்கப்பட்டு, அதன்மூலம் மட்டக்களப்பு மாவட்டத்தின் கும்புறுமூலை எதனோல் தொழிற்சாலைக்கான கருவிகள் அர்ஜுன் அலோசியஸினால் கொண்டுவரப்பட்டன. இந்த நிலையில் இந்தத் தொழிற்சாலை அந்தப் பகுதியில் வாழும் மக்களின் வாழ்வாதாரத்தையும் அவர்களின் எதிர்கால நடவடிக்கையையும் பாதிக்கும் என்ற வகையில் இந்த உயர் சபையிலே பல தடவை எங்களது எதிர்ப்பை வெளியிட்டோம். அதுதவிர, மக்கள் போராட்டங்களையும் நடாத்தினோம். மட்டக்களப்பு மாவட்டத்தின் தமிழ், முஸ்லிம் அரசியல் பிரதிநிதிகள் கையொப்பமிட்டு ஜனாதிபதி அவர்களிடம் மகஜர் சமர்ப்பித்திருந்தோம். அவ்வாறு இருந்தபோதிலும், பிரதேச சபைகூட அனுமதியளிக்காத நிலையிலும் அதன் வேலைகள் நடைபெற்றன. நாங்கள் அதை நிறுத்துவதற்குப் பல முயற்சிகள் எடுத்ததன் பிரகாரம் சில காலம் அது நிறுத்தப்பட்டிருந்தது.

ஆனால், அர்ஜுன் அலோசியஸ் பிணையில் சென்றதன் பின்னர் திடீரென மீண்டும் வேலைகள் ஆரம்பிக்கப் பட்டிருக் கின்றன. அந்த எதனோல் தொழிற்சாலைக் கட்டுமானப் பணிகள் இரகசியமான முறையிலே நடைபெற்றுக் கொண்டிருக்கின்றன. 52 சிங்களத் தொழிலாளர்களும் 35 தமிழ் தொழிலாளர்களும் 16 காவலாளர்களும் அங்கு கடமையில் ஈடுபட்டிடுக்கொண்டிருக்கின்றார்கள். இந்தியக் கம்பனி யொன்று 3,250 மில்லியனை இந்தத் தொழிற்சாலைக்காகக் கொடுத்திருக்கின்றது. அர்ஜுன் அலோசியஸ் 2,170 மில்லியனை இதற்கு வழங்கியிருக் கின்றார். மொத்தம் 5,420 மில்லியன் ரூபாய் செலவில் இது கட்டப்படுகின்றது. இந்தத் தொழிற்சாலையால் அந்த மக்களுக்குப் பாதிப்பேயன்றி நன்மையில்லை. ஆகவே, இந்த நாட்டைப் போதையற்ற நாடாகக் கொண்டுவர வேண்டுமென்று கூறி பல நடவடிக்கையெடுக்கின்ற மேதகு ஜனாதிபதி அவர்களும் இந்த நாட்டின் பிரதமரும் இந்தத் தொழிற்சாலையின் கட்டுமான வேலைகளை உடனடியாக நிறுத்துவதற்கு உடனடியாக

நடவடிக்கையெடுக்க வேண்டுமென்று இந்த உயரிய சபையிலே கேட்டுக்கொள்கின்றேன். இந்தியா வடக்கு, கிழக்கு மக்களுக்கு அனுகூலமான தொழிற்சாலைகளை உருவாக்கு மென்று நாங்கள் எதிர்பார்த்தாலும், இந்தியக் கம்பனிகள் வந்து உருவாக்குவது எமது மக்களின் வாழ்வாதாரத்தைச் சீரழிக்கின்ற தொழிற்சாலைகளே என்பதையிட்டு இந்தச் சபையிலே கவலை தெரிவிக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கம் இவ்வரவு செலவுத்திட்டத்தில் வறிய மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்தும்முகமாக கடன் திட்டம் வழங்கும் செயற்பாட்டைக் கொண்டுவந்திருக்கின்றது. 2018இல் கொண்டுவரப்பட்ட பலநோக்குக் கூட்டுறவுச் சங்கம் மூலம் கடன் வழங்கும் திட்டம் முழுமையாக வெற்றியளிக்க வில்லை. அதேநேரம் இன்று அங்கு பல குடும்பங்கள் நுண்கடன் பெற்றபோதிலும், அந்தக் கடனைச் செலுத்த முடியாத நிலையில் இன்று நடுத்தெருவுக்கு வந்துள்ளன. கிட்டத்தட்ட 169 பெண்கள் நுண்கடன் காரணமாகத் தற்கொலை செய்துள்ளார்கள். எனவே, அனைத்து நுண்கடன் களிலிருந்தும் மக்களை விடுவித்து, அந்தக் கடனைக் கட்டுவதை அரசாங்கம் பொறுப்பேற்பதுடன், அரசாங்கத்தால் வழங்கப்படும் கடன்களை இலகுபடுத்தி, மக்கள் அந்தக் கடனைப் பெறக்கூடிய வகையில் வசதிகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்றும் இந்த உயரிய சபையிலே கேட்டுக்கொள்கின்றேன்.

கடந்த வரவு செலவுத் திட்டங்களில் முன்மொழியப்பட்ட பலநோக்குக் கூட்டுறவுச் சங்கம்மூலமான கடன் வழங்கல், புனர்வாழ்வு அதிகாரசபைமூலம் வழங்கப்படும் இரண்டரை இலட்சம் ரூபாய் பெறுமதியான கடன் திட்டம் போன்றவை வறிய, பாதிக்கப்பட்ட மக்களைச் சென்றடையவில்லை. மாறாக வங்கிகளின் கடுமையான சுற்றுநிருபங்கள் காரணமாக அவற்றை மக்கள் பெறமுடியாமல் இருந்தது. ஆனால், வங்கிகள் அந்தப் பணத்தை வைத்து இலாபமடைந் திருக்கின்றன. ஆகவே, இன்று கடன் திட்டங்களை முன்மொழிந்திருக்கும் இந்த அரசு, அவற்றை வறிய மக்கள் பெறக்கூடிய வகையில் இலகுபடுத்திக் கொடுத்து அம்மக்களின் வாழ்வாதாரத்துக்கு உதவ வேண்டுமென்று இந்தச் சபையிலே கேட்டுக்கொள்கின்றேன். அதுதவிர, கடவுச் சீட்டுக்கு -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
Okay.

ஒரு நாள் சேவையினூடாகக் கடவுச் சீட்டைப் பெறுவதற்கான கட்டணத்தை 10,000 ரூபாயிலிருந்து 15,000 ரூபாயாக அரசாங்கம் அதிகரித்து இருக்கின்றது. ஆனாலும், வடக்கு, கிழக்கைச் சேர்ந்த மக்கள் ஒருநாள் சேவையினூடாக கடவுச்சீட்டைப் பெறுவதற்காக இங்கு வந்து இரண்டு நாட்கள் தங்கியிருக்க வேண்டிய நிலை இருக்கிறது. ஆகவே, ஒவ்வொரு மாவட்டத்திலும் கடவுச்சீட்டு வழங்கும் நிலையங்கள் உருவாக் கப்படல் வேண்டும். ஒருநாள் சேவையினூடாகக் கடவுச் சீட்டைப் பெறுவதற்கு இவ்வளவு பாரிய தொகையைச் செலுத்த வேண்டிய அதேநேரத்தில், இரண்டு மணித்தியாலயங் களில் அந்தக் கடவுச்சீட்டை வழங்குவதற்கு ஏற்பாடு செய்ய வேண்டுமென்றும் இந்தச் சபையில் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු වසන්ත අලුවිහාරේ මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.20]

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture, Irrigation and Rural Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා මේ අය වැය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීමේදී, මන්ත්‍රීවරු කිහිපදෙනෙක් සුබ වාදීව කරුණු ඉදිරිපත් කළා. ගරු මුදල් ඇමතිතුමා මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළ පසු, මාධ්‍ය තුළින් අඩුවෙන්ම විවේචන එල්ල වූ අය වැයක් හැටියටයි මම මේ අය වැය සලකන්නේ. මොකද, මේ අය වැයෙන් සහන රැසක් ලබා දී තිබෙනවා. අපට ඒ ගැන කථා කරන්න පුළුවන්කම තිබෙනවා.

දේශීය ආර්ථිකය නඟා සිටුවීමට ඉවහල් වන අන්දමේ සහ සාමාන්‍ය ජනතාවට ප්‍රතිලාභ රැසක් අත් කර දෙන අන්දමේ අය වැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මුදල් ඇමතිතුමාටත් මගේ කෘතඥතාව පළ කිරීමට කැමතියි.

ඒ වාගේම වත්මන් ආර්ථික අර්බුදයට වගකිව යුත්තේ කවුද? 2019 වර්ෂයේ අය වැය යෝජනා සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීමට ප්‍රථමයෙන්, අපේ රට මුහුණ දී සිටින දැඩි ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් වැදගත් කරුණු කිහිපයක් සඳහන් කිරීමට මා කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එසේ සඳහන් කරන්නේ රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදයට වත්මන් රජය වගකිව යුතු බවට ඒකාබද්ධ කල්ලියේ ආර්ථික විශේෂඥයන් ජනමාධ්‍ය ඔස්සේ නිතරම, පදනම් විරහිත අන්දමින් බොරු බෙගල් ඇදබෑම පුරුද්දක් කරගෙන සිටින නිසායි. 2015 ජනවාරි 08වැනි දින අපගේ රජය බිහිවී, මේ රටේ පාලනය භාර ගත්තේ පසුගිය සන්ධාන රජය ලබාගෙන තිබූ විශාල ණය කන්දරාවක්ද සමඟයි. මුදල් අමාත්‍යාංශයේ වාර්තාවන්ට අනුව 2004 වර්ෂයේ රජයේ සමස්ත ණය ප්‍රමාණය පැවතුණේ රුපියල් බිලියන 2,140ක් ලෙසයි. නමුත් 2014 වර්ෂයේ අවසානය වන විට මේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 7,391ක් දක්වා ඉහළ ගොස් තිබුණා. ඒ අනුව 2004 වර්ෂයේ සිට 2014 දක්වා කාල සීමාව තුළ රජයේ සමස්ත ණය ප්‍රමාණය සියයට 345කින් පමණ ඉහළ ගියා. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස අපට දේශීය හා විදේශීය වශයෙන් ණය ලබා ගැනීමට සිදුවීම වැළැක්විය නොහැකි තත්ත්වයක්. එහෙත් එසේ ලබා ගත් ණය වැඩිපුර වැය කළ යුතුව තිබුණේ, දේශීය ආදායම ඉහළ නංවන ව්‍යාපෘතීන් සඳහායි. නමුත් පැවති සන්ධාන රජය එවැනි දූරදර්ශී ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කළේ නැහැ. පසුගිය රජය කෙටි කාලීන ගෙවීම් කොන්දේසි යටතේ ඉහළ පොලියට විශාල වශයෙන් ණය ලබා ගත්තා. මෙසේ ලබාගත් ණයවලින් වැඩි ප්‍රමාණයක් වැය කළේ, ජනතාවට හෝ දේශීය ආර්ථිකයට ප්‍රතිලාභයක් ලැබෙන ව්‍යාපෘතීන් සඳහා නොවෙයි. මෙහි ඉතා භයානක තත්ත්වය නම් 2016 වර්ෂයේ රාජ්‍ය ආදායම වූ රුපියල් බිලියන 1,686න් රුපියල් බිලියන 1,352ක්ම, එනම් සියයට 80ක්ම වැය කිරීමට සිදු වුණේ පසුගිය රජය අධික පොලියට ලබාගත් ණය හා පොලී වාරිකය ගෙවීමටයි. මේ අනුව පසුගිය සන්ධාන රජය සිදු කළේ

[ගරු වසන්ත අලුවිහාරේ මහතා]

දේශීය ආර්ථිකය, බරපතළ ණය උගුලකට හසු කිරීමයි. සැබෑ තත්ත්වය එසේ වී තිබියදී, ඒකාබද්ධ මන්ත්‍රී කණ්ඩායම මාධ්‍ය සංදර්ශන පවත්වමින්, බොරු බේගල් ඇදබාමින්, ජනතාවට ප්‍රකාශ කරන්නේ 2015 වර්ෂයේ දී, සන්ධාන රජය රටේ පාලනය භාර දෙන විට ඉතා යහපත් ආර්ථික තත්ත්වයක් පැවති බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2000 වර්ෂයේ ආර්ථිකය බින්දුවට වැටුණු අවස්ථාවේ දී ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආණ්ඩුව භාර ගත්තාට පසුව, ඒ ආර්ථිකය ධන මට්ටමට ගන්න පුළුවන්කම ලැබුණා. එම නිසා මුදල් අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ වාර්තාවන්ට අනුව, 2015 ජනවාරි 08වැනි දින සන්ධාන රජය ඉවත්ව යන විට දේශීය ආර්ථිකයට අත් වී තිබුණු භයානක ඉරණම පිළිබඳව මා විසින් ඉදිරිපත් කළ කරුණුවලටද සාධාරණ ප්‍රසිද්ධියක් ලබා දෙන ලෙස මා සියලුම ජනමාධ්‍ය ආයතනවලින් ඉතාම කරුණිකව ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සන්ධාන රජය දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් විශාල ණය ප්‍රමාණයක් ලබා ගත්තත්, දේශීය ආර්ථිකය නඟා සිටුවීමට දායක වන කිසිදු මහ පරිමාණ ව්‍යාපෘතියක් ඔවුන්ගේ පාලන කාල සීමාව තුළ ක්‍රියාත්මක කළේ නැහැ. 1978 වර්ෂයේ දී මහා පරිමාණ මහවැලි සංවර්ධන ව්‍යාපාරය බිහි කළේත් එක්සත් ජාතික පක්ෂ රජය බව මා විශේෂයෙන් සඳහන් කරන්නට කැමැතියි. ඉන් අනතුරුව සන්ධාන රජය බලයේ සිටි කාලසීමාව තුළ එවැනි මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති එකක් හෝ රට තුළ ක්‍රියාත්මක කළේ නැහැ.

ඊළඟට, මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය ගැන කිව්වොත්, මීට පෙරාතුව වත්මන් ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාද කිහිප අවස්ථාවකදීම ප්‍රකාශ කළ පරිදි, මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතිය දියත් කිරීමට පසුගිය සන්ධාන රජය පැවැති අවධියේ එතුමා බලවත් උත්සාහයක් දැරුවත් එය අසාර්ථක වුණා. එතුමාට එය ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, මේ යහපාලන ආණ්ඩුව ආවායින් පසුව තමයි එතුමාට මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ගන්න පුළුවන් වුණේ.

ඒ විතරක් නොවෙයි. යෝධ සංවර්ධන ව්‍යාපෘතිය යථාර්ථයක් බවට පත් කළේ, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ අපගේ රජය විසින් බව මේ අවස්ථාවේ දී මා විශේෂයෙන් සඳහන් කළ යුතු වෙනවා. මේ යෝධ සංවර්ධන ව්‍යාපෘතිය නිසා අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය හා මාතලේ දිස්ත්‍රික්කයන්හි කුඹුරු හෙක්ටයාර් අසූදෙදහසකට පමණ දෙකන්නයම වගා කිරීම සඳහා වාරි ජලය සැපයීමටත්, එමඟින් පවුල් එක්ලක්ෂ තිස්දහසකට පමණ තිරසාර ආර්ථිකයක් ළඟා කර දීමටත්, වාර්ෂිකව මෙට්‍රික්ටොන් තුන්දහස ඉක්මවූ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයක් ජාතික ආර්ථිකයට එක් කිරීමටත්, මෙගාවොට් 25ක ආර්ථික විදුලිබලයක් උත්පාදනය කිරීමටත්, වකුගඩු රෝගයෙන් පීඩා විඳින ප්‍රදේශ රැසකට පිරිසිදු පානීය ජලය සපයා දීමටත් ඉඩ ප්‍රස්ථාව ලැබී තිබෙනවා.

ඊළඟට, වයඹ ඇළ ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක කුඹුරුවලට ජලය අක්කර අඩි එක්ලක්ෂ පන්දහසක් ලබා දීමට අපේක්ෂා කරනවා.

එසේ වගා බිම් හෙක්ටයාර 12,500කට වාරි ජලය සැපයීම තුළින් ගොවි පවුල් 13,000කට පමණ කුඹුරු ඉඩම් දෙකන්නයේම වගා කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙනවා ඇති. මේ සම්බන්ධයෙන් කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් විපක්ෂ නායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාද වත්මන් රජයට ස්තුතිවන්ත වනු ඇතැයි මම උදක් අපේක්ෂා කරනවා. මොරගහකන්ද - කළු ගඟ බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2019 වර්ෂයේ අය වැයෙන්ද රුපියල් මිලියන 12,000ක් වෙන් කරදීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාට විශේෂ ස්තුතිය පළ කිරීමටද මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

උමාඔය ව්‍යාපෘතියේ අසාර්ථකත්වය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තරම් වැදගත්කමක් ඇති මොරගහකන්ද - කළු ගඟ - වයඹ ඇළ බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය දියත් කිරීම හිතාමතාම පැහැර හරිනු ලැබූ පසුගිය සන්ධාන රජය උමාඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නම් කටයුතු කළා. කුහක පරමාර්ථයක් යටි හිතේ තබාගෙන විශේෂඥ ඉංජිනේරුවරුන්ගේ උපදෙස් නොසලකා හරිමින් මෙම ව්‍යාපෘතිය එවකට සිටි නායකයින් විශාල මුදලක් වැය කර ක්‍රියාත්මක කළා. ඔවුන් අදහස් කළේ, ඌව පළාතේ සමහර ප්‍රදේශවල ජනතාවට ඇති වන පීඩාවන් ගැන තැකීමක් නොකර, ඌව පළාතේ ජල සම්පත තමන්ගේ ගම් ප්‍රදේශවල අවශ්‍යතාවන් සඳහා ලබා ගැනීමයි. අවසානයේ සිදු වුණේ ඌව පළාතේ සමහර ගම් ප්‍රදේශවල ජනතාවට ඔවුන්ගේ උන්හිටි තැන් හා සියලු දේපළ අහිමි වීමයි. අද එම ගැටලුවට විසඳුම් සෙවීමට සිදුවී තිබෙන්නේත් අපගේ රජයටයි.

2019 අය වැය යෝජනා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මුලින් සඳහන් කළ පරිදි පැවති සන්ධාන රජය විසින් දායාද කළ ආර්ථික අර්බුදයෙන් රට බේරා ගැනීමේ විශාල වගකීම පැවරී තිබියදීත්, සාමාන්‍ය ජනතාවට ප්‍රතිලාභයන් අත්වන අන්දමේ ජනතා හිතවාදී අය වැයක් ඉදිරිපත් කිරීම ගැන මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා වෙත ප්‍රථමයෙන් මගේ බලවත් ප්‍රසාදය පළ කර සිටිනවා.

සමෘද්ධි දීමනාව. පසුගිය දශකයේ සමෘද්ධි දීමනා ලබා දීමේ දී එම හිමිකම ලැබිය යුතු බොහෝ පවුල්වලට දේශපාලන හේතූන් නිසා පවා එම දීමනාව ලැබුණේ නැහැ. මෙවර අය වැයෙන් එම ප්‍රතිලාභය හිමි විය යුතු 600,000ක පමණ පිරිසකට මෙම සහනාධාරය ලබාදීමට රුපියල් මිලියන 10,000ක් වෙන් කිරීම තුළින් මේ දක්වා අසාධාරණයට ලක්වූ විශාල පිරිසකට සාධාරණය ඉටු කරදීම පිළිබඳවද ගරු මුදල් ඇමතිතුමාට මගේ ප්‍රශංසාව පළ කරනවා.

රාජ්‍ය සේවක වැටුප සහ විශ්‍රාම වැටුප. 2019 ජූලි මාසයේ සිට රජයේ සේවකයන්ට රුපියල් 2,500ක අන්තර්කාලීන මාසික දීමනාවක් ලබා දීමටත්, විශ්‍රාම වැටුප් විෂමතාවන්ට මුහුණ දී සිටින 585,000ක් පමණ වූ විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 12,000ක් වෙන් කිරීමටත් මෙවර අය වැයෙන් කටයුතු කර තිබීම සම්බන්ධයෙන් ගරු මුදල් අමාත්‍යතුමාට කෘතඥතාව පළ කරන ලෙස ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටද මා කාරුණිකව ආරාධනා කරනවා. එසේම, 2015දී අපගේ රජය බලයට පත්වීමෙන් පසුව ඉතිහාසයේ විශාලම වැටුප් වැඩිවීම ලෙස රාජ්‍ය සේවක මාසික වැටුප රුපියල් 10,000කින් වැඩි කිරීමටත්, සියලුම දීමනාවන් මූලික වැටුපට ඇතුළත් කිරීමටත් පියවර ගත් බවද විශේෂයෙන් සිහිපත් කළ යුතු වෙනවා.

ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ දීමනා. මෙවර අය වැය ඉදිරිපත් කිරීමේ දී ගරු මුදල් ඇමතිතුමාද සඳහන් කළ පරිදි ත්‍රිවිධ හමුදාවන්හි ඇතැම් දීමනා අවුරුදු විස්සකටත් වැඩි කාලයක් තිස්සේ වැඩි කර නොතිබීම ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. තත්ත්වය එසේ වුවත්, හමුදා රණ විරුවන්

උද්ඝෝෂණය කළේ නැහැ; හර්තාල් පැවැත්වූයේ නැහැ; වර්ජනවලට පෙළඹුණේ නැහැ. ඔවුන් එදත් රට වෙනුවෙන් දිවි හිමියෙන් සේවය කළා. අදටත් එසේමයි. එම නිසා මෙවර අය වැයෙන් ත්‍රිවිධ හමුදා රණ විරුවන්ගේ ගෙවල් කුලී දීමනාව සියයට සියයකින් වැඩි කිරීමටත්, නිල ඇඳුම් දීමනාව, යහපත් පැවැත්මේ දීමනාව, කොමාන්ඩෝ දීමනාව ආදියද වැඩි කිරීමටත් පියවර ගැනීම ගැන ගරු මුදල් ඇමතිතුමාට අපගේ කෘතඥතාව පළ කළ යුතු වෙනවා.

විශේෂ හැකියාවන් සහිත පුද්ගලයන්ගේ දීමනාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ හැකියාවන් සහිත පුද්ගලයන් සඳහා දෙනු ලබන රුපියල් 3,000ක මාසික දීමනාව මෙවර අය වැයෙන් රුපියල් 5,000ක් දක්වා වැඩි කර තිබීම නිහතමානීව ඇගයීමට ලක් කරන ලෙස මා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටද යෝජනා කිරීමට කැමැතියි. ගරු මුදල් ඇමතිතුමා සඳහන් කළ පරිදි මේ පිරිසට තවදුරටත් පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමට සිදු වන්නේ නැහැ.

වකුගඩු රෝගීන් සඳහා දීමනාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වකුගඩු රෝගීන් තවත් 5,000කට පමණ රුපියල් 5,000ක දීමනාව ලබාදීමට මෙවර අය වැය මඟින් පියවර ගැනීම තුළින් පොරොත්තු ලේඛනය අහෝසි කිරීමට ගරු මුදල් ඇමතිතුමා කටයුතු කර තිබීම අපි අගය කළ යුතු වෙනවා.

"ගම්පෙරළිය" වැඩසටහන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා "ගම්පෙරළිය" වැඩසටහන යටතේ මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් වෙන් කෙරෙන මුදල මෙවර අය වැයෙන් රුපියල් මිලියන 200 සිට මිලියන 300 දක්වා වැඩි කර තිබෙනවා. ඒ අනුව මෙම ප්‍රතිලාභය ඒකාබද්ධ මන්ත්‍රී කණ්ඩායම නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසවලටත් කිසිදු ප්‍රභේදයකින් තොරව ලැබීම ගැන එතුමන්ලා සතුටු වනු ඇතැයි මම අපේක්ෂා කරනවා.

"එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නඟා සිටුවීම සඳහා ඉතාම සහනදායී පොලියක් යටතේ ණය ලබා දීම පිණිස, රුපියල් මිලියන 60,000ක් මුදා හැර තිබීමද ඉතාම අගය කළ යුතු වෙනවා. ඔවුන්ට අවශ්‍ය ඇප සුරැකුම්පත් ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ අරමුදලක් පිහිටුවීමටත්, බැංකුවලින් මෙම ණය ලබා ගැනීමේදී මුහුණ පෑමට සිදුවන බාධා හා ප්‍රමාදයන් පිළිබඳව දැනුම් දීම සඳහා විශේෂ දුරකථන අංකයක් සහිතව වෙනම ඒකකයක් මුදල් අමාත්‍යාංශයේ ස්ථාපිත කිරීමටත් පියවර ගැනීම පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමාට මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

දීර්ඝ කාලයක සිට පවතින වතු කම්කරු ජනතාවගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නයට නිසි විසඳුමක් ලබා දීම ඉතාම සාධාරණ හෙයින්, මෙවර අය වැයෙන් යෝජනා කර ඇති පරිදි, වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මැතිතුමා සමඟද සාකච්ඡා කොට මෙම ගැටලුවට කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස මමද කාරුණිකව ඉල්ලා සිටිනවා.

මාතලේ බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩාංගණය නවීකරණය සඳහා මීට ප්‍රථමයෙන් ලබා දුන් රුපියල් මිලියන 550ට අමතරව, මාගේ විශේෂ ඉල්ලීම පරිදි, මෙවර අය වැයෙන් ද රුපියල් මිලියන 300ක් ලබා දීම ගැන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාටත්, ක්‍රීඩා අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමාටත් මාගේ විශේෂ ස්තුතිය පුද කිරීමටද මෙය අවස්ථාවක් කර ගන්නවා.

අපේ රටට විදේශ විනිමය රැගෙන එන විදේශගත ශ්‍රමිකයන් සඳහා පොලියෙන් සියයට හැත්තෑ පහක් රජය විසින් දැරීමේ පදනම මත අවුරුදු දෙකට ණය ආපසු ගෙවීමේ සහන කාලයක් ද සහිතව රුපියල් මිලියන දහයක් දක්වා ණය මුදලක් ලබා දීමටත්, ඔවුන්ගෙන් ජාත්‍යන්තර දුරකථන මත අයකරන විදුලි සංදේශ ගාස්තු ඉවත් කිරීමටත් මෙවර අය වැයෙන් යෝජනා කර තිබීම ඉතාම ප්‍රශංසනීය බව මා සඳහන් කිරීමට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවස්ථා විරෝධී ලෙස පසුගිය වර්ෂයේ නොවැම්බර් මාසයේදී අපගේ රජය විසුරුවා හැරීම සිදු නොවුණා නම්, මේ වර්ෂයේ මාර්තු 6වැනි දින ඉදිරිපත් කළ මේ අය වැය පසුගිය වර්ෂයේ නොවැම්බර් මාසයේදීම ඉදිරිපත් කිරීම තුළින් මෙවර අය වැයෙන් ජනතාවට අත් කර දී ඇති සියලුම සහනයන් පසුගිය වර්ෂයේදීම ලබා දීමට ඉඩප්‍රස්තාව තිබූ බව මා විශේෂයෙන් සඳහන් කිරීමට කැමැතියි. විශේෂයෙන්ම "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" සහ "ගම්පෙරළිය" වැඩසටහන් මඟින් මේ වන විටත් රටේ ජනතාවට ප්‍රතිලාභ රැසක් ලබා දීමට අවස්ථාව තිබූ බවද පෙන්වා දිය යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015දී අපගේ රජය බලයට පත් වූ පසු, ජාත්‍යන්තර රටවල විශ්වාසය දිනා ගැනීමට අපට පුළුවන් වුණා. දැන් ශ්‍රී ලංකාවට එරෙහිව ජාත්‍යන්තර යුද අධිකරණ පිහිටුවීමේ හෝ ආර්ථික සම්බාධක පැනවීමේ තර්ජනයක් නැහැ. ඒ වාගේම ස්විට්සර්ලන්තයේ පැවති ලෝක ආර්ථික සමුළුවට සහභාගි වීමට ආරාධනා ලැබූ ප්‍රථම ශ්‍රී ලාංකික නායකයා වන්නේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. "ජීඑස්පී ප්ලස්" තහනම සහ යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීමට එම සමුළුවේදී එතුමාට හැකියාව ලැබුණා. "ජීඑස්පී ප්ලස්" තහනම ඉවත් වීම තුළින් දේශීය භාණ්ඩ අපනයනයෙන් ලැබෙන ආදායම ඉහළ නංවා ගැනීමටත්, ගරු මුදල් අමාත්‍යතුමා අය වැය කථාවේදී සඳහන් කළ පරිදි යුරෝපා සංගමයට අයත් රටවලට මත්ස්‍ය අපනයනය සියයට 14කින් වැඩි කර ගැනීමටත් අවස්ථාව සැලසී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluwihare )
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රටේ සංවර්ධනය සඳහා දැන් විදේශ ආධාර පවා විශාල වශයෙන් ලැබෙමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකාබද්ධ කණ්ඩායම පසුගිය අවුරුදු හතර තිස්සේම මාධ්‍ය සංදර්ශන හා රැස්වීම් පවත්වමින්, අපගේ රජයට විරුද්ධව ගායනා කරන තේමා ගීතය බවට පත්කර ගෙන තිබෙන්නේ මහ බැංකු බැඳුම්කර සිද්ධියයි. මේ සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කළ ජනාධිපති කොමිසමේදී හෙළිදරව් වූ කරුණු අනුව දැනටමත් ගරු අධිකරණයේ පවරා ඇති නඩුවට අනුව, එයට වගකිව යුතු පුද්ගලයන්ට දඬුවම් කිරීම සම්බන්ධයෙන් මමත් සම්පූර්ණයෙන්ම එකඟ වෙනවා. මහා භාණ්ඩාගාරයේ මෙවැනි සිද්ධියක් ඇති වූ ප්‍රථම අවස්ථාව මෙය නොවෙයි. පසුගිය සන්ධාන රජය පැවති අවධියේත්, එනම් 2008 වර්ෂයේ සිට 2014 දක්වා කාල සීමාව තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී අක්‍රමිකතා සිදු වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී තිබෙන නිසා, ඒ පිළිබඳවත් පරීක්ෂණ කළ යුතු බවට එම ජනාධිපති කොමිසම විසින්ම වාර්තා කර තිබෙනවා. එම කාල සීමාවේ මුදල් අමාත්‍ය ධුරය දැරුවේත් හිටපු රාජ්‍ය නායකයා බව විශේෂයෙන් සිහිපත් කිරීමට කැමැතියි. මේ

[ගරු වසන්ත අලුවිහාරේ මහතා]

පිළිබඳව මතකය අලුත් කර ගැනීමට අවශ්‍ය නම්, ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ පිටු අංක 915 සහ පිටු අංක 917 නැවත වරක් කියවා බලන ලෙස ඒකාබද්ධ මන්ත්‍රී කණ්ඩායමට මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර්ජුන මහේන්ද්‍රන් මහතා නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා නොගැනීම සම්බන්ධයෙන් ඒකාබද්ධ කණ්ඩායම අපගේ රජයට විශාල වශයෙන් චෝදනා එල්ල කරනවා. මෙසේ ශ්‍රී ලංකාවෙන් පිටමං වී සිටින්නේ අර්ජුන මහේන්ද්‍රන් මහතා පමණක් නොවෙයි. රුසියාවේ තානාපතිවරයා වශයෙන් සිටියදී තානාපති කාර්යාලය සඳහා ගොඩනැඟිල්ලක් මිලදී ගැනීමේ කටයුත්තේදී ඇමෙරිකානු ඩොලර් තුන් ලක්ෂ පනස් දහසක් වංචා කිරීම නිසා රුසියාව විසින් තානාපති සේවයෙන් ඉවත් කළ උදයංග වීරතුංග මහතාත් ගරු අධිකරණය මඟ හරිමින්, විදේශ රටවල සැඟවෙමින් සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදයංග වීරතුංග මහත්මයා කාගේ කවුදැයි අපි හැමදෙනාම හොඳින් දන්නා කරුණක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කණ්ඩායමෙන් කාලය අඩු කරන්නේ නැතිව කථාව ඉදිරියට කරගෙන යන්න දෙන්න බැහැ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluwihare )
මට තව සුළු වෙලාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කණ්ඩායමෙන් විනාඩි 3ක් අඩු කරනවා. ඔබතුමා කථාව කරන්න.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluwihare )
එහෙම නම් මගේ කථාව අවසන් කරන්නම්. මගේ කථාවේ ඉතිරි කොටස මා සභාගත කරන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාවේ ඉතිරි කොටස ඔබතුමාට හැන්සාඩ්ගත කරන්න පුළුවන්.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluwihare )
හොඳයි. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled:*

කෙසේ වෙතත් අර්ජුන මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකාවට ගෙන්වා නොගැනීම සම්බන්ධයෙන් දිගින් දිටගම රජයට චෝදනා එල්ල කරන ඒකාබද්ධ කණ්ඩායම උදයංග වීරතුංග මහතා විදේශ රටවල සැඟවී සිටීම සම්බන්ධයෙන් ගොළුවත රැකීම බලවත් පුදුමයටත්, හාස්‍යයටත් කාරණයක් වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකාබද්ධ මන්ත්‍රී කණ්ඩායම දැන් කථා කරන්නේ ඔවුන්ගේ පාලන කාල සීමාවේ ඉතාම පිරිසිදු පාලනයක් පවත්වාගෙන ගිය ආකාරයටයි. "කෝප්" කමිටුවේ සාමාජිකයෙක් ලෙස එම කමිටු පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි සන්ධාන රජය පැවැති අවධියේ සිදුවී ඇති මහා පරිමාණ දූෂණ හා වංචා පිළිබඳ කෙටියෙන් හෝ සඳහන් කිරීමට මා අදහස් කරනවා. හෙජින් ගිවිසුම නිසා ඛනිජ තෙල් සංස්ථාවට සිදු කළ පාඩුව රුපියල් මිලියන 10,200ක්. එවකට සංස්ථාවේ සභාපතිවරයා කවුදැයි මා අමුතුවෙන් සඳහන් කළ යුතු නැහැ. ක්‍රියාත්මක නොකළ නිල්වලා ව්‍යාපෘතිය නමින් 2015 ජනාධිපතිවරණයට පෙර දින වංචා සහගත ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ඇති චෙක්පතේ වටිනාකම රුපියල් මිලියන 4,000ක්. මෙයට සම්බන්ධ අමාත්‍යාංශ ලේකම් අයිවන් සිල්වා මහතාත් පිට රටට පලා ගොස් තිබෙනවා. 2015 මැතිවරණයේදී නීති විරෝධි ලෙස ප්‍රචාරක කටයුතු සඳහා විදුලි සංදේශ නියාමන කොමිසමෙන් වංචා කළ මුදල රුපියල් මිලියන 600ක්. අවසානයේ හිටපු නායකයාගේ නියෝග ක්‍රියාත්මක කළ අසරණ රාජ්‍ය නිලධාරින්ට සිර දඬුවම් නියම වී තිබෙනවා. නාවික හමුදාව ඉටු කළ යුතු "සමුද්‍රීය ආරක්ෂණ කටයුතු" නීති විරෝධි ලෙස "ඇවන්ට් ගාර්ඩ් සමාගමට" පැවරීමෙන් රජයට සිදු කළ පාඩුව රුපියල් බිලියන 11ක්. අපගේ රජය විසින් මෙම රාජකාරිය නැවතත් ශ්‍රී ලංකා නාවික හමුදාවට පැවරීමෙන් පසු එම ආදායම නැවතත් රජයට ලබා ගැනීමට හැකිවී තිබෙනවා.

සන්ධාන රජය විසින් වෙස්කෝ -WESCO- සමාගමට අලුත්වැඩියාව සඳහා භාරදී ඇති ලංගම බස් රථ 143ක් ආගිය අතක් නැහැ. මෙය ඉතා බරපතළ වංචාවක්. දුනුකොළ මිලදී ගැනීමේදී පුද්ගලික සමාගමකට වැඩිපුර ගෙවා ඇති මුදල රුපියල් මිලියන 124ක්. පසුගිය ජනාධිපතිවරණයේදී ප්‍රචාරක කටයුතු සඳහා ස්වාධීන රූපවාහිනියට ගෙවිය යුතු රුපියල් කෝටි ගණනක මුදල නොගෙවීම සම්බන්ධයෙන් හිටපු රාජ්‍ය නායකයා වග කිව යුතු බව ජනාධිපති පරීක්ෂණ කොමිසම ද තීරණය කර තිබෙනවා. එම නිසා අනුන්ගේ ඇස්වල තිබෙන කුණු සෙවීමට පෙර තමන්ගේ ඇස්වල තිබෙන පොල් පරාල ගැන සිතා බලන ලෙස සමස්ත ඒකාබද්ධ මන්ත්‍රී කණ්ඩායමට යෝජනා කර සිටීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. අවසන් වශයෙන් දේශීය ආර්ථිකය නඟා සිටුවීමට ඉවහල් වන අන්දමේ සහ සාමාන්‍ය ජනතාවට ප්‍රතිලාභ රැසක් අත්කර දෙන අන්දමේ අය වැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මුදල් ඇමතිතුමාටත් මගේ කෘතඥතාව පළ කර සිටිනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාව නැවැත්වූ තැනින් මගේ කථාව පටන් ගන්නයි මා බලාපොරොත්තු වෙන්නේ. ශ්‍රී ලංකා මහ බැංකුව මංකොල්ල කාපු එක ප්‍රසිද්ධ කාරණයක්. අර්ජුන මහේන්ද්‍රන් ගැන මේ පාර්ලිමේන්තුව තුළදී අගමැතිතුමා කිව්ව කාරණය මුළු රටම දන්නා කාරණයක්. ඔහු මඟුල් ගෙදරක ගිහින් තිබෙනවාය, මඟුල් ගෙදර කටයුතු අවසන් කරලා නැවත එනවාය කියා තමයි අගමැතිතුමා කිව්වේ. එය කාටවත් නැහැය කියන්න බැහැ. එය ඉතා ප්‍රසිද්ධ කාරණයක්. හැබැයි ඔහු ආවේ නැහැ. එතැනින් ඉදිරියට නීති කටයුතු කරන්නයි පාර්ලිමේන්තුවේ සංශෝධනයකුත් කර ගත්තේ. ආණ්ඩු පක්ෂයේ ඔබතුමන්ලා විරෝධතාව දක්වනවා වාගේම අපි එකතුවෙලා ඒ මහා මුදල් කන්දරාව ලබා ගැනීමට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ මහා මුදල් කන්දරාව

ලැබුණා නම් සංවර්ධනය වෙනුවෙන් කොයි තරම් දේවල් කරන්න පුළුවන්ද? ඒ මුදල් අපට එපා, තමුන්නාන්සේලා රට හදන කටයුත්තට ඒ මුදල් දායක කර ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කෙටි කාලයකින් පැවැත්වෙන මැතිවරණයක් බලාපොරොත්තුවෙන් තමයි, මේ අය වැය ඉදිරිපත් කරන්නේ. ගම්වල ඉන්න ජනතාව බලාපොරොත්තු වුණේ මේ විදියේ අය වැයක් නොවෙයි. ඒ ගොල්ලෝ බලාපොරොත්තු වුණේ, රට ගොඩ නඟන, සහන දෙන අය වැයක්. "ගම්පෙරළිය" වැඩසටහන අපිත් කළා. එම වැඩසටහනේ ගැටලු තිබුණා, හොඳ දේවලුත් තිබුණා. නමුත් "ගම්පෙරළිය" වැඩසටහන කෙරුණා. වර්තමානයේ "ගම්පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක කරගන්න පුළුවන්ද කියන කාරණය භාණ්ඩාගාරයේ මුදල් තත්ත්වයත් එක්ක තීරණය වන කාරණයක්.

අද -කාන්තා දිනයේදී- බොහෝ කාරණා සිද්ධ වුණු ආකාරය අපි දැක්කා. ප්‍රවාහන ඇමතිතුමා දුම්රිය මැදිරියක් කාන්තාවන්ට වෙන් කළා. දුම්රිය වාගේම, බස් රථ වෙන් කරන්නත් එතුමා බලාපොරොත්තුව පළ කළා. රටේ සමස්ත කාල සටහන් පද්ධතිය තවමත් හදාගන්න බැරි වුණු පාලනයක් යටතේ තමයි අපි ඉන්නේ. බස් මාෆියාවට, ගණන්කාරයන්ගේ, තැරැව්කාරයන්ගේ මං කොල්ල කෑමට අහුවුණු බස් හිමියන්, සේවකයන් සියලුදෙනා වෙනුවෙන් ප්‍රවාහන අමාත්‍යතුමාට මා යෝජනා කරනවා, බස් රථ කාල සටහන් නැවත නිරවුල් කරන්නය කියා. ලංකාවේ පළාත් නවයෙන් දැනට දකුණු පළාතේ විතරයි නියමිත පරිදි ඒකාබද්ධ කාල සටහනක් දියත් කරන්නේ. එය සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. අනික් ප්‍රදේශවලටත් එය ක්‍රියාත්මක කරයි කියා අපි අපේක්ෂා කරනවා.

දැන් අපි කෘෂි කර්මාන්තය ගැන බලාපොරොත්තු පළ කර තිබෙනවා. හැබැයි ඒවා බලාපොරොත්තු විතරයි. අවුරුදු 4කට පස්සේ මෙවර කන්නය හොඳයි. ඒක කාගේවත් හපන්කමක් නොවෙයි. වර්ෂාව ලැබුණු නිසා අපට ඒ අවස්ථාව ලැබී තිබෙනවා. ඒකෙනුත් හානියක් වෙලා තිබෙන්නේ වැඩිපුර අස්වැන්න ලැබුණු නිසායි. එතකොට කෘෂිකර්ම ඇමතිතුමා කෘෂි කර්මාන්තය වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න තීන්දු කර තිබෙන්නේ මොනවාද?

එතුමාට දීලා තිබෙන විෂයන්වලින් ටිකක් විෂයක් නැතිව සිටින ඇමතිවරුන්ට බෙදලා දුන්නා නම් හොඳයි. මේ ඇමතිකම් තොගය බෙදා ගන්න එක හොඳයි. මොකද, වැඩ කර ගන්නට එතුමාට බැහැ. ඒක පෙනෙනවා.

රටේ වැවිලි කර්මාන්තයට මොකක්ද වෙලා තිබෙන්නේ? වැවිලි කර්මාන්තයේ, වතු සමාගම්වල හාම්පුතුන් රුපියල් 1,000ක දෛනික වැටුප කම්කරුවාට දෙන්නට බැහැයි කියා මහ විශාල අඳෝනාවක් නඟනවා. නමුත්, ඒ අයට සාධාරණ වැටුපක් දෙන්නට ඕනෑ. අපි ගම්වල අපේ ඉඩම්වල වැඩ කරන කම්කරුවාට දවසකට රුපියල් 1,000 දෙනවා, වතු හාම්පුතුන් තමයි බැහැයි කියන්නේ. අපි වැඩවල විදිය අනුව රුපියල් 1,200ක් දෙනවා, 1,500ක් දෙනවා. අපි එහෙම දෙනකොට වතු හාම්පුතුන්ට බැහැලු. වතු හාම්පුතුන් කියන්නේ කවුද? තමන් මිලදී ගත්ත වත්ත බලන්නට සීමිත වාර ගණනක් පමණක් ගිය, කොළඹ air-conditioned room එකේ ඉඳලා වතු පාලනය කරන පරිපාලකයෝ. ඒ අය තමයි මේක ගෙවන්නට බැහැයි කියන්නේ. මම අතිගරු ජනාධිපතිතුමාට යෝජනා කළා මේ වතු, ඒ සමාගම්වලට කරන්නට බැරි නම් අක්කර 5 ගණනේ බෙදලා බදු පදනමක් මත වත්තේ වැඩ කරන සේවකයින්ට භාර දෙන්න කියා. ඒවායේ ගෙවල් හදන්නට බැහැ, ඉඳි කිරීම් බැහැ. වත්තෙන් මුදල් ගෙවන විධියට වගා කර එළදාව වත්තට ලබා දෙන්න කියා. මම බලාපොරොත්තු වෙනවා මේක ඉදිරි යෝජනාවක් විධියට ගන්න. වැවිලි සමාගම්වලට ආදායම් බදු ගෙවන්නත් බැරි නම්, පඩි ගෙවන්නත් බැරි නම්, මොකක්ද කළ යුත්තේ?

අපි ආණ්ඩුවෙන් බැහැරවෙලා දවස් 52ක් ගත කළා. අපි ආණ්ඩුවක් හැදුවා. නමුත් ඒ ආණ්ඩුව ඉස්සරහට ගෙන යන්න බැරි වුණා. මම විශ්වාසයෙන් කියනවා, තව වැඩි කල් යන්නේ නැහැ ඒ කරගෙන යන්නට බැරි වුණු ආණ්ඩුව ඔබතුමන්ලාත් සම්බන්ධ කරගෙන අපි හදන්නට ලැහැස්තියි කියන එක. මෙවර අය වැය ලේඛනයට මාගේ දැඩි විරෝධය දක්වමින්, මේක පරාජය කරන්නට කළ හැකි සියලු දේ කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.45]

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமரவீர- தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - Non Cabinet Minister of Labour and Trade Unions Relations)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය පිළිබඳව දෙවැනි වර කියවීමේ විවාදයේදී කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මුලින්ම මම සන්තෝෂ වෙනවා. මේ දින කිහිපයේදී මේ ගරු සභාව තුළ අපි ආණ්ඩුවත්, විපක්ෂයත් හැටියට මෙවර අය වැය පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. අපට පෙනෙනවා සම්ප්‍රදායක් හැටියට මේ පිළිබඳව ආණ්ඩු පක්ෂය හොඳ කියනවා, විපක්ෂය වැරදි කියනවා, විරුද්ධ වෙනවා, පරාජය කරනවා කියනවා. විපක්ෂය පරාජය කරන්නට හදන, විරුද්ධ වෙන්නට හදන මේ ලේඛනයේ මොනවාද අඩංගුවෙලා තිබෙන්නේ කියන එක අපි දැන් දන්නවා. පසුගිය කාල සීමාව තුළදී රජයක් හැටියට අපි ලබා ගත්ත ජයග්‍රහණ ගැන පසුව කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් මම මේක අහන්නේ. අපි රාජ්‍ය සේවය අරගෙන බලමු. අපි කවුරුත් දන්නවා, 2015 ජනවාරි 8වැනිදා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and THE* HON. VELU KUMAR *took the Chair.*

**ගරු රවින්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "විරුද්ධ වෙනවා" කියන එකේ මොනවාද අඩංගු වෙලා තිබෙන්නේ කියා අපි බලමු. මම මෙය විපක්ෂයෙන් අහනවා. අපි කවුරුත් දන්නවා, 2015 ජනවාරි 8වැනිදා අපි මේ රජය භාර ගත්තායින් පසු පෙබරවාරි මාසයේ ඉදිරිපත් කළ අතුරු සම්මත ගිණුමෙන් කවුරුත් විශ්වාස නොකළ විධියට, කවුරුත් බලාපොරොත්තු නොවුණු විධියට රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කරන්න මේ රජයට පුළුවන්කම ලැබුණ බව. එසේ වැඩි කළ රුපියල් 10,000 පිළිබඳව මේ ගොල්ලෝ ගණන් හැදුවේ, රුපියල් 20,000ක පඩියක් ගත් කෙනෙකුගේ පඩිය දැන් රුපියල් 30,000ක් වෙන්න ඕනෑ කියායි. එහෙම නොවෙයි, ඒ පඩි වැඩිවීම වුණේ. මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවේ ඒක තිබෙනවා. 2015දී රාජ්‍ය සේවයේ පහළම තනතුර වන කාර්යාල කාර්ය සහායක තනතුරේ රුපියල් 11,730ක වැටුපක් ගත් පුද්ගලයා මේ අවුරුද්දේ රුපියල් 21,000ක් ගන්නවා, එන අවුරුද්දේ රුපියල් 24,000ක් ගන්නවා. එතකොට ඔහුගේ පඩිය වැඩි වෙන්නේ රුපියල් 10,000කින් නොවෙයි. මූලික වැටුපට අවස්ථා 4කදී ඒ මුදල එකතු වෙනවා. ඒකනේ දැන් සමහරු අහන්නේ, "කවුද මේක උඹලාගෙන් ඉල්ලුවේ." කියා. දැන් රාජ්‍ය සේවකයින්ට මේක අමතක වෙලා. ඒ ගැන මම කනගාටු වෙනවා. රුපියල් 2,500ක දීමනාවක් දැන් නැවතත් යෝජනා කර තිබෙනවා. ඉදිරි කාලයේදී එම මුදලත් වැටුපට එකතු වෙයි. එතකොට සම්පූර්ණ වැටුප් වැඩිවීම රුපියල් 12,500යි. මම අහනවා, ඒකටද මේ ගොල්ලෝ විරුද්ධ වෙන්නේ? මේ රටේ රාජ්‍ය සේවකයින්ට අවස්ථා 4කදී රුපියල් 12,500ක් මූලික වැටුපට එකතු කිරීමටද විරුද්ධ වෙන්නේ කියා මම ඒ අයගෙන් අහනවා.

මේ රටේ විශ්‍රාමිකයන්ට අවුරුදු ගණනාවක් තිස්සේ ප්‍රශ්නයක් තිබුණා. සාමාන්‍යයෙන් මේවා ගැන කථා වුණේ මැතිවරණ කාලයේදී විතරයි. මේ රටේ මැතිවරණ ප්‍රකාශනවලට විතරයි මෙතෙක් කල් මේවා ඇතුළත් වෙලා තිබුණේ. මැතිවරණ ප්‍රකාශනයෙන් කියනවා, "මෙහෙම කරනවා. මෙහෙම දෙනවා. මෙහෙම දෙනවා." කියා. නමුත්, ඒවා කවදාවත් ක්‍රියාත්මක වුණේ නැහැ. වග කීමක් ඇතිව, වගකිව යුතු රජයක් හැටියට මුදල් ඇමතිතුමා දැන් ඒ සඳහා කටයුතු කර තිබෙනවා. විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුපේ තිබුණු විෂමතාව ඉවත් කර තිබෙනවා. ඔවුන්ගේ විශ්‍රාම වැටුප වැඩි වෙනවා විතරක් නොවෙයි, 2017ට කලින් තිබුණු විෂමතාවත් ඉවත් කර ඒ තුළින් ඒ අයට සාධාරණයක් ඉෂ්ට කර තිබෙනවා. අපි අහනවා, ඒකටද විරුද්ධ කියා. ඒ සඳහාද විරුද්ධ වෙන්නේ?

දුප්පත් බව තුරන් කිරීමේ වැඩසටහන වන "සමෘද්ධිය" අපි අරගෙන බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා 1989දී ජනසවිය ආරම්භ කරපු වෙලාවේ මම තමයි ඒ විෂය භාරව සිටි නියෝජ්‍ය අමාත්‍යවරයා. ඒ වැඩ පිළිවෙළ පිළිබඳව මම දන්නවා. "ජන සවිය" කියා තමයි එදා අපි කිව්වේ. ඒ වැඩ සටහනේදී යෝජනාවක් තිබුණා, ක්‍රියාදාමයක් තිබුණා, ප්‍රතිඵලයක් තිබුණා. තෝරාගත් පවුලක් සඳහා මාස 24කට පමණයි අපි "ජන සවි" වරම දුන්නේ.

ඒ මාස 24 තුළ දී, දැන් පාවිච්චි කරන වචනයෙන් කියනවා නම්, ඒ අය සවිබල ගැන්නුවා; ඒ අය යම්කිසි ආදායම් මාර්ග උපයන තැනකට ගෙනාවා. ඒ තැනට ගෙනාවාට පසුව මාස 24න් පසුව ඒ අය අයින් වුණා. මොකක්ද, ඒ ව්‍යාපාරයට අද වෙලා තිබෙන්නේ? එය 1994 වර්ෂයේදී වෙනස් වුණා. රුසියාවේ තිබුණු ක්‍රමය මෙහේට ගෙනාවා. එය "සමෘද්ධිය" බවට පත් වුණා. සමෘද්ධිය බවට පත් වූ එය දේශපාලන ව්‍යාපාරයත් එක්ක බද්ධ කර ගත්තා. 1994 වර්ෂයේදී දුප්පත් කියා කියූ මනුස්සයා, 1994 වර්ෂයේදී සමෘද්ධිය ලැබූ මනුස්සයා මේ වන කොටත් සමෘද්ධියෙන් -අවුරුදු 17ක් ගිහිල්ලාත්- කනවා. අවුරුදු 17ක්! ඒ සමෘද්ධිලාභියාට අවුරුදු 17කට පස්සේ අද ලැබී තිබෙන්නේ මොකක්ද? ඔහුට ලැබිච්ච දෙයක් නැහැ. ආණ්ඩුවෙන් දෙන සමෘද්ධි දීමනාව අරගෙන ඒ ඒ කාලවල පවතින ආණ්ඩුවලට ඕනෑ ඕනෑ විධියට ඒ අය කටයුතු කරනවා. පසුගිය කාලයේ එහෙම සිදු වනවා අපි දැක තිබෙනවා. දේශපාලන රැස්වීම් පැවැත්වෙන කොට, සෙනඟ ඕනෑ වුණාම සමෘද්ධි නියාමකයා සමෘද්ධිලාභීන් බස් එකේ දමාගෙන අරගෙන යනවා. ඔන්න, දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනේ අද තත්ත්වය! ඒ නිසා තමයි මා අය වැය කාරක සභා අවස්ථාවේදී -අපේ ගරු දයා ගමගේ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙන අවස්ථාවේදී,- යෝජනාවක් ගෙනෙන්න බලාපොරොත්තු වන්නේ. අවුරුදු 17ක් යන කල් එක පුද්ගලයකු කිසිම ව්‍යාපෘතියකට සම්බන්ධ නොවී නිකම්ම සමෘද්ධියෙන් කකා ඉන්නවා නම් එය මේ රටට කරන ලොකු අපරාධයක්. මම යෝජනා කරනවා, අවුරුදු 17ක් තිස්සේ සමෘද්ධිය ගන්නා උදවිය මාස දෙකක් ඇතුළත යම්කිසි අනාගත සවිබල ගැන්වීමකට යටත් කරලා කරුණාකර සමෘද්ධිලාභී තත්ත්වයෙන් ඉවත් කරන්න කියා. මොකද, මේ විෂය පථයට වැටෙන තවත් දුප්පත් සැඟෙන කොටසක් ඉන්නවා. අපි දන්නවා, මේ ව්‍යාපාරය දේශපාලනීකරණය වෙලායි තිබෙන්නේ කියා. එහි හංගන්න දෙයක් නැහැ. මෙම අමාත්‍යාංශය අපට ලැබුණාට පසුව අපි ඒ ගැන සොයා බැලුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සමෘද්ධි නියාමක" නමින් කොට්ඨාසයක් ඉන්නවා. ඒ අය තමයි මේ සෙල්ලම කරන්නේ. ඒ මිනිසුන් මොකක්ද අපට කිව්වේ? ඒ අය කිව්වා, "ඇමතිතුමා, අපි අවුරුදු 17ක් තිස්සේ සමෘද්ධි නියාමකයන් හැටියට ඉන්නවා. අපට තවම ස්ථිර තත්ත්වයක් උදා වෙලා නැහැ" කියා. අද සමෘද්ධි නියාමකයන් එක්දහස් ගණනක් විශ්‍රාම ගිහින් ඉන්නවා. ඒ මිනිසුන් සමෘද්ධිලාභීන්ටත් වඩා හපන්. ඒ අයට විශ්‍රාම වැටුපක් නැහැ; කිසිම දීමනාවක් නැහැ; කිසි දෙයක් නැහැ. සමහරු සේවයේ යෙදී සිටියදී මිය ගිහින්; එක්කෝ අසනීප වෙලා; එහෙමත් නැත්නම් ආබාධිත වෙලා. ඒ පවුල්වල මිනිසුන්ට අද වැලේ වැල් නැහැ. මේකයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. ඉතින්, මෙහෙම පුළුවන්ද දුප්පත්කම තුරන් කරන්න? ඒ නිසා එම යෝජනාව ගෙනෙන්න මම බලාපොරොත්තු වෙනවා, අය වැය කාරක සභා අවස්ථාවේදී.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය පැත්තෙන් ගත්තත් අද වර්ධනයක් ඇති වී තිබෙනවා. GSP සහනය ගැන අපේ අමාත්‍යවරයෙක් කිව්වා. අපි දන්නවා, එදා අපේ රටේ ඇති වූ තත්ත්වය. හිටපු ජනාධිපති ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ඇඟලුම් කර්මාන්ත 200 වැඩසටහන ආරම්භයේදී මොනවාද නොකිව්වේ? නමුත් එය කෙරුණා; එහි සාර්ථකත්වයක් තිබුණා. අද ඒ කර්මාන්තශාලාවලින් කීයක් වැහිලාද? ඇයි ඒ? අපට GSP සහනය අහිමි වී ගියා. අපේ රටට දුන් එම සහනය, අපේ ආණ්ඩුවලට පෙර පැවැති ආණ්ඩු කාලයේදී කරපු නීති විරෝධි ක්‍රියා නිසා අපේ රටින් ඉවත් කරගත්තා. නමුත්, අපේ පසුගිය ආණ්ඩුව ආවාට පසුව අපට පුළුවන්කම ලැබුණා, ඇඟලුම් ක්ෂේත්‍රයට නැවත වතාවක් GSP සහනය ලබා ගන්න. ඒ විතරක් නොවෙයි, පනවා තිබූ මත්ස්‍ය තහනම ඉවත් කරවා ගන්නත් අපට

පුළුවන් වුණා. අද නැවත වතාවක් ධීවර ක්ෂේත්‍රයේ ලොකු පිබිදීමක් ඇති වෙලා තිබෙනවා. මේවා තමයි අද සිදු වෙලා තිබෙන්නේ. මම අහනවා, මේවාටද මේ අය විරුද්ධ වන්නේ කියා.

ඒ විතරක් නොවෙයි, අපි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කළා. අපි කොමිෂන් සභා පිහිටෙව්වා; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනාවා; තොරතුරු දැනගැනීමේ පනත ගෙනාවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝක කාන්තා දිනය. තවම මේ ගරු සභාවට විතරයි බැරි වුණේ, ප්‍රමාණවත් පරිදි කාන්තා නියෝජනය ලබා දෙන්න. අද කාන්තාවට දවසින් දවස මේ රටේ ලැබෙන්නේ සම තැන පමණක් නොවෙයි, අද කාන්තාව පුරුෂ පක්ෂය අභිභවා යන තැනටත් ඇවිත් තිබෙනවා. දේශපාලනයට විතරයි ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් නැතිව තිබුණේ. අපි දුන්නා ප්‍රතිඥාවක්, පසු ගිය මැතිවරණයේදී. දැන් පළාත් පාලන ආයතන මට්ටම සඳහා සියයට 40 කාන්තා නියෝජනය ගෙනැවිත් තිබෙනවා.

මේ ගරු සභාවේ කාන්තාවන් කී දෙනාද ඉන්නේ? මේ ගරු සභාවටත් ඉදිරියේදී වැඩිපුර කාන්තාවන් ඒවි. මේ වාගේ විශාල වැඩ කොටසක් අපට කර ගන්න පුළුවන්කම ලැබුණා. අඩු ආදායම්ලාභී පවුල්වලට සමෘද්ධි දීමනාව ලබා දීම, අවුරුදු 70ට වැඩි අයට වැඩිහිටි දීමනාව ලබා දීම, ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ල ලබා දීම, විශේෂ හැකියාවන් ඇති පුද්ගලයන්ට මාසික දීමනාව ලබා දීම වශයෙන් සහන රාශියක් මෙවර අය වැය තුළින් අපි ලබා දීලා තිබෙනවාය කියලා 2001 අවුරුද්දේ සමාජ සේවා අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යවරයා හැටියට මම කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගැන අපි පක්ෂ භේදයෙන් තොරව මේ අවස්ථාවේදී කථා කළ යුතු වනවා.

"අපි මේ අය වැයෙන් පොලීසියට සලකලා නැහැ" කියලා දැන් කියනවා. මීට අවුරුද්දකට කලින් ඒ අයගේ සියලුම දීමනා සියයට 40කින් වැඩි කරන්න මොන ආණ්ඩුවද කටයුතු කළේ කියලා පොලිස් නිලධාරින් දන්නවා. හමුදාවේ නිලධාරින්ට මේ සහනය මේ වතාවේ ලබා දීලා තිබෙනවා. ඒ අයට කථා කළොත් ඒ අය එම කාරණය ගැන කියාවි. හිටපු රාජ්‍ය නායකයා හැටියට අපේ විපක්ෂ නායකතුමාට ආරක්ෂාව ලබා දෙන්නේ හමුදාවේ කමාන්ඩෝ බලකායයි. අපට ඉන්නවා වාගේ MSD එකේ රාළහාමිලා එතුමා ළඟ නැහැ. ඒ දීමනාව වැඩි කරන්න වුණේත් අපට බව මම මේ ගරු සභාවේදී මන්ත්‍රීවරුන්ට මතක් කරන්න ඕනෑ. ඒකටද, ඔබතුමන්ලා විරුද්ධ? හමුදාවට මේ දීමනාව දෙනවාටද විරුද්ධ කියලා ඒගොල්ලන් කියන්න. "මේ අය වැය පරද්දනවා. පරාජය කරනවා. මේකට අපි විරුද්ධයි" කියලා ඔබතුමන්ලා කිව්වා නේ. මේ සහන දෙනවාට තමයි විරුද්ධ කියලා රටට කියන්න. මෙන්න මේකයි අද යථාර්ථයක් බවට අපි පත් කරලා තිබෙන්නේ කියන කාරණය මම මතක් කරලා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වතුකරය ගැන හැම දාම කථා කරනවා. පාසල් දරුවන් වෙනුවෙන් -විශේෂයෙන් වතු පාසල්වල දරුවන් වෙනුවෙන්- පසුගිය අවුරුදු තුනහමාරේ අපි වැඩසටහන් ඔබතුමා දන්නවා. ද්‍රවිඩ භාෂාව උගන්වන ගුරුවරුන් සම්බන්ධයෙන් මේ අය වැයේදී විශේෂ තැනක් ලබා දීලා තිබෙනවා. ද්‍රවිඩ භාෂා ගුරුවරුන් පත් කිරීමට විභාගයක් පැවැත්වූවාම මේ විභාගයෙන් බොහෝ දුරට සමත් වෙන්නේ මුස්ලිම් ගුරුවරු -අපි මුස්ලිම් ජනතාවට විරුද්ධ වනවා නොවෙයි. - බව ඔබතුමා දන්නවා. ඒ අය වතුකරයේ රස්සාවට යන්න කැමැති නැහැ. ඒකයි ප්‍රායෝගික තත්ත්වය; ඒකයි ඇත්ත. වතුකරයේ තිබෙන්නේ දුෂ්කර පාසල්. මගේ ආසනය ගත්තොත් ඔහිය, ඉදල්ගස්හින්න, උඩවේරිය, අඹේවෙල, වෝවික් වැනි ප්‍රදේශවල පාසල්වලට කවුරුවත් යන්නේ නැහැ. අද ඒ පාසල්වල පුරප්පාඩු රාශියක් තිබෙනවා. වතුකරයේ ජීවත් වන අයගේ දරුවන්ට මේ අධ්‍යාපනය සුදුසු නැද්ද? ඒ දරුවන් වෙනුවෙන් තමයි මේ අය වැයෙන් විශේෂ තැනක් ලබා දීලා තිබෙන්නේ කියන කාරණය මම මතක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මට මේ කාරණය කියන්න ලැබීම ලොකු දෙයක්. එහෙනම් මේ ගොල්ලන් විරුද්ධ ඒකටද කියලා මම අහනවා.

අද වතුකරයේ කම්කරුවන්ගේ පඩිය ගැන ඔබතුමන්ලා කෑ ගහනවා නේ. පඩි පිළිබඳ සාමූහික ගිවිසුමට ආවේ ආණ්ඩුව නොවෙයි. සමහරු හිතාගෙන ඉන්නවා, මේක ආණ්ඩුවෙන් කරපු දෙයක් කියලා. ඒක පාර්ශ්ව දෙකක් අතර ඇති වෙච්ච ගිවිසුමක්. ඒක ප්‍රමාණවත් නොවන බව අපි පිළිගන්නවා. ඒ නිසා තමයි ඒක අපි අය වැය ලේඛනයට දාලා තිබ්බේ. මේ රටේ කම්කරු අමාත්‍යවරයා හැටියට මම වගකීමෙන් කියනවා, මේ අය වැය ලේඛනය තුන්වන වර කියවා සම්මත කර ගන්න කලින් වග කිව යුතු රජයක් හැටියට අපි ඒ අය වෙනුවෙන් ඒ ප්‍රශ්නයට සාධාරණය ඉෂ්ට කරලා දෙනවාය කියලා. ඒ කටයුත්ත අපට කරන්න පුළුවන්. නමුත් මේ ඇති කර ගත් සාමූහික ගිවිසුමට තමුන්නාන්සේලා මේ රජය සම්බන්ධ කර ගන්න එපා. ඒක පාර්ශ්ව දෙකක් අතර ඇති කර ගත් දෙයක්. අපි -ආණ්ඩුව- කියන්නේ මැදිහත්කරුවෙකු විතරයි. සාමූහික ගිවිසුම කියන්නේ, පාර්ශ්ව දෙකක් අතර ඇති කර ගන්නා වූ ගිවිසුමක්.

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ 'සුරක්ෂා' රක්ෂණාවරණය පිළිබඳව අද කවුරුවත් කථා කරන්නේ නැහැ. ඊයේ - පෙරේදා කවුද කියනවා මම අහගෙන හිටියා, "රක්ෂණය දැන් නවත්වලා. අපේ දරුවාගේ කකුල කැඩුණා. තවම රක්ෂණයෙන් මුදල් ගෙව්වේ නැහැ" කියලා. එතකොට විතරක් රක්ෂණය මතක් වනවා. 4,200,000ක් වූ මේ රටේ පාසල් දරුවන් මේ ආණ්ඩුව විසින් පසුගිය අය වැයේදී රක්ෂණය කළා. නමුත් මේ ගැන කථා කළේ කවුද? කිසි කෙනෙක් කථා කළාද? නැහැ. එහෙනම් ඒකටද මේගොල්ලන් විරුද්ධ?

"ළඟම පාසල-හොඳම පාසල" ව්‍යාපෘතිය දැන් ක්‍රියාත්මක කරනවා. මීට මාසයකට කලින් මගේ ආසනයේ පාසලක් විවෘත කළා. මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් දුන්නාට පළාතේ අධ්‍යාපන අමාත්‍යවරයා තමයි මේක ක්‍රියාත්මක කළේ.

අපේ අධ්‍යාපන ඇමතිතුමා -අපේ මහ ඇමතිතුමා- කරපු කථාව මම අහගෙන හිටියා. එතුමා කිව්වා, "ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ ඌව පළාතට බිලියන හතරක මුදලක් අනුමත වුණා කියලා. එතුමා ඒ වැඩ කටයුතු ඉවර කරලා ඇවිල්ලා අධ්‍යාපන ඇමතිතුමාට කිව්වාම, තව රුපියල් බිලියනයක් වැඩිපුර ලබා දී තිබෙනවා. එතකොට බිලියන පහයි. එසේ දීලා ඒකත් මදියි කියලා ගිහින් කිව්වාම, අනුමත වෙලා පාවිච්චි නොකරපු මුදල්වලින් තව බිලියනයක් එතුමාට දීලා තිබෙනවා. ඒ අනුව බිලියන හයක හෝ හයහමාරක වැඩ කටයුතු ඌව පළාතේ ක්‍රියාත්මක කළා කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. මේකටද, ඔබතුමන්ලා විරුද්ධ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

ඊළඟට, ග්‍රාමීය පාසල් දරුවන් වෙනුවෙන් පෝෂණය සඳහා කිරි වීදුරුවක් ලබා දීමට අපි අලුතින් යෝජනා කර තිබෙනවා.

[ගරු රවීන්ද්‍ර සමරවීර මහතා]

එසේ දෙන එක හොඳ නැහැ කියලාද ඔබතුමන්ලා මේ කියන්නේ? එහෙම නම් තමුන්නාන්සේලා රටට ඇහෙන්න කියන්න, "උඹලා මේක දෙනවාට අපි විරුද්ධයි" කියලා. අන්න, එතකොට රට දැන ගනීවි, තමුන්නාන්සේලා ඉන්නේ කොතැනද කියලා. එක්සත් ජාතික පක්ෂයෙන් අය වැය ගෙනාවාම, "අපි දේශපාලන වශයෙන් උඹලාට විරුද්ධ නිසා, මේකටත් විරුද්ධයි" කියලා කෑ ගහන එක නොවෙයි, යුතුකම. ඒක තමයි මේකේ තිබෙන කනගාටුදායක තත්ත්වය. මේ රට ඉදිරියට යන්නේ නැත්තේ ඒකයි. එදා සිංගප්පූරුව කිව්වේ, "අපි ලංකාව විධියට හැදෙන්න ඕනෑ" කියලායි. අද සිංගප්පූරුව කොහේද, අපි කොහේද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. අඩුපාඩුකම් ඇති. ඒක නැහැ කියලා මම කියන්නේ නැහැ. අපි සාකච්ඡා කරලා ඒ අඩුපාඩුකම් ටික විසඳා ගනිමු. මේක ගෙනෙන්නේ මේ රට වෙනුවෙන්.

ඊළඟට, මෙතුමන්ලා කියනවා, මෙසේ ගෙනාවාට, මේ යෝජනා ක්‍රියාත්මක කරන්න බැහැ කියලා. අපි ගිය අවුරුද්දේ ගම් පෙරළිය වැඩසටහන ක්‍රියාත්මක කළා. එතකොට අපි ජාතික ආණ්ඩුවක් විධියට හිටියේ. මම කියන්නම්, මගේ ආසනය ගැන. අපිට මිලියන 200ක් හම්බ වුණා. ඒ ලක්ෂ 2,000ක මුදල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකතුමා හා මා අතරේ ලක්ෂ 1,000 ගණනේ බෙදුවා, ජාතික ආණ්ඩුවක් පැවැති නිසා. එතුමාට ලක්ෂ 1,000යි; මට ලක්ෂ 1,000යි. මම ගිය අවුරුද්දේ ගම් පෙරළිය වැඩසටහන තුළින් ව්‍යාපෘති 104ක් අනුමත කර ගත්තා. මොකද, වුණේ? ඔක්තෝබර් මාසයේ 26වැනි දා සිදු වෙච්ච කුමන්ත්‍රණයෙන් පසුව 28 වැනි දා වනකොට චක්‍රලේඛයක් නිකුත් කළා, "වහාම ගම් පෙරළිය වැඩසටහන නවත්වන්න" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අනුමත කර ගත්, යෝජනා 104න්, 58යි මට ක්‍රියාත්මක කරගන්න පුළුවන් වුණේ. මෙතුමන්ලා කුමන්ත්‍රණයක් මෙහෙයවීම නිසා, මෙතුමන්ලාට පින් සිද්ධ වෙන්න, මේ රටේ ජනතාවට අනෙක් යෝජනා ටික නැති වුණා. ලංකාවේ අනෙක් තැන්වල සිද්ධ වුණේත් ඒකයි. අපි මේ අවුරුද්දේ මිලියන 300ක් -ලක්ෂ 3,000ක්- දෙනවා. ඒ වාගේම මීට අමතරව ඒ ඒ අමාත්‍යාංශවලින් වෙන වෙනම මුදල් ලැබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව කෙටි කරන්න.

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව බොහෝ දේ කථා කරන්න තිබෙනවා. නමුත් වේලාව හරස් වුණු නිසා, මම ඉතුරු කාරණා ටික කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වන අතර, මෙච්චර අමාරුකම් මැද මේ වාගේ අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා, රටේ හැම ක්ෂේත්‍රයකටම සහනයක් ලබා දෙන්නට මුදල් ඇමතිතුමා ක්‍රියා කිරීම පිළිබඳව එතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි අටක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.4.05]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரணா)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සමරවීර මැතිතුමනි, ඔබතුමා යන්නේ නැතුව පොඩ්ඩක් ඉන්නවා නම් හොඳයි කියලා මා හිතනවා. මොකද, මේ ආණ්ඩුව කරන කියන හැම දෙයටම අපේ විරෝධතාවක් නැහැ කියන එක අපි සඳහන් කරන්න කැමැතියි. අපිත්, තමුන්නාන්සේලාත් නයි-පොළොංගු නොවෙයි. හැබැයි, තමුන්නාන්සේලා දින 100 වැඩසටහනේ ඉඳලා කරගෙන කියාගෙන ආපු වැඩ පිළිවෙළ පිළිබඳව අපේ විශ්වාසයක් නැහැ. තමුන්නාන්සේට හොඳට මතක ඇති, ලංකාව කර්මාන්ත පුරයක් කරනවා කියපු බව. කුලියාපිටියේ ෆෝර්ඩ් කර්මාන්තශාලාවක් හදනවා කිව්වා. රටේ නායකයා, අගමැතිවරයා ගිහිල්ලා ඒකට මුල්ගල තිබ්බා. පහුවදා ඒ ආයතනයෙන් කිව්වා, එහෙම දෙයක් නැහැ කියලා. තමුන්නාන්සේලා ගැන විශ්වාසයක් නැති නිසා, මේ කියන සියල්ල වචනයට සීමා වුණු ඒවා කියලා අපි කියන්නේ ඒකයි.

තමුන්නාන්සේලාගේ මේ අය වැයේ ප්‍රධාන හරය, ප්‍රධාන අරටුව "Enterprise Sri Lanka" කියන එකයි. අද මුදල් රාජ්‍ය ඇමතිතුමාවත් මේ සභාවේ නැහැ. "Enterprise Sri Lanka" තුළින් කීයෙන් කී දෙනෙකුට පුළුවන්ද, ණය ගන්න? මීට ඉස්සෙල්ලා යාපනය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් කථා කළා. මේ රටේ නායකයා -ජනාධිපතිවරයා- යාපනයට ගිය අවස්ථාවක සඳහන් කළා, යාපනයේ ජනතාවට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් ගැන. මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය අරගත් කාන්තාවන් 69 දෙනෙක් සියදිවි නසා ගෙන තිබෙනවා.

මේකට විසඳුමක් දෙනවා කිව්වා. පසුගිය අය වැයෙන් - Budget එකෙන් - ඒකට මුදල් වෙන් කළා. මෙතුමා දැන් ප්‍රකාශ කරනවා, කිසිම පුද්ගලයකුට ඒ මුදල් ලැබුණේ නැහැ කියලා. අපි ඒකයි කියන්නේ, "Enterprise Sri Lanka" කියන වැඩසටහනත් බොරුවක් කියලා. යම් ප්‍රමාණයකට-

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
ගරු මන්ත්‍රීතුමනි, "Enterprise Sri Lanka" වැඩසටහන බොරුවක් නොවෙයි. ණය දෙන ඕනෑම අයතනයකින් ණයක් අරගෙන ගෙවලා නැත්නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයේ ප්‍රශ්නයක් තිබෙන බව ඔබතුමා කිව්වා. මම එය පිළිගන්නවා. යාපනයේ විතරක් නොවෙයි. ලංකාවේ හැම තැනම එම ප්‍රශ්නය තිබෙනවා. ඒ පිළිබඳව දැන් රජය කටයුතු කරගෙන යනවා. ඒ ප්‍රශ්නය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වුණා. අපි දිස්ත්‍රික්ක දහයක් නම් කරලා තිබෙනවා. ඉදිරියේදී ඒ දිස්ත්‍රික්ක දහයේ ඉන්න ණය ගත්ත උදවිය ඒකෙන් නිදහස් වෙයි. නමුත් ණය දෙන කටයුත්තේදී බැංකුවට තිබෙන ප්‍රශ්නය තමයි, අපි යම් තැනකින් ණයක් අරගෙන තිබෙනවා නම් ඇපකාර-

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரணா)
(The Hon. S.C. Mutukumarana)
ගරු ඇමතිතුමනි, ඒක හරි. එහෙම නම් තමුන්නාන්සේලා "Enterprise Sri Lanka" වැඩසටහන ගැන මෙච්චර පුන පුනා කියන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේලා දන්නවා, මෙම වැඩසටහනේ එහෙම කරන්න බැරි බව. බැංකුවේ කළමනාකරුට අවශ්‍ය විධියට තමයි ණය ලබා දෙන්නේ. මේ කොළ අච්චු ගහලා,

ඒ ගැන පුන පුනා කියලා, බොරුවෙන් ජනතාව මුළා කරමින්, අපෙන් අහනවා මේකට විරුද්ධද කියලා. ළමයින්ට ශිෂ්‍යත්ව දෙනවාට, අපි විරුද්ධ නැහැ. ළමයින්ට කිරි වීදුරුවක් දෙනවාට, අපි විරුද්ධ නැහැ. හැබැයි, ඔබතුමන්ලාගේ අතීත පොරොන්දු බැලුවාම, මේ රටේ ජනතාව මුළා කරනවාට අපි විරුද්ධයි. මේ රටේ ජනතාව මුළා කර, රවටනවාට අපි විරුද්ධයි. ඒකයි අපි මෙයට විරුද්ධ. කෝ මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ? මෙම වැඩසටහනට මුදල් හොයන ක්‍රමය කියා තිබෙනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් ආරම්භ කරනකොට ඒකේ සැලැස්මක් තිබෙනවා; මෙන්න මේ ආකාරයටයි කියලා පියවරෙන් පියවරට යන විධියක් තිබෙනවා. මෙහි පසුබිපරමක් තිබෙනවාද? නැහැ.

අද ගමේ ආර්ථිකය කඩා වැටිලා; සිල්ලර වෙළෙන්දාගේ ඉඳන් සුළු කොන්ත්‍රාත්කාරයාගේ දක්වා කඩා වැටිලා. මහ ලොකුවට කිව්වා "ළඟම පාසල - හොඳම පාසල" කියලා. අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත්කාරයෝ පාසල් ගොඩනැඟිලි හැදුවා. ඇමතිවරයා පෙරහැරේ ගිහින් ගොඩනැඟිලි විවෘත කළා. හැබැයි, කොන්ත්‍රාත්කාරයින්ගේ සල්ලි නැහැ. කොන්ත්‍රාත්කාරයා තමන් පදිංචි නිවස උගස් තියලා කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කළා. අද ගැනියි, මිනිහයි ගෝරි. බැංකුවට මාසයකට ලක්ෂ 2 ගානේ පොලිය යනවා. මාස 10ක් ගියාම මොකද වෙන්නේ? ලක්ෂ 20ක් මේ මිනිහා බැංකුවට පොලිය ගෙවලා. ව්‍යාපෘති සම්බන්ධව පසුබිපරමක් තිබෙනවා නම් මේ සල්ලි ගෙවන්න ඕනෑ නේද? එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා අපි කියන්නේ, මේ ආණ්ඩුව දින 100 ඉඳලා පටන් ගත්ත බොරුව දිගින් දිගටම ගෙනි යන බවයි.

ඇත්ත වශයෙන්ම අපි භය වුණා, මේ ආණ්ඩුව ගෙන එන අය වැය තුළ අපට ජනතාව ළඟට යන්න බැරි වෙයි කියලා. මම කියනවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට, තමුන්නාන්සේලාගේ "ගම්පෙරළිය" වැඩසටහනට වෙන් කළ මුදල මිලියන 300යි -ලක්ෂ 3,000යි- කියා. මම හොරොව්පතාන ආසන සංවිධායක වශයෙන් ඉන්නකොට අපි 2014 අවුරුද්දේ මිලියන 4,600 ගණනක් වියදම් කරලා ගම්මාන සංවර්ධනය කළා. අපට පුළුවන් වුණා ජයග්‍රහණය කරන්න. දැන් රටේ රැල්ලක් යනවා. මේ රැල්ල දැන් පටන් අරගෙන අවසානයි. එදා ආපු ජනතා විරෝධී රැල්ල අපට පෙනුණේ නැහැ. අපි දැක්කේ අවසාන මොහොතේයි. හැබැයි, අද මේ ආණ්ඩුවට විරුද්ධව පටන් ගත්ත රැල්ල දිගින් දිගටම යන බව පෙනෙනවා. මේ "ගම්පෙරළිය" මුහුදු රැල්ල වාගේ ඇවිල්ලා. මේ "ගම්පෙරළිය" වැඩසටහනේ රහේ තමුන්නාන්සේලාට පෙනෙන්නේ, මේ "ගම්පෙරළිය" කියන්නේ මොකක්ද කියලා තමුන්නාන්සේලාට තේරෙන්නේ මැතිවරණය තිබ්බාට පස්සේයි. අපි ඔය "ගම්පෙරළියට" භය වෙන්නේ නැහැ. අපි දන්නවා, තමුන්නාන්සේලාට සැලැස්මක් නැහැ කියා. ඒ නිසා තමුන්නාන්සේලාට මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නත් බැහැ.

මේ අය වැය වචනයට සීමා වෙච්ච දෙයක්. ඒ නිසා මම මුදල් ඇමතිවරයාට කියනවා, අලුත් ව්‍යාපාර ඇති කරන්න කලින් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලිය හින්දා ඇද වැටිච්ච ව්‍යාපාර නඟාසිටුවන්න වැඩ පිළිවෙළක් ගෙනෙන්න කියලා. අද වඩේකාරයාගේ ඉඳලා බදු අය කරනවා. වඩේකාරයාගේ ඉඳලා බදු අය කරන නිසා අද මිනිස්සු ජීවත් වෙන්නේ භීතියෙන්. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා මුදල් ඇමතිතුමාගෙන්, එතුමාගේ අවධානය මේ වෙනුවෙන් යොමු කරන්නය කියලා. අලුත් රැකියා අවස්ථා හදන්න පෙර, කලින් තිබුණු රැකියා වැටුණේ ඇයි, තිබුණු ව්‍යාපෘති කඩා වැටුණේ ඇයි, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා සොයා බලන්න කියා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කරුණ කියනවා. තමුන්නාන්සේලා එදා කිව්වේ මොකක්ද? "හොරු, හොරු, හොරු" කිව්වා. දැන් මොකක්ද කියන්නේ? දැන් "හොරු" කියන කථාව පැත්තකට දැම්මා. ඊළඟට උසාවි හැදුවා. දැන් කරන්න දෙයක් නැහැ. දැන් කියනවා, "ණය, ණය, ණය උගුල" කියලා. තමුන්නාන්සේලාට දැන් කියන්න දෙයක් නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා කරපු දේ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව තත්පරයක් දෙන්න.

තමුන්නාන්සේලාගේ ඔය 'ගම් පෙරළිය', 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' කියන දේවල් තමුන්නාන්සේලාටම ආපසු කැරකිලා ඊළඟ මැතිවරණයෙන් පෙනෙනවාය කියමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු පියසේන ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා.4.14]

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විවාදය වෙනුවෙන් මාගේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබීම ගැන ඉතා සන්තෝෂ වනවා.

පළමුවෙන්ම මේ කරුණ සඳහන් කළ යුතුයි. ගරු මුදල් ඇමතිතුමා අදට, නැත්නම් දැනට රටේ පවතින උග්‍ර ණය අර්බුදය, ඒ වාගේම ආර්ථික තත්ත්වය අනුව කරන්න පුළුවන් උපරිම දේ මේ අය වැය තුළින් කර තිබෙනවාය කියන කාරණය පැහැදිලිව පෙනෙන්න තිබෙන දෙයක්. අය වැය කථාව කළ අවස්ථාවේදී මේ ගරු සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ මුහුණු දිහා බැලුවාම පෙනුණා, මේ අය වැය කොතරම් සාර්ථකද කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරු වැඩි පිරිසක් අන්දුන්කුන්දුන් වෙලා සිටි බව එදා ඔබතුමන්ලා දකින්න ඇති.

එක්තරා ප්‍රධාන තරුණ මන්ත්‍රීවරයෙක් ඇතුළු විපක්ෂ මන්ත්‍රීවරු කියන කථාවක් තමයි, "මෙම අය වැය මැතිවරණ අය වැයක්" කියලා. ඉතාම සුළු කාලයක් හැර 1989 සිට මේ දක්වා අවුරුදු 30ක් මම මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. 1948න් පසුව ඉදිරිපත් කළ අය වැය ගැන කරුණු මා පරීක්ෂා කරලා තිබෙනවා. පසුගිය අවුරුදු හැත්තෑවේම අය වැය පරීක්ෂා කරන විට පැහැදිලිවම පෙනේවි, සෑම මැතිවරණ වර්ෂයකම මුදල් ඇමතිවරුන් ඉදිරිපත් කරලා තිබෙන්නේ මැතිවරණ අය වැය බව. ලංකාවේ ආර්ථික සංඛ්‍යාලේඛන බැලුවොත් ඉතාම පැහැදිලිව පෙනෙන දෙයක් තමයි, මැතිවරණ වර්ෂවලදී රජයේ වියදම් වැඩි වෙලා, ජනතාවට වැඩියෙන් සහන ලැබෙන බව. මේක පොදු ලක්ෂණයක්. ලංකාවේ විතරක් නොවෙයි, මැතිවරණවලින් බලයට පත්වන ඕනෑම රටක එහෙමයි වෙන්නේ. "Election Budget" කියන වචනය අපට ලැබුණේ එංගලන්තයෙන්. ඒ කියන්නේ, මේ රටේ මුදල් ඇමතිවරුන් මැතිවරණ කාලයට සුදුසු

[ගරු පියසේන ගමගේ මහතා]

අය වැය ලේඛන ඉදිරිපත් කරලා තිබෙනවා කියන එක නේද? ජනතාවට සහන ලබා දීම කියන්නේ ජනතාව රැවටීමක් නොවෙයි. ජාති, ආගම් භේද අවුස්සලා, ජනතාව අතරේ ගැටුම් ඇතිකරලා බලය ලබා ගැනීමට උත්සාහ කිරීම කියන්නේ, ජනතාව රැවටීමයි. ඒ වාගේම, ඉතා අවංක විධියට කථා කරලා, ආර්ථික සංවර්ධන යෝජනා ඉදිරිපත් කරලා, මහා පරිමාණයෙන් ගසාකෑමත් ජනතාව රැවටීමක්. කෙසේ වෙතත්, මැතිවරණ අය වැයකට වඩා මෙම අය වැයේ විශාල වෙනසක් තිබෙනවා.

ජාතික ප්‍රතිපත්තියක් ඇතිව මුදල් ඇමතිතුමා මෙම අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා කියලා පැහැදිලි වෙනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, කඩිනම් ග්‍රාමීය සංවර්ධනය සඳහා ගම්පෙරළිය වැඩසටහන දීර්ඝ කාලීන වැඩසටහනක් නොවේද? පසුගිය කාලයේ කුරුල්ලන්ගේ ගමන් මාර්ගවල හදපු ගුවන් යානා එන්න බැරි ගුවන් තොටුපොළ, ක්‍රීඩකයන් නැති ක්‍රීඩාංගන, සම්මන්ත්‍රණ නැති සම්මන්ත්‍රණශාලා හැදීමෙන් කොමිස් මුදල් ගැනීම හැර ජනතාවට යහපතක් වුණාද? අද ගම්බද ජනතාව කොච්චර දුක්බර ජීවිතයක්ද ගත කරන්නේ කියලා දැනගන්න, " සිරස" ටීවී එකේ "ගම්මැද්ද" වැඩ සටහන බලන්න. සමහරවිට ඒවා දාන්නේ දේශපාලන අරමුණින් වෙන්නත් පුළුවන්. නමුත් ඒවායේ සත්‍යයක් තිබෙනවා. පාලමක් නැති නිසා ගවුම තෙමාගෙන, කලිසම තෙමාගෙන සපත්තු, සෙරෙප්පු තෙමාගෙන උදේට ඉස්කෝල් යන ළමයි දැකලා නැද්ද? මම නම් ඒවා අත්දැකීමෙන් දැක තිබෙනවා. ගම්පෙරළිය වැඩසටහන නිසා මෙම ප්‍රශ්නවලට දීර්ඝ කාලීන විසඳුමක් ලැබෙනවා නේද?

ඒ වාගේම, "Enterprise Sri Lanka" වැඩසටහනින් සුළු ව්‍යාපාරිකයන්ට, ව්‍යාපාර කිරීමේ හැකියාව ඇති නිර්මාණශීලී තරුණයන්ට ව්‍යාපාරික ණයක් ලබා ගන්න හැකි වෙනවා. මේ ණය අරගෙන ව්‍යාපාර පටන් ගත්තාම ඒ මඟින් රැකියා අවස්ථා නිතැතින්ම බිහි වෙනවා. මේ ණය බොරුකාරයන්ට, දේශපාලන පන්දම්කාරයන්ට දුන්නොත් තමයි ප්‍රශ්නයක් ඇති වෙන්නේ. ව්‍යාපාර හැකියාව ඇති අයට නියම ණය ලබා දෙන්න මන්ත්‍රීවරු වශයෙන් අපි හැම කෙනෙක්ම උනන්දු වෙන්න ඕනෑ. ඒ වාගේම, බැංකුවලින් වැරදි අයට ඒ ණය ලබා දුන්නොත් ඒවා පෙන්වා දෙන්න අපට පුළුවන්කම තිබෙනවා. එම ව්‍යාපාරවලින් බිහි වන රැකියා අවස්ථා නිසා ගම්බද තරුණ තරුණියන්ට ඇතිවන යහපත දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේ මේ වාගේ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ රාශියක් තිබෙනවා. මුදල් ඇමතිතුමා ගැන විස්තර කළ නිසා මම වැඩිදුර ඒ ගැන කියන්න යන්නේ නැහැ. කරුණාකර මේ ගැන ධනාත්මකව කල්පනා කරන්න. එතකොට පෙනේවි අය වැය යෝජනාවල වැඩි වශයෙන් අඩංගුවෙලා තිබෙන්නේ ආර්ථික වර්ධනයට ඉවහල් වන දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් බව.

මේ අවස්ථාවේ මම මේ ගරු සභාවට කියන්න කැමතියි, මේ රටේ පවතින ප්‍රධාන ප්‍රශ්නයක් ගැන. පසුගිය කාලයේ කිසිම මුදල් ඇමතිවරයෙක් මේ සම්බන්ධව අවධානය යොමු කරලා නැහැ. දැන් අපේ සංඛ්‍යාලේඛන අනුව කියනවා, ජාතික ආදායමේ හා ඒක පුද්ගල ආදායමේ වර්ධනය අඩු වෙලා කියලා. මේ සංඛ්‍යාලේඛනවලින් කියන තත්ත්වය හරිද? මේ ළඟදී විගණකාධිපතිතුමා කියා තිබුණා අපේ රට ණය වෙලා තිබෙන ප්‍රමාණයට වත්කම් නැති බව. මට මතක හැටියට ණය වෙලා තිබෙන ප්‍රමාණයෙන් සියයට 50ක පමණ ප්‍රමාණයක් තමයි වත්කම් වශයෙන් තිබෙන්නේ. එහෙම නම් මේ මුදල් වලට මොකද වුණේ? ඒ සල්ලි කා ගාවද, කොහේද තිබෙන්නේ? ඒ වාගේම, අපේ රටින් පිට රටට යවන භාණ්ඩවලට නියම වටිනාකමක් ලැබෙනවාද? මේවායේ invoice වල සඳහන් මුදලයි, ලැබෙන මුදලයි අතර විශාල වෙනසක් තිබෙනවා නේද? පරිගණක මෘදුකාංග ඉංජිනේරුවන් online සේවා සැපයීම්වලින් උපයන මුදල් නියම ලෙස සටහන් වෙනවාද? ඒවා ජාතික ආදායමට ඇතුළත් වෙනවාද? ආර්ථික විද්‍යාඥයන් කියනවා, වෙළඳපොළ ආර්ථිකයක් පවතින රටවල සංඛ්‍යාලේඛනවලට ඇතුළත් නොවන සියයට 10 -30ත් අතර අවිධිමත් ආර්ථිකයක් - informal economy - තිබෙනවාය කියලා. මම නම් හිතන්නේ ලංකාවේ ඒ ගණන සියයට 40ටත් වැඩියි කියලා. ඕනෑම නගරයක තිබෙන වාහන තදබදය බලන්න. සුඛෝපභෝගී වාහන කොපමණ තිබෙනවාද?

දුප්පත් මිනිසුන් කොපමණ දුක් විඳිනවාද? එහෙත් පෝසත් මිනිසුන්ට නැති සැපයක් නැහැ. දිව්‍යලෝක සැප මේ ලෝකයේ දීම ලබනවා නේද? මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා, ඔච්චර ආර්ථික සංවර්ධන වැඩ කළායි කියන හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණක් වැසිකිළි පහසුකම් නැති ගෙවල් 15,000ක් පමණ තිබෙන බව. ඒ වාගේම ජනගහනයෙන් දස ලක්ෂයකට මූලික සනීපාරක්ෂක පහසුකම් නැති බව. මා දන්නා හැටියට, මේ අවිධිමත් ආර්ථිකය ගැන අපේ කිසිම ආර්ථික විද්‍යාඥයකු හරියට පරීක්ෂණ කරලා නැහැ. මහ බැංකුව වුණත් මේ ගැන පරීක්ෂණ කරලා තිබෙනවාද කියා මා දන්නේ නැහැ. විශ්වවිද්‍යාලවල සිටින ආර්ථික විද්‍යාඥයන් මේ ගැන සොයා බලනවාද? මම පසුගිය දා රූපවාහිනියෙන් දැක්කා, රුපියල් මිලියන 500ක් වටිනා දියමන්තියක් ගැන. ඒ වාගේම රුපියල් මිලියන 150ක් පමණ හංගපු මුදල් ගැන. මෙහෙම සල්ලි තිබෙන්නේ කොහොමද? මේවාට බදු අය කරලා තිබෙනවාද? මේවා ජාතික ආදායම ගණනය කිරීමේ දී එකතු වෙලා තිබෙනවාද? මේ අවිධිමත් ආර්ථිකය තුළ වැඩ කරන මිනිසුන්ට නිසි වැටුපක් ලැබෙනවාද? නියම සේවා තත්ත්වයක් තිබෙනවාද? මේවා ගැන සොයා බලන්නේකවුද? මම තව ප්‍රශ්නයක් අහන්නම්. කොළඹ ජනරළියක් තිබෙනකොට අරක්කු බෝතලයයි, කෑම පැකට් එකයි, සල්ලියි දෙනවා කියලා කථාවක් තිබෙනවා. මේවාගේ වියදම් කරන්න සල්ලි කොහෙන්ද? මෙම මුදල් ලැබෙන්නේ විගණකාධිපතිතුමා කියපු ආකාරයට අර ගත්තු ණය වලින් සියයට 50ක කොටසින් නේද?

පසුගිය කාලයේ ඉදිරිපත් කළ කිසිම අය වැය යෝජනාවකින් මේ අවිධිමත් ආර්ථිකයට අවශ්‍ය පිළියම් යොදලා නැහැ. මට මතකයි, අපි විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ, ඒ කියන්නේ 1970 ගණන්වල ආචාර්ය ඇන්.එම්. පෙරේරා මැතිතුමා තමයි එවකට මුදල් ඇමතිවරයා. එතුමාගේ කාලයේ රුපියල් 100 සහ 50 නෝට්ටු අවලංගු කළා. ඇයි, දැන් බැරි? කලින් දන්වලා රුපියල් 1,000 සහ රුපියල් 5,000 නෝට්ටු අවලංගු කළොත්, අවිධිමත් ආර්ථිකයේ කොපමණ සැඟවුණු සල්ලි තිබෙනවාද කියලා එතකොට පෙනෙයි. තවත් යෝජනාවක් කරන්න පුළුවන්. පිටරට තැන්පත් කර ඇති මුදල් බදු සහන කාලසීමාවකට යටත්ව මෙරටට ගෙන්වා ගත යුතුයි. ඒ වාගේම එම දිනයෙන් පසුව අසුවෙන මුදල් සම්බන්ධයෙන් දැඩි දඬුවම් දෙන වැඩපිළිවෙළක් යොදන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමා කියන මරණ දඬුවම වුණත් දීම සුදුසු යැයි කියන්න මා කැමැතියි. මේ වාගේ දැඩි තීරණ ගන්නේ නැතිව මෙවැනි අවිධිමත් ආර්ථික ප්‍රශ්න විසඳන්න බැහැ.

විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මේ අය වැය ලේඛනයෙන් තරුණ තරුණියන්ගේ ප්‍රධාන ප්‍රශ්නය වන රැකියා ප්‍රශ්නය ගැන අවධානය යොමු කළා මදි කියලා තමයි මට නම්

හිතෙන්නේ. මේ දවස්වල කථා කරන්නේ විරැකියාව ගැන. විශේෂයෙන් රැකියා විරහිත උපාධිධාරින් පිළිබඳ ප්‍රශ්නය නිරතුරුවම අපට අහන්න ලැබෙන මාතෘකාවක්. සමහර විට මුදල් ඇමතිතුමා යෝජනා කළ සංවර්ධන යෝජනා වලින් එම ප්‍රශ්නය විසඳීමට සැලසුම් කළා වෙන්න පුළුවන්. කොහොම වුණත්, උපාධිධාරින්ගේ රැකියා ප්‍රශ්නය ඉතාම වැදගත්. මම හිතන විධියට දැනට 40,000කට වැඩි පිරිසක් රැකියා විරහිත උපාධිධාරින් ඉන්නවා. රැකියා නැති උපාධිධාරින්ගේ ප්‍රශ්නය අපි විශ්ව විද්‍යාලයේ සිටි කාලයේ සිටම එන්නක්. 1965 දී පමණ සිට පැවති ප්‍රශ්නයක්. රැකියා වෙළෙඳපොළ හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය අතර පවතින පරතරය මෙයට ප්‍රධාන හේතුවයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

හොඳයි. පසුගිය කාලය තුළ විශ්වවිද්‍යාල විෂය මාලාවන් සුළු වශයෙන් වෙනස් කර තිබුණත් තවමත් රටේ ආර්ථිකයට නොගැළපෙන උපාධිධාරින් බිහිවීමක් සිදු වනවා. මෙය බරපතළ ප්‍රශ්නයක්. නමුත් ආණ්ඩුවක් හැටියට හේතු කියලා පමණක් බේරෙන්න බැහැ. ප්‍රශ්නයට දීර්ඝකාලීන විසඳුම් සෙවිය යුතුවාක් මෙන්ම ඇති වී ඇති ප්‍රශ්නයට කෙටි කාලීන විසඳුම් සෙවිය යුතුයි. මම කලිනුත් ප්‍රකාශ කළා මෙන් මේ රටේ අති විශාල අවිධිමත් ආර්ථිකයක් තිබෙනවා. ඒවායේ සංඛ්‍යා ලේඛන ජන හා සංඛ්‍යා ලේඛනවලට හසු වන්නේ නැහැ. ඒ සඳහා නිලධාරින්ගේ සැලකිය යුතු හිඟයක් තිබෙනවා.

රැකියා විරහිත උපාධිධාරින් පුහුණු කර මේ සඳහා ප්‍රයෝජනවත් ලෙස යොදා ගන්න පුළුවන්. ඒ වාගේම අවිධිමත් ආර්ථිකයෙන් නිසි බදු මුදල් අය කිරීමක් සිදු වෙන්නේ නැහැ. ඒ ගැන සොයා බලා බදු අය කර ගැනීමට කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගෙන එම උපාධිධාරින් පුහුණු කර යොදවන්න පුළුවන්. එමඟින් ඵලදායී සේවාවක් ලබා ගැනීමට හැකි වෙනවා. එක පැත්තකින් රජයට ආදායමක් ලැබෙනවා. වැටුප් ගෙව්වාට ඒ වැටුපට වඩා වැඩි මුදලක් රජයට උපයා ගැනීමට අවස්ථාව සැලසෙනවා.

ගරු මුදල් ඇමතිතුමා අඩු අදායම්ලාභීන් 600,000ක් සඳහා අලුතින් සමෘද්ධිය ලබා දීමටත් ගත් තීරණය ඉතා වැදගත්. මම සමෘද්ධි නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට කාලයක් සේවය කළා. අපේ රටේ දිළිඳු බව තුරන් කිරීමට සමෘද්ධි හා ජනසවිය වැනි වැඩසටහන් ක්‍රියාත්මක කළත්, ඒවා දේශපාලන වහලුන්ට සැලකීමේ ක්‍රමයක් බවට පත් වෙලා තිබෙනවා. මාගේ මිත්‍ර එක්තරා සමෘද්ධි ඇමතිවරයෙක් කිව්වා, එයා "ඡන්ද මැෂිමක්" කියලා. දුප්පත්කම නැති කිරීමේ නියම ව්‍යාපාරයකින් ඡන්ද මැෂින් හදන්න පුළුවන්ද? දැනුත් කොළඹ තිබෙන මහ රැළිවලට පැමිණෙන වැඩි පිරිසක් සමෘද්ධිය ලබන දේශපාලන වහල්ලු බව කියන්න කැමැතියි. ඔය ලයිට් කණුවල නඟින්නේ, විෂ කිරි පැකට් බොන්නේ, අරක්කු බීලා පිස්සු නටන්නේ දේශපාලන වහල්ලු. දුප්පත්කම නැති කිරීමේ මුවාවෙන් දේශපාලන වහලුන් ඇති කිරීමේ ක්‍රමය වහාම වෙනස් කළ යුතුයි. සැබෑ දුප්පතුන්ට පමණක් සමෘද්ධිය ලබා දිය යුතුයි. ඔවුන්ගේ දුප්පත්කම නියමිත කාලයක් ඇතුළත නැති කිරීමට සුදුසු ක්‍රමෝපායන් හඳුන්වා දිය යුතුයි. පසුගිය සතියේ චීනයේ අගමැතිතුමා ප්‍රකාශ කර සිටියා මේ වසරේ දී මිලියන 10ක් පමණ දිළිඳුබවේ රේඛාවෙන් ඉහළට ගන්නා බව. අපේ සමෘද්ධි ව්‍යාපාරයද එවැනි අරමුණක් හා දැක්මක් ඇතිව සකස් කරන්න මේ රජය වහාම කටයුතු කරයි කියා මා බලාපොරොත්තු වෙනවා. අපි කළ යුත්තේ මාවෝ සේතුං තුමා කියපු ආකාරයට බඩගින්නේ සිටින කෙනෙකුට මාළුවෙකු දෙනවා වෙනුවට බිලී පිත්තක් ලබා දීමයි. පසුගිය කාලයේ ලංකාවේ සිද්ධ වුණේ මාළුවත් නැහැ; බිලී පිත්තත් නැහැ. ලැබුණු එකම දේ පෙළපාළි ඒමට අරක්කු හා ගමන් ගාස්තු ලබාදීම පමණයි. ඔවුන් දුප්පතුන් වශයෙන් දිගටම තබා ගැනීම දේශපාලනඥයන්ට විශාල වාසියක්. ඒ ගොල්ලන් පහසුවෙන් පෙළපාළියට ගෙනෙන්නට පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කථාව කෙටියෙන් අවසන් කරන්න.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

අවසාන වශයෙන් ජාතික ආණ්ඩුව ගැන මම සඳහන් කරන්න කැමැතියි. 2015 දී අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එකතු වෙලා ජාතික ආණ්ඩුවක් පිහිටුවපු වෙලාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තරුණ මහාචාර්යවරයෙක් ආර්ථික විද්‍යාඥයින්ගේ සංගමයක දේශනයකදී ප්‍රකාශ කළා, අපේ රටේ ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලා ආණ්ඩුවක් පිහිටුවීම එතුමාගේ දිගු කලක පටන් පැවති සිහිනයක් බව. ලංකාවේ ප්‍රධාන ජාතික ප්‍රශ්න -විශේෂයෙන්ම ජනවාර්ගික ප්‍රශ්නය- විසඳීමේ එකම මාර්ගය ප්‍රධාන පක්ෂ දෙක එකතු වීම බව එතුමා ප්‍රකාශ කළා. විපක්ෂයේ සිටින විට එක් මතයකුත්, ආණ්ඩු පක්ෂයේ සිටියදී එක් මතයකුත් තිබීම තමයි අපේ රටේ තිබෙන ප්‍රශ්න විසඳීමට නොහැකිවීමට ප්‍රධාන හේතුව. නමුත් පක්ෂ දෙක එකතු වෙලා ආණ්ඩුවක් පිහිටෙව්වාට පසුව කටයුතු කළේ ප්‍රධාන ඒකාධිකාරි වෙළෙඳ සමාගම් දෙකක් වෙළෙඳ පොළ පාලනය කරන්න ගහපු ගිවිසුමකින් පසුව කටයුතු කරපු ආකාරයටයි කියන එක සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.30]

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන අය වැය සම්බන්ධව විවාදයේ දී අදහස් දැක්වීමට මටත් අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මෙම අය වැය "බේමාගේ කොලුවාගේ අය වැය" කියලා කියනවා. මම හිතන්නේ මෙම අය වැය මංගල සමරවීර මැතිතුමාගේ අවුරුදු 30ක දේශපාලන ජීවිතයේ; පාර්ලිමේන්තු ජීවිතයේ ඉදිරිපත් කරන දෙවැනි අය වැය. මෙම අය වැය පිළිබඳව මගේ අදහස් ඉදිරිපත් කරන්න විනාඩි 08ක් වාගේ සුළු කාලයක් වෙන් කර දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කොයි වෙලාවෙත් කියන කාරණාවක් තමයි ගරු මංගල සමරවීර ඇමතිතුමාට මුදල් අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශයක් කරන්න හැකියාවක්

[ගරු තාරක බාලසූරිය මහතා]

තිබෙනවාද කියන එක. එතුමා ඉතාම දක්ෂ දේශපාලනඥයෙක්. ඒකේ තර්කයක් නැහැ. මීට කලින් හිටපු මුදල් අමාත්‍යවරු ඉතාම දක්ෂ, බුද්ධිමත් අමාත්‍යවරු. ඒ නිසා මුදල් අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශයක කටයුතු කරන්න එතුමාට ඒ වාගේ හැකියාවක් තිබෙනවාද කියන එක ගැනත් මෙතැනදී ගැටලුවක් තිබෙනවා. කෙසේ වෙතත් එක පැත්තකින් එතුමා මුදල් අමාත්‍යාංශයේ කටයුතු කරන එක හොඳයි, විදේශ අමාත්‍යාංශයේ කටයුතු කරනවාට වඩා. මොකද, විදේශ අමාත්‍යාංශයේ කටයුතු කරමින් ජිනීවා යෝජනා මාලාව වාගේ යෝජනාවලට අත්සන් කළොත්, එයින් එතුමා මේ රටට කරන හානිය, ආර්ථිකයට කරන හානියට වඩා දීර්ඝ කාලීනව මේ රටට බලපාන නිසා.

ඒ කරන ආර්ථික හානියක් අවුරුදු දෙකක්, තුනක් ගියාට පසුව හෝ යම්කිසි විධියකින් අපට නැවත හදාගන්න පුළුවන්. නමුත්, දේශපාලන හානියක් කළොත්, එය දීර්ඝ කාලීනව බලපානවා.

කෙසේ වෙතත් මමත් පිළිගන්නවා, ගරු මංගල සමරවීර ඇමතිතුමාට මෙම අවුරුද්දේ මෙම අය වැය ඉදිරිපත් කිරීම එතරම් ලෙහෙසි පහසු කාරණාවක් නොවෙයි කියන එක. කුමන මුදල් ඇමතිවරයකුට වුණත් මේ අවුරුද්දේ ඒක එතරම් ලෙහෙස පහසු කාරණාවක් නොවෙයි. මේක මැතිවරණ අවුරුද්දක් කියා අපි සියලුදෙනාම දන්නවා. එහෙම නම්, අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ගම්වලට යාමට පෙර, තමන් යම්කිසි දෙයක් කළාය කියා ඒ ජනතාවට පෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා.

අනෙක් අතට, ඇමෙරිකානු ඩොලර් බිලියන 5.9ක් වාගේ මුදල් ප්‍රමාණයක් අපට මේ අවුරුද්ද තුළදී ණය හැටියට ගෙවන්න වෙලා තිබෙනවා. මේ ණය ගෙවන්න අනෙක් රටවලින්, ජාත්‍යන්තර ආයතනවලින්, ඒ කියන්නේ ත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF එක - වැනි ඒවායින් අපට ණය ගන්න වෙලා තිබෙනවා. එතකොට මේ රටේ ආර්ථික ස්ථාවරත්වය බොහෝ දුරට වැදගත් වෙනවා. මොකද, අපේ ආර්ථික ස්ථාවරත්වය යම්කිසි විධියකින් කැඩුණොත් ඒ ගන්න ණයවල පොලී ප්‍රතිශතය බොහෝ දුරට වැඩි වෙනවා. ඒ නිසා ඉදිරියේදී අපි මූල්‍ය කළමනාකරණය යම්කිසි විනිවිදභාවයකින් යුතුව, fiscal discipline එකක් ඇතිව ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාවක් තිබෙනවා.

ආර්ථිකය අතින් බැලුවොත්, මුළු ලෝකයෙන්ම දකුණු ආසියාවේ වැඩිම ආර්ථික වර්ධනයක් තිබෙන වෙලාවේ, ඉන්දියාවේ සියයට 7.4ක ආර්ථික වර්ධන වේගයක්, භූතානය, නේපාලය වැනි රටවල සියයට 7.3ක පමණ ආර්ථික වර්ධන වේගයක් තිබෙන වෙලාවේ ගිය අවුරුද්දේ ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.3ට අඩු වෙලා තිබෙනවා. ඒ නිසා යම්කිසි විධියක ආර්ථික උත්තේජනයක් - economic stimulus එකක් - ඇති කරන්න අවශ්‍ය වෙනවා. එවැනි දෙයක් කරන්න අපි දන්නා ආර්ථික විද්‍යාව අනුව නම් එක්කෝ රජය මුදල් වියදම් කරන්න ඕනෑ. එහෙම නැත්නම් බදු අඩු කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. නමුත්, මේ අය වැය දිහා බලනකොට රජය වියදම් කරන මුදල් ප්‍රමාණය යටතේ එහෙම වර්ධනයක් වෙලා නැහැ. ඒ වාගේම බදු අඩු වීමකුත් අපි දකින්නේ නැහැ. එක පැත්තකින් ඒ ආර්ථික වර්ධන වේගය එන අවුරුද්ද වන විට වැඩි වේවිද, නැද්ද කියන එක ගැනත් සැකයක් තිබෙනවා.

අය වැය පරතරය 3.5ක ප්‍රතිශතයක් වශයෙන් ගෙන යන්නය කියා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඉල්ලා සිටියාය කියා පුවත් පත්වල පළ වෙලා තිබුණු ආකාරය අපි දැක්කා. නමුත්, විශේෂයෙන්ම මේක මැතිවරණ අවුරුද්දක් නිසා එක්සත් ජාතික පක්ෂයේ නායකයන් කියා තිබෙනවා, 4.5ක නැත්නම් 4.8ක අය වැය පරතරයක් ගෙන යන්නයි ඒ අයගේ බලාපොරොත්තුව තිබෙන්නේ කියා. කෙසේ වෙතත්, ගරු මංගල සමරවීර මැතිතුමා තව දුරටත් එතුමාගේ අසාර්ථක නියෝලිබරල් ප්‍රතිපත්ති මාලාවක් ඉදිරියට ගෙන යන්න සැලැස්මක් තිබෙනවාය කියන එකයි අපි දකින්නේ. අය වැය යෝජනා අංක 12හි ගරු මංගල සමරවීර ඇමතිතුමා විග්‍රහ කර තිබෙනවා, පසුගිය කාලයේ බොහෝ අය crony capitalism ක්‍රමයට ප්‍රතිලාභ අත්කර ගෙන තිබෙනවා, සමහර ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර පවත්වා ගෙන යාමේදී, පිට රටින් ගෙනෙන භාණ්ඩවලට විශාල බද්දක් දමා ඒකෙන් ප්‍රතිලාභ ලබා තිබෙනවාය කියා. ඒ බද්ද අයින් කරන්න ඕනෑය කියා එතුමා යෝජනා කර තිබෙනවා. මමත් යම්කිසි මට්ටමකට මේකට එකඟයි. දැන් බලන්න, ලංකාවේ ටයිල් හදන්නේ කවුද? ලංකාවේ එකම පුද්ගලයෙකුයි ටයිල් නිෂ්පාදනය කරන්නේ. ආයතන දෙකක්, තුනක් තිබුණත් ධම්මික පෙරේරා මහත්මයා තමයි ලංකාවේ ටයිල් නිෂ්පාදනය කරන්නේ. ඉතින් අපි පිට රටින් ගෙනෙන ටයිල්වලට බද්දක් දමලා ධම්මික පෙරේරා මහත්මයාව පොහොසත් කරනවා නම්, ඒක හොඳ ආර්ථික සැලැස්මක් නොවෙයි කියන එකයි අපි කියන්නේ. එවැනි තත්ත්වයක් තිබුණොත් අපි අනිවාර්යයෙන්ම ඒ වෙළෙඳ පොළ විවෘත කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එහිදී අපේ මංගල සමරවීර ඇමතිතුමා කියන කාරණයට මමත් එකඟ වෙනවා. ඒ කියන්නේ, මිලියන 20ක ජනගහනයෙන් එක පුද්ගලයකු පොහොසත් කරන්න පිට රටින් ගෙනෙන ඒවාට බද්දක් දමන්න අවශ්‍ය නැහැ. හැබැයි, ඒක එක පුද්ගලයකුට අදාළ ව්‍යාපාරයක් පිළිබඳ කාරණාවක්. සමහර වෙලාවට මේක රබර් කර්මාන්තයටත් අදාළ වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සමහර වෙලාවට ඔය steel වාගේ දේවලුත් හුඟක් අය නිෂ්පාදනය කරන්නේ නැහැ. එක පුද්ගලයකුගේ කර්මාන්තයකට අදාළ වෙළෙඳ පොළ විවෘත කරන එක හා රටේ විශාල ප්‍රමාණයකට හෝ සමස්ත ජනතාවට බලපාන කර්මාන්තයකට අදාළ වෙළෙඳ පොළ විවෘත කරන එකයි අතරේ ලොකු වෙනසක් තිබෙනවා කියන එක මෙතැනදී අපි තේරුම් ගන්න අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න, සිංගප්පූරු ගිවිසුම් වාගේ දේවල් හරහා අපේ කෘෂිකර්මය නැත්තටම නැති කර තිබෙනවා නේ.

ඊළඟට, ගම්මිරිස් ප්‍රශ්නය දිහා බලන්න. ප්‍රතිඅපනයනය කිරීම නිසා රුපියල් 1,200ට ඉහළ ගිය ගම්මිරිස් කිලෝග්‍රෑම් එක දැන් විකිණෙන්නේ රුපියල් 550ටයි. ඒ වාගේම රබර් කර්මාන්තය දියුණු කරන්න කියලා replantingවලට රුපියල් බිලියන 800ක් වෙන් කර තිබෙනවා. හැබැයි, මෙතැන ගැටලුව තිබෙන්නේ replanting සම්බන්ධයෙන් නොවෙයි. රබර් වතු තිබෙන අය ගිහින් රබර් tap කරන්නේ නැහැ. ඇයි, tap කරන්නේ නැත්තේ? මොකද, රුපියල් 225ක් වාගේ මුදලකට රබර් කිරි කිලෝවක් දීලා මේවා නඩත්තු කරන්න බැහැ. එහෙම නම්, කරන්න තිබෙන්නේ මොකක්ද? අපේ මුදල් ඇමතිතුමාට පුළුවන්, ඒකට යම්කිසි බද්දක් දමා රබර් වවන ගොවින්ට ඊට වඩා හොඳ සහනයක් ලබා දෙන්න.

අපි කුරුඳු වගාව ගැනත් බලමු. "ලංකා කුරුඳු" කියලා අපේ කුරුඳු වගාව දියුණු කරන්න ඕනෑය කියමින් රුපියල් මිලියන 50කුත්, ඒ වාගේම තවත් රුපියල් මිලියන 75කුත් වෙන් කර තිබෙනවා. "Ceylon Cinnamon" කියලා කුරුඳු වගාව දියුණු කරන්න කටයුතු කරලා අනික් පැත්තෙන් කුරුඳු ප්‍රතිඅපනයනය කරනවා නම්, මේ වැඩේ තේරුමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ වියට්නාමයෙන් කුරුඳු ගෙන්වා තිබෙන ආකාරය සංඛ්‍යා ලේඛනවලින් අපි දැක තිබෙනවා. එක පැත්තකින් "Ceylon Cinnamon" brand කියලා අපේ කුරුඳු වගාව ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වනවා. නමුත්, අනික් පැතිවලින් මේකට තවත් තහංචි දමනවා. මේ වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

මට වෙන් කර තිබෙන්නේ කෙටි කාලයක් නිසා සියලු අදහස් ඉදිරිපත් කරන්න විධියක් නැහැ. ඉදිරි කාලයේදී -මේ මාසය තුළදී- අය වැය සම්බන්ධයෙන් තවත් විවාද කරනකොට මගේ අදහස් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා.

මුලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කරුණ කියන්න කැමැතියි. මේ මොනවා කථා කළත්, ගිය අවුරුද්දේ අය වැය යෝජනාවලින් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ සියයට 8යි. මේ අය වැය යෝජනා ගැන කථා කරන එකත් එක පැත්තකින් මෝඩ වැඩක්. ඒක අපේ කාලය නාස්ති කිරීමක් පමණයි. අනිවාර්යයෙන්ම අපි Budget Office එකක් නිර්මාණය කරන්න ඕනෑය කියන යෝජනාවත් ඉදිරිපත් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කේ.කේ. පියදාස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 4.40]

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
මුලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 වසරට ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වනවා. අපි මේ ආණ්ඩුව ලබා ගත් අවස්ථාවේ සිට - පසුගිය කාල පරිච්ඡේදයේ- භයානක ගංවතුර අවස්ථා දෙකක් පමණ ඇවිල්ලා, නාය යාම් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා, ඔක්තෝබර් 26වන දා භයානක කුණාටුවකුත් ආවා. ඒ සියලු ප්‍රශ්නවලට මුහුණ දීලා මෙවැනි සහන සලසන අතිසාර්ථක අය වැයක් මේ රටට ඉදිරිපත් කරන්න කටයුතු කිරීම පිළිබඳව මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාටත්, එතුමාගේ ලේකම්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයටත් මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම පසුගිය කාලය දිහා බැලුවාම ඔක්තෝබර් 26වන දාට කලින් අපි ක්‍රියාත්මක කළ"ගම්පෙරළිය" වැඩසටහන ගැන කථා කරනවා නම්, ඒ වැඩසටහන අනුව අපේ ගම්වල සංවර්ධන වැඩ කටයුතුවලට අපට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වුණා. අපි ඒ තුළින් ඉතාම හොඳින් අපේ ගම්වල සංවර්ධන කටයුතු කර ගෙන ආවා. ගමේ ජනතාවට විශාල වශයෙන් පහසුකම් ලැබෙන විධියට ග්‍රාමීය මට්ටමින් පාරවල්, පාලම්, බෝක්කු, නිවාසවල වැඩ කටයුතු කර ගෙන ඉදිරියට යන අතරේ, එක පාරටම පැමිණි ඒ කුණාටුවෙන් විශාල හානියක් වුණා. මම රට ගැන කියන්නේ නැහැ. මම නියෝජනය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ලැබුණු රුපියල් කෝටි 15 1/2ක මුදලක් එම ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ඉතා සන්තෝෂයෙන් ආපහු මහා භාණ්ඩාගාරයට යැව්වා. ඒ මුදලින් අපට ශත පහක වැඩක් කරන්න දුන්නේ නැහැ. රටේ තත්ත්වය මෙන්න මේකයි. දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී ඒ ගැන සාකච්ඡා කළාම කියන්නේ මොකක්ද? "නිලධාරින් නැත්නම් මම මේකට මොකක්ද කරන්නේ?" කියලා ඔවුන් කියනවා. රුපියල් කෝටි 15 1/2ක මුදලක් මහා භාණ්ඩාගාරයට ආපහු ගියේ නිලධාරින් නැති නිසා ලු. ජනතාවට -ප්‍රදේශයට- වැඩක් කරන්න වෙන් කළ සල්ලි, ඒ කටයුතු කරන්න අපට ලබා දෙන්නේ නැත්නම්, රටක් සංවර්ධනය කරන්නේ කොහොමද? ඒකයි පළමුවැනි කාරණය. මගේ ආසනයට වෙන් කළ රුපියල් කෝටි 15 1/2ක මුදල ආපහු මහා භාණ්ඩාගාරයට යැව්වේ ඒ අයට නිලධාරින් නැති නිසා ලු.

අර සුළි කුණාටුවත් සමඟ ඒක ආපහු ගියා. මේ වාගේ තත්ත්වයක් තුළ තමයි අපට මේ රටේ වැඩ කරන්න සිදු වෙලා තිබෙන්නේ කියා මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

2015.12.31වැනි දිනට පෙර විශ්‍රාම ලැබුවන් හා 2016 ජනවාරි 01 වන දින සිට විශ්‍රාම ලැබුවන් අතර විශ්‍රාම වැටුප් විෂමතාවක් තිබෙනවා. එම විෂමතාව සංශෝධනය කිරීමට මෙවර අය වැයෙන් පියවර ගෙන තිබෙන බව විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මෙයින් දළ වශයෙන් මේ රටේ විශ්‍රාමිකයන් 585,000ක් පමණ ප්‍රතිලාභ ලබන බව මේ අවස්ථාවේ මම මතක් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, පහළ මට්ටමේ රජයේ විශ්‍රාමිකයෙකුට රුපියල් 1,600ක්ද, පළමු පන්තියේ ගුරුවරයෙකුට අවම වශයෙන් රුපියල් 4,600ක්ද අමාත්‍යාංශ ලේකම්වරයෙකු සඳහා රුපියල් 12,000ක්ද වශයෙන් විශ්‍රාම වැටුප වැඩි වෙනවා. මෙහෙම විශ්‍රාම වැටුප වැඩි කිරීම හොඳ දෙයක්ද, නරක දෙයක්ද කියා මේ අය වැය පරාජය කරනවා කියන ඇත්තන්ගෙන් මම අහනවා.

වසර 20කට වැඩි කාලයක් තිස්සේ මේ රටේ ත්‍රිවිධ හමුදා දීමනා වැඩි කිරීමක් සිදු කර නැහැ. මෙම අය වැය මඟින් කමාන්ඩෝ දීමනාව, නිල ඇඳුම් දීමනාව, ගෙවල් කුලී දීමනාව වැඩි කර තිබෙනවා. ගෙවල් කුලී දීමනාව සියයට සියයකින් වැඩි කර තිබෙනවා. හමුදා සේවයේ ඉහළ පන්තියේ සිට පහළ පන්තිය දක්වා හැම කෙනෙකුටම අවශ්‍ය පහසුකම් ලබා දීමට මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා. මේ අය වැය පරාජය කරනවා කියන ඇත්තන්ට මම කියනවා මේ යෝජනාවලට අකැමැති නම් මේ අය වැය පරාජය කරන්න කියා. මේ වාගේ හොඳ යෝජනා ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක, අපි ග්‍රාමීය මට්ටමේ ගැමි ජනතාවත් සමඟයි ජීවත් වෙන්නේ. අපේ ප්‍රදේශවල ඉන්නේ මහ පොළොවේ පය ගහලා සිටින ගම්වල මිනිස්සු.

ග්‍රාමීය මට්ටමේ ප්‍රාථමික පාසල් දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා නොමිලේ කිරි වීදුරුවක් ලබා දෙනවා. ඒක නරකද? ඒ නිසාද මෙවර අය වැය පරාජය කිරීමට කටයුතු කරන්නේ කියා අපට අහන්න සිද්ධ වෙනවා. මේ වාගේ කටයුතු කරගෙන ඉදිරියට එනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ මා නියෝජනය කරන ප්‍රදේශය ගත්තාම, මධ්‍යම පළාත ගත්තාම, මධ්‍යම කඳුකරය ගත්තාම ඉතා දුප්පත්, අහිංසක ජනතාව තමයි වැඩියෙන්ම ජීවත් වෙන්නේ. ඒ සමහර අයගේ නිවාසවල තත්ත්වය කියන්න බැරි තත්ත්වයට පත් වී තිබෙනවා. වතු නිවාස ගැන මම පසුව කථා කරනවා. ඒ අයගේ සනීපාරක්ෂක පහසුකම්, වැසිකිළි පහසුකම්වල විශාල අඩු පාඩුවක් තිබෙනවා. ඒ පහසුකම් ලබා දීමට වැඩ පිළිවෙළක් යොදලා තිබෙන එක නරකද?

ඊට අමතරව කඳුකරයේ ගම්මානවලට වැසිකිළි සකස් කර ගැනීම සඳහා ජල සම්පාදන අමාත්‍යාංශය වෙනම රුපියල් 50,000ක දීමනාවක් ලබා දෙනවා. මේවා නරකද කියා මේ අය වැය පරාජය කරනවා කියන ඇත්තන්ගෙන් මම අහනවා. යමක් කරන්න යනකොට හැම දෙයක්ම සියයට සියයක් යහපත් වෙන්නේ නැහැ. මොන දේ කළත් -අයහපත් දේ කළත්- යහපත් දේ කළත් අඩු පාඩු තිබෙනවා. හැම දෙයටම විරුද්ධ වෙන්නේ නැතිව වැරැද්ද පෙන්වලා නිවැරැදි කර ගැනීමට කටයුතු කිරීම නොවෙයි කරන්නේ. අපි විරුද්ධයි කියා ඒවා විනාශ කරන්න කටයුතු කරනවා.

පසුගිය කාල පරිච්ඡේදයේ තිබුණු හොරකම් දැන් ගොඩක්ම අඩු වෙලා තිබෙනවා. මේ ක්‍රමවේදය තුළින් හොරකම් කිරීමට බැරි වෙලා තිබෙනවා. කොන්ත්‍රාත්වලින්, අරවායින්, මේවායින් ගසා කෑම වැනි කටයුතු දැන් ගොඩක් අඩු වෙලා තිබෙනවා. දැන් ඒවා කර ගැනීමට බැරි තත්ත්වයට පත් වෙලයි තිබෙන්නේ. එම නිසා මේ ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ විනාශ කර දමන්නේ කොයි ආකාරයෙන්ද කියන එක ගැන තමයි දැන් හැම පැත්තෙන්ම කථා වෙන්නේ, ඔන්න ඕක ගැනයි කථා වෙන්නේ. ව්‍යාපාර ක්ෂේත්‍රයේ

[ගරු කේ.කේ. පියදාස මහතා]

කලින් තිබුණු තත්ත්වය දැන් නැහැ. තමන්ට පුළුවන් මට්ටමින් ව්‍යාපාරය කරගෙන යනවා. ඉස්සර එක තැන තිබුණු ව්‍යාපාර දැන් තැනින් තැනට ව්‍යාප්ත වෙලා වතුකරයටත් ගිහින් තිබෙනවා, ගමටත් ගිහින් තිබෙනවා, නගරයේත් තිබෙනවා. මෙසේ ව්‍යාපාර බෙදී ගිය නිසා කලින් පැවැති විශාල ප්‍රමාණයේ ලාභ ඉපයීම් මාර්ග ටිකක් අඩු වෙලා තිබෙනවා. ඒකයි පවතින ප්‍රශ්නය. ඒ නිසා මේ ක්‍රමය හරි නැහැ කියා සමහර අය කියනවා. ග්‍රාමීය ජනතාවට, වතුකරයේ සිටින ජනතාවට මේ ක්‍රමය හොඳයි. ඒ ගොල්ලන් දැන් යමක් සොයා ගෙන ජීවත් වෙන මාර්ගයට ඇවිත් තිබෙනවාය කියා මම විශේෂයෙන් මතක් කරනවා.

දැන් supermarket තිබෙනවා. අපි ග්‍රාමීය මට්ටමින් වසම් තුනකට mini-supermarket එකක් ආරම්භ කරන වැඩ පිළිවෙළකට ගියොත් මොකද වෙන්නේ? කාන්තාවන් දොළොස්දෙනෙක් විතර එකතු වෙලා සමිතියක් හදාගෙන ග්‍රාමීය මට්ටමේ mini-supermarket එකක්, වසම් තුනට එකක් වෙන්න හදලා දුන්නොත් එතැනින් දියුණුවක් ලබා ගන්න බැරිද? එමඟින් උදව් කරන්න බැරිද? අන්න ඒකට තමයි "Enterprise Sri Lanka" හරහා ණය ලබා දී ඉදිරියට එන්න වැඩ පිළිවෙළක් අපි ඇති කර දීලා තිබෙන්නේ. ඒ වාගේ ක්‍රමවේද ඇති කර දුන්නත් ණය ගෙන නැහැ. ණය ගෙවන්න බැහැ කියා කවුරුවත් ණය ගත්තෙත් නැහැ. දැනට මේ රටේ 30,000කට වැඩිය "Enterprise Sri Lanka" යටතේ ණය අරගෙන තිබෙනවා.

ණය ගන්න බැරි එක්කෙනාට, ණය ගන්න බැහැ. අවශ්‍යතාවන් ඉදිරිපත් කරන්න බැරි අයට, බැංකුවෙන් ඉල්ලන තොරතුරු ලබා දෙන්න බැරි අයට, මීට කලින් ණය වෙලා ඒ ණය ගෙවා ගන්න බැරි වුණු අයට, වෙනත් තැන්වල ප්‍රශ්න ඇති කර තිබෙන අයට ඒ ණය ලබා ගන්න බැහැ. තමන් ඒ කරුණු කාරණා කෙළින්ම ඉදිරිපත් කර, ණය ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයක් හදා ගත්තා නම්, ණය ලබා ගන්න පුළුවන්. එම නිසා "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යටතේ ණය ලබාගෙන දියුණු වෙන්න පුළුවන් මාර්ග ඇති කර දීලා තිබෙනවා කියන එකත් මම විශේෂයෙන්ම මතක් කරනවා. ඒ වාගේම, සනීපාරක්ෂක පහසුකම් වැනි පහසුකම් ලබා දෙන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා. මම නියෝජනය කරන දිස්ත්‍රික්කය තුළ ග්‍රාමසේවා වසම් 492ක් තිබෙනවා. ඒ හැම වසමකම ග්‍රාමසේවා නිලධාරී මහත්වරුන්ට පණිවුඩ යවලා මම ඔවුන්ව දැනුවත් කර තිබෙනවා, තමන්ගේ වසමේ සම්පූර්ණයෙන්ම වහල හදන්න තිබෙන නිවාසවල තොරතුරු අපට ලබා දෙන්න කියා. ඒ වාගේම, නිවාස අර්ධ වශයෙන් සාදා තිබෙන අය පිළිබඳවත් අපට දැනුම් දෙන්න කියා දැනුවත් කර තිබෙනවා. සම්පූර්ණ වහල හදන්න තිබෙන නිවාසවලට ලක්ෂ 3ක මුදලක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. අර්ධ නිවාසවලට රුපියල් ලක්ෂයක මුදලක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ සඳහා මෙවර අය වැයෙන් "ගම්පෙරළිය" වැඩසටහන යටතේ අපට මුදල් වෙන් කරන්න පුළුවන්. ඒවාට අපට මුදල් තිබෙනවා. අපි මේවා කරනවාට තමුන්නාන්සේලා අකැමැති ද කියන එකයි අපි අහන්නේ. තමුන්නාන්සේලා මේක පරාජය කරන්න කටයුතු කරන්නේ ඇයි? අපි දුප්පත් අහිංසක මිනිස්සුන්ට උදවු කරන නිසා ද? ඒ රුපියල් ලක්ෂ තුනෙන් **වහළත්** ගහලා, ගේ ඇතුළේ පොළොව හදන්න තිබෙනවා නම්, බිත්ති කපරාරු කරගන්න තිබෙනවා නම්, තවත් අඩු පාඩුකම් තිබෙනවා නම්, ඒවාටත් ඒ ලක්ෂ තුනෙන් උදව් ගන්න පුළුවන්. ඒක ආපහු අය කරගන්නා ණයක් නොවෙයි. රජයෙන් ප්‍රදානය කරන මුදලක්. මේ විධියේ වැඩසටහන් අපි දැනටත් ක්‍රියාත්මක කරගෙන යනවා. දැනට මේ අවුරුද්ද වෙනුවෙන් අපට ඒ සඳහා මුදල් ලැබිලා තිබෙනවා. අපි මේ වාගේ යහපත් දේවල් කරනකොට කිසි දෙයක් කියන්නේ නැහැ. "මේවා බොරු කථා" කියමින් කථා කරන්න එපා කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

අපේ ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමා "සුවසැරිය" ගිලන් රථ සේවාව ආරම්භ කළා. පසුගිය කාලයේ කථාවක් ගියා, ඉන්දියාවේ "රෝ" සංවිධානයට ඔත්තු සපයන්න මේක ක්‍රියාත්මක කළා කියා. අද වන විට එම "සුවසැරිය" ගිලන් රථ සේවාව මධ්‍යම පළාතටත් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම, වතුකරයටත් ඇවිල්ලා තිබෙනවා. වතුකරයේ ගමක හදිසි ලෙඩෙක් වුණාම, එක්කෝ නාවලපිටිය රෝහලට යන්න ඕනෑ. නැත්නම්, නුවරඑළිය රෝහලට යන්න ඕනෑ. ඒ වාගේ දුර ප්‍රදේශවලට යන්න ඕනෑ. 1990 නොම්මරයට ගැහුවාම, ළඟම තිබෙන පොලිසියෙන් අපට ගෙන්වා ගෙන ඒ කටයුත්තට උදව් ගන්න පුළුවන් තත්ත්වයක් එතැන ඇති කර තිබෙනවා. ඒක නරක ද කියන එකයි මම අහන්නේ. ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත්, මුදල් ඇමතිතුමාත් එක්ව අනෙක් අයගේත් සහයෝගය ඇතිව රටේ ජනතාවට මේ වාගේ සේවාවන් කරමින් අපේ රට ඉස්සරහට ගන්න කටයුතු කරන එක හරි ද, වැරැදි ද කියායි මම අහන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ආසනයේ බෞද්ධ සිද්ධස්ථාන 37ක් තිබෙනවා. ඒ බෞද්ධ සිද්ධස්ථාන 37න් සිද්ධස්ථාන 20කට "ගම්පෙරළිය" වැඩසටහන යටතේ රුපියල් ලක්ෂ 10 ගණනේ මේ වන විට දීලා තිබෙනවා. ඒ වාගේම, කෝවිල්වලටත් අපි මුදල් දීලා තිබෙනවා. දැන් වතුකරයේ කෝවිල් ටිකත් හැදෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියකින් කථාව අවසන් කරන්න.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්නකෝ, මම තවම වතුකරය ගැන කථා කළේ නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකක කාලයක් දෙන්නම්. ඔබතුමා කථා කරන්න.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. 1993දී තමයි මේ වතුවල ජනතාවට පර්චස් 7ක් දුන්නේ. කවුද, එහෙම දුන්නේ? අපේ ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා දිවංගත අපේ සෞම්‍යමූර්ති තොණ්ඩමන් ඇමතිතුමාත් සමඟ නුවරඑළියේදී සාකච්ඡා කර, මේ අහිංසක ජනතාවට පර්චස් 7ක ඉඩම දුන්නා. ඒ කාලයේ ගෙවල් හදලා දෙන්න කථා වුණේ නැහැ. නමුත්, ඉඩම දුන්නා. 1994දී අපේ ආණ්ඩුව පරාද වුණාට පස්සේ, ඒ ගැන කථාවකුත් නැහැ. ඊට පස්සේ, පශු සම්පත් සංවර්ධන හා වතු යටිතල පහසුකම් කියා අමාත්‍යාංශයක් හැදුවා. නමුත්, එක නිවාසයක් හැදුවෙත් නැහැ, ඒ අහිංසක මිනිස්සුන්ට පර්චස් 7ක් දුන්නෙත් නැහැ. මේ ආණ්ඩුව ආවාට පස්සේ අපි පර්චස් 7ක ඉඩමක් දෙනවා. අද වන විට මධ්‍යම කඳුකරය ආශ්‍රිත වතුකරයේ ගෙවල් කොපමණ ප්‍රමාණයක් හදලා තිබෙනවා ද කියා ගිහිල්ලා බලන්න. අඩි දහයයි දහයේ ලයින් කාමරයේ හිටපු වතුකරයේ ජනතාවට අපි අද වන විට නිවාස ලබාදීලා තිබෙනවා. වතුකරයේ විතරක් නොව ගමේත් එහෙමයි. ගමේ සමහර නිවාසවල දොරවල් නැති නිසා, උළුවස්සේ තවමත් රෙදි කෑලි එල්ලාගෙන වහගෙන සිටිනවා. මොකද, දොරක් හදා ගන්න විධියක් නැහැ. ඒ තරම් අහිංසක දුප්පත් මිනිස්සු සිටිනවා. ඒ ගැන කථා කළාම

මෙතුමන්ලා සුරංගනා ලෝකයක් ගැන කථා කරනවා. ඒ ගැන කථා කරද්දී එතුමන්ලා කියනවා, "අවුරුදු 17ක, 20ක පමණ කාලසීමාවක් තුළ අපි මොන මොන ආකාරයෙන් වැඩ කටයුතු කළා ද, අපි ජනතාව වෙනුවෙන් මොන විධියට සේවය කළා ද?" කියා. අනෙක් කාරණය අධිවේගී මාර්ගය සම්බන්ධයි. මේ වාගේ එක එක දේවල් ගැන කථා කරනවා. නමුත්, ග්‍රාමීය මට්ටමේ ජනතාවට, දුප්පත් අහිංසක මිනිස්සුන්ට මේ සේවාවන් වුණේ නැහැ කියා මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. සමෘද්ධි සහනාධාරය පිළිබඳ කථාව ගැන තමයි මම මේ කියන්නේ. අවුරුදු 17ක්, 20ක් තිස්සේ එක්තරා පන්තියකට සමෘද්ධි සහනාධාරය ලැබුණේ නැහැ. දේශපාලනීකරණය කර තමයි සම්පූර්ණයෙන් කටයුතු කළේ. අන්න ඒ අයහපත් පැත්ත දැන් යහපත් අතට හැරිලා තිබෙනවා.

ගරු මුදල් ඇමතිතුමා හය ලක්ෂයකට මේ සහනාධාර දෙන්න මේ අය වැය තුළින් කටයුතු කිරීම සම්බන්ධයෙන් මා එතුමාට ස්තුති කරනවා.

අධිවේගී මාර්ගයේ යන වාහනයක් සඳහා රුපියල් 100ක් වැඩි කළා කියලා දැන් කෑ ගහනවා. රුපියල් සියය නොවෙයි, ඒක 500ක් කරන්න ඕනෑ. අධිවේගී මාර්ගයේ යන්නේ අධිවේගයෙන් යන්න පුළුවන් අයයි; බැරි අය යන්නේ නැහැ නේ. අද අධිවේගී වෙන්න බැහැ, අධිවේගී මාර්ගවල යනකොට 'වොකොස්, වොකොස්' ගාලා උඩ පනිමින් යන තත්ත්වයට පත්ව තිබෙනවා. ඒවා පසුගිය කාලයේ ඉදිකරපු මාර්ග. ගිහිල්ලා හොඳට බලන්න. ඒ මාර්ග ඒ තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. ඒ අධිවේගී මාර්ග නඩත්තු කරන්න ඒ වාගේම මුදලක් නැවතත් අවශ්‍ය වෙනවා කියන එක මම විශේෂයෙන් මතක් කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මේ අය වැය සාර්ථක අය වැයක් කියන එක විශේෂයෙන් මතක් කරමින්, මේ රටේ ජනතාවට මෙයින් සහන සැලසේවා! දුප්පත් මිනිසුන්ගේ ජන ජීවිතය තවත් ඉහළ නැඟේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ வைத்திய கலாநிதி சி. சிவமோகன் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருக்கின்றன.

[பி.ப. 4.53]

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டம்மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நான் நன்றி கூறுகின்றேன். இந்தக் குறுகிய நேரத்தில் அதிக விடயங்களை வெளிப்படுத்த முடியா விட்டாலும் ஒரு சில விடயங்களை வெளிப்படுத்துகின்றேன்.

தேசிய உற்பத்தி, அதிலிருந்து வரும் தேசிய வருமானம் ஆகியவற்றை அடிப்படையாக வைத்து வரவு செலவுத் திட்டத்தைத் தயாரிப்பதுதான் எமது நாட்டுக்கு சிறந்ததாக அமையும். ஆனால், இன்று பாதுகாப்பு அமைச்சுக்கு 393 பில்லியன்கள் ஒதுக்கப்பட்டிருப்பதைக் காணலாம். இது மொத்தச் செலவீட்டின் 17 சதவீதமாகும். நாட்டுக்கு எந்த வித வருமானத்தையும் தேடித்தராத ஒரு துறைக்காக இவ்வளவு தொகை ஒதுக்கப்பட்டிருப்பதை இந்த வரவு செலவுத் திட்டத்தின் பலவீனமாக நான் கருதுகின்றேன். 2008ஆம் ஆண்டு ஒரு கொடிய யுத்தத்தை எதிர்கொண்டபொழுதுகூட, 200 பில்லியன் மட்டும்தான் பாதுகாப்புக்கென ஒதுக்கப்பட்டிருந்தது. ஆனால், அது இப்பொழுது இரண்டு மடங்குகளாக அதிகரிக்கப்பட்டிருக்கின்றது. இது எவ்வளவு தூரம் சரியானது என்பது கேள்விக்குறியாக இருக்கின்றது.

எமது நாடு ஒரு விவசாய நாடாகும். தேயிலை, தெங்கு, நெற்செய்கை அதுபோன்று மீன்பிடித்துறை போன்ற முக்கிய உற்பத்திகளைக் கொண்டதொரு நாடாகும். அப்படி இருக்கும்பொழுது, விவசாயத்துறைக்காக 114 பில்லியன் மட்டுமே ஒதுக்கப்பட்டிருக்கின்றது. இது பாதுகாப்புத் துறைக்கு ஒதுக்கப்பட்டதைவிட 3.5 சதவீதம் குறைவானதாகக் காணப்படுகின்றது. எனவே, இந்த வரவு செலவுத் திட்டம் உற்பத்தியை நோக்கி, தேசிய வருமானத்தை அதிகரிக்கும் நோக்கத்தில் தயாரிக்கப்படவில்லை என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். தேயிலை ஒரு முக்கியமான உற்பத்திப் பொருளாகக் காணப்படுகின்றது. இருந்தபோதிலும் தோட்டத் தொழிலாளர்களின் ஒரு நாளுக்கான சம்பளம் 1,000 ரூபாய் வழங்கப்பட வேண்டும் என்பதைக்கூட இந்த அரசு இதுவரை கரிசனையில் எடுக்கவில்லை. இதற்கு முதலாளிமார் சம்மேளனத்தைக் காரணம் காட்டி நிற்கின்றது. இதுவொரு தவறான செயலாகக் காணப்படுகின்றது.

அதுமட்டுமல்ல, எமது வட பகுதியில் நெற்செய்கையானது வெள்ள அனர்த்தத்திற்குட்பட்டு அழிவடைந்தது உங்களுக்குத் தெரியும், அதற்கான காப்புறுதிகள் வழங்கப்பட்டிருந்தன. ஆனால், அந்தக் காப்புறுதிகள் இதுவரை சரியான முறையில் வழங்கப்பட்டிருக்கின்றதா என்பதில் சந்தேகங்கள் நிலவு கின்றன. எனவே, அவற்றையும் சீர் செய்ய வேண்டுமென இந்த இடத்தில் நான் கேட்டுக்கொள்கின்றேன்.

புதுக்குடியிருப்பு நகரில் 682ஆவது படைப்பிரிவின் முகாமொன்று அமைந்துள்ளது. இந்த முகாமை உடனடியாக அகற்றுமாறு His Excellency President, Maithripala Sirisena அவர்கள் உத்தரவிட்டிருந்தார். அதனடிப்படையில் Major General W.B.D.P Fernando - Commander, Security Forces அவர்கள் ஒப்பமிட்டுப் பிரதேசச் செயலரிடமும் அரச அதிபரிடமும் ஒரு கடிதம் ஒப்படைக்கப்பட்டது. அதன்படி 7.75 ஏக்கர் நிலப்பகுதி இரண்டு கிழமைகளுக்குள்ளும் 10 ஏக்கர் நிலப்பகுதி 3 மாதங்களுக்குள்ளும் 1 ஏக்கர் நிலப்பகுதி 6 மாதங்களின் பின்பும் விடுவிக்கப்படுவதாகத் தெரிவிக்கப் பட்டிருந்தது. ஆனால், இன்று இரண்டு வருடங்கள் கடந்தும் இந்தக் காணிகள் விடுவிக்கப்படவில்லை. அங்கிருந்து வெளியேறுவதற்கு 59 மில்லியன் ரூபாய் பணம் தேவைப்படு கின்றது என்று அவர்கள் சொல்கின்றார்கள். இன்று பாதுகாப்புக்காக பில்லியன் கணக்கில் பணம் ஒதுக்கப் படுகின்றது. ஆனால், இவர்கள் 59 மில்லியனுக்காக உண்மைக்குப் புறம்பான வார்த்தைகளைச் சொல்லி ஏமாற்றிக் கொண்டிருக்கின்றார்கள். இந்த அரசும் பாதுகாப்பு அமைச்சைப் பொறுப்பேற்று நடத்தும் His Excellency President அவர்களும் இதில் கவனமெடுக்கவில்லை என்பது கவலைக்குரிய விடயமாக இருக்கின்றது. எனவே, வழங்கப் பட்ட வாக்குறுதிகளின் அடிப்படையில் இந்த முகாம் முற்றாக அகற்றப்பட வேண்டும்.

இன்று மன்னார் மனிதப் புதைகுழியில் கண்டெடுக்கப் பட்ட எலும்புக்கூடுகள் தொடர்பான காபன் அறிக்கை வெளிவந்துள்ளது. அதில், "குறித்த எலும்புக்கூடுகள் 1499ஆம்

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

ஆண்டுக்கும் 1719ஆம் ஆண்டுக்கும் இடைப்பட்ட காலப்பகுதிக்குரியவை" என்று கூறப்பட்டிருக்கின்றது. உண்மையில், இந்த அறிக்கையை மக்கள் நம்பவில்லை. அங்கே காணப்பட்ட 300 வருடங்களாக உக்காத இரும்புகள், பிளாஸ்டிக் லேபல்கள் என்பன அவர்களது அறிக்கைக்கு முரணாகக் காணப்படுகின்றன. சாதாரணமாக உலக வல்லரசுகள் தங்களது வியாபாரத்திற்காகவும் அரசியலுக் காகவும் எத்தனையோ விடயங்களைச் செய்துவருகின்றன என்பது வெளிப்படை. இந்த உலக வல்லரசுகள் பொய்யை உண்மையாகவும் உண்மையைப் பொய்யாகவும் மாற்றுவதில் வல்லவை. இதற்கோர் உதாரணத்தைச் சொல்ல விரும்புகின்றேன்.

தென்கிழக்காசியப் பிரதேசம் தெங்குப் பொருட்களுக்குப் பெயர்பெற்றதாகும். அமெரிக்கா போன்ற நாடுகளில் தேங்காய் எண்ணெய்க்குக் கிராக்கி அதிகம். இன்றும்கூட அந்தக் கிராக்கி காணப்படுகின்றது. மேலைத்தேய நாடுகளின் ஓர் உற்பத்தி corn oil எனப்படும் எண்ணெய்யாகும். அதை நாம் vegetable oil என்று சொல்வோம். உண்மையில், மருத்துவ ரீதியில் தேங்காய் எண்ணெயைவிட corn oil உடலுக்குக் கேடானது. அதாவது, தேங்காய் எண்ணெய்யிலுள்ள saturated fatty acid என்பது corn oil இல் உள்ளதைவிடக் குறைவானது என்பதுதான் உண்மை. இதைப் பல ஆராய்ச்சிகள் உறுதிப்படுத்தி யிருக்கின்றன. ஆனாலும், அண்மையில் Harvard University இனைச் சேர்ந்த Professor ஒருவர் ஜேர்மனியில் நடைபெற்ற nutrition சம்பந்தப்பட்ட ஒரு மாநாட்டில் "Coconut oil is 'pure poison' " என்று பேசியிருக்கின்றார். இந்தச் செய்தி YouTube இல் அதிகப்படியாகப் பார்க்கப்பட்டிருக்கின்றது. "The New York Times" பத்திரிகையில் வெளியிடப்பட்டிருக்கின்றது. சம்பந்தப்பட்டவர்களின் நோக்கம் என்ன? அமெரிக்காவில் தேங்காய் எண்ணெயின் கிராக்கியைக் குறைப்பதுதான் அவர்களின் நோக்கம். இவர்கள் இன்றுவரை வியாபாரத்திற் காக உண்மையைப் பொய்யாக்கி, உலகத்திலுள்ள மக்களை மருத்துவ ரீதியில் ஏமாற்றி வருகின்றார்கள். அதேபோன்ற ஒன்றுதான் மன்னார் மனிதப் புதைகுழியிலிருந்து எடுக்கப்பட்ட எலும்புக்கூடுகள் தொடர்பான அறிக்கையும் என்று நான் சந்தேகிக்கின்றேன். வல்லரசின் புலனாய்வு அமைப்புக்களிடம் சிக்கிய ஓர் அறிக்கையாகவே இதனை நான் பார்க்கின்றேன். பல்லாயிரக்கணக்கானோர் வலுக்கட்டாயமாகக் கொடிய யுத்தத்தால் காணாமலாக்கப்பட்டனர்; இந்த நாட்டில் ஒரு தமிழினப் படுகொலை பகிரங்கமாக நிறைவேற்றப் பட்டிருக்கின்றது. வலுக்கட்டாயமாகக் காணாமலாக்கப் பட்டோரின் நீதியை எதிர்பார்க்கும் உறவுகளுக்கு இந்த நாட்டில், இந்த உலகில் என்றும் நீதி கிடைக்கப்போவதில்லை என்பதுதான் உண்மை. எனவே, இந்த காபன் பரிசோதனை அறிக்கையை மட்டும் வைத்துக்கொண்டு ஒரு முடிவுக்கு வர முடியாது. எனவே, மன்னார் மனிதப் புதைகுழி விடயத்தில் மறுபரிசீலனை செய்யப்பட்ட விசாரணை அவசியம் என்பதை நான் இந்த மேலான சபையில் கோரி நிற்கின்றேன்.

இந்து - கிறிஸ்தவ மக்கள் ஒற்றுமையாக வாழ்ந்த, வாழும் மன்னார் மண்ணில் இன்று ஓர் அசிங்கம் நிறைவேற்றப் பட்டிருக்கின்றது. அதுவும் சமயப் போதனை செய்யவேண்டிய ஒரு பாதிரியார் முன்னிலையில் நடைபெற்றிருக்கின்றதென்பது கவலைக்குரியதே. அங்குள்ள மடுப் பிரதேசம் கிறிஸ்தவ மக்களுக்கு உரிய பிரதேசம்; அந்த மக்களின் புனித பிரதேசம். எனவே, அங்கு இந்துக்கள் அதற்கு உரிமை கோருவது பொருத்தமானதாக அமையாது. அதேபோல், திருக் கேதீஸ்வரம் இந்து மக்களின் புனிதப் பிரதேசம். பல நூற்றாண்டுகளுக்கு முன்பே பாடல்பெற்ற ஒரு புனிதத் தலம். எனவே, அதனைக் கிறிஸ்தவ மக்கள் உரிமைகோருவது சரியானதாக அமையாது. ஒவ்வொருவரும் மதமென்பதைப் பார்க்கும் பார்வை வேறு, கடைப்பிடிக்கும் மார்க்கம் வேறு. எனவே, அதைவிடுத்து அனைத்து மதங்களும் இறுதியாகக் காட்டும்வழி ஒன்றே என்பதை நாங்கள் ஏற்றுக்கொள்ள வேண்டும். அன்பு, பரிவு, உண்மை, நேர்மை கொண்டதோர் அழகிய வாழ்க்கையே அனைத்து மதங்களின் இறுதி நோக்கமாக அமைகின்றதென்பதுதான் உண்மை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் உள்ளது.

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
அரசியலமைப்புக்கான 13ஆவது திருத்தம் ராஜீவ் - ஜே.ஆர். ஒப்பந்தத்தின்மூலம் கொண்டுவரப்பட்டது. ஆனாலும், இன்று அதை வலுவிழக்கச் செய்கின்றார்கள். மகாவலி அபிவிருத்தி அதிகாரசபை, வனவளப் பிரிவு, தொல்பொருள் ஆராய்ச்சித் திணைக்களம், வன ஜீவராசிகள் திணைக்களம், பாதுகாப்புப் படையினர் என அனைத்துத் தரப்பினரும் இந்தத் திருத்தத்தை உருக்குலைக்கின்றார்கள். எனவே, இங்கு ஓர் அரசியல் யாப்பு இருந்தாலும் ஒன்றுதான்; புதிய ஓர் அரசியல் யாப்பு வந்தாலும் ஒன்றுதான். இந்தச் சட்டங்களுக்குக் கீழ்ப்பட்டு இந்த அரசாங்கத்திலோ அல்லது இந்த நாட்டிலோ நிகழ்வுகள் நடக்கின்றனவென்று யாரும் கூறிவிட முடியாது. இன்று தொல்பொருள் ஆராய்ச்சித் திணைக்களம் என்ன செய்கின்றது? இன்று அதன் Director General நீதிமன்றத்தில் பொய் சொல்லியிருக்கின்றார். அதாவது, செம்மலையிலுள்ள சைவக் கோயில் அமைந்திருக்கின்ற இடம் ஒரு புத்த கோயில் இருந்த இடமென்று பொய் சொல்லியிருக்கின்றார். நீதிமன்றத்தில் பொய்யுரைக்கும் Director General ஐ இவர்கள் தண்டிப்பார்களா? பொய்ச்சாட்சி சொல்வதெல்லாம் இவர்களுக்குச் சாதாரணமாகிப் போய்விட்டது. அந்த இடத்தினை செட்டிமலையென்று தெரிவித்து gazette notification செய்யப்பட்டிருக்கின்றது. ஆனால், செட்டிமலை யென்ற ஒரு பிரதேசமே அங்கு இல்லை. முதலில் அந்த gazette notification ஐத் திருத்துவதற்கான நடவடிக்கைகளை எடுக்கவேண்டும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය.

Order, please! ඊට ප්‍රථමයෙන් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, (மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

[අ.භා. 5.04]

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ලෝක කාන්තා දිනය. අද මේ අවස්ථාවේ මේ ගරු සභාවේ මූලාසනයේ ඉන්නවා, කාන්තාවක්. අද මේ අවස්ථාවේ මේ ගරු සභාවේ කථා කරනවා, කාන්තාවක්. ලෝක කාන්තා දිනය විධියට ලෝකය අද දිනය සැමරුවත්, අද ලංකාව ඇතුළේ මේක කාන්තා දිනය නොවෙයි; ඊනියා කාන්තා දිනය. අපේ රටේ සියයට 52ක්, 53ක් කාන්තාවෝ ජීවත් වෙනවා. සියයට 56ක් ඡන්දදායිකාවෝ ඉන්නවා. කනගාටුවට කාරණාව නම්, නිදහස ලැබිලා අවුරුදු 71ක් වන මේ ලංකා භූමියේ තවමත් අපි අම්මලාව රට පටවලා, ඒ අම්මලාගේ පවුල් නන්නත්තාර කරලා, විනාශ කරලා ඒ අම්මලාගෙන් යැපෙන රටක ජීවත් වීමයි. අද කාන්තා දිනයේදී ඒ පිළිබඳව කනගාටු වෙන ගමන්, ඒ පිළිබඳව මතක් කරලා දෙන ගමන් මම මේ කාරණය කියන්න කැමැතියි.

අද අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ විශේෂ දෙයක් සිද්ධ වුණා. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අධීක්ෂණ මන්ත්‍රීවරිය විධියට මම අද ඒ ගැන සතුටු වෙනවා. පයින් ගමන් කිරීමේදී, දුම්රියේ ගමන් කිරීමේදී, බස් රියේ ගමන් කිරීමේදී කාන්තාවන්ට සිද්ධවන ලිංගික, මානසික හා වාචික හිරිහැර අවම කිරීම සඳහා කාන්තාවන්ගේ යෝජනාවකට කන් දීලා අර්ජුන රණතුංග මැතිතුමා අද උදේ පාන්දර අපූරු වැඩක් පටන් ගත්තා. මුලාරම්භයක් විධියට එය දුම්රිය හතක පටන් ගත්තා. ඒ දුම්රියවල උදේටත්, හවසටත් වෙනම කාන්තා මැදිරියක් අද සිට ආරම්භ කළා. මෑත ඉතිහාසයේ මේ ආණ්ඩුවෙන් විතරයි මේක සිද්ධ වුණේ. මාධ්‍ය මිතුරන්ගෙන් මම ඉල්ලා සිටිනවා, ආණ්ඩුව විවේචනය කරනවා වාගේම මේ වාගේ හොඳ දෙයක් වුණාම මේකත් රටේ ජනතාවට දැන ගන්න තියන්න; රටේ ජනතාවට මේ පිළිබඳවත් තොරතුරු දෙන්න කියලා. මොකද, අපේ තිබෙන ලොකු අඩු පාඩුවක් තමයි, මේ ආණ්ඩුවෙන් කරන හොඳ දේවල් ගොඩාක් වෙලාවට ජනතාව අතරට යනවා අඩුවීම. දැන් මේ අය වැය ගැන හිතන්න. මේ අය වැය මෙතෙක් ඉතිහාසයේ මුදල් ඇමති කෙනෙක් ඉදිරිපත් කරපු හොඳම අය වැය. මම ජීවත් වෙච්ච කාලය අවුරුදු 31ක්. යමක් තේරෙන කාලය අවුරුදු 15ක් කියලා ගනිමු. මම ඉගෙන ගන්න කාලයේ ඉඳන් -අධ්‍යාපනය ලබන කොටත්- අද වෙන කල් අය වැය නොයෙක් අවස්ථාවල කියවලා තිබෙනවා. හැබැයි, මේ වාගේ සෑම සමාජ මට්ටමක්ම, සෑම සමාජ කොට්ඨාසයක්ම නියෝජනය වෙන ආකාරයට, දීර්ඝ කාලීනව සැලසුම් සහගතව හදපු අය වැයක් මගේ ඇස ගැටිලා නැහැ.

මේ අය වැය ගෙනෙන්න කලින් විපක්ෂයෙන් ඉදිරිපත් කළ චෝදනාව තමයි, අපි මැතිවරණය බලාගෙන අය වැයක් ගෙනෙනවාය කියලා. මේ අය වැය මැතිවරණය බලාගෙන නොවෙයි, අනාගත පරපුර සඳහා අනාගතය දිහා බලාගෙන හදපු අය වැයක්. මා එහෙම කියන්නේ ඇයි? උදාහරණයක් විධියට ගත්තොත්, මේ අය වැයෙන් විශේෂයෙන්ම අපොස උසස් පෙළ හොඳම results ගන්නා දරුවන් කිහිපදෙනකු ලංකාවෙන්ම තෝරාගෙන හාවර්ඩ්, ඔක්ස්ෆර්ඩ් වැනි විශ්වවිද්‍යාලවලට යන්න අවස්ථාවක් ලබා දෙනවා. පසුගිය දවස්වල මන්ත්‍රීවරයෙක්, මේ කාර්යය ප්‍රායෝගිකව කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය අහලා තිබුණා මා දැක්කා. මා කියන්නේ, මේ සඳහා තේරුණු දරුවකුට අධ්‍යාපන කටයුතු සඳහා, එක්කෝ half sholarship එකක්, එහෙම නැත්නම් full sholarship එකක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ඒ අදාළ විශ්වවිද්‍යාලත් එක්ක යම්කිසි ගිවිසුමකට එන්න ඕනෑය කියලායි. මෙපමණ කාලයක් වන කල් අපේ දරුවකු ඔබගේ විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නවා, ඒ සඳහා half sholarship එකක් හෝ full sholarship එකක් ලබාදෙන්න කියලා යම්කිසි ගිවිසුමකට එන්න ඕනෑ. එවැනි දීර්ඝ කාලීන හොඳ සැලසුම් තමයි මේ අය වැය ලේඛනයේ තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කනගාටුවට කාරණාවක් තමයි, මෙය " සිහින අය වැයක්" කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් පසුගිය දවස්වල කියා සිටි එක. ඇයි, අපට සිහින දකින්න බැරිද? අපි සිහින දැකිය යුතුයි. මේ ආණ්ඩුව පෙරළා, නැවතත් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා හෝ ඔබතුමන්ලාගේ ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ හෝ ජනාධිපති පුටුවට ගෙනැවිත්, ඉතුරු හොරකම් ටිකත් හොඳට කරගෙන, ඉතුරු මිනී මැරුම් ටිකත් ලස්සනට කරගන්න එක නම් ඔබතුමන්ලාගේ සිහිනය, ඔබතුමන්ලා ඒ සිහිනය දකින්න. අපේ සිහිනය ඒක නොවෙයි. අපේ සිහිනය තමයි, හැම දාම යැපුම් මානසිකත්වයෙන් ඉන්න මේ රටේ ජනතාවගේ, හැම දාම නිකම් ලැබෙන කල් උඩ බලාගෙන ඉන්න, ආකල්පමය වෙනසක් සිද්ධ වුණේ නැති ජනතාවගේ ආකල්පමය වෙනසක් සිද්ධ කරලා, මේ රටේ දණ ගහගෙන ඉන්න මිනිසුන් තව අවුරුදු 10කින් හෝ 15කින් හෝ කකුල් දෙකෙන් නැඟිට්ටවීම තමයි අපේ සිහිනය. ඒ නිසා තමයි අපි අනාගතය දිහා බලා මෙවැනි ඉතාමත් විශිෂ්ට අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ සිහිනය ඊළඟ වතාවේ ජනාධිපතිවරණය දිනන එක නේ. ඒ සිහිනය ඔබතුමන්ලා දකින්න. විපක්ෂයක් වුණාම සිහින දකින එක හොඳයි.

අය වැයක් ඉදිරිපත් කළාම ඒ අවුරුද්ද අවසාන වනකොට ඒ අය වැයේ සඳහන් ඔක්කොම වැඩ ටික අවසන් කරන්න ඕනෑය කියලා හිතනවා. එහෙම එකක් නැහැ. අපේ ආණ්ඩුව 2025 වන කල් පවත්වාගෙන යනවා. මේ වැඩ කොටස කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් බෙදාගෙන, 2025 වන කල් ඒ වැඩ ටික කරගෙන යන්නයි අපට අවශ්‍ය වන්නේ. ඒක තමයි අපේ plan එක, ඉදිරියට කරගෙන යන වැඩ කොටස ඒ විධියටයි අපි කරන්න හිතාගෙන ඉන්නේ. ඔබතුමන්ලාගේ සිහිනය යම්කිසි දවසක සැබෑවෙයි කියලා හිතනවා නම්, ඔබතුමන්ලා ආණ්ඩුවක් කරගෙන යන කාලයක හෝ ඔබතුමන්ලාට කැත නැතුව, ලජ්ජා නැතුව, භය නැතුව මේ සියලුම යෝජනා ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඕනෑම ආණ්ඩුවක් මේ යෝජනා ක්‍රියාත්මක කරනවා නම් රටේ ජනතාවට ප්‍රතිලාභයක් ලැබෙනවා මිසක්, අනාගත පරපුර කකුල් දෙකෙන් නැඟිටින්න පුළුවන් ජනතාවක් බවට පත් කරනවා මිසක්, වෙන කිසි දෙයක් වෙන්නේ නැහැ. විපක්ෂය විසින් මේ අය වැය පරාජය කරනවාය කියන්නේ මොන හේතුව නිසාද කියලා මට හිතා ගන්න බැහැ. මොන නරක අදහසක්ද

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

මෙතැන තිබෙන්නේ? මේ අය වැය තුළින් සිදුවන අවාසිය මොකක්ද? පුළුවන් නම් මෙම අය වැය යෝජනාවල අවාසියක් තිබෙන එක යෝජනාවක් කියන්න.

මේ විපක්ෂය තරම්, මහින්ද රාජපක්ෂ මැතිතුමා තරම්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තරම් යුද හමුදාවේ ඉන්න සෙබළුන් විකුණාගෙන කාපු නායකයන් ලෝකයේ කොහේවත් නැහැ. ඔබතුමන්ලා පසුගිය දවස්වල මේ ආණ්ඩුවට මොකක්ද කිව්වේ? යුද හමුදාවේ රණ විරුවන්ගෙන් පළි ගන්නවාය කිව්වා; සංඝ රත්නයෙන් පළි ගන්නවාය කිව්වා; අපට සංඝ රත්නය ගැන, බුද්ධාගම ගැන කිසි හැඟීමක් නැහැයි කිව්වා. "ගම්පෙරළිය" වැඩසටහනින් රුපියල් ලක්ෂ 5ක් විහාරස්ථානවලට දුන්නා. දැන් ඒ මුදල රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කරලා තිබෙනවා. අපි ඔබතුමන්ලා වාගේ ස්ටේජ්වලට නැඟලා, කියව-කියවා, පපුවට ගහගන්නේ නැති වුණාට, අපේ අග්‍රාමාත්‍යතුමා යන යන තැන පන්සල්වල රැස්වීම් - meetings - පවත්වන්නේ නැති වුණාට, මේ රට, ජාතිය, ආගම සහ සෙබළුන් රැක ගැනීම සඳහා, ඔවුන්ගේ වැඩ කටයුතු සඳහා, ඔවුන්ගේ අනාගතය සඳහා දීර්ඝ කාලීනව කරන්න ඕනෑ හැම දෙයම අද වනකොට plan කරලාත් ඉවරයි; ඒවා කරලාත් ඉවරයි; ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වන දේවලුත් අපි plan කරලා ඉවරයි. දැන් බලන්න, මේ සෙබළුන් ගැන. ඔබතුමන්ලා තරම් මේ සෙබළුන් විකුණාගෙන කාපු ආණ්ඩුවක් ලෝකයේ වෙන කොහේවත් නැහැ.

පසුගිය දවස්වල කිව්වා අපි රණ විරුවන්ගෙන් පළි ගන්නවා කියලා. ඒ කතන්දර කියන එක් කෙනෙකුටවත් මේ අවුරුදු 10ටම රණ විරුවන් වෙනුවෙන් රුපියලක් වැඩි කරන්නට හිතුනේ නැහැ. ඡන්දයක් ළඟ එනකොට හැම දාම ඔබතුමන්ලාගේ හොඳම ආයුධය තමයි රණ විරුවා. අපි කවදාවත් රණ විරුවා ආයුධයක්, අතකොළුවක් කර ගත්තේ නැහැ. අපි කවදාවත් ඔවුන් විකුණාගෙන කන්න හැදුවේ නැහැ. හැබැයි, අපි ඔවුන් වෙනුවෙන් කළ යුතු යුතුකම් ඉෂ්ට කළ ආණ්ඩුවක්.

මේ හොඳ දේවල්ද දැන් ඔබතුමන්ලා පරාජය කරන්නට හදන්නේ? ඔබතුමන්ලා ඒවා පරාජය කරනවා නම්, අපි පරාජය කරනවා ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය. මේ වෙනකොට පසු පෙළ මන්ත්‍රීවරුන් 25කට වැඩිය මේ සඳහා එකට ඉන්නවා, එක පෙළට හිටගෙන ඉන්නවා. ජනාධිපතිතුමා බෝල්පොයින්ට් පෑනෙන් අත්සන් කරලා, සරල ජනාධිපතිවරයකු විධියට තමයි පත් වුණේ.

මම කියවන්නම් ජනාධිපතිවරයාගේ පසුගිය වැය ශීර්ෂ. ජනාධිපතිවරයා වෙනුවෙන් 2018දී අය වැයෙන් වෙන් කරලා තිබුණා රුපියල් මිලියන 10,887ක්. 2019දී ජනාධිපතිවරයා වෙනුවෙන් රුපියල් මිලියන 13,560ක් වෙන් කරලා තිබෙනවා. ඊටත් වැඩියි කියලා තමයි කියන්නේ. මේ අය වැය හරහා සියලු අමාත්‍යාංශවලට ලබා දීලා තිබෙන මුදල්වල එකතුව වාගේ ප්‍රමාණයකින් අඩක පමණ ප්‍රමාණයක් බෝල්පොයින්ට් පෑනෙන් ලියපු, සරල ජනාධිපතිතුමා එතුමාගේ කාර්යාල වැඩවලට විතරක් වෙන් කරගෙන තිබෙනවා. ඒ ගමන්ම මා මේ සියලුදෙනාටම ඇහෙන්නට කියවන්නම් අග්‍රාමාත්‍යතුමාගේ 2018 වැය ශීර්ෂය කොපමණද කියලා. ඒක රුපියල් මිලියන 1,911යි. 2019දී එය රුපියල් මිලියන 1,620යි. මේ අවුරුද්දේ පසුගිය අවුරුද්දේ තිබුණාටත් වඩා අඩු කරගෙන. කටින් බතල හිටෙව්වාට හරියන්නේ නැහැ. තමුන් සරලයි කියලා, තමුන් ගමරාල කියලා, ගම්වල අරක කළා, මේක කළා, විරිදු කිව්වා කියලා කටින් කිව්වාට හරියන්නේ නැහැ. සරල බව පෙන්වන්නට ඕනෑ ක්‍රියාවෙන්. ඒ නිසා මා විශ්වාස කරනවා මේ රටේ ජනතාව, තවදුරටත් වැඩ කරන්නේ කවුද, කටින් බතල හිටවන්නේ කවුද කියලා හරියට තේරුම් ගත යුතුයි කියලා. ඉදිරි මැතිවරණවලදී ඒවා ඔබේ ඔළුවට ගත යුතුයි.

කුඩු වෙළෙඳාම් කරන පුද්ගලයන්ට මරණ දඬුවම දෙන්න ඕනෑ කියලා ජනාධිපතිතුමා පසුගිය දවස්වල යෝජනාවක් ගෙනාවා. කාන්තාවක් විධියට මාත් ඒකට එකඟයි. ඒ යෝජනාව පළමුවෙන්ම මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ මගේ පියා, 2002දී. ඒ යෝජනාව ස්ථිර කළේ ෆීලික්ස් පෙරේරා හිටපු ඇමතිතුමා. පැහැදිලිවම ඒ තීරණය ගැන අපි කෙළින් ඉන්නවා; එය කළ යුතුයි. ඉන් පසුව නැවතත් මා යෝජනාවක් ගෙනාවා, -ඒ කුඩු වෙළෙඳාම්කාරයන් සම්බන්ධව නොවෙයි- ඉතාම කනගාටුදායක විධියට බලහත්කාරකමකට ලක් වුණු සේයා සඳෙව්මි දියණියට කළ අපරාධයෙන් පසුව, බාල වයස්කාර දරුවන් සහ දැරියන් දූෂණය කොට මරා දමන පුද්ගලයන්ට මරණ දඬුවම දිය යුතුයි කියලා. ඒකත් ගෙන ආ යුතුයි.

හැබැයි, මට මතකයි ඒ දවස්වල මංගල සමරවීර ඇමතිතුමා ලංකාව වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගිහින්, මරණ දඬුවම වාගේ ක්‍රියාමාර්ග ලංකාව ඇතුළේ ක්‍රියාත්මක වෙන්නේ නැහැයි කියලා, ඒ එකඟතාවට ආවා. ඉන් පසුවයි මා ඒ යෝජනාව ගෙනාවේ. මංගල සමරවීර ඇමතිතුමා මට කිව්වා, "හිරුනිකා අපි මෙහෙම එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. අපට මේක ගොඩාක් අමාරු වැඩක් වේවි. යෝජනාව හොඳ එකක්, හැබැයි අපට හුඟක් අමාරු වැඩක් වේවි" කියලා. මා ඒ යෝජනාව ගෙනාවේ ඇත්තටම හිතට ආපු කනගාටුවට. මාත් අම්මා කෙනෙක්. අපේ දරුවෝ පරිස්සම් කර ගන්න අපට හැකියාව තිබුණාට, සමහර දුප්පත් අම්මලා තාත්තලාට තමන්ගේ දියණිය, පුතා ගෙදර දාලා විදේශ රැකියාවලට යන්න වෙනවා. එහෙමත් නැත්නම් කුමන හෝ රැකියාවකට යන්න වෙනවා. එවැනි අවස්ථාවල ඒ දරුවන් බලාගන්නේ ආච්චි, සීයා එහෙමත් නැත්නම් මාමලා, නැන්දලා. පවුලේ එවැනි අයගෙන්ම දරුවන් අතවරයට පත් වන අවස්ථාත් තිබෙනවා. ඇත්තටම මා සද් භාවයෙන් ගෙනාපු යෝජනාවක් ඒක.

මෙතැන ගැටලුව තිබෙන්නේ මෙයයි. ජනාධිපතිතුමා මරණ දඬුවම දෙන්න කියලා තිබෙනවා කුඩු වෙළෙඳාම්කාරයින්ට. ඒක සද් භාවයෙන්ද ගෙනාවේ? ජනාධිපතිතුමාට මා කියනවා එක පාරක් දකුණ බලන්න, තව පාරක් වම බලන්න, නැවතත් දකුණ බලන්න, නැවතත් වම බලන්න, නැවතත් තමුන්ගේ ඉස්සරහා බලන්න, පිටුපස්ස බලන්න, දැලක් එළන්න කියලා. මේ ලංකාවට ප්‍රධාන වශයෙන් කුඩු, මත් ද්‍රව්‍ය ගෙනෙන බිස්නස්කාරයෝ ටික ඉන්නේ ඔබතුමාගේ වටේ. වගකීමක් ඇතුවයි මා කියන්නේ. පසුගිය දවස්වල ඒ බව ඉතාම පැහැදිලිව අපි රූපවාහිනියෙනුත් දැක්කා.

මරණ දඬුවම ගෙනාවාම මරණ දඬුවමට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේත් කාන්තාවන්ටමයි. ඇයි මම එහෙම කියන්නේ? දැන් ඔබ ගිහිල්ලා බලන්න. දැන් වැලිකඩ බන්ධනාගාරයේ, මැගසින් බන්ධනාගාරයේ වැඩිපුර ඉන්නේ කාන්තා රැඳවියන්. හෙරොයින් මිලිග්‍රෑම් දෙකකට වඩා සන්තකයේ තියාගත්තොත් ඒක මරණ දඬුවම ලැබිය යුතු වරදක්. ඔබ කල්පනා කරලා බලන්න. මේ කාන්තාවන් කුඩු ගහන හින්දාද කුඩු ටිකක් තමන්ගේ පර්ස් එකේ, එහෙම නැත්නම් හැට්ටේ අස්සේ තියාගෙන ඉන්නේ?

නැහැ. වනාතමුල්ල පැත්තේ, කොළොන්නාව පැත්තේ, වැල්ලම්පිටිය පැත්තේ කුඩු වෙළෙඳාම් කරන මුදලාලිලාට කුඩු ටික එහාට මෙහාට ප්‍රවාහනය කරන්න අපහසුයි. සාමාන්‍යයෙන් කාන්තාවන් ගැන තමයි පොලීසිය සැක නොසිතන්නේ. එම නිසා කුඩු පැකට් එක හැට්ටෙ අස්සේ ගහගෙන අහවල් තැනට ගිහිල්ලා

දීලා එන්න කියලා ඒක කාන්තාවට දෙනවා. ඒ අතර තුර ඒ කාන්තාව පොලීසියට අහු වුණොත්, ඇය සන්තකයේ තිබෙන කුඩු ප්‍රමාණය මිලි ග්‍රෑම් දෙකකට වඩා වැඩි නම් ඇය හිර ගෙදරට දානවා; අවුරුදු ගණනක් තිස්සේ නඩු අහනවා. එතකොට ගෙදර ඉන්න ළමයි ටික අනාථ වෙනවා, මනුස්සයා අනාථ වෙනවා, නෑදෑයෝ ටික අනාථ වෙනවා. මම ඒ කාන්තාව කරන වැඩේ හොඳයි කියලා කියනවා නොවෙයි. ඒ බොහෝ කාන්තාවන් ඉගෙන ගත්තේ නැති උදවිය. ඔවුන්ගේ දරුවන්ට පාන් ගෙඩියක් ගෙනියන්න, හාල් ටිකක් ගෙනියන්න, කිරි පැකට් එකක් ගෙනියන්න, එදා දවස ඇතුළත ආදායමක් ලබන්න රුපියල් 2,000කට, 3,000කට තමයි ඒ වැඩේ කරන්නේ. රුපියල් 2,000ක්, 3,000ක් හම්බ කරගන්න තමන් සන්තකයේ කුඩු මිලි ග්‍රෑම් 2කට වඩා තබාගත් කාන්තාව තමයි හිර ගෙට ගිහිල්ලා ඉන්නේ. අද වන විට කාන්තාවන් කීදෙනෙක් ඉන්නවාද මරණ මංචකයේ? ගරු ජනාධිපතිතුමා ගෙනෙන මරණ දඬුවම හරහා ඇත්තටම එල්ලන්න යන්නේ කාන්තාවන් නම්, කල්පනා කර බලන්න, අපි අපේ රටට මොකක්ද කරගෙන තිබෙන්නේ කියලා. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා කෙළින් ඉඳගෙන පැහැදිලිවම කුඩු වෙළෙඳාමට ප්‍රධාන වශයෙන් සම්බන්ධ වෙලා ඉන්න, ප්‍රධානම මුදලාලිලා, දේශපාලනඥයෝ අල්ලාගෙන මරණ දඬුවම දෙන්න. ඒ පිළිබඳව මගේ කිසි විරුද්ධත්වයක් නැහැ. ඒක තමයි කළ යුතු වැදගත්ම දේ. නමුත්, තමන්ගේ ළමයාට කන්න දෙන්න කීයක් හරි සොයා ගන්න කුඩු පැකට් එක හැට්ටෙ අස්සේ දමාගෙන එළියට ගිය අහිංසක දුප්පත් අම්මා එල්ලා මරණවා නම්, රටක් විධියට අපි කොහේද ඉන්නේ? කාන්තා දිනය නිසායි මම මේක කියන්නේ. එම නිසා තමුන්ට හිතෙන හිතෙන විධියට වීර කථා කිව්වාට හරියන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ දවස්වල -යුද්ධය කාලයේ- කිව්වා, "කිසිම රටකින් ඇඟිලි ගහන්න එපා, මගේ රටේ මට ඕනෑ දේ කරන්නේ, යුද්ධය නවත්වන්න කියලා කිසිම රටකින් මට බලපෑම් කරන්න එන්න එපා" කිව්වා. ඒ කාලයේ හැටියට ඒක ඉතාම හොඳ කථාවක්. ඒකෙන් මිනිසුන්ගේ morale එක වැඩි වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මට තව විනාඩියක කාලයක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වෙලාවේ මිනිසුන්ගේ ලේ කුපිත වෙලා තිබුණේ. ඒ කාලයේ එහෙම කිව්වාම මිනිසුන්ට හොඳ morale එකක් එනවා. දැන් මේ රටේ යුද්ධයක් නැහැ. සාමකාමී විධියට, වැදගත් විධියට දේශපාලනය කරගෙන යන කාලයක් මේක. නමුත් මේ කාලයේ කිව්වොත්, "මගේ රටේ ප්‍රශ්න මම විසඳා ගන්නම්, මානව හිමිකම් කථා පැත්තකට දාන්න" කියලා, අපට හොම්බෙන් යන්න වෙන්නේ. රටක් විධියට අපේ රට දණ ගහගෙන ඉන්න රටක්. පසුගිය කාලයේ හිටපු පාලකයෝ අවුරුදු ගණනක් තිස්සේ අපේ රට දණ ගස්වලා තිබෙන්නේ. අපේ රට දුප්පත් රටක්. අපේ රට හුදෙකලාවේ ජීවත් වෙන්න පුළුවන් රටක් නොවෙයි. ලෝකයේ තිබෙන ප්‍රධාන රටවල් පැත්තකට දාලා, "උඹලා ඕනෑ දෙයක් කර ගනිල්ලා, මට ඕනෑ දේ මම කරන්නේ" කියලා අපට හිතුවක්කාර දේවල් කරන්න බැහැ. මම කියන්නේ නැහැ, තැන තැන ගිහිල්ලා රටවල්වලට නැවෙන්න ඕනෑ කියලා. හැබැයි, පාලකයන් විසින් අපි නැවෙන තත්ත්වයට පත් කරලා ඉවරයි. රටක් විධියට අපි හුදෙකලා වුණොත්, නැවතත් GSP සහනය නැති වුණොත්, අපි නැවතත් අන්තර්ජාතික වශයෙන් තනි රටක් විධියට කොන් වුණොත් කවදා හෝ දවසක අපේ ළමයින්ට යන කල දසාව මොකක්ද? රුසියාව, ඇමෙරිකාව වාගේ අපේ රටත් මාරම රටක් නම්, අපි මාරම තැනකට ඇවිල්ලා නම් ඔය පණ්ඩිත කථා කිව්වාට කමක් නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
ඇත්තටම බොහෝදෙනා අය වැය පිළිබඳව හැම දේම කථා කළා. නමුත් මට මේ ටික කියන්න අවශ්‍ය වෙලා තිබුණා. ඉතින්, බැටළු හම පොරවා ගත්ත සමහර පාලකයන්ගෙන් මම ඉල්ලා සිටිනවා, "එක්කෝ ඇත්තටම බැටළුවා වාගේ ඉන්න, එහෙම නැත්නම් ඇත්තටම වෘකයා වාගේ ඉන්න" කියලා. ඒ අතර මැද සිටියොත් කවදා හෝ දවසක මේ රටේ මිනිසුන් විසින්ම උත්තර දීලා අවශ්‍ය වැඩ කටයුතු කරලා කොයි තැනකට යවයිද කියන්න දන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Sivasakthi Ananthan, please. You have 13 minutes.

[பி.ப. 5.21]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்ட விவாதத்திலே எனக்கும் பேசுவதற்கு நேரம் தந்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன். ஜனநாயகத் தினை நிலைநாட்டுவதற்காகப் போராடுகின்ற தமிழ்த் தரப்பின் ஜனநாயக மறுப்புக்கு எதிராகக் கடந்த ஒன்றரை வருடங்களாக நான் முன்னெடுத்திருந்த இடைவிடாத போராட்டத்தின் காரணமாக இன்று இந்தச் சபையில் உரையாற்றுவதற்கு எனக்குச் சந்தர்ப்பம் கிடைத்திருக்கின்றது. இந்தச் சந்தர்ப்பத்தில் நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற எங்களு டைய பிரதேச மக்களுடைய தேவைகளையும் மற்றும் பொதுவான விடயங்களையும் இங்கே முன்வைக்க விருக்கின்றேன்.

2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் எதிர்பார்க்கப்படும் மொத்த வருமானம் 2,400 பில்லியன் ரூபாயாகவும் மொத்தச் செலவினம் 4,550 பில்லியன் ரூபாயாகவும் உள்ளது. துண்டுவிழும் தொகை 2,150 பில்லியன் ரூபாயாக என்றுமில்லாதவாறு காணப்படுகின்றது. மேலும், நாட்டின் மொத்த வருமானத்தினைவிடவும் மொத்தச் செலவினமானது இரண்டு மடங்காக இருக்கின்றது. அதாவது, துண்டுவிழும் தொகையானது ஏறத்தாழ நூறு வீதமாகக் கணிக்கப்பட்டுள்ளது. துண்டுவிழும் தொகை இவ்வாறு உயர் சதவீதத்தில் இருக்கின்றபோதும், அரசாங்கம் எதிர்பார்க்கும் வருமானம் கிடைத்தால் மட்டுமே இவ்வாறு துண்டுவிழும்

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

தொகை அமையும். அவ்வாறு இல்லாதுவிட்டால் துண்டு விழும் தொகை மேலும் அதிகரிக்கும்.

இது ஒருபுறமிருக்கையில், வடக்கு, கிழக்கிற்கு 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்துள்ளதாகவும் 15,000 செங்கல் வீடுகள் அமைத்தல் உள்ளிட்ட பல செயற்பாடுகள் மேற்கொள்ளப்படவுள்ளதாகவும் கூறப்படுகின்றது. குறிப்பாக, இந்த வரவு செலவுத் திட்டத்தில் வடக்கு, கிழக்கிற்கு அள்ளி வழங்கியதுபோன்றதான தோற்றமொன்றினை மிக அழகாக வெளிப்படுத்திக் காட்டியிருக்கிறார் நிதி அமைச்சர் அவர்கள். ஆனால், வடக்கு, கிழக்கிற்கு ஒதுக்கப்பட்டுள்ள தொகை உட்பட எதிர்பார்க்கப்படும் வருமானமானது சர்வதேச நாடுகளின் உதவிகள், நன்கொடைகள் மற்றும் முதலீடுகள் மூலமே கிடைக்கவுள்ளதாக அமைச்சர் அவர்கள் தெளிவாகக் குறிப்பிட்டுள்ளார்.

கடந்த நான்கு ஆண்டுகளில் எத்தனையோ எதிர்பார்ப்புக்களை அள்ளி வழங்கியே கூட்டு அரசாங்கம் வரவு செலவுத் திட்டத்தினைச் சமர்ப்பித்து வந்திருக்கின்றது. இறுதியாகச் சமர்ப்பித்த நீலப் பசுமை வரவு செலவுத்திட்டத்திலும்கூட எதிர்பார்ப்புக்களின் அடிப்படை யிலேயே நாட்டின் வருமானம் கணக்கிடப்பட்டிருந்தது. கூட்டு அரசாங்கமாக ஆட்சிபீடத்தில் ஏறி, "புதிய அரசியல் யாப்பின்மூலம் தீர்வளிப்போம்" என்று நான்கு வருடங்களாகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைமைக்கு நம்பிக்கையளித்து, எதிர்க்கட்சித் தலைவர் பதவியையும் வழங்கினீர்கள். அத்தலைமையைப் பயன்படுத்தியே ஜெனீவாவில் இலங்கை மீதிருந்த பிடியை நீர்த்துப்போகச் செய்து, இனப் பிரச்சினைக்கான தீர்வில் கூட்டமைப்பை கொள்கையிலிருந்து விலக்கி, தமிழர்களின் அடிப்படைக் கோட்பாடுகளை உடைத்து, அற்பசொற்ப விடயங்களை ஏற்கச் செய்துவிட்டு, அவற்றைக்கூடத் தற்போது வரையில் வழங்காது ஏமாற்றிவிட்டீர்கள். உங்களுடைய ஆளும் அதிகாரத்திற்கான நன்மைகளைப் பெற்றதன் பின்னர் கூட்டமைப்பின் தலைமைக்கு வழங்கப்பட்டிருந்த எதிர்க்கட்சித் தலைவர் பதவியையும் திட்டமிட்டுப் பறித்துவிட்டீர்கள். இத்தகைய செயற்பாடுகள் சிங்களத் தலைவர்கள் ஒருபோதும் தமிழர்களுக்கு நியாயமான தீர்வை வழங்கமாட்டார்கள் என்பதைப் புடம்போட்டுக் காட்டியுள்ளது. இதற்குமேல் புதிதாக எதனையும் செய்ய வேண்டியதில்லை.

ஆனால், சிங்களப் பேரினவாதத் தலைமைகளின் மாயைக்குள் சிக்கிய தமிழ் தலைமைகள், இனி விட்டுக் கொடுப்பதற்கே இடமில்லாது விட்டுக்கொடுப்புக்களைச் செய்துவிட்டு, அற்பசொற்ப அதிகாரங்களைப் பெறுவதற்காக "நாங்கள் இராஜதந்திரமாக நகர்கின்றோம், சர்வதேசம் எம்முடன் இருக்கின்றது, இரண்டு தேசியக் கட்சிகளும் கூட்டாக இருக்கின்றன, புதிய அரசியலமைப்பை உருவாக்கி நாங்கள் தமிழர்களுக்கான நியாயமான தீர்வினைப் பெற்றுத்தருவோம்" என்று முரசறைந்து கொண்டிருந்தார்கள். ஈற்றில் நடந்தது என்ன? சிங்களப் பேரினவாதத் தலைமைகள் தமிழ்த் தலைமையை கறிவேப்பிலையாகப் பயன்படுத்தித் தூக்கியெறிந்துவிட்டார்கள். "தமிழ்த் தலைமையின் இராஜ தந்திரம் தோற்றுவிட்டது" என்று இலங்கைத் தமிழரசுக் கட்சியின் பாராளுமன்ற உறுப்பினர் சிறீதரனே பகிரங்கமாகக் கூறுமளவுக்கு நிலைமைகள் மோசமடைந்துள்ளன.

இப்படியிருக்கும்போது எமது பேரம் பேசும் சக்தியைப் பயன்படுத்தாமல், அரசாங்கத்தினை பாதுகாக்கும் நிகழ்ச்சி நிரலில் செயற்படும் சர்வதேசத் தரப்புக்களை ஆதரித்து அரவணைத்துச் செல்வதால் மட்டும் தமிழர்களுக்கு விடிவு கிட்டிவிடுமா? இராஜதந்திரம் என்ற பெயரால், சர்வதேசத்தின் நிகழ்ச்சி நிரலுக்குள் தமிழ்த் தலைமைகள் சிக்கி அந்த நிகழ்ச்சிநிரலை வலுப்படுத்திக்கொண்டிருக்கும் வரையில், எமக்கான விடிவு என்பது கேள்விக்குறியே!

தற்போது ஜெனீவா மனித உரிமைகள் கூட்டத்தொடரில் பிரித்தானியா தலைமையில் பிரேரணை கொண்டுவரப் படவுள்ளது. இதில் இலங்கை ஏற்கெனவே இணை அனுசரணை வழங்கி நிறைவேற்றப்பட்ட 30.1, 34.1 இலக்கத் தீர்மானங்களை நடைமுறைப்படுத்துவதற்கு இரண்டு வருடகால அவகாசம் வழங்கப்படவுள்ளது. இராஜதந்திரமும் சட்டமும் தெரிந்த பாராளுமன்ற உறுப்பினர் கூறுவது போன்று, இலங்கைமீது சர்வதேசக் கண்காணிப்பு இரண்டு வருடம் நீடிக்கப்படவுள்ளது என்றே வைத்துக்கொள்வோம். அதனால் நடைபெறப்போவது என்ன? எதுவுமே இல்லை! கடந்த காலத்தில் சர்வதேசத்தின் கண்காணிப்பின்கீழ் விடப்பட்டிருந்தபோது நடந்தது என்ன? "இப்பொழுதுதான் இலங்கை அரசாங்கம் நடைமுறைப்படுத்தத் தொடங்கி யுள்ளது" என்று கால அவகாசத்தைப் பெற்றுக்கொடுக்க முன்னின்று உழைத்தவரே சொல்கின்றார். "இந்நாள் ஜனாதிபதி மைத்திரியும் முன்னாள் ஜனாதிபதி மஹிந்தவும் ஜெனீவா பிரேரணைக்கு முற்றுப்புள்ளிவைக்கப் பார்க்கையில், நாமும் கால அவகாசம் வழங்குவதற்கு அனுமதிக்காதுவிட்டால் ஜெனீவாவில் இலங்கைமீதான பிடி அற்றுப்போய்விடும். அதன் பின்னர், ஐ.நா பிரேரணையைக் குப்பைத் தொட்டிக்குள்தான் போடவேண்டும்" என்று தமது செய்கைக்கு அர்த்தம் கற்பிப்பவர்கள், ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையில் இலங்கைமீதான பிடியை இறுக்குவதற்கு ஏன் சிந்திக்கவில்லை? அதற்குரிய முயற்சிகளை ஏன் எடுக்கவில்லை?

இலங்கைமீதான பிடியை இறுக்குவதற்காக மனித உரிமைப் பேரவையின் உறுப்பு நாடுகளுடன் அழுத்தமான கலந்துரையாடல்களில் ஈடுபட்டிருக்கலாம்; போராட்டங்களை முன்னெடுத்திருக்கலாம். இலங்கை அரசாங்கம் பொறுப்புக் கூறலை மறுதலித்துச் செயற்படுகின்றது, நியாயமாக நடப்பதாக இல்லை என்பதை சான்றா தாரங்களுடன் ஐ.நா. மனித உரிமைகள் ஆணையாளரிடத்தில் நிரூபித்திருக்கலாம். அதன்மூலம் மனித உரிமைகள் ஆணையாளருக்கு அழுத்தங்களைப் பியோகித்து இலங்கை விவகாரத்தினைப் பொதுச் சபைக்கு நகர்த்தி அதனையடுத்து மேற்கொள்ள வேண்டிய நடவடிக்கைகளை முன்னெடுத்திருக்க முடியும்.

இலங்கை விடயத்தினைப் பொதுச் சபைக்கு நகர்த்தியிருந்தால், பாதுகாப்புச் சபைக்கு நகர்த்துவதா, இல்லை விசேட தீர்ப்பாயத்திற்குக் கொண்டுசெல்வதா, இல்லை சர்வதேசக் குற்றவியல் நீதிமன்றத்திற்குக் கொண்டு செல்வதா என்பது பற்றிக் கலந்துரையாடப்பட்டிருக்கும்; தீர்க்கமான முடிவொன்றும் எடுக்கப்பட்டிருக்கும். ஆனால், அவ்வாறு செய்வதற்குப் பதிலாக, தற்போதைய இலங்கை அரசாங்கத்தினைப் பாதுகாக்கின்ற சர்வதேச தரப்பின் பிடிக்குள் சிக்கி, அந்த நிகழ்ச்சிநிரலுக்குள் செயற்படவே தமிழ்த் தலைமை விழைந்தது. அதற்காக, "புதிய அரசியலமைப்பு வரும், காணமாலாக்கப்பட்டவர்களுக்கான அலுவலகம் உருவாக்கப்படுகின்றது, இழப்பீட்டுப் பணியகம் உருவாக்கப்படவுள்ளது, புதிய பயங்கரவாதத் தடைச் சட்டம் வருகிறது. அதனால் அரசியல் கைதிகள் அனைவரும் விடுதலையாகவுள்ளனர், மஹிந்த அரசைவிட முன்னேற்றங்கள் உள்ளன" என்றெல்லாம் அரசாங்கக்

காப்பீட்டு வார்த்தைகளைச் சர்வதேசத்திற்குத் தொடர்ச்சியாகத் தமிழ் தலைமை வழங்கியது

தென்னிலங்கையில் அதிகாரத்திற்கான போட்டிகள் ஆரம்பித்துள்ள நிலையில் தற்போது புதிய அரசியலமைப்பு என்ற பேச்சுக்கே இடமிருக்காது. காணாமல் போனவர்களுக்கான அலுவலகம் உருவாக்கப்படும்போது பாதிக்கப்பட்டவர்களைக் கோரவுமில்லை. தற்போதுவரையில் அதன் பணிகள் நத்தை வேகத்திலேயே உள்ளன. அதனால் எவ்வாறு தீர்வினை வழங்க முடியும் இழப்பீட்டுப் பணியகத்திற்கு நிதி ஒதுக்கீடு செய்வதென்றால் அமைச்சரவையின் அனுமதி தேவையாக உள்ளது. அதனால், அதன் சுயாதீனமான செயற்பாடு என்பது கேள்விக்குறியாகின்றது. "புதிய பயங்கரவாதத் தடைச் சட்டம் உருவாக்கப்பட்டால் தமிழ் அரசியல் கைதிகள் விடுதலையாகமாட்டார்கள்" என்று சனாதிபதி சட்டத்தரணி கே.வி. தவராஜா பகிரங்கமாகக் கூறிவிட்டார். இவர் இலங்கைத் தமிழரசுக் கட்சியின் மத்திய குழு உறுப்பினராவார். மேலும், அந்தக் கட்சியின் கொழும்புக் கிளையின் தலைவரும்கூட. அத்துடன், புதிய பயங்கரவாதத் தடைச் சட்டத்தால் பாரிய ஆபத்துக்கள் இருப்பதாகவும் அவர் சுட்டிக் காட்டியுள்ளார்.

யதார்த்த நிலைமைகள் இவ்வாறு இருக்கின்றபோது, கொள்கைகளைக் கைவிட்டு அரசாங்கத்திற்கு முண்டு கொடுத்துக்கொண்டு, "இராஜதந்திரமாக நகர்கின்றோம்" என்று தொடர்ந்தும் அரசாங்கத்தினை அரவணைக்கும் சரணாகதிப் போக்கால்தான், தாயகத்திலும் புலம்பெயர் தேசங்களிலும் முன்னெடுக்கப்பட்ட போராட்டங்கள் மலினப்படுத்தப்பட்டன. பாதிக்கப்பட்ட தரப்பிலிருந்து நியாயமான கோரிக்கைகள் முன்வைக்கப்பட்டாலும், அவை கருத்தில் கொள்ளாது விடப்பட்டன. ஆகக்குறைந்தது வீதியில் இரண்டு ஆண்டுகளாக உறவுகளுக்காகவும் நில உரிமைக்காகவும் போராடுகின்ற மக்களைக்கூட ஏன் என்று கேட்காத கையறுநிலை உருவாகியுள்ளது.

தற்போது தமிழர்கள் அரசியல் அநாதைகளாக்கப் பட்டுள்ளனர். இந்த வரவு செலவுத் திட்டமும் அதனையே எடுத்துக்காட்டுவதாக அமைந்துள்ளது. எமது பிரதேசத்தை நிர்வகிப்பதற்கும் அபிவிருத்திகளை மேற்கொள்வதற்கும் எமக்குள்ள உரிமைகளைக் கேட்டால், "தொழிற்சாலை தருகிறோம், உங்கள் பகுதிகளுக்கான அபிவிருத்திப் பணிகளுக்கு நீங்களே திட்டங்களைக் கொடுங்கள், உங்களது திட்டங்களையும் பரிசீலனை செய்கிறோம்" என்று கதைசொல்கிறது அரசாங்கம்; காணாமல்போகச் செய்யப்பட்டவர்களுக்கு என்ன நடந்தது? என்று கூறுங்கள் என்றால், "மாதாந்தம் பணம் தருகிறோம்" என்கின்றது அரசாங்கம். எமது உரிமைகள் தொடர்பில் எத்தகைய கரிசனையும் கொள்ளாத, எமது மக்களின் காத்திருப்புக்கு எத்தகைய பதிலையும் முன்வைக்காத, இந்த அரசாங்கத்தின் வரவு செலவுத் திட்டத்தை ஆதரிப்பதற்கு ஏதாவது காரணம் இருக்கிறதா?

இன்றைய தினம் உலகம் முழுவதும் சர்வதேச மகளிர் தினம் அனுஷ்டிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இந்த நிலையிலே வடக்கிலும் கிழக்கிலும் பெண்களைத் தலைமைத்துவமாகக் கொண்ட கிட்டத்தட்ட 121,000க்கும் மேற்பட்ட குடும்பங்கள் இருக்கின்றன. இவர்களிலே பெரும்பாலானவர்கள் யுத்த காலத்திலே தங்களுடைய கணவன்மாரை இழந்தவர்கள். இதற்கப்பால், கடந்த யுத்த காலத்திலே இராணுவத்திடம் தங்களது உறவுகளைக் கையளித்த பல்லாயிரக்கணக்கான பெண்கள் இருக்கின்றார்கள். அதுமாத்திரமன்றி, நீண்ட காலமாகச் சிறையிலே இருக்கின்ற தங்களுடைய கணவன்மாரைப் பிரிந்து வாழுகின்ற பெண்கள் இருக்கின்றார்கள். காணாமலாக்கப்பட்டு இருக்கக்கூடியவர்களின் உறவினர்கள் கிட்டத்தட்ட 746 நாட்களாக வீதியோரத்திலே தொடர் போராட்டத்தில் ஈடுபட்டுக்கொண்டிருக்கிறார்கள். இன்று சர்வதேச மகளிர் தினம் அனுஷ்டிக்கப்பட்டபோதிலும், இலங்கையைப் பொறுத்தவரை, யுத்தம் முடிவடைந்து 10 வருடங்கள் கடந்தும்கூட, யுத்தத்தால் பாதிக்கப்பட்டிருக்கக்கூடிய பெண்களுக்கு இன்றுவரை நீதி கிடைக்கவில்லை. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து நான்கு வருடங்களாகின்றன. இந்த நான்கு வருட காலத்தில் இராணுவத்தினரிடம் கையளிக்கப்பட்டிருக்கக்கூடிய அவர்களுடைய கணவன்மார், பிள்ளைகள் விடயத்தில்கூட எந்த விதமான தீர்வும் கிடைக்கப்பெறவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
Okay.

அடுத்து, மலையகத்தைச் சேர்ந்த தோட்டத் தொழிலாளர்கள் தங்களுக்கு 1,000 ரூபாய் சம்பள உயர்வு கோரிப் பல வருட காலமாகத் தொடர் போராட்டங்களில் ஈடுபட்டுக்கொண்டிருக்கிறார்கள். ஆனால், இந்த வரவு செலவுத் திட்டத்திலும்கூட அவர்களுக்கு 1,000 ரூபாய் சம்பள உயர்வை வழங்குவதற்கு ஏற்றவிதத்தில் சரியான முறையிலே நிதி ஒதுக்கீடு செய்யப்படவில்லை. அண்மையிலே எங்களுடைய வவுனியா மாவட்டத்தைச் சேர்ந்த தர்மலிங்கம் பிரதாபன் என்ற ஓர் இளைஞன் இந்த தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் சம்பள உயர்வு வழங்கப்பட வேண்டும்; அவர்களுக்கு நிரந்தரமான குடியிருப்புக் காணி வழங்கப்படவேண்டும் என்று கூறி, இலங்கையைச் சுற்றிக் கிட்டத்தட்ட 2,500 கிலோமீற்றர் தூரம் துவிச்சக்கர வண்டிமூலம் பயணித்திருக்கிறார். ஏற்கெனவே, இவர் சமூகம் சார்ந்த பல சாத்வீக ரீதியான போராட்டங்களை முன்னெடுத்திருக்கின்றார். இப்படிப்பட்டவர்களுடைய கோரிக்கைகளை அரசாங்கம் செவிமடுக்க வேண்டுமென்று இந்த நேரத்திலே கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.35]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. නිදහසින් පසු වසර ගණනාවක් තිස්සේ මහත් අගාධයකට වැටුණු රටක ආර්ථිකය ගොඩ නඟලා, දෙකෝටි දසලක්ෂයක ජනතාවගේ සුබ විහරණය සඳහා වන ප්‍රශස්තම අය වැයක් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මහ පෙන්වීම යටතේ, අපේ මුදල් අමාත්‍ය ගරු

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මංගල සමරවීර මැතිතුමා පසුගිය 5වන දා ඉදිරිපත් කළා. ඒ ගැන මම සතුටු වෙනවා. මේ අය වැය ඉදිරිපත් කළ ගමන්ම, එක්සත් ජනතා නිදහස් සන්ධානය සැලුණා; සමහරුන් මෙතැන කථා කරගන්න බැරිව බහු බූත කථා කිව්වා; සමහරුන්ගේ කකුල් වෙව්ලන්න ගත්තා. මේ අය වැයෙන් වෙන් වූ මුදල් ටික ඉතාම පැහැදිලි ලෙස මේ රටේ සංවර්ධනයට යෙදෙව්වොත්, මේ අය වැයෙන් සිදු වන යම් යම් සේවාවන් නිසා ලබන මැතිවරණය නොවෙයි, 2030 දක්වාම ඉදිරියට යන්න අපට පුළුවන්කමක් ලැබේවි කියා මා කියනවා. ඒ නිසා ඒ අය සාධාරණයි. මේ යෝජනා දකින්නේත් නැතිව, මෙය ක්‍රියාත්මක වීම පිළිබඳව මොකවත් දන්නේත් නැතිව අද එතුමන්ලා කථා කරනවා, මෙය අසුභදායක දෙයක්ය කියා. ඒ අය කියන්නේ, මෙය මහා පුස් අය වැයක්, හිස් අය වැයක් කියායි. අද මා තමුන්නාන්සේලාට කියනවා, මේ අවුරුද්දේ දෙසැම්බර් මාසයේ 31වන දාට පසුව මේ අය වැයේ අසුබවාදී පැත්ත පිළිබඳව කථා කරන්නය කියා. එදාට මේකට විවේචන ගෙන එන්න. පසුගිය 5වන දා අය වැය යෝජනා ඉදිරිපත් කළා විතරයි. "පුදන කොටම කාපි යකා" කිව්වා වාගේ, මේවා ක්‍රියාත්මක වන්නේ නැති ලු. අපි බොහෝ දේවල් ක්‍රියාත්මක කර තිබෙනවා. 2015 වර්ෂයේ ජනවාරි 8වන දායින් පසුව ජනාධිපතිවරයාත් එක්ක අපි ගිය ගිය ගමන නිසා මේ රටේ ඇති වූ වෙනස මොකක්ද කියා අපි දන්නවා. ජනාධිපතිතුමා එක් එක්කෙනාගේ ලණු කාලා පැවැති සංහිඳියාව නැති කර ගත්තාට අපට කරන්න දෙයක් නැහැ. ඒ නිසා තමයි තනි එක්සත් ජාතික පෙරමුණේ ආණ්ඩුවක් හැටියට ජනාධිපතිවරයාගේ උපදෙසුත් නැතිව මේ අය වැය ඉතාම ප්‍රශස්ත මට්ටමින් ඉදිරිපත් කරන්න අපට පුළුවන්කම ලැබුණේ. මොකක්ද, ඒකට හේතුව?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය ලේඛනයේ සඳහන් වන යෝජනා පිළිබඳව මා දැන් කථා කරන්නම්. බලන්න, හැම ක්ෂේත්‍රයක් පුරා දිවෙන ඉතාම වැදගත් කරුණු කාරණා මෙහි තිබෙනවා. කුඩා කර්මාන්ත වෙන්න පුළුවන්, ගොවීන් සඳහා වන කෘෂි ව්‍යාපාර යෝජනා ක්‍රම වෙන්න පුළුවන්, කටුනායක, ඇඹිලිපිටිය, යාපනය, කැප්පෙටිපොළ ආදී ප්‍රදේශවල කෘෂි ආර්ථිකයට අවශ්‍ය ගබඩා පහසුකම් වෙන්න පුළුවන්, පෞද්ගලික අංශය විසින් නිෂ්පාදනය කරන යම් යම් කර්මාන්ත වෙන්න පුළුවන්, විශේෂයෙන්ම දකුණේ තිබෙන කුරුඳු වගාව ගැන වෙන්න පුළුවන්, මේ හැම දෙයක් සඳහාම වූ සාධනීය යෝජනා මේ අය වැය තුළ තිබෙනවා. මෙතෙක් කාලයක් කුරුඳු වගාව සඳහා අවශ්‍ය පහසුකම් දෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපේ රට අවුරුදු ගණනාවක් තිස්සේ කුරුඳු නිෂ්පාදනය කළ රටක්. දකුණේ අපි බෙහෙවින් කනගාටු වෙනවා, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව හෝ -ඒ කිසි ආණ්ඩුවක්- මේ රටේ අහිංසක ගැමි ජනතාවට කුරුඳු ගැන කියා දෙන්න අඩුම ගණනේ පාසලක් වත් හදා නොතිබීම ගැන. අපි එය මෙවර ස්ථාපිත කරනවා. ඒවා අකුරු හරඹ නොවෙයි; ගණන් හරඹ නොවෙයි.

ධීවර ආම්පන්න පිළිබඳව කථා කරනකොට මම කියන්න ඕනෑ, බහු දින යාත්‍රාවල ගබඩා පහසුකම් දියුණු කිරීම කෙරෙහිත් මෙවර අය අය වැය මඟින් අවධානය යොමු කර තිබෙන බව. අපි ධීවරයන් වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කර තිබෙනවා. පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් දෙන එකට විරුද්ධවයි මෙතුමන්ලා ඡන්දය දෙනවාය කියන්නේ. මට කනගාටුයි, අපේ ආණ්ඩුවේ හිටපු නිශාන්ත මුතුහෙට්ටිගමගේ නියෝජ්‍ය ඇමතිතුමා ගැන. වාසනාවකට, අපේ යහ පාලන ආණ්ඩුවට පින් සිද්ධ වෙන්න එතුමා නියෝජ්‍ය ඇමතිකම ගත්තා. වත්මන් ජනාධිපතිතුමා බද්දේගමට ගිහිල්ලා ජනාධිපති අපේක්ෂකයා හැටියට එදා කථා කළා. එදා ඒ වේදිකාව ගිනි තියලා, ජනාධිපතිවරයා ඝාතනය කරන තත්ත්වයට පවා පත් වෙලා, ඉතාම අසාධාරණ විධියට කටයුතු කළ අය ලජ්ජා නැතිව ඇවිල්ලා මේ ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිකම් ගත්තා. ඒ අය කලිසම් ඇඳගෙනද මේ පාර්ලිමේන්තුව තුළ කථා කරන්නේ? ඒ වේදිකාව ගිනි තැබූ අයට, ඒ වේදිකාව ගිනි තැබූ සමහර වග උත්තරකාරයන්ට මේ ආණ්ඩුව ලජ්ජා නැතිව වරායේ රැකියා දුන්නා. එහෙම කළ නිසා ද, මේ ආණ්ඩුව ගැන විවේචනාත්මකව කථා කරන්නේ? නමුත් ඒ වේදිකාව හදපු අපේ අහිංසක මිනිස්සු එළියේ ඉඳගෙන ඒ දිහා බලාගෙන සුසුම් හෙළුවා. ඒ වාගේ ලජ්ජා නැති කථා කියන අයට රටේ ජනතාව ඉදිරියට කොහොම සලකාවිද කියා මම දන්නේ නැහැ.

මෙතුමන්ලා කියනවා, මෙය පරද්දන්න පුළුවන් ඉහළම දේ කරනවාය කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහෙම කරන්නේ, කිරි වීදුරුව දෙන එකට විරුද්ධවයි. ඒ අය කිරි බීලාද හැදුණේ කියන එක මට ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේවා ගැන කියන්න මට ලජ්ජයි. වේදිකාවක කියනවා නම්, මම ඒක කියනවා. ගරු පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට යට වෙලා මම එහෙම කියන්නේ නැහැ. පාසල් දරුවෙකුට කිරි වීදුරුවක් දෙන එක පරාජයට පත් කරන්න කටයුතු කරනවා නම්, එහෙම කියන අය කිරි බිව්වාද, නැත්නම් වෙනත් කිරි බීලා හැදුණු අයද කියා මට හිතෙනවා. ඒ විතරක් නොවෙයි.

සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හම්බන්තොට දිස්ත්‍රික්කය ගැන කථා කරනකොට ලජ්ජයි. හම්බන්තොට හදලා තිබෙන දේවල්වල ගණන් බැලුවාම ලජ්ජයි. නමුත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැසිකිළි 15,000ක් නැහැ. වැසිකිළි 15,000ක් නැති හම්බන්තොට, Mattala International Airport එකට වියදම රුපියල් බිලියන 27ක්. ඒ සමඟම Hambantota Port එකේ phase 1වලට වියදම රුපියල් බිලියන 47යි. ඒ සමඟම Hambantota Port එකේ phase 2වලට වියදම රුපියල් බිලියන 78යි. රන්මිහිතැන්නට වියදම රුපියල් බිලියන 2යි. රන්මිහිතැන්න හදනවා. නමුත් වැසිකිළි හදන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා ලංකාව වටේම ගිහිල්ලා බලන්න. මොන දුම්රිය ස්ථානයේද හරියට වැසිකිළියක් තිබෙන්නේ? මේවා කියන්නත් මට ලජ්ජයි. ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මැතිඇමතිවරු මේ පාර්ලිමේන්තුවේත් සිටියා. ලජ්ජයි. ගාල්ල නගරයට ආවොත් පෙනෙනවා, හරියට පාවිච්චි කරන්න පුළුවන් වැසිකිළියක් නැහැ; හරියට සනීපාරක්ෂක පහසුකම් නැහැ කියා. එහෙම කථා කරපු අය තමයි අද ලජ්ජා නැතිව මෙතැන ඇවිල්ලා සංවර්ධනය ගැන කියන්නේ. මේක දිස්ත්‍රික්ක මට්ටමින් ගත්තත් අසාධාරණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය කාල පරිච්ඡේදය දිහා අපි බලමු. ගාල්ල නගරය ගැන මම කථා කරන්න ඕනෑ. ඒ, මගේ නගරය. ගාල්ල දිස්ත්‍රික්කයේ ජනගහනය ගත්තොත් 2014 වර්ෂය වෙනකොට 1,083,000ක ජනතාවක් ගාල්ල දිස්ත්‍රික්කයේ සිටියා. ඒ සමඟම මාතර 832,000ක් ඉන්නවා. හම්බන්තොට ඉන්නේ 618,000යි. ඒ, 618,000කට තමයි අර පහසුකම් දුන්නේ. හැබැයි, ගාල්ල දිස්ත්‍රික්කයේ සිටි 1,083,000ක ජනගහනයට දුන්නේ මොනවාද කියා මම අහනවා.

අද බලන්න, අපි කොපමණ වැඩසටහන් ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනවාද? මෙතැන කථා කරපු සමහර මන්ත්‍රීවරු රට වටේ යනවාද, නැත්නම් ආසනයේ සිට, තමන්ගේ ගෙදර සිට මේ පාර්ලිමේන්තුවට එනවාද කියා මම දන්නේ නැහැ. ඒ අයට මම කියනවා, ගිහිල්ලා "ගම්පෙරළිය" වැඩසටහන ගැන බලන්න කියා. මෙතැන වාද විවාද කර මේ අය වැය පුස් අය වැයක්ය කියන; ගම්පෙරළියට මඩ ගහන අයට මම කියනවා, අපේ ආසනවලට

එන්න කියා. කන්න බොන්න දීලා, ඕනෑ නම් උනවටුනේ හොඳ හෝටලයක නතර කර ඒ අය වෙනුවෙන් මම වියදම් කර ඕනෑ නම් මුහුදේ නාවලා ආපහු එක්කරගෙන එන්නම්. එහෙම ඇවිල්ලා ගම් මට්ටමින් අපි කරපු වැඩ ටික බලන්න. හෙට - අනිද්දා මම මාර්ග 400ක් විවෘත කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඔබතුමන්ලා අපේ ආසනවලට ඇවිල්ලා මේවා බලන්න. ඒ විතරක් නොවෙයි.

ගාල්ල දිස්ත්‍රික්කයේ දසලක්ෂයක ජනගහනයක් සිටිනවා. ඒ සමඟම ඡන්ද දායකයොත් විශාල සංඛ්‍යාවක් සිටිනවා. පවුල් 280,000ක් සිටිනවා. නමුත්, ගාල්ලට සම්මන්ත්‍රණශාලාවක් නැහැ. හැබැයි, රුපියල් කෝටි ගණනක විශාල මුදලක් වැය කර හම්බන්තොට මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණශාලාව හදා ඇත, හැබැයි, දැන් ඒක වසා ඇත. අපි ගාල්ලේ හැදුවා, ආසන 2,000ක සම්මන්ත්‍රණශාලාවක්. ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් එතුමාගේ ආසනය තුළයි එය හැදුවේ. ඒ වාගේම අපි හදනවා, සමසෞඛ්‍ය පීඨයක්. මට මතකයි, 2015 වර්ෂයේ අපි යහපාලන ආණ්ඩුව ගන්නකොට එදා සමසෞඛ්‍ය පීඨයේ දරුවෝ මැස්සක් ගහගෙන දින 57ක් තිස්සේ උපවාසයේ යෙදුණු බව. මම ගිහිල්ලා ඒ අයට කිව්වා, අපේ ආණ්ඩුවේ අවසන් දවස වෙන්න කලින් ඔබගේ අවශ්‍යතාව ඉෂ්ට කරනවා කියා. දැන් මම සතුටු වෙනවා. ඒ වාගේම ගරු අගමැතිතුමාටත්, විශේෂයෙන්ම මේ කටයුතු කරපු අපේ මුදල් අමාත්‍යතුමාටත් මම ස්තුතිවන්ත වනවා. රුහුණු විශ්වවිද්‍යාලයේ 10වෙනි පීඨය විධියට සමසෞඛ්‍ය පීඨය ගාල්ල ප්‍රදේශයේ ස්ථාපිත කරන්න එතුමන්ලා විශාල මුදලක් ලබා දීලා තිබෙනවා. මම හිතන්නේ ඒක අප ලැබූ ජයග්‍රහණයක්. අපි නිකම් කටින් බතල කොළ හිටවන අය නොවෙයි. අපි කියන දේ කරන, කරන දේ කියන මිනිසුන්. එවැනි විශාල වැඩ පිළිවෙළවල් අපි ක්‍රියාත්මක කරනවා. අද රට වටේ ගියාම ඒවා පෙනෙනවා. මේ අය අවුරුදු 20ක් ආණ්ඩු කර අද කියනවා, "අපේ කාලයේදී තමයි සම්පූර්ණයෙන් රට හැදිලා තිබෙන්නේ." කියා. ඒ අවුරුදු 20න් අපි -එක්සත් ජාතික පක්ෂය- මේ රට පාලනය කළේ අවුරුදු කීයද? මේ අය මේ වැඩ කළා නම්, මාර්ග වැනි යටිතල පහසුකම් හැදුවා නම්, අද අපි මේ තරම් විශාල මුදලක් ගම්පෙරළියට වියදම් කරන්න ඕනෑද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද "නිල සෙවණ" වැනි ව්‍යාපෘති යටතේ ග්‍රාම නිලධාරින්ට, ඒ සමඟම කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින්ට, සංවර්ධන නිලධාරින්ට නිල නිවාස ලබා දෙනවා විතරක් නොවෙයි. ඒ හැම කෙනෙකුටම අවශ්‍ය කාර්යාලයක් අපි ගම්වල හදා තිබෙනවා. මේ වනකොට මගේ ආසනයෙත් එවැනි කාර්යාල 30ක්, 40ක් පමණ හදා තිබෙනවා. සෑම ග්‍රාම සේවා වසමක් පාසාම අපි ඒ කාර්යාල හදනවා. රුපියල් 2,000ක් හෝ 3,000ක් දීලා කුලියට හිටපු මේ නිලධාරින්ට ආත්ම ගරුත්වයක් ඇතිව ඉන්න තමන්ගේම කියා කාර්යාලයක් දැන් අපි හදා දීලා තිබෙනවා. මේ අපි දීපු රස්සා නොවෙයි. නමුත්, ඒ අයට ආත්ම ගරුත්වයක් ඇතිව කටයුතු කරන්න පුළුවන්කමක් දැන් තිබෙනවා. අපි එතැනින් නැවතුණේ නැහැ. රංජිත් සියඹලාපිටිය මැතිතුමා කිව්වා මට මතකයි, "සිහින මාළිගා" වැනි වචන දමා මේ අය වැය කථාව ලස්සන කර තිබෙනවා කියා. ඔබතුමන්ලාගේ කාලයේ සිහින මාළිගා තමයි තිබුණේ. යම් කිසි කෙනෙක් යන්නේ එක්කෝ මැදපෙරදිග වෙන්න පුළුවන්, කොරියාවට වෙන්න පුළුවන්, මැලේසියාවට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් වෙනත් රටකට වෙන්න පුළුවන්, ඒ අය විදේශ රටකට යන්නේ මොකටද?

රුපියල් 25,000, රුපියල් 30,000 පඩියට ලංකාවේ රස්සාවක් කළාට ගෙයක් දොරක් හදා ගන්න බැරි බව ඔවුන් දන්නවා. ඒ අයට සිහිනයක් තිබුණා, සිහින මාළිගාවක් තිබුණා. ඒ "සිහින මාළිගා" ණය යෝජනා ක්‍රමය යටතේ මේ වතාවේ රුපියල් මිලියන 10ක ණයක් ඒ අයට ලබා දෙන්න පුළුවන්. පිටරට සේවය කරන අයට රුපියල් මිලියන 10ක් දීම තුළින් ඔවුන්ට ලංකාවට ඇවිල්ලා, තමන්ගේ අඹු සැමියන් සමඟ ජීවත් වෙන්න හොඳ නිවහනක් නිර්මාණයක් කර ගන්න පුළුවන් වනවා. මේවා කියනකොට "මේ රට ණය වෙනවා ලු." කියනවා. ඔවුන් මේ රටට කරපු නස්පැත්තිය -විනාශය- දෙස බැලුවාම මේ කාරණය තේරුම් ගන්න පුළුවන්. අහිංසක, දුප්පත් මිනිසුන් විදේශයන්හි ශ්‍රමිකයන් හැටියට වැඩ කරමින් මේ රටේ ජාතික දේහයට විශාල වටිනාකමක් එක් කරනවා. මෙලෙස පිටරට ගිහිල්ලා වැඩ කරන අයට රුපියල් මිලියන 10ක් දෙන්න ආණ්ඩුවකට පුළුවන්කමක් නැත්නම් අපි මේ ආණ්ඩු කරන්නේ මොකටද කියා මම අහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපි අලුත් නිර්මාණශීලී වැඩක් තමයි කළේ. ඒ විතරක් නොවෙයි, "බෞද්ධ සිද්ධස්ථානවලට උදවු කරන්නේ නැහැ. රට බෙදනවා. බෞද්ධාගමට තැන දෙන්නේ නැහැ." කියා අද මේ ආණ්ඩුවට පට්ට පතුරු යන්න ගහනවා. මේ අවුරුද්ද අන්තිම වනකොට මගේ ආසනයේ තිබෙන සියලුම විහාරස්ථානවලට විතරක් නොවෙයි, පූජනීය ස්ථාන සියල්ලටම අඩු ගණනේ රුපියල් ලක්ෂ පහක මුදලක් ලබා දෙනවා. මහින්ද රාජපක්ෂ මහත්තයා මල් වට්ටිය අරගෙන ගිහිල්ලා, මහා ලොකුවට සිල් ගන්න මිනිසුන් වාගේ කථා කළාට, කවුරු හෝ හදා දීපු රන් වැටක් විවෘත කළාට, අවුරුදු 20ක් තුළ එතුමන්ලා කළේ මොනවාද කිය ා මම අහනවා. එතුමන්ලාට ඕනෑ දේශපාලනය කරන්නයි. අවශ්‍ය තැන්වලට මන්දිර හදා දීලා හාමුදුරුවන්ට උදවු කළාට, රටේ සමස්ත අහිංසක භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් කටයුතු කරන්න එතුමන්ලා ක්‍රියා කළේ නැහැ. ඒ නිසා අපි ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්න යනවා. එය බුද්ධාගම වෙන්න පුළුවන්, ඉස්ලාම් ධර්මය වෙන්න පුළුවන්, හින්දු ධර්මය වෙන්න පුළුවන්, ක්‍රිස්තියානි වෙන්න පුළුවන්.  අපිට එහෙම භේදයක් නැහැ. ජාතිවාදය තුළින් ඉස්සරහට යන මිනිස්සු නොවෙයි අපි, එක්සත් ජාතික පක්ෂය.  එහෙමයි අපි -එක්සත් ජාතික පෙරමුණ- හැදිලා තිබෙන්නේ. සියලු පක්ෂ එකට එකතුවෙලා, එක්සත් ජාතික පෙරමුණ හදපු නිර්මාණශීලී පක්ෂයක් හැටියට -මේ රටේ ඉතාම දැවැන්ත පක්ෂය හැටියට- ඒ හොරණෑව අපි ඉතාම පැහැදිලිව ප්‍රකාශයට පත් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අසාධාරණයක් වෙනවා. හැම දාම අන්තිමට කථා කරන්න සිටින අපේ වේලාවෙන් විනාඩි දෙක තුන කපනවා. අපි හැම දාම රැස්වීම් කටයුතු අවසන් කර තමයි යන්නේ. ඒ නිසා මට තව විනාඩි තුනක් ලබා දෙන්න කියා මා ඔබතුමියගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා. මොකද, මේ කථා කරන දේ ආපසු කවදාවත් අපිට කථා කරන්න ලැබෙන්නේ නැහැ. මේ අවසාන අය වැය, මේ අවසාන අය වැය. විජේපාල හෙට්ටිආරච්චිට මේ අවසාන අය වැයේදී ඔබතුමියට විනාඩි තුනක් ලබා දෙන්න බැරි නම් මන්ත්‍රීවරුන් හැටිය  අපි කටයුතු කරන්නේ කොහොමද කියා මම අහනවා. ඒ විතරක් නොවෙයි, හැම ක්ෂේත්‍රයකම,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අපි කාගෙන් හෝ වේලාව ඉල්ලා ගනිමු.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මට තව විනාඩි තුනක් ලබා දෙන්න කියා මා ඉතාම කාරුණිකව ඔබතුමියගෙන් ඉල්ලනවා.අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙකු හැටියට

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

කිසිම දීමනාවක් ලබන්නේ නැතිවයි මම කටයුතු කරන්නේ කියන කාරණය මේ අවස්ථාවේදී පැහැදිලිව කියනවා. "නොයෙක් දීමනා, අර වරප්‍රසාද, මේ වරප්‍රසාද ගන්නවා." කියා ඇතැම් අය කියනවා. රටේ මිනිසුන් මේවා ගැන දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දෙවන ත්‍රිපුද්ගල මහාධිකරණ උසාවියක් අපි හෙට - අනිද්දා වනකොට පටන් ගන්නවා. එතකොට "නඩු අහලා ඉවර වෙන්නේ කවදාද?" කියන කතන්දරය අහන්න බැහැ. මොකද, ඒකට අවශ්‍ය පසුබිම හැදිලා තිබෙන්නේ. පොලිස් දෙපාර්තමේන්තුව පාවිච්චි කර, කුඩු වාගේ විෂමාචාර මත් ද්‍රව්‍ය මේ රටේ නැති කරන්න ජනාධිපතිතුමාට යම්කිසි හයියක් ලැබුණා නම්, ඒකට අවශ්‍ය ශක්තිය ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බව මම කියන්න කැමතියි. පොලීසියට සියයට 44ක වැටුප් වැඩිවීමක් කර, ඒ වරප්‍රසාද ටික දීලා, ඒ අය සතුටු කර, ඒ අයට ආත්ම ගරුත්වයක් ඇතිව තමන්ගේ රාජකාරිය කරන්න අවශ්‍ය පසුබිම හදා දුන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂයයි. විශේෂයෙන්ම මා මේ අවස්ථාවේදී අපේ සාගල රත්නායක ඇමතිතුමන්ලා වාගේ අයට ස්තුතිවන්ත වනවා. එතුමන්ලා කරපු ක්‍රියාදාමය නිසා තමයි ඒ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ.

මට කලින් කථා කරපු මන්ත්‍රීවරු කිව්වා වාගේ විපක්ෂයේ අය යුද හමුදාව ගැන කථා කරනවා, නොයෙක් දේවල් ගැන කථා කරනවා, "යුද හමුදාවේ සෙබළුන්ට කුඩම්මාගේ සැලකිල්ල." කියනවා. හැබැයි, යුද හමුදා සෙබළුන්ගේ නිල ඇඳුම්වලට රුපියලක් වියදම් කරන්න, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නිල නිවාසවලට රුපියලක් වෙන් කරන්න, ඒ කාරණා පිළිබඳව ඇහැක් ඇරලා බලන්න ඔවුන්ට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ නිසා අපි කියන කාරණා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළදී හෝ වෙනත් ඕනෑම තැනකදී, ඕනෑම කෙනෙකු සමඟ -ඔය බන්දුල ගුණවර්ධනලා වාගේ කටින් බතල කොළ හිටවන අයත් සමඟ -වාද විවාද කරන්න අපි ලෑස්තියි. උදය ගම්මන්පිලලා අද හොයා ගන්නත් නැහැ. අපිත් සමඟ ඕනෑම විවාදයකට එන්න කියා අපි ඒ අයට කියනවා. මේවායේ තිබෙන අකුරු හරඹත් සමඟ, ඉලක්කම් සමඟ අපිත් එක්ක වාද කරන්න එන්න. බොරුවට තැන් තැන්වලට, අගුපිල්වලට, පඩි පෙළවල්වලට, මුඩුක්කුවලට ගිහිල්ලා කථා කරන්නේ නැතිව, මේ ගරු සභාවේ ඉඳගෙන අපි කථා කරන ඒවාට එරෙහිව පුළුවන් නම් උත්තර දෙන්න ලෑස්ති වෙන්න. නමුත් අද මේ ගරු සභාවේ එක්කෙනෙක්වත් නැහැ; විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් මේ අවස්ථාවේදී සභා ගැබේ නැහැ, අපි ලබා දෙන උත්තර අහන්න. කෝ, මේ අය? මම දන්නේ නැහැ, එක්කෙනෙක් ඉන්නවාද කියලා. කනගාටුයි. ඒකාබද්ධ විපක්ෂයේ ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය ඉන්නවා. ඔබතුමිය ඉන්න එක හොඳයි. විශේෂයෙන්ම අද කාන්තා දිනය නිසා, මම ඔබතුමියගේත් කටහඬ අහන්න ආසයි. හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය හොඳ කථාවක් කළා. සැබෑ ලෙස, යථාර්ථවාදීව ඇය ඉතාම එඩිතරව ඒ කථාව කළා. ඒ නිසා කාන්තා දිනය යෙදී තිබෙන අද වාගේ දවසක මම කියන්න කැමැතියි, මේ අය වැය විශේෂයෙන්ම මේ රටේ කාන්තාවන් වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන අය වැයක් කියලා. මේ අය වැය එක්සත් ජාතික පෙරමුණේ, මේ ආණ්ඩුවේ, මංගල අය වැය කියලායි අපි කියන්නේ. මේ මංගල අය වැය, රටට මංගල්‍යයක්ම වේවා කියලා ප්‍රාර්ථනා කරමින් ඒ තුළින් මේ රටේ දුක් විඳින අහිංසක මිනිහාට, මේ රටේ නිෂ්පාදනයට දායක වෙන අයට සහන සලසා දෙමින්, ඇතිවන ආනයන-අපනයන ශක්තිය තුළින් ගෙවුම් ශේෂ හිඟය අඩු කරලා නිර්මාණශීලී රටක් හදන්න ඉදිරි මාස කිහිපය තුළදී අපට හැකියාව ලැබෙයි කියලා විශ්වාස කරමින්, මූලසුනේ සිටින ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට විනාඩි අටක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 5.51]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාත්‍යන්තර කාන්තා දිනය අදට යෙදී තිබෙනවා. මම මුලින්ම ගරු තාරානාත් බස්නායක මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමාට ලබා දී තිබුණු කාලය මට පරිත්‍යාග කරලා විනාඩි අටක් මට ලබා දීම පිළිබඳව. ඒ වාගේම ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන අද දවසේ ඔබතුමිය මූලාසනයේ සිටින වේලාවේ, අපේ රටේ ජනතාවගෙන් සියයට 52ක් වන අම්මාවරුන්, සහෝදරියන්, මිතුරියන් ඇතුළු සමස්ත කාන්තාවන් අපි අගය කරනවා. මොකද, සැබෑ ලෙසින්ම සවිබල ගැන්වුණු ඔවුන්ගේ ශක්තිය තමයි රටේ ශක්තිය. ඒ නිසා හොඳ සමාජයක්, යහපත් රටක් හදන්න අපිත් එක්ක අත්වැල් බැඳගන්න කියලා අපි සියලු කාන්තාවන්ට අද ආරාධනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මට කලින් කථා කරපු අපේ විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටපු මට හිතුණා, එතුමාගේ කට බොරු කිව්වත්, දිව බොරු කියන්නේ නැහැ කියලා. මොකද, එතුමා කිව්වා, මේක එතුමාගේ අවසාන අය වැය කථාව කියලා. එතුමා පිළිගෙන තිබෙනවා, මින් ඉදිරියට එතුමන්ලාට අය වැයක් ඉදිරිපත් කරන්න හම්බ වෙන්නේත් නැහැ, එතුමාට කථා කරන්න හම්බ වෙන්නේත් නැහැ කියලා. [බාධා කිරීමක්] ඒක තමයි සැබෑ තත්ත්වය. එතුමා ඇත්තම කිව්වා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමිය මගේ නම සඳහන් කළා. ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව - [බාධා කිරීමක්] ඔබතුමන්ලාමයි කියන්නේ. ඊළඟට, අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තු මැතිවරණය, ජනාධිපතිවරණය, පළාත් සභා මැතිවරණ පැවැත්වෙනවා. මේ ආණ්ඩුවෙන් -

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒක point of Order එකක් නොවෙයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාම තමයි කිව්වේ මේක අන්තිම අය වැය කියලා. මම නොවෙයි, ඔබතුමා තමයි කිව්වේ. [බාධා කිරීමක්] ඒ නිසා අපි එය පිළිගන්නවා. මොකද, මේ අය වැය සුන්දර වචන යොදා, අලුත් වචන යොදා, සිහින මාළිගා පෙන්වලා, "Home Sweet Home" කියලා අද රටේ තරුණ පරම්පරාවත් ණයකරුවන් බවට පත් කරන්න ඉදිරිපත් කරපු අය වැයක් කියන එක අපි මතක් කරනවා.

විශේෂයෙන්ම අලුතින් විවාහයට පත් වෙච්ච අයට අවුරුදු 25කින් ගෙවන්න සියයට 6ක පොලියට ලක්ෂ 100ක් දෙනවාලු. මම ගණන් හදා බැලුවාම පෙනී ගියා, අවුරුදු 25කට පොලියම ලක්ෂ 150ක් හැදෙන බව. ලක්ෂ 100ක ණයක් අරගෙන, අවුරුදු 25ක් කඹුරලා-කඹුරලා ලක්ෂ 150ක් පොලිය ගෙවනවා. ඒ අනුව මාසයකට වාරිකය රුපියල් 83,000ක් ගෙවන්න ඕනෑ. මේ තරුණ පිරිසට කොහෙන්ද, ඒකට සල්ලි? රුපියල් 83,000ක් මාසිකව ගෙවන්න නම් ලක්ෂ තුනක ආදායමක් ලැබෙන්න ඕනෑ. හැබැයි, ලක්ෂ තුනක ආදායමක් මාසිකව ලැබුණොත් බදු ගහනවා. බදු ගැහුවාම, නැත්තටම නැති වෙලා යනවා. ඒ නිසා මේ ලස්සන වචනවලට මුළා වෙලා, මේවාට රැවටෙන්න එපා කියලා මම රටේ තරුණ ප්‍රජාවගෙන් මුලින්ම ඉල්ලා සිටිනවා.

අද මේ රටේ ආර්ථිකයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන කියන්නේ මම නොවෙයි. රවි කරුණානායක ඇමතිතුමා තමයි 2019 ජනවාරි මස 31 වැනි දා පළ වූ "මව්බිම" පුවත් පතට ඒ ගැන කියා තිබෙන්නේ. එහි සඳහන් වෙනවා, "මේ රට බංකොලොත් වෙන්නයි යන්නේ. රටේ ආදායමට වඩා විශාල ලෙස වියදම වැඩිවීමෙන් රට බංකොලොත්භාවයට පත් වෙනවා" කියලා. මෙහෙම කියන්නේ, ඔබතුමන්ලාගේම හිටපු මුදල් ඇමතිතුමායි. ඒ වාගේම 2016 වසරේදී ශ්‍රී ලංකාවේ ඇති වූ දේශපාලන අස්ථාවරත්වය නිසා රටේ තිබෙන්නේ සියයට තුනක වාගේ ආර්ථික වර්ධන වේගයක් කියලා මහ බැංකුවේ අධිපතිතුමා කළ ප්‍රකාශයක් CNewsවල වාර්තා වී තිබුණා.

අද වනවිට ආසියාතික කලාපයේ අඩුම ආර්ථික වර්ධන වේගය තිබෙන්නේ අපේ රට තුළයි. බංග්ලාදේශයේ ආර්ථික වර්ධන වේගය සියයට 7.4යි; නේපාලයේ සියයට 7.9යි; භූතානයේ සියයට 7.4යි; ලාඕසයේ සියයට 6.9යි; ඉන්දියාවේ සියයට 6.7යි; පාකිස්තානයේ සියයට 5.4යි; මාල දිවයිනේ සියයට 4.8යි. අපි අද ඇෆ්ගනිස්තානයත් එක්ක අන්තිම ස්ථානය සඳහා සටන් කරනවා.

අද මේ රටේ ආර්ථිකයේ ගැටලුවක් තිබෙනවා. අපේ ආදායමට වඩා අපේ වියදම වැඩියි. අපි පවුලක් අරගෙන බලමු. පවුලක නෝනයි, මහත්තයායි දෙදෙනාම රක්ෂා කරනවා. ඔවුන්ට පඩියක් ලැබෙනවා. ඔවුන් ස්වයං රැකියා කරලාත් අමතර ආදායමක් ලබනවා. හැබැයි, වියදම වැඩි වුණොත් ඒ ගොල්ලන්ට ඒක පියවා ගන්න බැහැ. එතකොට මොකද, කරන්නේ? බැංකුවල තැන්පත් තිබෙනවා නේ. ඔවුන් ඒ තැන්පත් මුදල් ටික අරගන්නවා. ඒවා වියදම් කරනවා. හැබැයි, හරියාකාරව කළමනාකරණය කරගත්තේ නැත්නම්, වියදම අඩු කරගත්තේ නැත්නම්, වියදම පාලනය කරගත්තේ නැත්නම් මේ පවුලට දියුණු වෙන්න බැහැ.

වියදම පාලනය කර ගත්තේ නැත්නම් අන්තිමට මොකද වෙන්නේ? බැංකුවට ඉඩම තියලා ණය ටික ගන්නවා. ඒ ණය පියවන්න තවත් කෙනෙකුගෙන් ණය ගන්නවා. ඇපය වෙනුවෙන් බැංකුවට තියන්න ඉඩමක් නැති වුණාම, ගිනි පොලී මුදලාලිගෙන් ණය අරගෙන ණය ටික ගෙවනවා. ඒ නිසා ඉතිරියක් නැහැ. අද රටට වෙලා තිබෙන්නේත් ඒකයි. අද රටේ ආදායම අඩුයි; වියදම වැඩියි. අද වැට් බද්ද, ජාතිය ගොඩ නැඟීමේ බද්ද, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද යනාදි බදු ගහලා ජනතාවට විශාල ජීවන බරක් පටවා තිබෙනවා. මේ ආණ්ඩුවේ දුර්වල ආර්ථික කළමනාකරණය නිසා අද රුපියලේ වටිනාකම දිනෙන් දින පහළට ගිහින්, අද ඩොලරයක අගය රුපියල් 184ක් වනවා. අපි බොහෝ භාණ්ඩ ආනයනය කරනවා. අපි අපනයනයෙන් ලබන ආදායමට වඩා ආනයනය වෙනුවෙන් වැය කරනවා. ඒ නිසා අපේ මුදල් විශාල ප්‍රමාණයක් පිට රටවලට ඇදී යනවා. අද සෘජු විදේශ ආයෝජන ලංකාවට එන්නේ නැහැ. මොකද, විශ්වාසයක් නොමැතිකම නිසා, අද ස්ථිර ප්‍රතිපත්තියක් රටේ නැති නිසා විදේශ ආයෝජකයෝ ලංකාවට එන්නේ නැහැ. දින 100 තුළ වෙච්ච ත්‍රිලියනයක බැඳුම්කර වංචාව නිසා අද ලංකාව කෙරෙහි විශ්වසනීයත්වයක් විදේශ ආයෝජකයෝ තුළ නැහැ. ඒ නිසා අද රටේ ආදායම අඩු වෙලා තිබෙනවා. මේ ආදායම්, වියදම් පරතරයට අපි යම්කිසි ක්‍රමවේදයක් හැදුවේ නැත්නම්, සෘජු ප්‍රතිපත්ති ගෙනාවේ නැත්නම්, අපේ ආර්ථික වර්ධන වේගය දියුණු කර ගන්න බැහැ. දැන් වෙන්නේ, අතීසාරයට අමුඩේ ගැහුවා වාගේ දෙයක්. අතීසාරයට, ප්‍රතිකාර කරන්න ඕනෑ. අමුඩය ගැහුවාට වැඩක් වෙන්නේ නැහැ. අද අපි මේ අය වැය දකින්නේත්, "අතීසාරයට අමුඩේ ගහපු අය වැයක්" හැටියටයි.

අපේ රටේ පලතුරු විශාල වශයෙන් තිබෙනවා. පලතුරු ආහාරයට ගැනීම ඉතාමත්ම වැදගත්. විශේෂයෙන්ම පලතුරු ආහාරයට ගැනීමෙන් ශරීරයට අවශ්‍ය විටමින් වර්ග, ඛනිජ ලවණ, තන්තු වර්ග හා ප්‍රතිඔක්සිකාරක ලැබෙනවා. අද අපි විදේශ විනිමය විශාල වශයෙන් පිට රට යවමින් පලතුරු ආනයනය කරලා, වෙන රටවල ගොවියෝ දියුණු කරනවා. අපි 2017 පලතුරු ටොන් 76,139ක් ගෙනෙන්න රුපියල් බිලියන 12.9ක් වියදම් කර තිබෙනවා; අපනයනය කර තිබෙන්නේ ටොන් 31,320යි; ආදායම බිලියන 6.3යි. බලන්න අද ලංකාවේ දේශීය පලතුරු වෙනුවට, විදේශයෙන් ඇපල්, මුද්දරප්පලම්, දොඩම්, දෙළුම් වාගේ පලතුරු ගෙන්වනවා. සියඹලාත් ගෙනැල්ලා! අද මේ පලතුරු මාර්කට් එකේ ඕනෑ තරම් තිබෙනවා. හැබැයි, මේවායේ කිසිම ගුණයක් නැහැ. ගහේ තිබුණාට වඩා වැඩි කාලයක් නැවේ තිබුණු, ඊටත් වඩා වැඩි කාලයක් සුපර්මාර්කට්වල තිබෙන මේ පලතුරුවලට අද වැඩි වටිනාකමක් දෙනවා. අද අපේ රටේ ප්‍රතිපත්තියක් නැහැ. එදා කිව්වේ, "සිරිලක දේ - සිරි සැප දේ" කියලායි. අද දේශීය දේවලට අපි අගයක් ලබා දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමියට මතක ඇති, අපි කේරලයේ KILA Institute එකට ගිය වෙලාවේ අපිට උදේ තේවලට දුන්නේ ඔවුන්ගේ නිෂ්පාදනයක්. කෙසෙල් බැදලා, ලුණු කුඩු හා මිරිස් කුඩු තවරලා දුන්නේ. අද අපි workshops තියනකොට සෞඛ්‍යයට අහිතකර දේවල් කොච්චර ලබා දෙනවාද? පේස්ට්‍රි, කට්ලට්ස්, රෝල්ස්, පැටිස් වාගේ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සහ බටර් ආශ්‍රිත අයිසින් කේක් වාගේ නිෂ්පාදනයි ලබා දෙන්නේ. ඒ නිසා අද රටේ බෝ නොවන රෝග වැඩි වෙලා. දේශීය දේවල් අගය කරන්න අද අපේ උනන්දුවක් නැහැ. අද දෙන්නේ දේශීය පලතුරු නොවෙයි, පිට රටවලින් ගෙනෙන කිසිම ගුණයක් නැති පලතුරු. ඒ නිසා අපට මේ වියදම අඩු කරන්න-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කියන්න ගොඩක් දේවල් තිබෙනවා. නමුත්, කාලය නැහැ. මේ අය වැය ඉතාමත්ම ලස්සනට අයිසින් කරපු, පුස් කාපු කේක් එකක් බව සඳහන් කරන

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ]

අතර, අපි ආදායම වැඩි කර ගන්නත්, වියදම අඩු කර ගන්නත් ඍජු ප්‍රතිපත්තිවලට යා යුතු බව කියමින්, මා නිහඬ වනවා. ඔබතුමියට ස්තුතියි.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමයනි, එතුමිය අවුරුදු දෙකක් තිස්සේ මේ ආණ්ඩුවේ හිටියා. මේ යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව බලලාවත් නොවෙයි කථා කරන්නේ. ඒ ණය ගෙවන්න අවුරුදු 2 සහන කාලයක් දෙනවා; සියයට 3.46යි පොලිය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඊළඟ කථිකයාට අවස්ථාව දෙමු.

මීළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.59]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද කාන්තා දිනයේ ඔබතුමිය මූලසුන දරන වෙලාවේ මගේ කථාව පැවැත්වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. අද ජාත්‍යන්තර කාන්තා දිනයයි. ලංකාවාසී සියලුම කාන්තාවන්ට මම මේ අවස්ථාවේදී සුබ පතනවා.

"Vision 2025 - පොහොසත් රටක්" යන තේමාව යටතේ සමාජ සංවර්ධන දැක්මට අනුව, එහි තවත් ඉදිරි පියවරක් විධියට, සමාජයේ සෑම තරාතිරමකම ජන කොට්ඨාස ඉලක්ක කරගෙන මෙවර අය වැය ඉදිරිපත් කිරීම සුවිශේෂී ලක්ෂණයක් විධියට මම දකිනවා. අද කාන්තා දිනය නිසා මම හිතුවා, මුලින්ම කාන්තාව සම්බන්ධයෙන් කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ආර්ථිකයේ කොඳු නාරටිය වන්නේ කාන්තාවයි. කාන්තා දිනය යෙදෙන අද දින ඒ ගැන කථා කරන්න ලැබීම ගැන මම සතුටු වනවා.

ලංකාවේ ජනගහනයෙන් සියයට 52ක් ඉක්මවන්නේ කාන්තාවන්. ඒ නිසා අපේ රටේ කාන්තාවන් තීරණාත්මක කණ්ඩායමක් විධියට හඳුනාගනිමින්, ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය රටේ ආර්ථිකයට ලබා ගැනීමට මේ අය වැය තුළින් අවධානය යොමු කිරීම වැදගත් කාරණාවක් විධියට මම දකිනවා. විශේෂයෙන් කාන්තාවන්ට පහසු වෙලාවට වැඩ කිරීමට නම්‍යශීලී වැඩ කරන වෙලාවන් ඇති කරලා, නිවසේ සිට වැඩ කිරීමට හැකිවන ආකාරයට කම්කරු නීති සංශෝධනය කිරීමට යෝජනා කිරීමම ප්‍රශංසනීය කාරණාවක් කියා මම හිතනවා. ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල තුළ කාන්තා නියෝජනය වැඩි කිරීමට මුදල් අමාත්‍යතුමා කළ යෝජනාව ඉතාම වැදගත් කියා මම හිතනවා. මොකද, ලෝකයේ සමාගම් ගත්තාම, කාර්යක්ෂමතාවයෙන් ඉහළ, ඵලදායිතාවයෙන් ඉහළ සමාගම්වල කළමනාකරණ කටයුතු කරන්නේ කාන්තාවන්. මම හිතනවා, ඒක බොහොම කාලෝචිත ක්‍රියාවලියක් කියලා.

පෞද්ගලික අංශයේ සේවයේ නියුතු කාන්තාවන්ට මාස තුනක අනිවාර්ය ප්‍රසූත නිවාඩුවක් ලබා දීමට අපේ රජයෙන් ගෙන ආ යෝජනාව මම අගය කරනවා, අම්මා කෙනෙක් හැටියට. රජයේ සේවයේ නියුතුව සිටින කාන්තාවන් විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේ සේවයේ යෙදී සිටින මව්වරුත් දරුවෙකු ලැබීමේ මුල් කාලය තුළ බොහෝ අපහසුතාවට පත් වෙන බව අපි දන්නවා. ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම ගැන කාන්තාවක් හැටියට මම රජයට ස්තුතිවන්ත වනවා.

ඒ වාගේම අද වැඩ කරන කාන්තාවන්ට තිබෙන ප්‍රබල අභියෝගයක් තමයි, සේවයේ යෙදී සිටින කාලය තුළ දරුවන් කා ළඟද තබා යන්නේ කියන කාරණය. දරුවන් ආරක්ෂා සහිතව තබා ඒමේ ගැටලුව අද සේවයේ යෙදෙන අම්මාවරුන්ට තිබෙනවා. පාසල් වේලාවෙන් පසුවත්, නිවාඩු දිනවලත් දරුවන් රැක බලා ගැනීමට ළමා සුරැකුම් මධ්‍යස්ථාන හා පහසුකම් සපයන ආයතන ඇති කිරීම සඳහා මේ අය වැය තුළින් දිරිගැන්වීමේ යෝජනා ඉදිරිපත් කර තිබීම ඉතාමත් කාලෝචිතයි කියා මම හිතනවා.

ඒත් එක්කම, කාටත් අමතක වෙලා තිබෙන දෙයක් අපි මතක් කරන්නට ඕනෑ. අද කාන්තාව සියලුම ක්ෂේත්‍ර විජයග්‍රහණය කරලා තිබෙනවා. පරිපාලන සේවය, වෛද්‍යවරු, ගුරුවරු, අධ්‍යාපන ක්ෂේත්‍රය වැනි ක්ෂේත්‍ර ගත්තාම, අද කාන්තාවන් තමයි ඉදිරියෙන් ඉන්නේ. නමුත්, දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා නියෝජනය අඩුයි. අපි ගත්තොත්, පාර්ලිමේන්තුවේ 225ටම ඉන්නේ කාන්තාවන් 12දෙනායි. මේ තත්ත්වය වටහා ගනිමින්, සියයට 25ක කෝටාවක් ගෙනැල්ලා, මෙන්න මේ ප්‍රතිපත්ති සැලසුම් කරන ආයතන තුළ කාන්තා නියෝජනය වැඩි කිරීමට අග්‍රාමාත්‍යතුමා ගත් වෑයම මම අගය කරනවා. මේ වන විට මේ ප්‍රතිපත්ති සැලසුම්කරණයේදී 2,000කට ආසන්න පිරිසක් පළාත් පාලන ආයතන නියෝජනය කරනවා.

ඒ වාගේම, 2015ට පෙර ගැබිනි මව්වරුන්ට ගෙවමින් තිබුණු රුපියල් 500ක දීමනාව, 2015 වර්ෂයේ අපේ රජයෙන් මාසිකව රුපියල් 2,000 දක්වා වැඩිකර මාස දහයක් ලබා දෙනවා. 2019 වර්ෂයේ ඒ සඳහා වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 5,500ක් දක්වා වැඩි කර තිබෙනවා. කුසේ සිටින දරුවාගේ පෝෂණය ගැන හිතමින් සෞඛ්‍ය සම්පන්න අනාගත පරපුරක් හදන්නට අපේ රජය ගෙන තිබෙන ක්‍රියා මාර්ග මම අගය කරනවා.

ඒ වාගේම, කාන්තාව දියණියක්, සොහොයුරියක්, මවක් ලෙස සලකන සමාජයක් නිර්මාණය කරන්නට, කාන්තාවට සමාජයේ නිසි ස්ථානය සැලසීමට දරන ප්‍රයත්නය, කාන්තාවක් විධියට මම අගය කරනවා. අපේ රජය එහෙම කටයුතු කරන කොට, අද කාන්තා දිනයේ මට මතක් වෙනවා, පසුගිය කාලයේ අපේ කාන්තාවන්ට සලකපු හැටි.

ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමියත් පිළිගන්නවා ඇති, පසු ගිය කාලයේ කාන්තාවන් දූෂණය කර, ඒවායේ සැමරුම් උළෙලවල් තිබුණු බව. අපි වැඩි ඈතකට යන්නට ඕනෑ නැහැ. මේ පසු ගිය දවස් 52 තුළ ඇති වෙච්ච සිද්ධියක් මේ පාර්ලිමේන්තුව තුළ මම බොහොම කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. සාමකාමීව ගමන් කරමින්, මධ්‍යස්ථව කටයුතු කරන්නය කියා මාධ්‍ය ආයතනවලින් ඉල්ලීමක් කරන්න ගිය අපේ රටේ ජ්‍යෙෂ්ඨ කලාකාරිනියන්ව අපේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමෙක් -ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා- දැක්කේ ගණිකාවෝ විධියට. ඒ ගැන මම කනගාටු වෙනවා. මොකද, ඒ අය එදා ගමන් කළේ දින 52 තුළ අහිමි වෙච්ච ප්‍රජාතන්ත්‍රවාදය, මාධ්‍ය නිදහස රැක ගැනීම සඳහායි. ලංකාවේ ඉන්න ප්‍රධාන පෙළේ

කලාකාරිනියෝ තමයි ඒ සඳහා ගමන් කළේ. ඔවුන්ට අපහාස කළා. එදා පාරට බැහැපු කලාකාරිනියන්ට පමණක් නොවෙයි ඒ අපහාසය වුණේ. සමස්ත කාන්තාවන්ට කරපු අසාධාරණයක්, අපහාසයක් විදියට මම මේ වෙලාවේ එය හෙළා දකිනවා. එදා පාරට බැස්සේ අම්මලා ටිකක්; එදා පාරට බැස්සේ බිරින්දෑවරු ටිකක්; එදා පාරට බැස්සේ සහෝදරියෝ ටිකක්; එදා පාරට බැස්සේ කාගේ හෝ දියණියන් ටිකක්. එහෙම නම් සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාට එදා ඒ කාන්තාවෝ පෙනුණේ ගණිකාවන් විදියට නම්, පාරට බහින සියලුම කාන්තාවන් ගණිකාවන් නම්, එතුමාගේ මවත්, බිරිඳත්, දියණියත් ඒ ගණයටම අයත් වනවාද කියා මම බොහොම කනගාටුවෙන් අහනවා. මොකද කාන්තාවන්ගේ ගෞරවය රකින්න ඕනෑ, අම්මෙකුගෙන් ඉපදුණ දරුවෙක් හැටියට. ගණිකාව කියා කාන්තාවක නම් කරනවා නම්, මේ ලෝකයේ පිරිමි සංවර වුණා නම් ගණිකාව කියා චරිතයක් ඇති වෙන්නේ නැහැ. අපි එවැනි යුගයක් පසු කරමිනුයි යන්නේ කියන එක මේ වෙලාවේ මම මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි මුහුණපාන ප්‍රධාන අභියෝග සඳහා දිගු කාලීන, මධ්‍ය කාලීන, කෙටි කාලීන විසඳුම් ඉදිරිපත් කිරීම මෙම අය වැය තුළ මම දකින සුවිශේෂී ලක්ෂණයක්. ඒ වාගේම මෙම අය වැය තුළ ප්‍රතිලාභ ලබනකොට පටු දේශපාලන අරමුණු හෝ දේශපාලනික ඉලක්ක සාධනය කර ගැනීමට කටයුතු කර නැහැ කියන එක මම කියන්නට ඕනෑ. නමුත් දේශපාලනය විසින් සිදු වූ අසාධාරණකම් සාධාරණීකරණය කර ගන්නට, නිවැරදි කර ගන්නට මෙම අය වැය තුළ අවස්ථාව ලබා දී තිබෙනවා. උදාහරණයක් විදියට කිව්වොත් සමෘද්ධි දීමනාව තවත් සුදුසුකම් තිබෙන -මම මෙහිදී අවධාරණය කරනවා- ලක්ෂ හයකට අපි ලබා දෙනවා. ඒ අයට සමෘද්ධි දීමනාව අහිමි වුණේ ඇයි? මේ ලක්ෂ හයට සමෘද්ධි දීමනාව අහිමි වුණේ පසුගිය වසර විසිතුන පුරාවටම එක්කෝ ඒ අය එක්සත් ජාතික පාක්ෂිකයෙකු වීම; එසේ නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙකු වීම. ඒ අයට තිබුණු නුසුදුසුකම ඒක. ඒ නිසා අපි ඒ සියලු දේවල් නිවැරදි කර සැබෑ ලෙස සමෘද්ධි දීමනාව හිමි විය යුතු නැත්නම් සවිබල ගැන්විය යුතු තවත් ලක්ෂ හයක් අපි එන මාර්තු මාසය වෙනකොට අපි සවිබල ගන්වන්නට කටයුතු කරනවා. පසුගිය කාල වකවානුව තුළ සමෘද්ධි දීමනාව බහුතරයක් ලබා දී තිබුණේ නුසුදුස්සන්ටය කියන එක අපි දන්නවා. 1994 වර්ෂයේ බලයට පත් වූ රජයේ දේශපාලන ව්‍යාපෘතිය තමයි සදමෘද්ධි ව්‍යාපාරය. මේ අසාර්ථක සමෘද්ධි ව්‍යාපාරය සාර්ථක විදියට, ජනතාව සවිබල ගැන්වෙන විදියට සකස් කරන්නය කියා මම මේ වෙලාවේ ගරු දයා ගමගේ අමාත්‍යතුමාගෙනුත්, අධීක්ෂණ මන්ත්‍රීතුමියගෙනුත් ඉල්ලීමක් කරනවා. ලක්ෂ 14ක් ජනතාව සමෘද්ධි දීමනාව ලබනවා. නමුත් පසුගිය වසර 23 පුරාම එක දිගට සමෘද්ධි දීමනාව ලබා ගත් අය ඉන්නවා. මේ ව්‍යාපාරය සාර්ථක ව්‍යාපාරයක් නම් වසර 23ක් එකම පුද්ගලයාට සමෘද්ධි දීමනාව දෙන්නට අවශ්‍ය වෙන්නේ නැහැ. එහෙම නම් සමෘද්ධි ව්‍යාපාරයෙන් සමෘද්ධිමත් වෙච්ච පිරිස අයින් කරන්නට කටයුතු කරන්නට ඕනෑ. සමෘද්ධි නියාමක මහත්මයා තමයි දේශපාලන ව්‍යාපාරය ගෙන ගියේ කියන එක අපි දන්නවා. ඒ අය හැන්ද අතේ තියාගෙන බෙදුවා. දුප්පත්කම හිඟන්නාගේ තුවාලයක් කර ගෙන පසුගිය රජය බොරදියේ මාළු බෑවා. සමස්ත ශ්‍රී ලාංකික ජනතාවගේම කොඳුනාරටිය බිඳ දාපු ව්‍යාපෘතිය තමයි සමෘද්ධි ව්‍යාපෘතිය කියන්නේ. යැපුම් මානසිකත්වයක් ඇති කර, වහල් මානසිකත්වයක් ඇති කර මේ රටේ ජනතාව අනුන්ට අතපාන ජාතියක් බවට පත් කළේ මේ සමෘද්ධි ව්‍යාපෘතියයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනිවාර්යයෙන්ම දිළිඳු අය සවිබල ගැන්විය යුතුයි. හැබැයි, ස්වශක්තියෙන් නැගිටින්නට පුළුවන් ජනසවිය වාගේ ව්‍යාපාරයක් ආපසු පටන් ගන්න කියලා මා ඉල්ලනවා. අපට වහල්ලු ඕනෑ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට ලබාදුන් කාලය අවසානයි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මට තව විනාඩි දෙකක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපට වහල්ලු ඕනෑ නැහැ. අපට වහල් හිමියන් වෙන්න ඕනෑත් නැහැ. ඒ නිසායි අපි එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා කියන ව්‍යාපෘතිය ගෙන ආවේ. ඒ තුළ අපි තරුණයන් ස්වශක්තියෙන් නැගිටීමට දිරි ගන්වනවා. තරුණ සේවා සභාවත් එක්ක සම්බන්ධ කරලා තරුණයන්ට ස්වශක්තියෙන් නැගිටින්නට අපි පාර කපලා තියෙනවා. අපි රුපියල් මිලියන 500ක් වෙන් කරලා තියෙනවා, අලුත් තරුණ ව්‍යවසායකයන් බිහි කරන්නට. අපි කෙටි කාලීන සහන සමෘද්ධියෙන් සලසන ගමන් දිගු කාලීනව දිළිඳුකම තුරන් කරන්නට, තරුණ පරපුර කිසිවෙකුට අතපාන්නේ නැති පිරිසක් කරන්න මේ තුළ කටයුතු කරලා තියෙනවා. පසුගිය යුගයේ ටකරන් බෙදලා, සාරි බෙදලා, සෙරෙප්පු බෙදලා, හාල් සේරුව බෙදලා, දිළිඳුකම ආයුධයක් කර ගත්ත බාලප්‍රයෝග අප අතරේ නැහැ කියලා මතක් කරන්න ඕනෑ. අපි ජනසවිය, ගම්උදාව, මහපොළ, ඇඟලුම් කම්හල්, නිදහස් වෙළඳ කලාප ඇති කළා. ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමියනි, මට තව එක දෙයක් කියන්න විනාඩියක් දෙන්න. එදා ශෙහාන් සේමසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපි ට්‍රිලියන 2ක් ණයට ගන්නවා කියලා. ගිය අවුරුද්දේ අපි ලොකුම ණය වාරිකය ගෙව්වා, බිලියන 2,089ක්. මේ අවුරුද්දේදී බිලියන 2,053ක් ගෙවන්න තියෙනවා. ඒවා මේ අපි ගත්ත ණය නොවෙයි. ඒවා පසුගිය කාලයේ මත්තල හදන්න, හම්බන්තොට වරාය හදන්න, සූරිය වැව සම්මන්ත්‍රණ ශාලා හදන්න, අවුරුද්දක්වත් තියා ගන්න බැරි කොන්ක්‍රීට් පාරවල් හදන්න ගත්ත සල්ලි. උතුරු නැගෙනහිර පාරවල් හදනකොට එකට තුන අනුපාතයට තුන්ගුණයක් වැඩි කරලා ඇස්තමේන්තු කළේ. මෙන්න මේවා තමයි අද අපට ගෙවන්න වෙලා තිබෙන්නේ.

ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා කාලය වැඩිපුර ලබාදීම සම්බන්ධයෙන්. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ Twitter ගිණුමේ කියලා තිබුණා, "හොඳ යෝජනා තියෙනවා, නමුත් කරයිද කියලා සැකයි" කියලා. නමුත් අනිවාර්යයෙන්ම කියන්න ඕනෑ, අපි ඒවා සැලසුම් කරනවා කියලා. එක්සත් ජාතික පක්ෂ රජයක් කියන්නේ සියලු දේවල් කරලා පෙන්වපු රජයක් නිසා අපි මේ සියල්ලත් කරනවා. ඒ නිසා එතුමාට බය නැතුව ඉන්න කියන එක ප්‍රකාශ කරමින් මේ අය වැය මංගල අය වැයක්ම වේවා! මංගල්‍යයක්ම වේවා! කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON.(DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

[பி.ப. 6.13]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் 2019ஆம் ஆண்டு பங்குனி மாதம் 05ஆம் திகதி சமர்ப்பிக்கப் பட்டிருக்கின்றது. இந்த வரவு செலவுத்திட்டத்தில் அபிவிருத்தி தொடர்பான ஒரு சில விடயங்களே உள்ளடக்கப் பட்டிருக்கின்றன.

கடந்த காலத்தில் தமிழர்கள் தனிநாடு கேட்டு ஆயுத ரீதியாகப் போராட்டம் நடத்தினார்கள். 2009ஆம் ஆண்டு யுத்தம் முடிவுக்கு வந்தது. ஆயுதப் போராட்டம் மௌனித்ததன் பின்பு இருந்த அரசாங்கம், அதாவது, முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ தலைமையிலான அரசாங்கம், தமிழ் மக்களுக்கு உரிமைகள் ரீதியாக, அபிவிருத்தி ரீதியாக ஒன்றும் வழங்கவில்லை என்ற காரணத்தினால், 2015ஆம் ஆண்டு மைத்திரிபால சிறிசேன அவர்கள் பொது வேட்பாளராக ஜனாதிபதித் தேர்தலில் நிறுத்தப்பட்டபோது, ஒரு புதிய அரசாங்கம் உருவாக வேண்டும் என்று வடக்கு, கிழக்கிலிருக்கின்ற தமிழ் மக்கள், தமிழ் பேசும் மக்கள் தென்பகுதியிலிருக்கின்ற மக்கள் எல்லோருமே இணைந்து அவருக்கு வாக்களித்தார்கள். அதிமேதகு ஜனாதிபதி அவர்கள் பொது வேட்பாளராக இருந்தபோது, தான் அரசியலமைப்பு ரீதியாக ஒரு யாப்பு மாற்றத்தைக் கொண்டு வருவதாகக் கூறியிருந்தார். அதனடிப்படையில், தமிழர்கள் கௌரவமாக வாழக்கூடிய வகையில் இந்த நாட்டில் ஒரு தீர்வு முன்வைக்கப் பட வேண்டும் என்ற நோக்கத்திற்காகத் தமிழர்களும் இணைந்து இந்த அரசாங்கத்தைக் கொண்டுவந்தார்கள். ஆனால், யுத்தம் முடிந்து 10 வருடங்கள் நிறைவடைகின்றன. இந்த அரசாங்கம் வந்து 4 வருடங்கள் முடிந்துவிட்டன. ஆனால், மக்களுடைய எதிர்பார்ப்பு என்பது கானல் நீராகிப் போனதாகத்தான் இருக்கின்றது. 2009ஆம் ஆண்டு வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்பட்டவர்கள், நேரடியாக ஓமந்தையில் இராணுவச் சோதனைச் சாவடிகளில் ஒப்படைக்கப்பட்டவர்களெனப் பல்லாயிரக் கணக்கானவர் களின் உறவினர்கள் இன்று போராட்டம் நடத்திக் கொண்டிருக்கின்றார்கள்.

காணாமற்போனோர் தொடர்பான அலுவலகம் - OMP ஆரம்பிக்கப்பட்டபோது, அந்த அலுவலகம்மீது மக்களுக்கு நம்பிக்கையிருக்கவில்லை. இந்த அலுவலகத்தின்மூலம் விசாரிக்கப்பட்டுத் தங்களுடைய பிள்ளைகளுக்கு அல்லது தங்களுடைய கணவன்மாருக்கு என்ன நடந்தது என்பது பற்றிக் கூறுவார்கள் என்று மக்கள் நம்பவில்லை. ஆனால், தாங்கள் இராஜதந்திர ரீதியில் OMP இனை வரவேற்பதாக வெளிநாட்டு இராஜதந்திரிகள் கூறியிருந்தார்கள். அந்த வெளிநாட்டு இராஜதந்திரிகளிடமும் OMPஇல் பணியாற்று கின்ற பணியாளர்களிடமும் நான் ஒன்றைக் கேட்க விரும்புகின்றேன். எங்களுடைய மக்களுக்கு என்ன நடந்தது என்பதைக் கூறக்கூடிய விதத்தில் இந்த OMP இனால் ஒரு சதவீத முயற்சியாவது இன்றுவரை எடுக்கப்பட்டிருக்கிறதா என்பது கேள்விக்குறியாகத்தான் இருக்கின்றது. அங்கு குறித்த பதிவுகள் மேற்கொள்ளப்படுகின்றதே ஒழிய, உண்மையில் காணாமற்போனவர்களுக்கு என்ன நடந்தது என்பதைப் பற்றிக் கண்டுபிடிக்க இந்த அலுவலகம் எந்தவிதத்திலும் முயற்சி செய்யவில்லை. இந்த அலுவலகம் ஆரம்பிக்கப் பட்டபோது அது பற்றி ஒரு சிலருக்கு நம்பிக்கையிருந்தாலும், இன்று அவர்களிடமும் அந்த நம்பிக்கை இல்லை. OMP இனுடைய செயற்பாடுகள் காரணமாகவே மக்கள் அந்த நம்பிக்கையை இழந்திருக்கின்றார்கள். ஆகவே, மக்கள் எதிர்பார்த்த இந்த அரசாங்கம் மக்களுடைய உரிமை ரீதியாக, மக்களுடைய எதிர்பார்ப்பு ரீதியாகத் தோற்றுப் போய்விட்டது என்பதுதான் என்னுடைய கருத்தாக இருக்கின்றது.

அதேநேரத்தில், ஐ.நா மனித உரிமைகள் பேரவையில் 2015ஆம் ஆண்டு 30.1 தீர்மானம் நிறைவேற்றப்பட்டது; 2 வருட கால அவகாசம் கொடுத்தார்கள். பின்பு 2017ஆம் ஆண்டு 34.1 தீர்மானம் நிறைவேற்றப்பட்டது; அதற்கும் 2 வருட கால அவகாசம் கொடுத்தார்கள். தற்பொழுது ஐ.நா மனித உரிமைகள் பேரவையில் இலங்கை தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது; ஜெனீவா கூட்டத்தொடர் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. 2015ஆம் ஆண்டிலே வெளிநாட்டமைச்சராக இருந்த தற்போதைய நிதியமைச்சர் மங்கள சமரவீர அவர்கள் ஐ.நா மனித உரிமைகள் பேரவையில் பல வாக்குறுதிகளை வழங்கி யிருந்தார். அதில் குறிப்பிடும்படியாக எந்தவிதமான முயற்சிகளையுமே எடுக்கவில்லையென்று நான் கூறவில்லை. ஏனென்றால், இராணுத்தின் கட்டுப்பாட்டிலிந்த மக்களுடைய சொந்தக் காணிகளை விடுவிப்பதில் ஒரு சில முன்னேற்றங்கள் இருந்திருக்கின்றன. ஆனாலும், பயங்கரவாதத் தடைச்சட்டம், காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு உண்மையாக என்ன நடந்தது என்பதைக் கண்டறிதல் போன்ற, இணங்கிய பல விடயங்களுக்கான எந்த நடவடிக்கையும் இன்றுவரை குறிப்பிடத்தக்களவில் மேற்கொள்ளப்படவில்லை என்பதுதான் எனது கருத்தாகவிருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
இந்த வரவு செலவுத்திட்டத்தைப் பொறுத்தவரையில், இது மக்களுக்கு நன்மை பயக்கக்கூடிய விடயங்கள் இருந்தாலும், இதில் இராணுவத்தினருக்குக் கொடுத்த முக்கியத்துவம்தான் உண்மையில் கேள்விக்குறியாக இருக்கின்றது. இராணுவம், கடற்படை, மற்றும் ஆகாயப் படைகளுக்குக் கொடுக்கின்ற சலுகைகளை ஏன் யுத்தத்தினால் பாதிக்கப்பட்ட, அங்கங்களை

இழந்தவர்களுக்குக் கொடுக்கவில்லை? யுத்தம் முடிவடைந்து 10 வருடங்கள் ஆகியும் அங்கவீனர்களுக்கான மலசலகூட வசதிகூட இந்த அரசாங்கத்தால் அமைத்துக் கொடுக்கப் படவில்லை. மன்னார் மாவட்டத்தில் 120 பேரும் வவுனியா மாவட்டத்தில் 75 பேரும் முல்லைத்தீவு மாவட்டத்தில் 86 பேரும் மாற்றுத் திறனாளிகளுக்கான மலசலகூட வசதிக்காக விண்ணப்பித்திருந்தார்கள். அவர்கள் அதற்குத் தகுதியுடைய வர்கள் என்று மாவட்டச் செயலகத்தால் தீர்மானிக்கப்பட்டும், இந்த அரசாங்கம் அந்த மக்கள்மீது கரிசனை கொண்டிராத காரணத்தினால் இன்றுவரை அந்த வசதியினை அவர்கள் பெற்றுக்கொள்ள முடியாமல் இருக்கின்றார்கள். ஆனால், நிதியமைச்சர் அவர்கள் தனது உரையில், மலசலகூடங்கள் இல்லாத நாட்டை உருவாக்குவதாகக் கூறியிருந்தார். நான் குறிப்பிட்டவை என்னுடைய 3 மாவட்டங்களிதும் தரவுகளாகும். அதைவிட, இலங்கையின் மிகுதி 22 மாவட்டங் களிலும் அங்கவீனர்கள் இருக்கின்றார்கள். இந்த அங்கவீனர் களுக்குரிய மலசலகூடங்களை உடனடியாக இந்த வருடத்திற்குள் செய்து கொடுக்கவேண்டும் என்று நான் நிதியமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன். எங்களுடைய அந்த உறவுகள் யுத்தத்தினால் அங்கவீனர்களாக மாறியிருக்கலாம் அல்லது இயற்கையாகவே அங்கவீனர்களாக இருக்கலாம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have to wind up now.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ஆனால், அவர்களுக்கு மலசலகூட வசதியினைக்கூடச் சரியாக அமைத்துக்கொடுக்கவில்லை என்பதையிட்டு, அரசாங்கம் வெட்கப்படவேண்டும். அந்த வகையில், இந்த விடயத்தில் மிகவும் கவனமெடுத்து அதனை இந்த வருடம் நடைமுறைப்படுத்தவேண்டுமென்று வரவு செலவுத்திட்டம் மீதான என்னுடைய உரையில் கேட்டுக்கொள்ள விரும்பு கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. A.L.M. Nazeer. You have only nine minutes.

**ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)
පසුපෙළ මන්ත්‍රී කියලා හැමදාම මාව පිටුපස තියන්නේ නැතිව ඉදිරියට ගෙනෙන්න උත්සාහ කරන්න. ඉදිරියේ දී ඒ ගැන සලකා බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මෙම විවාදය 6.30ට අවසන් කරන්න ඕනෑ. ඊට පසුව කල් තැබීමේ යෝජනාව ගැනීමට තිබෙනවා.

[பி.ப. 6.22]

**ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்!*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டத்தில் எனக்கும் பேசச் சந்தர்ப்பம் தந்தமையையிட்டு நான் நன்றிகளைத் தெரிவித்துக்கொள்வதோடு, எங்களைப் படைத்த இறைவனை யும் இந்தச் சந்தர்ப்பத்தில் நினைவுகூருகின்றேன்.

அமைச்சரவையும் நிதி அமைச்சர் அவர்களும் ஐக்கிய தேசியக் கட்சியினுடைய தலைவர் ரணில் விக்கிரமசிங்க அவர்களும் கடந்த ஆண்டுகளில் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்டங்களைவிட, இந்த ஆண்டிற்கான வரவு செலவுத்திட்டத்தினை மிகவும் திறம்படத் தயாரித்திருக் கின்றார்கள் என்பதை இந்த இடத்திலே குறிப்பிடுகின்றேன். குறிப்பாக, கடந்த காலங்களில் நிகழ்ந்த சில விடயங்களை நான் இங்கு ஞாபகப்படுத்த வேண்டுமென்ற ஓர் எண்ணம் என்னுள் தோன்றியுள்ளது.

2015ஆம் ஆண்டு ஆட்சி மாற்றத்தை ஏற்படுத்த வேண்டும் என்று விரும்பி முஸ்லிம், தமிழர்கள் எல்லோரும் சேர்ந்து ஆட்சி மாற்றத்தை ஏற்படுத்தி, மஹிந்த ராஜபக்ஷ அவர்களிடமிருந்த நாட்டின் ஆட்சியை மைத்திரிபால சிறிசேன அவர்களிடம் கையளித்தார்கள். அதேபோன்று, ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் அதிகாரத்தை வழங்குமுகமாக அவரை இந்த நாட்டினுடைய பிரதமர் ஆக்கினார்கள். இந்த ஆட்சிக்கு மூன்றரை ஆண்டுகள் பூர்த்தியாகி, குறிப்பாக அரசியல் குழப்பநிலை இடம்பெற்றிருந்த 52 நாட்களில் நாட்டில் ஏற்பட்ட நிலைமைகள் எவ்வாறு இருந்ததென்பதை இந்த இடத்தில் நான் ஞாபகப்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. அந்த நிலைமை காரணமாக புதிய 'கம்பெறலிய' திட்டத்தினூடான அபிவிருத்திகளுக்குக்கூடத் தடங்கல் ஏற்பட்டது. இந்த வருடத்தினுடைய வரவு செலவுத்திட்டம் ஏன் தாமதமாகி மார்ச் மாதத்தில் சமர்ப்பிக்கப்பட்டது என்பதை மாற்றுக் கட்சியில் இருக்கின்றவர்கள் - எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் ஞாபகம் வைத்துக்கொள்ள வேண்டும். குறித்த 52 நாட்களில் நடந்தேறிய விடயங்களைப் பற்றிப் பேச வேண்டும். மஹிந்த ராஜபக்ஷ அவர்கள் பிரதமர் பதவியை எடுத்த பின்னர் நடைபெற்ற முதலாவது அமைச்சரவையிலே அவர் எடுத்த முடிவு என்னவென்றால் 'கம்பெறலிய' திட்டத்தை இரவோடிரவாகத் தடுத்தமையாகும். இதை நான் இந்த இடத்திலே ஞாபகப்படுத்துகின்றேன்.

இந்த வரவு செலவுத்திட்டமானது மிகச் சிறப்பாகத் தயாரிக்கப்பட்டிருக்கின்றது. இதன்மூலம் தேசிய ரீதியாக நாடளாவிய ரீதியில் எல்லா அமைச்சர்களும் சரியாக இயங்குவதை இந்த நாட்டிலிருக்கின்ற மக்கள் எல்லோரும் பார்க்கின்றார்கள். எங்களுடைய நாட்டிலே பணவீக்கம் என்பது மிகவும் குறைவாக இருக்கின்றது என்பது எங்களுக்கு நன்றாகத் தெரிந்த விடயம். மஹிந்த ராஜபக்ஷ அவர்களாக இருக்கலாம் அல்லது மைத்திரிபால சிறிசேன அவர்களாக இருக்கலாம், யார் நாட்டினுடைய ஜனாதிபதியாக இருந்தாலும், பிரதமராக இருந்தாலும் இந்த நாட்டினுடைய பிற்போக்கு நிலை எங்களுக்கு நன்றாகத் தெரிந்ததொரு விடயம். ஆயினும், இந்தக் காலகட்டத்தில் இந்த வரவு செலவுத்திட்டம் மிகவும் சிறப்பாகத் தயாரிக்கப் பட்டிருக்கின்றது.

[ගරු ඒ.එල්.එම්. නසීර් මහතා]

கடந்த 2015ஆம் ஆண்டை எடுத்துக்கொண்டால் வடக்கு, கிழக்கிலே யுத்தத்தினால் பாதிக்கப்பட்ட அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை அதேபோன்று யாழ்ப்பாணம், மன்னார், முல்லைத்தீவு போன்ற மாவட்டங்களில் பாரிய அபிவிருத்திகள் நடந்திருக்கின்றன. நாங்கள் எல்லோரும் இதனை ஏற்றுக்கொண்டேயாக வேண்டும். இந்த ஆண்டு வரவு செலவுத்திட்டத்திலேகூட இதற்காகப் பாரியளவு நிதி உள்வாங்கப்பட்டிருக்கின்றது. குறிப்பாக என்னுடைய கட்சித் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள் முன்வைத்த யோசனைக்கமைய கல்முனை, சம்மாந்துறை, வாழைச்சேனை போன்ற பிரதேசங்களின் அபிவிருத்திக்காக 2,000 மில்லியன் ரூபாய் நிதி இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் வழங்கப்பட்டிருக்கின்றது. அதுமட்டுமன்றி, கௌரவ அமைச்சர் சஜித் பிரேமதாச அவர்களிடம் சென்று நாங்கள் வீட்டுத் திட்டங்களைக் கேட்கின்றபோது உடனடியாக அங்குள்ள பிரதேசங்களுக்கு அவர் வீட்டுத் திட்டங்களைத் தருகின்றார். அதேபோன்று, சுகாதார அமைச்சராக இருக்கின்ற கௌரவ ராஜித சேனாரத்ன அவர்களும் எங்களுக்கு உதவி புரிந்து வருகின்றார். எங்களுடைய பகுதிகளிலே புனரமைக்கப்படாத நிலையில் இருந்த வைத்தியசாலைகள் புனரமைக்கப் பட்டிருக்கின்றன. இந்த வகையில் இன்று எல்லா இடங்களிலும் பாரிய அபிவிருத்திகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன; இன்று நாங்கள் பாரிய முன்னேற்றங்களைப் பார்க்கின்றோம்.

நான் கிழக்கு மாகாணத்தின் சுகாதார அமைச்சராக இருந்தபோது கிழக்கில் வருகின்ற நிதிகள் ஊடாகவும் அங்கு சுகாதாரத்துறை மேம்படுத்தப்பட்டது. அதேநேரம் மத்திய அரசாங்கத்தில் அமைச்சராக இருக்கின்ற ராஜித சேனாரத்ன அவர்கள் 2016 - 2017 காலப்பகுதிகளில் பாரிய நிதியினை எங்களுக்குத் தந்துதவினார். நான் பாராளுமன்றத்துக்கு வந்த பின்னரும்கூட எங்களுக்கு நிதி வழங்கப்பட்டு வருகின்றது. நடப்பு ஆண்டிலும்கூட நாங்கள் கேட்கின்ற நிதியை உரிய அமைச்சர்கள் எங்களுக்கு வழங்கி வருகின்றார்கள்; சென்ற ஆண்டிலும்கூட வழங்கினார்கள். இப்படியாக நாட்டின் எல்லாப் பிரதேசங்களிலும் அபிவிருத்திகள் முன்னெடுக் கப்பட்டு வருகின்றபோது மக்களுக்குச் சந்தோசமாக இருக்கின்றது.

இந்த நாட்டில் இருக்கின்ற மாற்றுக் கட்சியினர் மீண்டும் அதிகாரத்தைப் பெற வேண்டுமென்று அவர்கள் காட்டுகின்ற படங்களும் பகட்டுகளும் எங்களுக்குத் தெரிந்த விடயமாகும். அவர்கள் சுமார் 20 ஆண்டுகள் இந்த நாட்டின் ஆட்சியைத் தம்வசம் வைத்திருந்தார்கள். அவ்வேளையில் அவர்கள் செய்த அநியாயங்கள், வெள்ளை வேனில் வந்து ஆட்கடத்தல் மற்றும் உயிர்களைக் கொன்றமை என்பன எல்லாம் எங்களுக்கு நன்றாகத் தெரிந்த விடயமாகும். நிலைமைகள் இவ் வாறெல்லாம் இருந்ததனால்தான் அந்த ஆட்சியை அகற்றிவிட்டு மீண்டும் ஒரு புதிய ஆட்சி தேவையென்று கருதி நாங்கள் இந்த ஆட்சியினை உருவாக்கினோம். ஆனால், இந்த ஆட்சியினைக் குழப்பி, மீண்டும் ஆட்சியை கைப்பற்ற வேண்டுமென்று தீய சக்திகள் எங்களுடன் வந்து மோதின. இந்தப் பாராளுமன்றத்தைக்கூடக் கலைத்தார்கள். இந்த வரவு செலவுத்திட்டம் இந்த மார்ச் மாதம் 5ஆம் திகதி சமர்ப்பிக்கப்படுவதும் கேள்விக்குறியாகவே இருந்தது. ஆனால், உச்சநீதிமன்றம் எங்களுக்குச் சரியான தீர்வைத் தந்தது.

இன்று கிழக்கில் நாங்கள் பெறவேண்டிய விடயங்கள் ஏராளம் இருக்கின்றன. அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்கள் போன்று ஒவ்வொரு பிரதேசத்திலும் மீள்குடி யேற்றச் செயற்பாட்டைத் துரிதப்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. அங்கு சுனாமியால் பாதிக்கப்பட்டவர்கள் இருக்கின்றார்கள்; யுத்தத்தினால் இடம்பெயர்ந்தவர்கள் இருக்கின்றார்கள்; பலதரப்பட்ட வசதியில்லாதவர்கள் இருக்கின்றார்கள். இந்த நிலையிலும் அங்கு மக்களுடைய காணிகளைச் சம்பந்தப்பட்ட அரச உயரதிகாரிகள் இன்னமும் விடுவிக்காதிருக்கின்றார்கள். அரசிடம் நாங்கள் பிச்சை கேட்கவில்லை. அந்த மக்களுடைய காணிகளை விடுவிக்குமாறுதான் நான் இந்த கௌரவமான சபையிலே வேண்டிக் கொள்கின்றேன். குறிப்பாக, அம்பாறை மாவட்டத்திலேயிருக்கின்ற பொத்துவில், கரங்கோ, கோமாரி, வட்டமடு போன்ற பிரதேசங்களிலிருக்கின்ற அந்த ஏழை மக்களின் காணிகளை விடுவிக்கின்றபோது, அந்த மக்கள் தங்களுடைய நாளாந்த வாழ்வாதாரத்தை கொண்டுநடத்து வதற்கு அது உதவியாக இருக்குமென்று இந்த உயர் சபையிலே தெரிவித்துக்கொண்டு, நேரத்தைக் கருத்திற் கொண்டு எனது பேச்சை இத்துடன் முடிக்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***
***එතැන් සිට විවාදය 2019 මාර්තු මස 09වන සෙනසුරාදා පවත්වනු ලැබේ.***

*அப்போது பி. ப. 6.30 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம் 2019 மார்ச் 09, சனிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.*
*Debate to be resumed on Saturday, 09th March, 2019.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. Hon. Member, you have ten minutes.

## විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා දීමනාව සහ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වැඩි කිරීම
## மாற்றுத்திறனாளிகளுக்கான கொடுப்பனவு மற்றும் சமுர்த்தி பயனாளிகளின் எண்ணிக்கையை அதிகரித்தல்
## ALLOWANCE FOR PERSONS WITH SPECIAL NEEDS AND INCREASE NUMBER OF SAMURDHI RECIPIENTS

[பி.ப. 6.30]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. சமூக வலுவூட்டலுக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் அவர்கள் இப்பொழுது இங்கு இல்லாவிட்டாலும் கௌரவ இராஜாங்க அமைச்சர் அவர்கள் சபையில் இருக்கின்ற இந்தச் சந்தர்ப்பத்திலே நான் எனது ஒத்திவைப்புவேளைப் பிரேரணையை முன்வைக்கின்றேன்.

> வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களில் மொத்தமாக 7,080 மாற்றுத்திறனாளிகள் உள்ளனர். இவர்களில் 1,852 பேருக்கு மட்டுமே அவர்களுக்கான 3,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்படுகின்றது. மிகுதியாக விருக்கும் 5,228 பேருக்கும் அந்தக் கொடுப்பனவு வழங்கப்படவில்லை. அவர்கள் நீண்டகாலமாகக் குறித்த கொடுப்பனவுக்காக எதிர்பார்த்திருக்கின்றனர். 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் இவர்களுக்கான 3,000 ரூபாய் கொடுப்பனவை 5,000 ரூபாவாக அதிகரித்திருப்பதாக நிதி அமைச்சர் அவர்கள் அறிவித்திருந்தார். அந்த அறிவிப்பை நான் வரவேற்பதோடு மீதமிருக்கின்ற மாற்றுத்திறனாளிகள் அனைவருக்கும் இக்கொடுப்பனவுவை கௌரவ அமைச்சர் அவர்கள் வழங்க வேண்டுமென்று கேட்டுக்கொள்ளுகின்றேன்.

குறிப்பாக வவுனியா மாவட்டத்தில் 2,633 மாற்றுத் திறனாளிகள் உள்ளபோது 487 மாற்றுத்திறனாளிகளுக்கு மட்டுமே 3,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்படுகின்றது; 2,146 மாற்றுத்திறனாளிகள் இன்னும் அந்தக் கொடுப்பனவை எதிர்பார்த்திருக்கிறார்கள். அதேபோல, முல்லைத்தீவு மாவட்டத்தில் 2,442 மாற்றுத்திறனாளிகள் உள்ளபோதும் 913 மாற்றுத்திறனாளிகளுக்கு மட்டுமே இந்த 3,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்படுகின்றது; 1,529 மாற்றுத் திறனாளிகள் இந்தக் கொடுப்பனவை எதிர்பார்த் திருக்கிறார்கள். இதேபோன்று, மன்னார் மாவட்டத்தில் 2,005 மாற்றுத்திறனாளிகள் உள்ளபோதும் 452 பேருக்கு மட்டுமே இந்தக் கொடுப்பனவு வழங்கப்படுகின்றது; 1,553 பேர் இந்தக் கொடுப்பனவை எதிர்பார்பார்த்திருக்கிறார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயம் தொடர்பாகக் கவனத்திற்கொள்ளுமாறு கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, முல்லைத்தீவு மாவட்டத்தில் சமுர்த்தித் திட்டம் அமுல்படுத்தப்படுவது தொடர்பாகப் பின்வரும் கோரிக்கையை முன்வைக்கின்றேன்.

> 2012ஆம் ஆண்டு முதல் முல்லைத்தீவு மாவட்டத்தில் சமுர்த்தித் திட்டம் அமுல்படுத்தப்படுவது தாங்கள் அறிந்த விடயமே. எனினும் கரைதுறைப்பற்று, புதுக்குடியிருப்பு ஆகிய இரண்டு பிரதேசச் செயலகப் பிரிவுகளிலுமுள்ள 65 கிராம அலுவலர் பிரிவுகளில் 23 கிராம அலுவலர் பிரிவுகளில் சமுர்த்தி திட்டம் இதுவரை அமுல்படுத்தப்படவில்லை. காரணம், 2012ஆம் ஆண்டு ஐப்பசி மாதத்திற்குப் பின்னரே இந்த 23 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த மக்களும் மீளக் குடியமர்த்தப்பட்டனர். இந்த மக்கள் மீளக் குடியமர்த்தப்பட்டு இன்று கிட்டத்தட்ட 07 வருடங்கள் நிறைவடைகின்றன. யுத்தத்தினால் முழுமையாகப் பாதிக்கப்பட்ட இவர்கள் இடம்பெயர்ந்து, பின்னர் மெனிக் பாம் முகாமிலே இருந்து, 2012ஆம் ஆண்டு மீளக் குடியமர்த்தப்பட்டார்கள். இவ்விடயம் தொடர்பில் நாங்கள் இரண்டு வருடத்திற்கும் மேலாகத் தொடர்ந்து வலியுறுத்தி வருகின்றபோதும், மாறிமாறி வருகின்ற அமைச்சர்கள் வாய்மூலம் வாக்குறுதிகளை வழங்குகின்றார்களே தவிர, அவ்வறிய மக்களுக்குச் சமுர்த்தி நிவாரணத்தை வழங்குவதற்கான எவ்வித முன்னேற்றமான நடவடிக்கைகளும் இன்றுவரை முன்னெடுக்கப்படவில்லை. முல்லைத்தீவு மாவட்டச் செயலாளரினால் குறித்த மாவட்டத்தில் 23 கிராம அலுவலர் பிரிவுகள் உட்பட முல்லைத்தீவு மாவட்டத்தில் 13,921 வறிய குடும்பங்களைத் தெரிவுசெய்யப்பட்டு, அவர்கள் சம்பந்தமாக சமுர்த்தி பணிப்பாளர் நாயகத்திற்குக் கடிதமூலம் கோரிக்கை விடுத்தமை இங்கு குறிப்பிடத்தக்கது. ஆனால், இதுவரையில் அதுகுறித்து எந்தவித நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எனவே, இந்த 23 கிராம அலுவலர் பிரிவுகளிலுமுள்ள மக்களுக்கும் சமுர்த்தி திட்டத்தினை அமுல்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

தண்ணீரூற்று கிழக்கு, செம்மலை கிழக்கு, கொக்குத் தொடுவாய் மத்தி, கொக்குத்தொடுவாய் வடக்கு, குமாரபுரம், முள்ளிவாய்க்கால் மேற்கு, தண்ணிமுறிப்பு, அம்பலவன் பொக்கணை, கேப்பாப்பிலவு, கொக்குத்தொடுவாய் தெற்கு, புதுக்குடியிருப்பு கிழக்கு, புதுக்குடியிருப்பு மேற்கு, கோம்பாவில், இரணைப்பாலை, ஆனந்தபுரம், சிவன்நகர், மந்துவில், மல்லிகைத்தீவு, உடையார்கட்டு வடக்கு, உடையார்கட்டு தெற்கு, சுதந்திரபுரம், வள்ளிபுனம், தேவிபுரம் ஆகியன இந்த 23 கிராம அலுவலர் பிரிவுகளுமாகும். இங்கு இன்றுவரை ஒருவருக்கேனும் சமுர்த்தி நிவாரணம் வழங்கப்படவில்லை என்பதையிட்டு அரசாங்கம் வெட்கப்பட வேண்டும்.

நான் கடந்த ஒன்றரை வருடங்களுக்கு முன்பு அமைச்சராக இருந்த எஸ்.பி. திஸாநாயக்க அவர்களிடம் இந்த விடயம் தொடர்பாகப் பாராளுமன்றத்தில் கேள்வி கேட்டிருந்தேன். அதற்கு அவர், இரண்டு மாதங்களில் அந்த சமுர்த்தி நிவாரணத்தை வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுப்பதாகக் குறிப்பிட்டார். கௌரவ அமைச்சர் அவர்களே, இந்த 23 கிராம அலுவலர் பிரிவுகளில் சமுர்த்தி நிவாரணம் வழங்கப்படாமைபோல் தென்பகுதியில் சமுர்த்தி நிவாரணம் கொடுக்காமல் உங்களால் இருக்க முடியுமா? யாருக்கேனும் சமுர்த்தி கொடுக்கப்படாத ஒரு மாவட்டம் தென்பகுதியில் இருக்கின்றதா? அவ்வாறு இல்லை என்பதை கௌரவ அமைச்சர் அவர்கள் ஏற்றுக்கொள்ள வேண்டும். உண்மையில் எங்களுடைய மக்கள் எல்லாவற்றையும் இழந்து நிற்கின்றார்கள். வறிய மக்களுக்கு அரசாங்கத்தால் வழங்கப் படுகின்ற சமுர்த்தி நிவாரணம்கூட இன்றுவரை இவர்களுக்குக் கிடைக்கவில்லை.

இவ்விடயமாக தற்போதைய அமைச்சர் அவர்களுடைய காலத்தில் அல்ல, இதற்கு முதல் அமைச்சராக இருந்த எஸ்.பி. திஸாநாயக்க அவர்களுடைய காலத்தில் அவரைச் சந்திப்பதற்காக நான் இரண்டு தடவைகள் அமைச்சுக்குச் சென்றிருக்கின்றேன். அதேநேரம் அமைச்சுக்கு வந்து பணிப்பாளர் நாயகத்திடம் இது தொடர்பாகத் தெளிவுபடுத்தியிருந்தேன். அதற்கு பணிப்பாளர் நாயகம் அவர்கள் அந்த சமுர்த்தி நிவாரணத்தை வழங்குவதாகக் கூறினார். ஆனால், இன்றுவரை அதனை வழங்குவதற்கு எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதை மனவேதனையுடன் தெரிவித்துக்கொள்கிறேன்.

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

நான் இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணை மூலம் இவ்விடயத்தை மீண்டும் இச்சபையில் கொண்டுவந்தமைக்குக் காரணம் இருக்கின்றது. அதாவது, முன்னர் இரண்டு பிரதான கட்சிகளின் கூட்டரசாங்கம் இருந்ததனால், குறித்த விடயம் தங்களுக்குச் சம்பந்தம் இல்லை என்று ஒவ்வொரு தரப்பினரும் மாறி மாறிக் கூறுவர். தற்பொழுது, இந்த அரசாங்கத்தை ஐக்கிய தேசிய முன்னணி வழிநடத்திச் செல்கின்றது. அந்த வகையில் இந்த அரசாங்கம் ஒரே தலைமைத்துவத்தின்கீழ் சென்றுகொண்டிருக்கின்றது. எமது மக்களுக்கு நிவாரணத்தைப் பெற்றுக்கொடுக்கவேண்டும் என்ற நோக்கத்துக்காக இந்த அரசாங்கத்தின்மீது நம்பிக்கை வைத்து, நான் இந்தப் பிரேரணையை முன்மொழிந்திருக்கின்றேன். ஆகையால், இதற்கான நல்லதொரு பதிலை கௌரவ அமைச்சர் அவர்களிடமிருந்து நான் எதிர்பார்க்கின்றேன்.

அதேநேரத்தில், 2019ஆம் ஆண்டு வரவு செலவுத்திட்ட உரையில் "மாற்றுத் திறனாளிகளுக்குக் கொடுக்கப்படுகின்ற 3,000 ரூபாய் கொடுப்பனவு 5,000 ரூபாயாக அதிகரிக்கப்படும்" என நிதி அமைச்சர் அவர்கள் கூறியிருந்தார். உண்மையில் இது வரவேற்கத்தக்க விடயமாகும். ஏனென்றால், மாற்றுத் திறனாளிகள் வைத்தியசாலைக்குச் செல்வதாக இருந்தால்கூட, முச்சக்கரவண்டியில்தான் செல்லவேண்டும். தன்னிச்சையாக பஸ்களில் ஏறிப் பயணிப்பது அவர்களுக்கு முடியாது. ஆகவே, அவர்களுக்கு அதிக செலவு ஏற்படுகின்றது. உண்மையில், 3,000 ரூபாய் தொகையை 5,000 ரூபாயாக அதிகரித்ததை நான் வரவேற்கின்றேன். இவ்வாறு மாற்றப்பட்டது மனத்திருப்தியை அளித்தாலும்கூட, ஏற்கெனவே குறிப்பிட்ட தொகையினருக்கு மட்டும்தான் 3,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்பட்டுக் கொண்டிருக்கின்றது. நான் ஏற்கெனவே அந்தத் தரவுகளைக் குறிப்பிட்டிருந்தேன். கௌரவ எஸ்.பி. திசாநாயக்க அவர்கள் அமைச்சராக இருந்தவேளையில், நான் அவரது அமைச்சுக்குச் சென்று இந்த விடயம் தொடர்பாகக் கூடிய கவனம் எடுக்கும்படி கேட்டிருந்தேன். 2 மாதங்களில் ஏனையவர்களுக்கும் அந்தக் கொடுப்பனவை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பதாக அவர் குறிப்பிட்டிருந்தார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you have only two more minutes.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ஆனால், இன்றுவரை ஏனைய மாற்றுத்திறனாளிகளுக்கு உரிய பலன்கள் கிடைக்கவில்லை. நான் பிரதிநிதித்துவப் படுத்துகின்ற 3 மாவட்டங்களில் இருக்கின்ற மாற்றுத் திறனாளிகளுக்கும் இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் - தங்களுடைய அமைச்சின்மூலம் நிவாரணம் கிடைக்க வேண்டும். புதிதாகக் கொடுக்கப்படவிருக்கின்றன 5,000 ரூபாய் கொடுப்பனவு மாவட்டத்திலிருக்கின்ற அனைத்து மாற்றுத்திறனாளிகளுக்கும் கிடைக்க வேண்டும் என்பதுதான் என்னுடைய கோரிக்கையாகும். உண்மையில், பலாலியில் airport கட்டினாலும் சரி, மத்தளையில் airport கட்டினாலும் சரி, அதனால் மாற்றுத்திறனாளிகளுக்கு எந்தவித நன்மையும் கிடைக்கப்போவதில்லை. அவர்கள் இயற்கையாக மாற்றுத்திறனாளிகளாக இருக்கலாம் அல்லது யுத்தத்தின் நிமித்தம் மாற்றுத்திறனாளியாகி இருக்கலாம். எவரானாலும் நீங்கள் கொடுக்கவிருக்கின்ற 5,000 ரூபாய் அவர்களுடைய வாழ்க்கையில் மிகவும் அத்தியாவசியமானதாகப் பயன்படப் போகின்றது. உண்மையில் இது நல்ல விடயம். இத்திட்டத்தை நான் வாழ்த்துகின்றேன். இந்தக் கொடுப்பனவு ஒவ்வொரு மாட்டத்திலுமிருக்கின்ற அனைத்து மாற்றுத்திறனாளிகளுக்கும் கிடைக்கவேண்டும். அப்படிக் கிடைத்தால்தான் அவர்கள் மிகுந்த சந்தோசமடைவார்கள். அவர்கள் மனதளவில் எவ்வளவு கஷ்டப்பட்டாலும் இந்த வரவு செலவுத் திட்டத்தைப் போற்றுவார்கள். இந்த வரவு செலவுத் திட்டம் மாற்றுத் திறனாளிகள் போற்றுகின்ற ஒன்றாக அமையவேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் இந்த மாற்றுத்திறனாளிகளுக்கு நிவாரணம் வழங்குவது குறித்து தகுந்ததொரு பதிலுரையை வழங்க வேண்டும் என்று எதிர்பார்த்து விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you very much. Hon. S. Yoheswaran, please. You have five minutes.

[பி.ப. 6.41]

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் இ. சாள்ஸ் நிர்மலநாதன் அவர்களினால் முன்மொழியப்பட்ட ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிகின்றேன். உண்மையிலேயே வடக்கு, கிழக்கு யுத்தத்தால் மிகவும் பாதிக்கப்பட்ட பகுதிகள். நாங்கள் ஒன்றைக் கருத்திற்கொள்ள வேண்டும். அதாவது, இலங்கையில் மாகாண ரீதியில் பார்த்தால், வட மாகாணம் வறுமையில் முதலாவது இடத்தையும் கிழக்கு மாகாணம் வறுமையில் இரண்டாம் இடத்தையும் பெற்றிருக்கின்றது. மாவட்ட ரீதியில் பார்த்தால், வறுமையில் முதலாவது இடத்தில் கிளிநொச்சி மாவட்டமும் இரண்டாவது இடத்தில் முல்லைத்தீவு மாவட்டமும் மூன்றாவது இடத்தில் மட்டக்களப்பு மாவட்டமும் நான்காவது இடத்தில் திருகோணமலை மாவட்டமும் காணப்படுகின்றன. அந்த வகையில் வடக்கு, கிழக்கு மாகாணங்கள் வறுமையினால் மிகவும் பின்தங்கிய நிலையிலேயே காணப்படுகின்றன. கடந்த யுத்தச் சூழலினால் அந்தப் பகுதியில் மக்கள் பெரிதும் பாதிக்கப்பட்டு, மாற்றுத்திறனாளிகளாகவும் பலர் இருக்கின்றார்கள். இயற்கையாக மாற்றுத்திறனாளிகளான பலரும் அங்கு இருக்கின்றார்கள். உண்மையிலே கௌரவ பாராளுமன்ற உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்கள் கொண்டுவந்திருக்கும் இந்தப் பிரேரணை வரவேற்கத்தக்கதாகும். ஆகவே, இந்த விடயம் தொடர்பில் இந்தச் சபை கவனம் செலுத்தவேண்டும்.

நாங்கள் மட்டக்களப்பிலும் இதே நிலைமைகளைக் காண்கின்றோம். மட்டக்களப்பு மாவட்டத்திலே மொத்தமாக 7,139பேர் விசேட தேவைக்குரியவர்களாக இன்றும் காணப் படுகின்றார்கள். ஆனால், இதுவரை விசேட தேவைக் குரியவர்களுக்குரிய கொடுப்பனவை - உதவியைப் பெறுப வர்கள் 1,287 பேர் மட்டுமே. அதாவது, கோறளைப்பற்று வடக்கிலே 47 பேர், கோறளைப்பற்றிலே 112 பேர், கோறளைப்பற்றுத் தெற்கிலே 69 பேர், ஏறாவூர்ப் பற்றிலே 69 பேர், ஏறாவூர் நகரத்திலே 111 பேர், மட்டக்களப்பிலே 71 பேர், வவுணதீவிலே 70 பேர், காத்தான்குடியிலே 161 பேர்,

ஆரையம்பதியிலே 102 பேர், களுவாஞ்சிக்குடியிலே 102 பேர், பட்டிப்பளையிலே 112 பேர், வெல்லாவெளியிலே 125 பேர், கோரளைப்பற்று மேற்கிலே 68 பேர், கோரளைப்பற்று மத்தியிலே 68 பேர் என மொத்தமாக 1,287 பேர்தான் இந்தக் கொடுப்பனவைப் பெறுகின்றனர். ஏனையவர்கள் அந்த வசதியைப் பெறாத நிலையிலே இருக்கின்றார்கள். ஆகவே, இந்த மாற்றுத்திறனாளிகளுக்கேற்ற உதவிகளை வழங்குவதிலே அரசாங்கம் கூடிய கவனத்தைக் காட்டுவதற்கு முன்வர வேண்டும்.

அதுதவிர, மட்டக்களப்பு மாவட்டத்திலே தற்போது சமுர்த்தி பெறுபவர்கள் 76,667 பேராவர். இன்னும் 26,832 பேர் அதற்குத் தகுதியுடையவர்களென இனங்காணப்பட்டிருக்கின்றார்கள். சமுர்த்தியைப் பொறுத்தவரையில், வறுமையை அடிப்படையாகக் கொண்டுதான் அது வழங்கப்பட வேண்டும். சமுர்த்தி பெறுவதற்கு அரசாங்கம் ஆறு லட்சம் பேரை முன்மொழிந்தால், அவர்களில் அதிகமானோர் வடக்கு, கிழக்குப் பகுதியில் இருந்துதான் உள்வாங்கப்படவேண்டும். மட்டக்களப்பு மாவட்டத்திலுள்ள 14 பிரதேச செயலாளர் பிரிவிலே 1 - 10 வரையுள்ள தமிழ்ப் பிரதேச செயலாளர் பிரிவுகள் தொடர்ந்தும் வறுமைக்கோட்டின்கீழ் இருந்துவருகின்றன.

**ගරු මුලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
Okay.

ஆகவே, இந்த விடயம் ஆராயப்பட்டு, அந்த மக்களின் வறுமையைத் தீர்க்கும் வகையில் சமுர்த்தி நிவாரணங்களை வழங்குவதற்கு அரசாங்கம் முன்வரவேண்டும்.

அதேநேரத்தில், அங்கிருக்கின்ற சமுர்த்தி உத்தியோகத்தர்கள் சார்பாகப் பல பிரச்சினைகள் இருக்கின்றன. அது சம்பந்தமாக இராஜாங்க அமைச்சர் அவர்களிடம் பேசியிருக்கின்றோம். ஒரு காலத்தில் அவர்களின் நியமனங்கள் அரசியல் ரீதியாக நடைபெற்றன. அவர்கள் அரசியல் ரீதியாகத்தான் சில செயற்பாடுகளை மேற்கொள்கின்றார்கள். அதில் மாற்றம் வேண்டும். பல இடங்களில் சமுர்த்தி சார்பான மோசடிகள் இடம்பெற்றிருக்கின்றன. குறிப்பாக, கோரளைப் பற்றுப் பிரதேசச் செயலகம், கிரான் பிரதேசச் செயலகம், அதேபோன்று மட்டக்களப்புப் பிரதேசச் செயலகம் உட்பட்ட பகுதிகளில் அவ்வாறான விடயங்கள் தெளிவாக வெளிக்கொண்டுவரப்பட்டிருக்கின்றன. இந்த மோசடிகள் தொடர்பான விடயம் கணக்காய்வாளர் நாயகத்தினூடாக 'கோப்' குழுவுக்குக் கூட வந்திருக்கின்றது. அங்கு சமுர்த்தி உதவி வழங்கும்போது மிகவும் அவதானமான முறையில் வழங்கப்பட வேண்டும். உண்மையிலே வறுமைக்கோட்டின்கீழ் வாழுகின்ற மக்களுக்கு அவை வழங்கப்படவேண்டும்.

அதேநேரத்தில், இன்னுமொரு விடயத்தையும் கூற விரும்புகின்றேன். சமுர்த்தி உத்தியோகத்தர்கள் தொடர்ந்தும் ஒரே பிரதேச செயலகப் பிரிவிலே கடமையாற்றாமல் மாவட்டத்திலே பரவலாக எல்லா இடங்களிலும் கடமையாற்றக்கூடிய வகையிலான ஏற்பாடு இருக்க வேண்டும். சம்பந்தப்பட்டவர்கள் ஊழலில் ஈடுபட்டால் அது பற்றி ஆராயப்பட வேண்டும். வறுமை சார்பாக வழங்கப்படுகின்ற இந்த சமுர்த்தி தர்மமாகும். ஆகவே, அந்தத் தர்மம் கொச்சைப் படுத்தப்படக்கூடாது என்பதிலே அரசாங்கம் கவனஞ்செலுத்த வேண்டுமென்றும் வறுமைக்கோட்டின்கீழ் வாழுகின்ற வறிய மக்களுக்கு இந்தச் சமுர்த்தி நிவாரணங்களைச் சரியான முறையில் வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்றும் கேட்டு, நிறைவுசெய்கின்றேன்.

**ගරු මුලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Velu Kumar. You have five minutes.

[பி.ப. 6.46]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று சக உறுப்பினர் கௌரவ சாள்ஸ் நிர்மலநாதன் அவர்களால் முன்வைக்கப்பட்டிருக்கின்ற மாற்றுத்திறனாளிகளினது கொடுப்பனவு மற்றும் சமுர்த்திக் கொடுப்பனவு தொடர்பான ஒத்திவைப்புவேளைப் பிரேரணைமீதான விவாதத்திலே கலந்துகொண்டு உரையாற்ற வாய்ப்பளித்தமைக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, வரவு செலவுத்திட்டம் பற்றி விவாதிக்கப்பட்டுக்கொண்டிருக்கின்ற காலகட்டத்திலே சமுர்த்தி தொடர்பாக, மாற்றுத் திறனாளிகளின் கொடுப்பனவு தொடர்பாக அரசாங்கம் தன்னுடைய முழு அக்கறையினைக் காட்டிக்கொண்டிருக்கக் கூடிய ஒரு சூழ்நிலையிலே, அதுபற்றி மேலதிக கவனஈர்ப்பைச் செய்யக்கூடிய வகையிலான இந்தப் பிரேரணையை அவர் முன்வைத்திருப்பது வரவேற்கத்தக்கதாகும். சாள்ஸ் நிர்மலநாதன் அவர்களும் அதேபோல கௌரவ யோகேஸ்வரன் அவர்களும் கூறியதுபோல இலங்கையினுடைய சகல மாவட்டங்களிலும் அந்தத் தேவையுடையவர்களிலே அரைப்பங்கானவர்களுக்கும் குறைவானவர்களுக்கே அந்தக் கொடுப்பனவுகள் வழங்கப்பட்டு வருகின்றன. எவ்வாறு மாதாந்தக் கொடுப்பனவுத் தொகை அதிகரிக்கப் பட்டிருக்கின்றதோ, அதே அடிப்படையில் பயனாளிகளின் எண்ணிக்கையும் அதிகரிக்கப்பட வேண்டிய தேவை பெரிதும் காணப்படுகின்றது.

இன்று சமுர்த்தி கொடுப்பனவானது முழுக்க முழுக்க அரசியல்மயப்படுத்தப்பட்ட ஒன்றாகவுள்ளதென்பது இந்தச் சபையிலே சகல தரப்பினராலும் பேசப்படுகின்ற விடயமாக இருப்பதைக் காணலாம். எந்த வகையிலே இது அரசியல் மயப்படுத்தப்பட்டிருக்கின்றது என்றால், சமுர்த்தி உத்தியோகத்தர்களின் நியமனங்கள் முழுமையாக அரசியல் மயப்படுத்தப்பட்டவையாகக் காணப்படுகின்றன. ஆகவே, கடந்த காலம் முழுவதும் அவர்கள் சமுர்த்திக் கொடுப்பனவுக் குரியவர்களைத் தெரிவுசெய்கின்றபோது முற்றுமுழுதாக கட்சி அடிப்படையிலே, பல்வேறு விதமான தொடர்புகளின் அடிப்படையிலேயே தெரிவு செய்திருக்கின்றார்கள். இதிலே பெரிதும் பாதிப்புக்குள்ளாகி இருக்கக்கூடிய ஒரு பிரிவினராக பெருந்தோட்டங்களிலே இருக்கக்கூடிய மக்கள் காணப்படுகின்றார்கள். குறிப்பாக, இந்தப் பெருந்தோட்டங்களிலே இருக்கின்றவர்கள் நாட்கூலியைப் பெறுகின்ற ஊழியர்களாக இருக்கின்றபோதும், அந்த நாட்கூலியானது ஒரு முறையான பதிவேட்டிலே பதிவு

[ගරු වේලු කුමාර් මහතා]

செய்யப்பட்டு வழங்கப்படுவதன் காரணமாக அவர்களுடைய அந்தக் கொடுப்பனவை மையப்படுத்திக்கொண்டு அவர்கள் இந்தச் சமுர்த்திக் கொடுப்பனவுக்கு தகைமையற்றவர்கள் என்று கணிக்கின்ற ஒரு போக்கு தொடர்ச்சியாகக் காணப்படுகின்றது. கௌரவ சாள்ஸ் நிர்மலநாதன் குறிப்பிட்டதுபோல, இந்தச் சபையிலே நானும் கடந்த 3 வருடங்களாக இந்தத் துறைக்குப் பொறுப்பாக இருந்த முன்னாள் அமைச்சர் எஸ்.பி. திசாநாயக்க அவர்களிடம் அங்கிருக்கின்ற அசாதாரணத் தன்மையைப் பற்றி தொடர்ச்சியாகப் புள்ளிவிபரங்களோடு முன்வைத்திருக்கிறேன். இந்தக் குறைபாட்டை குறுகிய ஒரு காலத்திலே நிவர்த்தி செய்வதாக அவரும் தொடர்ச்சியாகக் குறிப்பிட்டாலும் எதுவுமே நடைபெறவில்லை.

தற்போது சமுர்த்திப் பயனாளர்களின் எண்ணிக்கை 600,000 ஆக அதிகரிக்கப்படுகின்றபோது, கட்டாயம் தோட்டப்பகுதிகள் சார்ந்த துறைகளில் ஒரு மீள் மதிப்பீடு செய்து - ஒரு மீள் பரிசீலனை செய்து அங்கிருந்தும் புதியவர்கள் உள்வாங்கப்பட வேண்டுமென்ற வேண்டுகோளை நான் இந்தச் சந்தர்ப்பத்திலே இங்கே இருக்கக்கூடிய கௌரவ இராஜாங்க அமைச்சர் ஊடாக கௌரவ அமைச்சருக்கு முன்வைத்துக் கொள்வதோடு, சமுர்த்தித் திட்டமானது எங்களுடைய மக்களுக்கும் கைகொடுக்கின்ற ஒன்றாக அமைய வேண்டும் என்று கேட்டுகொண்டு விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, Hon. Seyed Ali Zahir Moulana. You have ten minutes.

[பி.ப. 6.50]

**ගරු සෙයිඩ් අලි සාහිර් මවුලානා මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா - சமூக வலுவூட்டல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Seyed Ali Zahir Moulana - State Minister of Social Empowerment)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களால் கரிசனையுடன் முன்வைக்கப்பட்ட இந்த ஒத்திவைப்புப் பிரேரணையை முற்றுமுழுதாகப் பார்க்கின்றபோது, அங்கவீன முற்ற மாற்றுத்திறனாளிகளின் எண்ணிக்கையானது நாட்டின் மொத்த சனத்தொகையில் 7 சதவீதமாக இருப்பதைக் காணலாம். சமுர்த்தித் திணைக்களத்தின் அறிக்கையின்படி அதில் 75 வீதத்திற்கு அதிகமானோர் குறைந்த வருமானம் பெறும் பயனாளிகளாவர். குறைந்த வருமானத்தைப் பெறும் பயனாளிகளுக்குப் பல்வேறு விதமான உதவிகள் மற்றும் சேவைகள் வழங்குதல் இடம்பெற்று வருகின்றது. குறைந்த வருமானம் பெறும் அங்கவீனமுற்ற பயனாளிகளுக்கு மாதாந்தம் வழங்கப்படும் 3,000 ரூபாய் கொடுப்பனவானது முக்கிய இடத்தைப் பெறுவதுடன் தற்போது இவ்வாறான 32,000 பயனாளிகளுக்கு இக்கொடுப்பனவு வழங்கப்பட்டு வருகின்றது. மேலும் இந்தக் கொடுப்பனவினைப் பெற்றுக் கொள்வதற்காக காத்திருப்போர்ப் பட்டியலில் ஒட்டு மொத்தமாக முழு நாட்டிலும் கிட்டத்தட்ட 40,000 பயனாளிகள் உள்ளார்கள். இவ்வெண்ணிக்கை அதிகரித்துக் கொண்டுதான் இருக்கின்றது. அங்கவீனமுற்ற நபர்களுக்கான 3,000 ரூபாய் கொடுப்பனவு வழங்குவதற்கு மேலதிகமாக இக்கொடுப்பனவு களைப் பெற்றுக்கொள்பவர்களாயினும் பெற்றுக்கொள்ளா தவர்களாயினும் தேசிய செயலகத்தினூடாக - National Secretariat for Persons with Disabilities - அவர்களுக்குப் பல உதவிகளை இன்னும் அதிகமாகச் செய்து கொண்டிருக்கின்றோம். வீடமைப்புக்கான உதவிகள், சுயதொழில்வாய்ப்பினைப் பெற்றுக்கொடுத்தல், வைத்திய உதவிகள், அவர்களின் பிள்ளைகளுக்கு கல்வி உதவி வழங்குதல், உபகரணம் வழங்குதல் போன்ற சேவைகளை எங்களது செயலகத்தினூடாக நாங்கள் வழங்கிக் கொண்டிருக் கின்றோம். 3,000 ரூபாய் கொடுப்பனவினைக் கோரி இருப்பவர்கள் தொடர்பில் அக்கொடுப்பனவினை வழங்குவதற்கு முடியாதவேளையில், மேற்குறிப்பிட்ட உதவி களில் அவரவர்க்கு வழங்கக்கூடிய உதவிகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுகின்றது. அந்த அடிப்படையிலே 3,000 ரூபாய் கொடுப்பனவினைப் பெற்றுக்கொள்வதற்குக் காத்திருக்கின்ற பட்டியலிலுள்ள பயனாளிகளுக்கு முடியுமான வரை உதவிகள் வழங்குவதற்காக ஒவ்வொரு வருடமும் வேண்டுகோள் முன்வைக்கப்பட்டுள்ளது.

கௌரவ உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களது வினாவின் பிரகாரம் விசாரணை செய்யப்பட்டுள்ள இந்த 3 மாவட்டங்கள் தொடர்பில், தற்போது ரூபாய் 3,000 கொடுப்பனவாகப் பெறும் பயனாளிகளின் எண்ணிக்கை மற்றும் காத்திருப்புப் பட்டியலுள்ளவர்களின் எண்ணிக்கை எடுத்துக்கொள்வோம். இப்பொழுது வவுனியா மாவட் டத்திலே 481 பயனாளிகள் இருக்கின்றபோதிலும் கிட்டத்தட்ட 2,572 பேர் காத்திருப்புப் பட்டியலில் - waiting list - இல் இருக்கிறார்கள். அதுபோன்று முல்லைத்தீவில் 950 பேர் பயனாளிகள்; 1,648 பேர் காத்திருப்புப் பட்டியலில் உள்ளார்கள். ஆனால், இந்த எண்ணிக்கை இங்கு குறைவாகக் குறிப்பிடப்பட்டது. அதுபோன்று, மன்னாரிலே 452 பயனாளிகள் உள்ளனர்; 1,135 பேர் waiting list இல் இருக்கிறார்கள். ஒட்டுமொத்தமாக 1,883 பேர் பயனாளிகளாக இருக்கின்றார்கள். இவர்கள் இந்த 3,000 ரூபாய் கொடுப்பனவைப் பெறுகின்றார்கள். காத்திருப்புப் பட்டியலிலுள்ள 5,355 பேரையும் வெகு விரைவிலே பயனாளிகள் பட்டியலில் உள்வாங்கி, அவர்களுக்கும் மேற்குறிப்பிட்ட உதவிகளை அங்கவீன முற்றோருக்கான தேசிய செயலாகதினூடாக வழங்கு வதற்கு நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளது. இது தொடர்பான இரண்டு பட்டியல்கள் என்னிடம் உள்ளன. நேரம் போதாத காரணத்தினால் I **table*** two schedules and I will submit a copy to you also, Hon. Member.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Charles Nirmalanathan.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, எல்லோருக்கும் சலுகைகள் வழங்க முடியாது. குறிப்பிட்டவர்களுக்குத்தான் வழங்க முடியும். என்னுடைய கேள்வி என்னவென்றால், இவ்வளவு பேர் இருக்கின்ற காரணத்தால் இப்போதிருக்கின்ற அரசாங்கத்தினால் மேலதிகமாக புதிதாக -

**ගරු සෙයියිඩ් අලි සාහිර් මව්ලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
அதற்குரிய விடையை நான் உங்களுக்குத் தரவிருக் கின்றேன். நீங்கள் சொன்ன அத்தனையையும் நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். நீங்கள் ஒரு பிரேரணையை முன்வைத்திருக் கின்றீர்கள். அது என்னவென்றால், 2012ஆம் ஆண்டிலிருந்து முல்லைத்தீவு மாவட்டத்தில் குறைந்த வருமானப் பயனாளிக் குடும்பங்களில் 11,020 குடும்பங்களுக்கு சமுர்த்தி நிவாரண உதவிகள் வழங்கப்படுகின்றன. வடக்கு, கிழக்கில் நிலவிய யுத்தச் சூழ்நிலை முடிவுக்குக் கொண்டுவரப்பட்டதன் பின்னர் அப்பிரதேசங்களில் புதிதாக மீள்குடியேற்றப்பட்ட குடும்பங்கள் இதில் உள்ளடக்கப்பட வேண்டியுள்ளன என்பதுடன், நாடு பூராவும் புதிதாக சமுர்த்தி நிவாரண உதவிகளைக் கோருபவர்களின் எண்ணிக்கை அதிகரித்துள்ளது என்பதாகும். சமுர்த்தி அபிவிருத்தி திணைக்களத்தினூடாக 2016ஆம் ஆண்டில் இடம்பெற்ற நாடளாவிய ஆய்வினூடாக தற்போதுள்ள சமுர்த்திக் குடும்பங்கள் 1,386,050 என்பதுடன், மேலும் 840,000 புதிய குடும்பங்களுக்கு புதிதாக சமுர்த்தி நிவாரண உதவிகள் தேவை என அந்த அறிக்கை சொல்கிறது.

2018ஆம் ஆண்டில் சமுர்த்தி விடயத்திற்குப் பொறுப்பான அமைச்சர் அவர்களினால், வடக்கு, கிழக்கு யுத்தத்தினால் பாதிக்கப்பட்ட பிரதேசங்களுக்கு அதிக கவனம் செலுத்தி அங்கீகரிக்கப்பட்ட அமைச்சரவை விஞ்ஞாபனத்தின் பிரகாரம் 150,000 குடும்பங்களுக்கு புதிதாக நிவாரண உதவிகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டபோதும், அரசியல் குழப்பத்தின் காரணமாக மாத்தளை மற்றும் பொலன்னறுவை போன்ற இரு மாவட்டங்களுக்கு மாத்திரமே அவற்றினை அமுலாக்குவதற்கு முடிந்துள்ளது. அதேபோல, 2018.11.05ஆம் திகதிய PMO/7/1/Dev/2018 (v) என்ற இலக்க கடிதத்தினூடாக பிரதமரின் செயலாளரினால் புதிய பயனாளிகளைத் தெரிவு செய்தல் மற்றும் நிவாரணம் வழங்குவதை உடனடியாக நிறுத்துமாறு ஆலோசனை வழங்கப்பட்டுள்ளது. யுத்தத்தினால் பாதிக்கப்பட்ட நபர்களுக்கு அதிக கவனத்தினைச் செலுத்தும் வகையில், அமைச்சின் மேலதிக செயலாளர் உட்பட 5 அங்கத்தவர்களைக் கொண்ட குழுவினூடாக மாவட்ட மொன்றுக்கான புதிய பயனாளிகளின் எண்ணிக்கை தீர்மானிக் கப்பட்டுள்ளது என்பதுடன், அதன் பிரகாரம் முல்லைத்தீவு மாவட்டம் தொடர்பில் 1,768 குடும்பங்களுக்கு புதிதாக நிவாரண உதவிகளை வழங்குவதற்கு முன்மொழியப் பட்டுள்ளது. இனிவரும் காலங்களில் வடக்கு, கிழக்கு பிரதேசங்களில் அநாதரவாக்கப்பட்டவர்களுக்கு முன்னுரிமை வழங்கப்படும். ஏற்கெனவே சகோதர உறுப்பினர் கௌரவ யோகேஸ்வரன் அவர்களும் இந்த விடயம் பற்றிச் சொல்லியிருக்கிறார்.

அதுபோன்று, பெருந்தோட்டத்துறையிலேயுள்ள பிரச் சினைகள் பற்றி இங்கு சொல்லப்பட்டது. இப்போது, சமர்ப்பிக்கப்பட்டுள்ள வரவு செலவுத்திட்டத்தினூடாக ஆறு இலட்சம் புதிய பயனாளிகளை நாங்கள் அடையாளம் காண இருக்கின்றோம். கௌரவ யோகேஸ்வரன் அவர்கள் சொல்லியபடி, மிகவும் பாதிக்கப்பட்ட, வறுமைக் கோட்டின்கீழ் இருக்கின்றவர்களுக்கு ஏதோ ஒரு வகையில் முன்னுரிமை கொடுத்து, அந்த விடயத்தில் அவதானம் செலுத்துவோம். ஏனென்றால், எனது அமைச்சர் அவர்களும் நானும் கிழக்கு மாகாணத்தைச் சேர்ந்தவர்கள். இந்த விடயத்திலே நீங்கள் கரிசனை கொள்வதுபோன்று, நாங்களும் கரிசனை கொள்கின்றோம். ஆகையால், நிச்சயமாக அதை ஏற்றுக் கொள்கின்றோம். கௌரவ நிர்மலநாதன் அவர்கள் கொண்டுவந்த இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை இந்தக் காலகட்டத்தில் ஒரு முக்கியமான விடயமாகவே நாங்கள் கருதுகிறோம். எனவே, இவ்விடயம் தொடர்பில் கரிசனைகொண்டு, புதிய நிவாரண உதவிகளை வழங்கு வதற்கு நடவடிக்கை எடுக்கப்படும் என்பதை இந்த நேரத்தில் உங்களிடம் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තබන ලද අවස්ථාවේ යෝජනාවට අදාළ විවාදය අවසන් වෙනවා.

***එකල්හි වේලාව අ. භා. 7.00 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2019 පෙබරවාරි 21 දින සභා සම්මතිය අනුව, 2019 මාර්තු 09 වන සෙනසුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 7.00 மணியாகிவிடவே, மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளு மன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது 2019 பெப்ருவரி 21ஆம் திகதிய தீர்மானத்துக்கிணங்க, 2019 மார்ச் 09, சனிக்கிழமை மு.ப.9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 7.00 p.m.,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*
*Adjourned accordingly until 9.30 a.m. on Saturday, 9th March 2019, pursuant to the Resolution of Parliament of 21st February, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.